



# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | දිනමිණ

ස්වර්ණභූමියේ අතීතාවලෝකනය
කතුරම
අද පත්‍රය සමඟ

ශ්‍රී බුඩ වර්ෂ 2564ක් වූ මැදින් පුර විසේනිය ලත් ගුරු දින | කාණ්ඩය 112 | පත්‍රය 79 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මාර්තු 18 බ්‍රහස්පතින්දා


ජායාරූපය - සමන්ත වීරසිරි

## බැඳුම්කර සිද්ධියට රවි ඇතුළු අටක් රිමාන්ඩ්

චූදිතයෝ සති 2ක් වැලිකඩ නිරෝධායනයට

පිට 06



## අසාද් සාලිගෙන් දවස් තුනක් ප්‍රශ්න කිරීමට අවසර

සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සහ පාස්කු කොමිසමේ නිර්දේශයන්ට අනුව කොල්ලුපිටියේදී පෙරේදා (16) අත්අඩංගුවට ගත් බස්නාහිර පළාත් හිටපු ආණ්ඩුකාර අසාද් සාලි මහතා දින තුනක් රඳවා ගෙන ප්‍රශ්න කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවසර ලැබී තිබේ. පිට 06




ශ්‍රී ලංකාව ලෝක ක්‍රිකට් කුසලානය දිනා වසර 25ක් ගත වීම නිමිත්තෙන් එම ක්‍රිකට් ශූරයන්ට උපහාර පිදීමේ උත්සවයක් ඊයේ (17) අරලියගහ මන්දිරයේදී පැවැත්විණි. එහිදී 1996 වසරේ විජයග්‍රාහී ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකයන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා සමඟ ජායාරූපයකට පෙනී සිටි අයුරු.

## අසාද් සාලිගේ රියේ විදෙස් පිස්තෝලයක්

රක්ෂණ ශ්‍රියන්ත

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පෙරේදා (16) අත්අඩංගුවට ගත් බස්නාහිර පළාත් හිටපු ආණ්ඩුකාර අසාද් සාලි මහතාගේ මෝටර් රථයේ තිබී විදේශ රටක නිෂ්පාදිත පිස්තෝලයක්, මැගසිනයක් සහ උණ්ඩ කිහිපයක් සොයා ගෙන ඇතැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය. පිට 06



## අස්ගිරි මහනාහිමියෝ 79 විය සපුරති

අසේල කුරුළුවංශ

ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහා නායක අතිපූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඤාණරතනාභිධාන මහනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ 79 වැනි ජනම දිනය අදට (18) යෙදී ඇත. පිට 06

## ශ්‍රී ලංකාවට එරෙහිව ඉන්දියාවේ සහාය ගන්න බ්‍රිතාන්‍යය දත කයි

පිට 06

## අගමැති හෙට බංග්ලාදේශයට

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාව සහ බංග්ලාදේශය අතර තිබෙන මිතුදම ශක්තිමත් කර ගනිමින් දෙදින නිල සංචාරයක් සඳහා අගමැති මහින්ද රාජපක්ෂ මහතා දෙදින සංචාරයක් සඳහා හෙට (19) බංග්ලාදේශය බලා පිටත්ව යෑමට නියමිතයි. පිට 06



## බිලූමැන්ඩල් සංබගේ කෝටි 2ක කුඩු සමඟ අයෙක් අත්අඩංගුවට

පිට 06

## එක පාරක් විද්දම ඇති ජොන්සන් ඇන්ඩ් ජොන්සන් ගේන්න අවධානය

පිට 06



## විදෙස් ශ්‍රමිකයන් ගැන ආණ්ඩුවට වගකීමක් නෑ

පිට 06


ජායාරූපය - රුක්මල් ගමගේ

## ස්වර්ණමහල් අධ්‍යක්ෂවරු සිව්දෙනා 30 දක්වා රිමාන්ඩ්

පිට 06



## ගැටලුවලට විසඳුම් නොදී ආණ්ඩුව බොරු ගොතනවා

පිට 06

## හේමසිරි-පූජිත් ගැන නීතිපති උපදෙස් තවම ලැබී නෑ

CIDය උසාවියට කියයි

සිරංජනි කුමාරි

පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාර මාලාව වළක්වා ගැනීමට කටයුතු නොකළ බවට චෝදනා එල්ල වී ඇති හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු සහ හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර යන අයට අදාළව කළ පරීක්ෂණ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් මෙතෙක් ලැබී නැති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට ඊයේ (17) දැනුම් දුන්නේය. පිට 06




## රන්ජන්ගේ දුරකතනය CIDයට

බුද්ධිකා ඉඹුලාන

රන්ජන් රාමනායක රඳවා සිටින අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ, Y විශේෂ අංශය අසල තිබී සොයා ගත් ජංගම දුරකතනය වැඩිදුර පරීක්ෂණ කටයුතු සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දුන් බව බන්ධනාගාර කළමනාකරණ, සිරකරු පුනරුත්ථාපන රාජ්‍ය ඇමැති ලොහාන් රත්වත්තේ මහතා කියයි. පිට 06

## උත්සව සමයේ අවශ්‍ය වුණොත් සංචරණ සීමා

යුද හමුදාපති

පිට 06



## 'ලූසී' ට නිදහස ඉල්ලා කැනඩා අගමැතිට සන්දේශයක්

පිට 06

# හම්බන්තොට වරාය නෞකාවලට ඉන්ධන තොග සැපයීම ආරම්භයි

**මහින්ද අලුත්ගෙදර**

රටේ ආර්ථිකයට ශක්තියක් එක්කරමින් හම්බන්තොට අනතර්ජාතික වරාය නෞකා සඳහා ඉන්ධන තොග වශයෙන් සැපයීම ආරම්භ කරයි.

හම්බන්තොට ජාත්‍යන්තර වරාය තම සේවාවන්හි සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, ලොව ප්‍රමුඛ පෙළේ ගෝලිය ක්‍රියාකරුවකු වන සයිනොපෙක් ඔයිල් සමාගමේ මෙරට නියෝජිත සමාගම වන සයිනොපෙක් ලංකා සමාගම (SFOL) සමඟ හවුල් වී වරාය සතු එම්. වී. කුමන (m.v Kumana) ඉන්ධන යාත්‍රාව හරහා ඉන්ධන තොග වශයෙන් සැපයීම ආරම්භ කෙරිණි.

IMO 2020 හෙවත් අවම සල්ෆර් සංයුතියකින් යුත් ඛනිජ තෙල් (VLSFO), මිළදී ගත් ප්‍රථම ගැනුම්කරු බවට පත්වෙමින් වෙළෙඳ නෞකා සඳහා ඉන්ධන සැපයීමේ වෙළෙඳපොල ප්‍රමුඛයා වන ලංකා මැරීන් සර්විසස් සමාගම (LMS), හම්බන්තොට වරායේ ද සහය ඇතිව, තම සේවාදායකයා වූ, ඉන්දියාවේ චෙන්නායි සිට සූවස් දක්වා යාත්‍රාකරමින් තිබූ එම්.වී. සූවස් හාන්ස් (m.v. Suez Hans) නැමැති ඉන්ධන ප්‍රවාහන නෞකාව වෙත ඉන්ධන සපයයි.

මෙහෙයුම පිළිබඳ අදහස් දක්වමින්, හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි, තිස්ස වික්‍රමසිංහ මහතා පෙන්වා දෙන්නේ මෙය ශ්‍රී ලංකාවේ වරායන්ට සහ කාර්යබහුල නැගෙනහිර - බටහිර නැව් මාර්ගයේ ගමන් කරන යාත්‍රා සඳහා ඉන්ධන සපයන මෙරට සියලුම බලපත්‍රලාභී ඉන්ධන සැපයුම්කරුවන්ට අගනා අවස්ථාවක් බවයි. 'එක්සත් අරාබි එමිර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ඩුබායි වැනි රටවලින් නාවික ඉන්ධන තෙල් ආනයනය කිරීම හා වරායෙන් පිටත වරායන් වෙත සැපයීම සඳහා පමණක් සීමාකොට තිබූ නැව්වලට ඉන්ධන සැපයීමේ කර්මාන්තය, මෙම මෙහෙයුම් හරහා ප්‍රථම වතාවට සයිනෝපෙක් ඔයිල් සමාගමට IMO 2020 හෙවත්, අවම සල්ෆර් සංයුතියකින් යුත් ඛනිජ තෙල් අපනයනය කිරීමට අවස්ථාව උදා විය.



නැව්වලට ඉන්ධන සැපයීමේ කර්මාන්තය වෙත නව මානයන් ගෙන එමින්, කලාපීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණ බව වික්‍රමසිංහ මහතා වැඩි දුරටත් සඳහන් කළේය. 'සියලු දේශීය ව්‍යාපාරිකයන් සඳහා සාධාරණ මිලකට අවම සල්ෆර් සංයුතියකින් යුත් ඛනිජ තෙල් සැපයීම හරහා, ව්‍යාපාරිකයන් සිය ගෝලීය සේවාදායකයන් ශ්‍රී ලංකාවට ගෙන එනු ඇත. අප 2020 අප්‍රේල් මාසයේ දී අඩු සල්ෆර් සංයුතියකින් යුත් ඛනිජ තෙල් ටොන් 25,000ක් හම්බන්තොට වරාය වෙත ආනයනය කළ නමුත් කෝවිඩ් වසංගතය හේතුවෙන් වරායට ඉන්ධන මෙහෙයුම් ආරම්භ කිරීමට නොහැකි විය.

නමුත් මෙහෙයුම් දැන් නැවත සක්‍රිය කර ඇති හෙයින්, අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක හවුල්කාරිත්වයක් සැපයීමට අප සූදානම් "යැයි තොග වෙළෙඳාම, අපනයනය සහ හම්බන්තොට වරාය හරහා ඉන්ධන මෙහෙයුම් සිදුකිරීම සඳහා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලබා ඇති සයිනොපෙක් ලංකා සමාගමේ සාමාන්‍යාධිකාරි ටාවෝ ලියු පැවසීය.

# ගින්නකින් බ්‍රවුන්ස්වික් වතුයායේ නිවාස 20ක් ගිනිබත් වෙයි

**අසේල කුරුළුවංශ**



මස්කෙළිය බ්‍රවුන්ස්වික් වතුයායට අයත් ක්වින්ස්ලැන්ඩ් කොටසේ වතුනිවාස පේලියක ඊයේ (17) පස්වරු 2ට පමණ හටගත් ගින්නකින් නිවාස 20ක් ගිනගෙන විනාශවී තිබේ.

එක් නිවසක හටගත් ගින්න සුළු වේලාවකදී සෙසු නිවෙේවලට පැතිර ගොස් තිබෙන බවත්, ඉන් කිසිවකුටත් තුවාල සිදුව නොමැති බවත් පොලිසිය පවසයි.

ගින්නෙන් පවුල් 20කට අයත් සමාජිකයන් 60 දෙනකු පමණ අවතැන්ව ඇත. මස්කෙළිය පොලිසියේ නිලධාරින්,යුද හමුදා භට පිරිස් සහ වතු කම්කරුවන් එක්ව ගින්න පැතිර යාම පාලනය කළද නිවාස වල තිබූ භාණ්ඩ සියල්ල ගිනිගෙන විනාශ වී තිබේ.

ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර ඉන් සිදුව තිබෙන අලාභය මෙතෙක් තක්සේරුකර නැත. ගින්නෙන් අවතැන් වූ පවුල් තාවකාලිකව එම වතුයායේම ආරක්ෂිත ස්ථානයක් කරා යොමු කර තිබේ.

# කල් බදු - ලීසිං - ණය ගෙවන්න දුන් සහනය වසරකින් දීඝු කරන්න

## උසාවියට රිට් පෙත්සමක්

**නෙල්කා මැදගෙදර**

වාහන මිලට ගැනීමට ගත් කල් බදු - ලීසිං - ණය මුදල් ගෙවීමට දුන් ණය සහන කාල සීමාව තවත් වසරකින් දීර්ඝ කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවට නියෝග කරන රිට් ආඥාවක් නිකුත් කරන්නැයි ඉල්ලා ශ්‍රී ලංකා සංචාරක රියදුරු එකමුතුව අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කර තිබේ.

එලෙස ලබා ගත් ණය මුදල් වලට වැල් පොළී එකතු කිරීම හෝ ණය වාරික නොගෙවූ වාහන රැගෙන ගොස් වෙන්දේසි කරන බවට වාහන හිමියන් බිය වැද්දීමෙන් මූල්‍ය ආයතන වළකන නියෝගයක් කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවට නියම කරන ලෙසද පෙත්සමෙන් ඉල්ලා ඇත.

ශ්‍රී ලංකා සංචාරක රියැදුරු එකමුතු වේ සභාපති මනෝජ් ලංකා විතානගේ, එහි ලේකම් සමන්ත සූරිය ආරච්චි, සහ එම එකමුතුව පෙත්සම් කරුවෝ වෙති.

ශ්‍රී ලංකා මහ බැංකු අධිපති මහචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන්, එහි මූල්‍ය මණ්ඩලය, මූල්‍ය මණ්ඩල සාමාජිකයන් මුදල් ඇමැති අගමැති මහින්ද රාජපක්ෂ, ජනාධිපති ලේකම් ආචාර්ය පී.බී .ජයසුන්දර, වගඋත්තර කරුවෝ වෙති.

# පැලියගොඩ

| පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳපොළ දෛනික මසුන් මිල | කිලෝ ග්‍රෑම් එකක මිල |
|---|---|
| තෝරා (බිලි) | 900 |
| ඇටනගුල් පරව්- | 600 |
| අංජිලා නයිලෝන්B- | 850-880 |
| බලයා ලොකු D - | 350-250 |
| බලයා කුඩා M - | 400 |
| කෙලවල්ලා ලොකු- | 550 |
| කෙලවල්ලා කුඩා - | 600 |
| කෙන්දා බොකු සහිත- | 500 |
| තලපත් ලොකු - | 620-640 |
| කොප්පරා - | 800 |
| මෝරු ශුද්ධ- | 600 |
| ඇට්ස්සා ලොකු- | 580-600 |
| හබරලි- | 360-570 |
| පිලා ලොකු | 600 |
| පිලා මධ්‍යම- | 630 |
| අලගොඩුවා ලොකු- | 400-420 |
| ඇටවල්ලා ලොකු - | 400 |
| පියාමැස්සා - | 260 |
| හුරුල්ලා- | 450 |
| ගල් හුරුල්ලා | 550 |
| සාලයා - | 150 |
| හාල්මැස්සා - | 180 |
| සප්පරා ශුද්ධ- | 520 |
| වන්නා - | 300 |
| දැල්ලා පිලි- | 800 |
| ඉස්සා ලොකු - | 99 |
| ඉස්සා කුඩා- | 500 |
| සවරා | 850 |
| මොරල්ලා | 400-450 |
| ලින්නා ලොකු | 300-330 |
| සුද්දා - | 500 |
| මුහුදු කකුළුවා කුඩා- | 450 |
| ගීනට් පරව්- | 550 |
| අගයා- | 430-450 |
| සූඩයා- | 100 |
| කුම්බලා/ බෝල්ලා කුඩා- | 480 |
| සුරාපරව් - | 500 |

| පැලියගොඩ එළවළු මිල | (කිලෝවක තොග මිල) |
|---|---|
| ගෝවා - | 80 -90 |
| බෝංචි - | 200 |
| තක්කාලි- | 100 |
| ලීක්ස්- | 60 |
| කැරට්- | 150 |
| බම්බටු- | 80-90 |
| පිපිඤ්ඤා- | 40 |
| අමු මිරිස්- | 130 |
| මාළු මිරිස්- | 220 |
| බංඩක්කා | 70 |
| තලන බටු | 50 |
| දෙහි | 70 |
| වට්ටක්කා | 70 |
| පතෝල | 80-90 |
| බීට් | 80 |
| දේශීය අර්තාපල් | 120 |
| ලොකු ලූනු | 70-80 |

| පැලියගොඩ පලතුරු මිල | (කිලෝවක තොග මිල) |
|---|---|
| අඹ අල්පොන්සෝ | 410-430 අතර |
| ගස් ලබු | 150-160අතර |
| කෝලිකුට්ටු | 140-160අතර |
| ඇඹුල් කෙසෙල් | 60-70-80අතර |
| දොඩං | 150-160 |
| කොමඩු | 110-120 අතර |
| අන්නාසි | 80-90-100 අතර |
| කිලෝපේර | 140-150 අතර |
| දොඩං | 140-150 |



# බැංකුවකට සයිබර් ප්‍රහාරයක් කර ඩොලර් මිලියන 2.104ක් සොරා ගත්තේ යැයි සාක්ෂි වාර්තා අධිකරණය ඉල්ලයි

**සුභාෂිණී සේනානායක**

ප්‍රසිද්ධ බැංකුවකට සයිබර් ප්‍රහාරයක් සිදු කරමින් අමෙරිකානු ඩොලර් මිලියන 2.104ක මුදලක් (රුපියල් ලක්ෂ 3000ක් පමණ) බැංකු පරිඝණක දත්ත මගින් සොරකම් කළ බව කියන සිද්ධියකට අදාළව දෙක තුන සහ හතර සැකකරුවන්ට අදාළව සාක්ෂි සම්පිණ්ඩන වාර්තා ලබන ජුනි 02 වනදාට පෙර ඉදිරිපත් කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ 27 නියෝග කළේය.

සිද්ධියට අදාළ නඩුව කැඳවූ අවස්ථාවේ ඇප මත මුදා හැර ඇති සැකකරුවන්ට එරෙහිව සාක්ෂි නොමැති බැවින් ඔවුන් මුදා හරින ලෙස ඔවුන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මඩුල්ල සිදු කළ ඉල්ලීම සලකා බැලූ මහේස්ත්‍රාත්වරයා මේ නියෝගය සිදු කළේය.

එදිනට ඉල්ලීම සම්බන්ධයෙන් සලකා බලන බවද මහේස්ත්‍රාත් වරයා පැවැසීය.

සිද්ධියට අදාළව රහස් පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇප මත මුදා සිටින ලිට්රෝ ගෑස් සමාගමේ හිටපු සභාපති ශලීල මුණසිංහ ,ජනක චමින්ද නම්මුණිගේ ,චූලපාල ලලින්ද්‍ර සිල්වා සහ බන්දුල වීරවර්ධන යන සැකකරුවනේ අධිකරණයේ පෙනී සිටියහ.

# ආඬිගම ඇඟලුම් සේවක සේවිකාවන් 18කට කොවිඩ්

**ඩබ්ලිව්.සී.බී.ප්‍රනාන්දු පුත්තලම සමූහ**

ආණමඩුවේ ආඬිගම ඇඟලුම් කර්මාන්ත ශාලාවක සේවක සේවිකාවන් 18 දෙනෙකුට කොවිඩ් ආසාදනයවී ඇති බව සෞඛ්‍ය අංශ අනාවරණය කරයි.

පසුගිය 13 වැනි දින එම කර්මාන්තශාලාවේ සේවක සේවිකාවන් 100ක් දෙනා පී.සී.ආර් පරීක්ෂණවලට යොමු කළ අවස්ථාවේ ඒ අතුරින් 18 දෙනෙකුට කොවිඩ් ආසාදනය වී ඇති බව මෙසේ අනාවරනයවී ඇත.

මෙසේ හඳුනාගෙන ඇති කොවිඩ් ආසාදිතයන් කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානවලට යොමුකර ඇති අතර, ඔවුන්ගේ ආශ්‍රිතයින් නිරෝධායනය සඳහා යොමු කිරීමට සෞඛ්‍ය නිලධාරීන් කටයුතු කර ඇත.

# තරුණියක් බාල්කයේ එල්ලී දිවි නසා ගෙන

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

මවුපියන්ගේ අවවාද නොරිස්සූ යාපනය චාවකච්චේරි නුනාවිල් ප්‍රදේශයේ වයස අවුරුදු 22 ක සුරූපී තරුණියක 16 දා ඇගේ නිවසේම බාල්කයක එල්ලී සියදිවි හානි කරගෙන තිබේ.

මෙසේ මියගොස් ඇත්තේ නුනාවිල් ගම්මානයේ පදිංචි මහාදේවන් සුබේදනී නමැති තරුණියකි. යාපනය චාවාකච්චේරි පොලීසිය සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පවත්වා ගෙන යයි.

# දරුවන් වෙනුවෙන් ජීවත් වෙන්න ලක්මාලිට නැවත ඉගෙන ගන්න උදවු කරමු



"මම පහුගිය කාලේ ගත්ත තීන්දු තීරණ ගැන දහස් වාරයක් පසුතැවෙමින් ඉන්නෙ. මම කාටවත් ඒ ගැන වරද පටවන්නෙ නැහැ. මගේම වරදින් සිදුවුණු දේවල් ඒවා. කොයි විදියකින් හරි ආයේ ඒවා හරිගස්සන්න බැරි බව මම දන්නව.

මගේ වයස දැන් අවුරුදු 26ක්. දැනට මට ළමයි දෙන්නෙක් ඉන්නව. ලොකු දුව නිපුනිගේ වයස අවුරුදු 11ක්. පුතා නිපුල් 6 වන වියේ ඉන්නෙ. දෙදෙනාම පාසල් යනවා.

මට යන්තම් වයස අවුරුදු 14 දි කසාද බඳින්න සිදුවුණා. ප්‍රේමලාල් මට මුණ ගැහුණේ අපේ වත්තෙ ගහක් කපන්න ආපු වෙලාවෙ. ඒ කාලේ මට ජීවිතේ ගැන එතරම් බරපතළක් තේරුණේ නැහැ. මගේ මෝඩ කමට එයා ගැන ඇති වුණ ඇල්ම මට වළක්ව ගන්න බැරි වුණා. ගෙදරින් මේක දැන ගෙන ඒ අය මේකට සෑහෙන්න විරුද්ධ වුණ ඒත් වැඩක් වුණේ නෑ. ඒ වන කොට මේ සම්බන්ධය බොහොම දුරදිග ගිහින් තිබුණා.

මම පස්සෙ එයාට කිව්ව අපි මේක අත්හැර දාමු කියලා. මට අම්මල තරහ කර ගන්න බැහැ කියලා. එයා ඇහුවෙ නෑ. ඉතින් මට මේකෙන් ගැලවෙන්න බැරි තැනට වැඩ සිද්ධ වුණා. එයා කිව්ව මාව නොලැබුණොත් වස බීල මැරෙනව කියලා. මම හොඳටම බය වුණා. ඊට පස්සෙ මම එයාගෙ ගෙදරට යන කොටත් මගේ බඩේ ළමයෙක් හිටියා. අපි කච්චේරියට ගිහින් කසාද බැන්ඳා. අන්තිමට මට පුතෙක් හම්බ වුණා. එයා ගස් කපල ලී ඉරල හම්බකරපු සල්ලිවලින් තමයි අපි ජීවත් වුණේ. කොතරම් නැතිබැරිකම් තිබුණත් එයා මට හොඳට සැලකුවා. කෑම බීමවලින් අඩුවක් කළේ නැහැ. දරුව ලැබෙන්න ආවහම එයා තමයි ඒ සේරම උදවු කළේ. දරුවට ඕන කරන සේරම දේ ගෙනත් දුන්නා. දුප්පත් වුණත් එයාගෙ ළඟ හොඳ මනුස්ස ගති ගුණ තිබුණා. එයා හොඳ තාත්ත කෙනෙක්. අදත් මම හිතන්නෙ එහෙමයි. ඊට පස්සෙ තමයි වෙන්න තියන ලොකුම විනාසෙ වුණේ. ඒ දවස මට හොඳට මතකයි. ඒ 2020 ඔක්තෝම්බර් 10 වැනිදා. එදා තමයි මගේ ජීවිතේ කඩා වැටුණ කාලකන්නිම දවස. අලුතෙන් හදන්න යන අපේ ගෙට ඕන කරන ලී ගන්න ගහක් කපන්න ගිහින් ඒක සිද්ද වුණේ. එයා තවත් කෙනෙක් එක්ක ගහ ඇද ගෙන හිටියා. ඇළ වුණ ගහ එකපාරටම එයා ඉන්න පැත්තට ආවා. ගහ වැටුණේ එයාගෙ ඇඟ උඩට. එයාට දුවගන්න බැරිවුණා. ඉස්පිරිතාලෙට ගෙනියන කොටත් පණ ගිහින්.ඒක ඇහුවම පොළොව මා වටේ කැරකෙනව වගේ මට දැනුණා. ගහ වැටුණේ එයාගේ ඇඟ උඩට නෙවි. අපි ඔක්කොමගෙම ඇඟවල් උඩට. අන්තිමට දරු දෙන්නෙකුත් එක්ක මම තනි වුණා.

මට දැන් තේරෙනව ජීවිතේ කියන්නෙ මොකක්ද කියලා. ඒක ආදරය ප්‍රේමය වගේ හැල්ලුවට ගන්න ලඳ බොළඳ එකක් නෙවි. මම මේ තත්ත්වයට ඇද වැටෙන කොට මම හිටියෙ 8වැනි ශ්‍රේණියේ. පන්තියෙ හොඳම ළමයා වුණේ මම. මම හැම විෂයයකටම ඉහළම ලකුණු ලබා ගත්තා. ක්‍රීඩා හැටියට නෙට්බෝල් ගැහුවා. මීටර් 100 200 400 දුවල දිනුව. මගේ පාසල් කාලය මතක් වෙන කොට බඩ පපුව දාගෙන යනවා. කියන්න බැරි තරමේ දුකක් ඇති වෙන්නේ.

දැන් මම තීරණයක් අරගෙන තියෙන්නේ. මගේ දරුවන් වෙනුවෙන් මම ජීවත් වෙන්න ඕනෑ. කොහෙමෙ හරි ආයෙ ඉගෙන ගන්න පටන් ගන්න මම හිතා ගත්තා. මම දරුවන්ට ඔවුන්ගෙ පාඩම් පොත් කියවල පාඩම් කියලා දෙනවා. ඒකෙන් මමත් ඉගෙන ගන්නවා.

ඒ තමයි පළමු වැනි පියවර. ඒක තමයි මේ දුකෙන් ගැලවෙන්න තියන හොඳම මාර්ගය. මම ඕගොගන්ගෙන් ඉල්ලා සිටින්නෙ මට උදවු කරන්න කියලා. 9,10 සහ 11 වසරවල පරණ පොත් තියෙනව නම් මට ලබා දෙන්න.

ඒ වගේම තව පොඩි ඉල්ලීමක්. මට පරණ මහන මැෂිමක් ලැබුණොත් ඇඳුම් මහල මුදලක් උපයා ගත හැකියි. දැන් ප්‍රශ්නෙ තියෙන්නෙ මම නිකම්ම කිනම් ගැහැනියක් වීමයි. ඒක සියල්ලටම වැඩිය දරුණු රිදවීමක්. මට ඒ අවලාදයෙන් මිදෙන්න උදවු කරන්න. මටම කියල ආදායමක් උපයා ගන්නා ගැහැනියක් බව මට පෙන්වන් ඕන.

මගේ දරු පැටව් දෙන්නාට පාසල් උපකරණ ටිකක් ලබා දෙනවා නම් ඒකත් මට මහ මෙරක් වගේ දෙයක්. දැනට අඩිතාලම දාල තියෙන ගේ හදා ගන්නත් ඕනෑ.

අපි වගේ අසරණ අයට පිහිට වීම ලොකු පිනක් කියල ඔබ සිතනව නම් කරුණාකර මට මේ අතර මගදි කඩා වැටුණ මගේ ජීවිතය ගොඩ දා ගන්න උදවු කරන්න කියලයි මම ඉල්ලන්නේ. මම - ආර්.ඩී. දිනේශා ලක්මාලි - කලුගොඩ- ගොඩවෙල - ඕමල්පෙ.

"ඇයට උදවු කිරීමට ඔබ කැමති නම් ඇගේ ගිණුම් අංකයත් දුරකතන අංකයත් මෙන්න. ගිණුම් අංක 81676703 ලංකා බැංකුව මිද්දෙනිය/ දුරකතන අංකය. 0703912217"

**ලීලානන්ද වික්‍රමසිංහ**

## ශ්‍රීකාන්තගේ ශ්‍රී දූපත




# තීරු බදු රහිතව ගෙනා දුම්වැටි 8800ක් විකිණීමට තබා ගෙන

**රක්ෂණ ශ්‍රියන්ත**

තීරු බදු රහිතව මෙරටට ගෙන්වන ලද නීති විරෝධී දුම්වැටි 8800ක් විකිණීම සඳහා සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු පෙරේදා (16) ගාල්ල පොලිස් වසමේ මාගාල්ල ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් පිරිසක් සිදුකළ වැටලීමක දී අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරුගේ වෙළෙඳසලක මෙම නීති විරෝධී දුම්වැටි තොගය අලෙවි කරන බවට අක්මීමන කඳවුරේ පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන්ට ලැබුණ තොරතුරක් මත මෙම වැටලිම සිදු කර තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරු වැඩිදුර විමර්ශන කටයුතු සඳහා ගාල්ල පොලිස් ස්ථානය වෙත භාර දී තිබේ.


## F&G නාමය යටතේ වෙළඳපොලෙහි ඇති ආරක්ෂක උපකරණයන්හි කූට/ ව්‍යාජානුකරණය පිළිබඳව ප්‍රවේසම් වීමේ දැනුම්දීමයි.

අයර්ලන්තයේ ඩබ්ලින් නුවර, පෙම්බ්‍රොකේ පාර, අංක 30, ඊටන් හවුස් හි සාංගමික මූලස්ථානයෙහි වූ ඊටන් පොදු සමාගම ("Eaton") වන අප පොදු මහජනතාව සහ හිතවත් පාරිභෝගිකයින් වෙත දැනුම් දෙනු ලබන්නේ, ඊටන් සමාගම, F&G සන්නාමය යටතේ ආරක්ෂක උපකරණ තවදුරටත් නිෂ්පාදනය නොකරන බවයි.

කෙසේ නමුත්, අපගේ විමර්ශන මගින් අනාවරණය කරගෙන ඇත්තේ F&G සන්නාමය යටතේ ඇතැම් ව්‍යාජානුකරණය කරන ලද ආරක්ෂක උපකරණ තවදුරටත් ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ අලෙවි වන බවයි. F&G ලාංඡනය, EATON ලාංඡනය සහ XPOLE ලාංඡනය ඔවුන් නිරතුරුව ප්‍රදර්ශනය කළද, ඊටන් සමාගම විසින් ඒවා නිර්මාණය නිෂ්පාදනය හෝ අවසර පත්‍රයක් හෝ ඔවුන් වෙත ලබා දී නොමැති නිසා මෙකී භාණ්ඩ කූට/ ව්‍යාජානුකරණය කරන ලද ආරක්ෂක උපකරණ වේ.. අප සමාගමේ අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයේ නිෂ්පාදනයන්හි පින්තූර මෙසේය:



F&G ලාංඡනය, EATON ලාංඡනය සහ XPOLE ලාංඡනය භාවිත කරමින් වෙළඳපොලේ අලෙවි වන එබඳු ව්‍යාජානුකරණය කරන ලද ආරක්ෂක උපකරණ පාවිච්චි කිරීමට එරෙහිව ඔබගේ ආරක්ෂාව සම්බන්ධව අපි දැඩිව ඔබට අවවාද කර සිටිමු.

එසේම, F&G සන්නාමය/ ලාංඡනය යටතේ වෙළඳපොලේ අලෙවි වන ව්‍යාජානුකරණය කරන ලද එබඳු ආරක්ෂක උපකරණයන්හි ක්‍රියාකාරීත්වය හා ආරක්ෂාව පිළිබඳවත්, ඒවා භාවිතා කිරීමෙන් හා ඒවා සමග කටයුතුකිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් කිසියම් හෝ පුද්ගලයකුට කවරාකාරයෙන් හෝ සිදුවන පාඩුවක් හෝ හානියක් සම්බන්ධයෙන් ඊටන් සමාගම හෝ එම සමාගමෙහි කිසියම් සාමූහික සමාගමක් කවර ලෙසකට හෝ වග නොකියන බව මෙමගින් පොදු මහජනතාව වෙත අවවාදකර සිටිමු.

F&G සන්නාමය/ ලාංඡනය යටතේ වෙළඳපොලෙහි අලෙවි වන ආරක්ෂක උපකරණයන්හි ව්‍යාජානුකරණයන් මිලදී නොගන්නා ලෙසත් ඒ පිළිබඳව ඔබ විශේෂ අවධානයක් යොමුකරන ලෙසටත් අප විසින් අනතුරු හඟවා සිටිමු.

ඊටන් සමාගම, සිය බුද්ධිමය දේපල අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමට සහ එහි පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් රැකීමටත් බැඳී සිටී. එසේම ඊටන් සමාගමේ බුද්ධිමය දේපල අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් මහජනතාව නොමග යවන ආකාරයෙන් එම සමාගමෙහි සන්නාමයෙහි කීර්තිනාමය භාවිතා කරමින් ව්‍යාජානුකරණ සම්බන්ධව කටයුතු කරන කූට ව්‍යාපාරිකයන් හසුවුවහොත් ඔවුන්ට එරෙහිව නිසි නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ඊටන් සමාගමෙහි නිෂ්පාදන පිළිබඳව එහි බලයලත් නිසි බෙදාහරින්නා වන රිචඩ්සන් ප්‍රොජෙක්ට් (පුද්ගලික) සමාගම, අංක 342, ගාලුපාර, කොළඹ 03, ශ්‍රී ලංකාව යන ස්ථානයෙන් මිලදීගත හැක.

**Richardson Projects (Pvt) Ltd., No. 342, Galle Road, Colombo 3, Sri Lanka**

ඔබ රිචාඩ්සන් ප්‍රොජෙක්ට් (පුද්ගලික) සමාගමෙන් හැර ඉහත පින්තූරයෙහි දැක්වෙන ආකාරයේ ව්‍යාජානුකරණය කරන ලද නිෂ්පාදන මිල දී ගෙන තිබේ නම් හෝ නිෂ්පාදකයා, බෙදාහරින්නකු හෝ වෙළෙන්දකු පිළිබඳ තොරතුරු තිබේ නම් සහ ඉහත කාරණාව සම්බන්ධව ඔබට යම් සොයාබැලීම් කිරීමට අවශ්‍ය නම් අයර්ලන්තයේ ඩබ්ලින් නුවර, ඊටන් හවුස්, අංක 30 පෙම්බ්‍රොකේ පාර සාංගමික මූලස්ථානයෙහි පිහිටි ඊටන් පොදු සමාගමෙහි නීතිඥයින්, වෙත යොමුකරන්න:

**Hilborne, Hawkin & Co.**
230 Commerce Drive, Suite 185
Irvine, California 92602
United States of America
Telephone: (714) 283-1155
Facsimile: (714) 283-1555
Email: info@hilbornehawkin.com


අසාද්සාලි කට මැත දොඩමින් නිතර
ලොකුකම පෙන්වමින් මහජනයා අතර
හැසුරුණි කෙනෙකු නැති විදියට මං විතර
දැන් ඇත පොලිස් හිරකූඩුවෙ වී නතර

සොයමින් එකිනෙකා අතරේ ඇති දෝස
අප ඇත අසා කරනා හැටි අපහාස
ආපිට පෙරළීම කරුණකි සුවිසේස
කළයුතු දේට නොලැබේ ඉන් අවකාස

රටේමුල්ලේ මුදන්නායක

යනවිට සහල් මිල තව තව ඉහළ ඇදී
වී සඟවලා නම් පිරිසක් අතර මැදී
ළඟදී බලෙන් හෝ ඒවා පිටට අදී
ඒ ටික උණොත් බත් කත හැක නැතත් හොඳී




සෙවණක පැතුම එලිකළ දිනුම



සෙවණ
ඔබට ගෙවල් - අතට මුදල්
உங்களுக்கு வீடு - கைகளில் காசு
ජාතික ලොතරැයි මණ්ඩලය
බ්‍රහස්පතින්දා සහ ඉරිදා දිනයන්හි
දිනුම් අදිනු ලබන
සෙවණ ලොතරැයියෙන්
සිහින නිවස සාදාගන්න
එක්කෝටි හතලිස් ලක්ෂයක්



ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකතනය: 011 460 70 00, 011 232 43 24
ෆැක්ස්: 011 466 94 16
වෙබ්: www.nlb.lk

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 මාර්තු 18 බ්‍රහස්පතින්දා

# කොවිඩ් මර්දනයේ අපේ සලකුණ

ශ්‍රී ලංකාවේ කොවිඩ් මර්දනය දෙස ආපසු හැරී බලන විට තෘප්තිමත් විය හැකි සාධක ගණනාවක් තිබේ. ජගත් සංවිධාන දෙකක් මීට පෙර පෙන්වා දී තිබුණේ ලෝක කොවිඩ් මර්දනය නිරීක්ෂණය කරන විට දකුණු ආසියාවේ කැපී පෙනෙන රාජ්‍යය ශ්‍රී ලංකාව බවය. මේ වන විට කොවිඩ් ව්‍යාප්තිය සැලකිය යුතු මට්ටමකින් පාලනය වී ඇත. බස්නාහිර පළාතෙන් හමුවන දෛනික ආසාදිතයන්ගේ ගණන පහත වැටී ඇත. කොවිඩ් ආසාදිත නව පොකුරු නිර්මාණය වීමක් දකින්නට නැත. කොවිඩ් එන්නත ලක්ෂ නවයකට වැඩි පිරිසකට ලබා දී ඇති අතර එන්නත්කරණය දිගටම සිදු වෙයි. කොවිඩ් මරණ සංඛ්‍යාව ද පහළ මට්ටමක පවතී. රජය කොවිඩ් මර්දනය සඳහා වෙන් කර ඇති මුදල ද විශාලය.

කොවිඩ් ලෝක වසංගතය තුළ රටවල් මුහුණ දෙන ප්‍රධාන ගැටලු දෙකක් පවතී. පළමු ගැටලුව වන්නේ රෝගය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ජන ජීවිතය කඩා වැටීමය. දෙවන ගැටලුව වන්නේ ආර්ථිකය ශීඝ්‍රයෙන් පිරිහීමට ලක්වීමය. ආර්ථික විශ්ලේෂණවලට අනුව 1930 ගණන්වල ලෝකය මුහුණ දුන් බරපතළ ආර්ථික අවපාතයට සමාන තත්ත්වයක් කොවිඩ් නිසා ද ඇති වීමට නියමිතය. ව්‍යාපාර කඩා වැටීම, නිෂ්පාදන කර්මාන්ත ඇනහිටීම හා රැකියා අහිමි වීම මේ ආර්ථික අවපාතයේ විශේෂ ලක්ෂණ වෙයි. අමෙරිකාවේ පමණක් දස ලක්ෂ ගණනකට රැකියා අහිමි වී ඇත. ශ්‍රී ලංකාව මේ තත්ත්වයට ඉතා පරිස්සමෙන් හා බුද්ධිමත්ව මුහුණ දෙන බව පෙනී යයි.

ශ්‍රී ලංකාවේ කම්හල් වසා දැමුණේ නැත. ව්‍යාපාර බිඳ වැටුණේත් නැත. ඒවා තාවකාලික ලෙස යම් පසුබෑමකට ලක්වීම සිදු වුව ද යළි සක්‍රිය තත්ත්වයට පත් වී ඇත. රාජ්‍ය නායකයා ගත් තීන්දු - තීරණ නිසා ආර්ථිකය ස්ථාවර මට්ටමකට ගෙන යා හැකි වූ බව පිළිගත යුතුය. මහ බැංකුව හා වාණිජ බැංකු පද්ධතිය සමඟ කරන ලද දීර්ඝ සාකච්ඡාවල ප්‍රතිඵලයක් හැටියට ව්‍යාපාර සඳහා නව උපායමාර්ග ක්‍රියාත්මක විය. ඒ ඔස්සේ සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරවලට සහන ගණනාවක් ලැබිණි. ඒවා තවම ක්‍රියාත්මකය. පෞද්ගලික බස් ව්‍යාපාරය වුව ඇදවැටීමකට ලක්වූයේ නැත. මේ වන විට බස් ධාවනය යථා තත්ත්වයට පත්වී ඇත. කෘෂිකර්මය හා ව්‍යාපාර අංශය ශක්තිමත් කළ යුතුය යන්න ජනාධිපතිවරයාගේ තේමා පාඨයක් වී තිබේ.

එක අතෙකින් කොවිඩ් මර්දනය කිරීමත් තව අතෙකින් ආර්ථිකය පණගැන්වීමත් රටවල් මුහුණ දෙන බරපතළ අභියෝගය ලෙස පවතී. බොහෝ රටවල් මේ අර්බුදය හමුවේ අසාර්ථකත්වයට පත් වී ඇත. ශ්‍රී ලංකාව මුල සිටම මේ අභියෝගයට මුහුණ දුන්නේ සැලැසුම් සහගතව යැයි කිව හැකිය. රට අභ්‍යන්තරයෙන් පළමු රෝගියා වාර්තා වීමටත් පෙර කොවිඩ් මර්දනය සඳහා බළකායක් හා වැඩසටහනක් සකස් කිරීමට ජනාධිපතිවරයා සමත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස සාමූහිකව වසංගතයට මුහුණ දීමට හැකි විය. සෞඛ්‍ය අංශ පමණක් ක්‍රියාත්මක වූයේ නම් කොවිඩ් මර්දනය අසාර්ථක වනු ඇත. මෙහිදී අන්තර්ජාතික සහයෝගය නොඅඩුව ලබාගැනීමටත් රජය සමත් විය. චීනය, ඉන්දියාව, රුසියාව හා ලෝක සෞඛ්‍ය සංවිධානය ශ්‍රී ලංකාවේ කොවිඩ් මර්දනයට සෘජු සහයෝගයක් ලබා දෙයි. එය ජයග්‍රහණයක් සේ සැලැකිය හැකිය.

ආණ්ඩුව කොවිඩ් මර්දනය සාර්ථක කර ගෙන ඇත්තේ තවත් දේශපාලන හා ආර්ථික අභියෝග ගණනාවකට මුහුණ දෙන අතරය. ජිනීවා මානව හිමිකම් කොමිසම ශ්‍රී ලංකාවට එරෙහිව චෝදනා ඉදිරිපත් කරන අතර අන්තර්ජාතික සහයෝගය මත එය පරාජය කිරීමට ආණ්ඩුව ක්‍රියා කර ගෙන යයි. රටවල් ගණනාවක් මේ වන විට ද අපට සහයෝගය දක්වන අතර චීනය හා ඉන්දියාව ඒ අතර විශේෂ වෙයි. ඉන්දියාව මෙන්ම චීනය ද ප්‍රකාශ කර ඇත්තේ මානව හිමිකම් කොමිසම හමුවේ ශ්‍රී ලංකාව අසීරුවට පත්වීමට ඉඩ නොතබන බවය. එය අප ලබන විශේෂ දේශපාලන ජයග්‍රහණයක් සේ සැලැකිය හැකිය. මේ අතර චීන මහජන බැංකුව රුපියල් කෝටි තිස්දහසක් ශ්‍රී ලංකාවට ලබා දීමට එකඟතාව පළ කර ඇත. එය මේ මොහොතේ අප ලබන ශක්තිමත් ආර්ථික ජයග්‍රහණයක් සේ හැඳින්විය හැකිය.

අපේ ජාතික ආර්ථිකය මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ විදේශ ණය හා පොලී ගෙවීමය. රජය මේ වසර සඳහා ණය ලබා ගෙන නැතත් ගිය ආණ්ඩුව ලබා ගත් ණය මුදල් පොලිය ද සමඟ ගෙවා දැමිය යුතුය. කොවිඩ් අර්බුදය හමුවේ වුව ණය වාරික හා පොලී ගෙවීමට රජය සමත් විය. අලුත් තත්ත්වය හමුවේ ශ්‍රී ලංකාවට අවශ්‍ය නම්, තවත් විදේශ ණය ලබා ගත හැකිය. විදේශ ණය ලබා ගැනීමේදී පරිස්සම් සහගත ක්‍රියාවලියක් අනුගමනය කිරීම රජයේ ප්‍රතිපත්තිය වී තිබේ. ණය උගුලක සිරවී සිටි ශ්‍රී ලංකාව එහි බැමි එකින්-එක ලිහිල් කරගෙන තිබේ. එය ආර්ථික අතින් බලන විට සතුටුදායක තත්ත්වයකි. විපක්ෂය කුමන චෝදනා එල්ල කළ ද රජය ආර්ථිකය හසුරුවන ආකාරය බුද්ධිමත්ය. කෘෂිකර්මය, අපනයනය හා කාර්මික අංශයෙන් ද මෙතෙක් ලබා ඇති ප්‍රගතිය ඊට සාක්ෂි ලෙස පවතී.

කොවිඩ් වසංගතය තුළ සමස්ත ලෝකයේම අධ්‍යාපනය බරපතළ කඩාවැටීමකට ලක් විය. බිලියන ගණනක් වූ ලෝක ශිෂ්‍ය ප්‍රජාව ස්වකීය අනාගතය පිළිබඳ භීතිකාවකට මුහුණ දුන්හ. ඇතැම් රටවල පාසල් විවෘත කරන්නැ'යි උද්ඝෝෂණ පැවැත්විණි. අධ්‍යාපනය යනු අනාගතය යැයි කියති. ඒ අනුව අධ්‍යාපනයේ කඩාවැටීම අනාගතයේ අසාර්ථකත්වයට හේතුවක් වෙයි. ශ්‍රී ලංකාව මේ තත්ත්වයට සැලැසුම් සහගතව මුහුණ දී ඇතැ'යි කිව හැකිය. මේ වන විට රටේ සියලුම පාසල් විවෘත කර අධ්‍යාපනය නිසි අයුරින් පවත්වා ගැනීමට රජය සමත් වී ඇත. වාර්ෂික පාඨමාලා, විෂය නිර්දේශ ආවරණය කිරීම සඳහා විශේෂ වැඩසටහන් යෝජනා කර ඇත. කොවිඩ් හේතු කොට ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපනයේ විශේෂ කඩාවැටීමක් සිදු වී නැතැ'යි කිව හැකිය.

ලෝකය විවිධ කාලවලදී අනේක අර්බුදවලට මුහුණ දෙයි. ස්වාභාවික විපත්, වසංගත රෝග, යුද ගැටුම් ඒ අතර ප්‍රධාන වෙයි. ශ්‍රී ලංකාව ද පොදුවේ ඉහත කී සෑම අර්බුදයකටම මුහුණ දී ඇත. නායකයන්ගේ තීන්දු-තීරණ, සැලැසුම් හා ආයතනවල කාර්යක්ෂමතාව ආදිය මත එම අර්බුද ජයග්‍රහණය කිරීමට අපි සමත් වී ඇත්තෙමු. කොවිඩ් වසංගතය දැන් අපගේ දෛනික ජීවිතයේ කොටසක් වී ඇත. ඊට සාමූහිකව මුහුණ දෙන්නට අපේ රට සමත් වී ඇත.

දිල්රුගෙ සිව්පද

| | |
|---|---|
| විසිපස් වසරකට පෙර කර | සිහනාද |
| අරගත් ලෝක කුසලානය | දුටුවා ද |
| එදයින් එදා මේ වෙන්නේ | මොනවාද |
| ලංකා පිලට ඇස්වහවත් | වැදිලා ද |

# මිහිතලයේ උරුමය සැබෑ හිමිකරුවන් අතට

ලොව සියලුම ශිෂ්ටාචාර ගොඩනැගුනේ භූමිය මුල්කරගෙනය. භූමියක් නොමැතිව මානව වර්ගයාට පැවැත්මක් නොවීය. ඒ අනුව නයිල් නිම්න ශිෂ්ටාචාරය, මෙසපොතේමියානු ශිෂ්ටාචාරය, යුප්‍රටීස් ටයිග්‍රීස් ශිෂ්ටාචාරය, ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ආදී මේ සියලුම ශිෂ්ටාචාරවල පැවැත්ම තීරණය කළේ භූමිය අනුවය.

දේශපාලන විද්‍යාවේ රාජ්‍යයක තිබිය යුතු අත්‍යවශ්‍ය අංග අතර මුලින්ම කියැවෙන්නේ නිශ්චිත භූමි ප්‍රදේශයක් පිළිබඳවය.

ගානර් නම් දේශපාලන විද්‍යාඥයා මේ ගැන තවදුරටත් විග්‍රහ කර ඇත්තේ මෙසේය.

'යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් ස්ථාවර වාසභූමියක් කර ගත් සංඛ්‍යාත්මක වශයෙන් අඩු හෝ වැඩි විය හැකි යම් ජන සංඛ්‍යාවකගෙන් සමන්විත ජනතාවගේ බහුතර අනුමැතිය ලබන සංවිධානාත්මක ආණ්ඩුවක් සහිත බාහිර වශයෙන් ස්වාධීන නැත්නම් වෙනත් පාලනයකට යටත් නොවූ මිනිස් සමාජය රාජ්‍යය ලෙස හැඳින්විය හැකිය' යනුවෙනි. එය සංවිධානගත මිනිස් සමාජයක් ආරම්භ වූවාට පසු කළ ප්‍රකාශයකි.

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිටම සාමූහිකව ජීවත් වූ ජනයා ක්‍රමානුකූලව අධික ජනගහනයට ඔරොත්තු දෙන ආකාරයට වැටකොටු බැඳගෙන වගා කටයුතු කළේය. එහෙත් භූමිය බෙදා වෙන් කොට පරිභෝජනය කිරීම අපේ සිංහල රාජවංශය තුළ ද පැවැති සිරිතකි. රාජකීය සන්නස් මඟින් රජවරු වෙහෙර විහාර වෙනුවෙන් පූජා කළ නින්දගම් පිළිබඳව ද තොරතුරු අපේ ඉතිහාසයේ සඳහන්ව ඇත.

දක්ෂ මැති ඇමැතිවරුන්ට රජ වාසලේ සේවය කළ නිලතල දැරූ පුද්ගලයන්ට රජවරු ඉඩම් ප්‍රදානය කළ අයුරු ඉතිහාසයේ සඳහන් වේ. ඇමැතිවරු තැනූ අනුරාධගාම, උපතිස්සගාම යන නම්වලින් එවැනි නිශ්චිත භූමි ප්‍රදේශ සංවර්ධනය කළ බව පැහැදිලිය.

## භූමියේ විශාලත්වය

භූමියේ විශාලත්වය අනුව රාජ්‍යවල ප්‍රබලත්වය ද ඉහළ ගියේය. මහා ඇලෙක්සැන්ඩර්, ධර්මාශෝක වැනි අධිරාජ්‍යයන් සටන් කළේ ද භූමියේ විශාලත්වය වැඩිකර ගැනීමටය. ඒ අනුව ලෝකයේ යුද්ධ පවා ආරම්භ වූයේ භූමියේ විශාලත්වය වැඩිකර ගැනීමට බව තවදුරටත් පැහැදිලිය. බ්‍රිතාන්‍ය හිරු නොබසින අධිරාජ්‍යය බවට පත් වූයේ ද එසේමය. විශේෂයෙන් භූමියේ පවතින රත්තරන්, මුතු මැණික්, ගෑස්, මිනිරන්, යපස්, ගල් අඟුරු, තෙල් ආදී භෞතික සම්පත් බහුල රටවල් නතු කර ගැනීමට මාන බලන බව නොරහසකි. ලෝකයේ භූමිය අතින් විශාලම රාජ්‍යය බවට පත්ව සිටියේ සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව හෙවත් වර්තමාන රුසියාවයි. එහි විශාලත්වය වර්ග සැතපුම් 17,098,242කි.

ලොව කුඩාම රාජ්‍යය වශයෙන් භූමියේ ප්‍රමාණය අනුව තීරණය කර ඇත්තේ සෙන්ට්මැරිනා රාජ්‍යයයි. භූමියෙන් විශාල වන රාජ්‍යයන්වල ජනගහනය අධික වීම නිසා ඉතා ඉක්මනින් සංවර්ධිත තත්ත්වයට පැමිණ ඇත්තේ මානව සම්පතෙන් ඉහළ යෑම නිසාය. එහෙත් ඊට හාත්පසින්ම වෙනස් සිංගප්පූරුව විශාලත්වය අතින් වර්ග කිලෝමීටර් 722කි. වර්තමානයේ සංවර්ධිත රටකි.

ලෝකයේ දේශසීමා අරගල ඇති වූයේ භූමියේ අයිතිය වෙනුවෙනි. වසර ගණනාවක්ම පලස්තීනය හා ඊශ්‍රායලය අතර හටගත් ගැටුමට මුල් වූයේ ගාසා තීරයයි. තෙල් සම්පත වෙනුවෙන් අරගල කළ බොහෝ රටවල් භූමිය අත්පත් කර ගැනීමට මාන බැලුවේ මේ අයුරිනි.

මේ නොනවතින අරගලය විවිධ මුහුණුවරින් අද ද ලිබරල්වාදය සමඟ මුසු වී රටවල්වල භූමිය අල්ලා ගැනීමේ මෙහෙයුමේ සිටින බව නොරහසකි.

භූමියට ඇති ආදරය නිසා අපි උපන් භූමියට 'මාතෘ භූමිය' යැයි පවසන්නේ දැඩි අභිමානයෙනි. විටෙක පිතෘ භූමිය යැයි ද කියනු ලැබේ. මේ මහ පොළොවේ පය ගහලා ඉන්න මිනිහෙක් යැයි විටෙක ව්‍යවහාර කරන්නේ අපේ පොළොව සමඟ ඇති අවියෝජනීය සබඳතාවය නිසාය. ඒ තරමටම මේ මහ පොළොව සමඟ අපට ඇත්තේ ආත්මීය බැඳීමකි.

ශ්‍රී ලංකාවට ඉඩම් නිරවුල් කිරීමක් අවශ්‍ය වූයේ ඓතිහාසික පසුබිමක් පදනම් කරගෙනය. 1815 වන තෙක් වසර දහස් ගණනක් තිස්සේ ශ්‍රී ලාංකිකයන් ඉඩම් භුක්ති විඳීම හා පරිහරණය කිරීම සිදු වුව ද එම ඉඩම්වල අයිතිය රජතුමා සතු විය. ඒ අනුව රටවැසියන්ට සමාන පරිදි ඉඩම්වල අයිතියක් පවරා දී තිබුණේ නැත.


මේ තත්ත්වය පවතිද්දී 1815 දී ශ්‍රී ලංකාව මුළුමනින්ම බ්‍රිතාන්‍යයට යටත්වීමත් සමඟ රාජාණ්ඩු ක්‍රමය අහෝසි විය. බ්‍රිතාන්‍යයන් විසින් 1840 අංක 12 දරන අනවසර ඉඩම් ආඥා පනත (No 12 of 1840 The Prevent Encroachments upon Crown Land) ප්‍රකාශයට පත් කරන ලද්දේ කිසියම් පුද්ගලයකුට තම ඉඩම තමාට අයත් බව සනාථ කිරීමට නොහැකි නම් එම ඉඩම රාජසන්තක කිරීම සඳහාය. මෙහිදී ශ්‍රී ලාංකිකයන් පාරම්පරිකව භුක්ති විඳීම හා වගාව සැලකිල්ලට නොගන්නා ලදී. මෙයින් බ්‍රිතාන්‍යයන් අදහස් කළේ අයිතිය සනාථ කිරීමට ඔප්පු, තිරප්පු, සන්නස් වැනි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු බවය. මේ තත්ත්වය යටතේ 1840 අනවසර ඉඩම් ආඥා පනත යටතේ අක්කර දහස් ගණනාවක් භූමි පුත්‍රයන් වූ අපට අහිමි විය. මේ තත්ත්වය උසුලාගත නොහැකි වූ ස්වදේශික වීරෝදාර ජනයා 1848 මහා විමුක්ති අරගලයක් දක්වා වර්ධනය වූයේ භූමියේ අයිතිය වෙනුවෙන් ඇති වූ ඒ මහා ගැටුමය.

වීර කැප්පෙටිපොළ, ගොන්ගාලේගොඩ බණ්ඩා මෙන්ම වීර පුරන්අප්පු ආදී ජාතික විරුවන් එදා මාතලෙන් ඌව වෙල්ලස්සෙන් ඒ සටන් ආරම්භ කළේ මේ භූමියේ අයිතිය රැකගැනීම උදෙසාය. ඔවුන් ජීවිත පූජා කළේ මේ මහ පොළොවේ අයිතිය වෙනුවෙනි.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් කොකෝවා, ගම්මිරිස්, කෝපි වැනි වාණිජ භෝග ද පසුව වතු වගාවේ තවත් ඉදිරි පියවරකට ගොස් තේ වගාව, රබර් වගාව දක්වා වාණිජ වැවිලි භෝග ආර්ථිකයක් අපේ රටට හඳුන්වා දී අපේ රටේ මහ පොළොවේ සාරය ඔවුන්ගේ මුදල් බවට පත් කර ගත්තේ සිත්පිත් නැත්තන් සේය.

විශේෂයෙන් හඟුරන්කෙත, දුම්බර, යාපනය ආදී ප්‍රදේශවල දුම්කොළ වගා කොට භූමියේ සරු පස නිසරු කළේ ඉතාම අකාරුණික ලෙසය. මේ සියලු අභියෝග, තර්ජන, ගර්ජන මධ්‍යයේ නිදහස් ශ්‍රී ලංකාවක් වූ අප රට ස්වාධීන රාජ්‍යයක් බවට මුළුමනින්ම පත් වූයේ 1972 දීය. 1948 ලැබුණු ඩොමිනියන් තත්ත්වය යටතේ වුවද ගොවි ජනපද ව්‍යාපාර හරහා වරින් වර ජනයාට ඉඩම්වල භුක්ති විඳීමේ අයිතිය ලබාදීමට එවකට සිටි ආණ්ඩු ක්‍රියා කළේය. ඩී. එස්. සේනානායක යුගය මෙන්ම බණ්ඩාරනායක යුගය මේ ගොවි ජනපද ව්‍යාපාරවලට මිනිසුන් යොමු කොට ඉඩම් බෙදා දුන්නේය.






1970 පිහිටු වූ සමගි පෙරමුණු ආණ්ඩුව යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හරහා එවකට ඉඩම් ඇමැතිවරයා වූ හෙක්ටර් කොබ්බෑකඩුව මහතා විශාල ඉඩම් හිමි වැවිලිකරුවන් සතු වූ ඉඩම් (රන්පවුම්-වතු) අක්කර 50 කට සීමා කොට ඉතිරි ඉඩම් රජයට පවරා ගත් බව ද සිහිපත් කළ යුතුව ඇත.

## සැබෑ දේශප්‍රේමියෙක්

මිහිතලයට බොහෝ දෙනා ආදරය කරති. 30 වසරක යුද සාපයෙන් මේ මිහිතලය දැවැන්ත මානුෂික මෙහෙයුමකින් මුදා ගැනීම ස්මරණය කරමින් එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා එතෙර සිට පැමිණ කටුනායකදී මේ පුණ්‍ය භූමිය සිප වැලඳ ගත්තේ මේ මිහිතලයට ආදරය කරන සැබෑ දේශප්‍රේමියකු වශයෙනි.

මේ මිහිතලය මත ඉපදී මේ රටේ බිම් අඟලකවත් අයිතිය නොමැතිව මිය යන අසරණ මිනිසුන් වෙනුවෙන් වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ දැඩි අවධානය යොමු වී තිබීම ඉතාම වටිනා පුණ්‍යකර්මයකි. රටේ ජීවත් වෙන ජනයාගේ දුක කඳුල හඳුනාගත් එතුමා ජනතා නායකයකු වශයෙන් ඉතාම වටිනා ජනතා තීන්දුවක් ලෙස අසරණ ගොවිජනයා ඇතුළු සමස්ත ජනතාවටම තම උපන් භූමියේ අයිතිය නීත්‍යනුකූලව පවරා දීමට ගත් තීරණය ඉතාම කාලෝචිත වැදගත් තීරණයකි. සෑම මිනිසකුටම අභිමානයක් ඇත.

ඒ අභිමානය ඇතුව මිය යෑමට නම් මේ රටේ බිම් අඟලක හෝ අයිතිය තමාටත්, තමන්ගෙන් පසුව පැවත එන දරු මුනුපුරන්ට දායාද කිරීම සෑම පුරවැසියකුගේම බලාපොරොත්තුවයි. ඒ බලාපොරොත්තුව මුදුන්පත් කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෘජු මැදිහත් වීම අගය කළ යුත්තකි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව නිරවුල් හිමිකමක් නොමැතිව රජයේ ඉඩම් භුක්ති විඳිමින් සිටි පවුල් වෙත දීමනා පත්‍ර ප්‍රදානය ජනාධිපතිතුමාගේ අතින්ම සිදු විය. නිරවුල් ඉඩමක හිමිකම සහතික කිරීම රජයේ අරමුණයි. ඉඩම් සංවර්ධන ආඥා පනතේ හා රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදනවලට යටත්ව මුළු දිවයිනම ආවරණය වන පරිදි නීත්‍යනුකූලව තෝරාගන්නා ලද 20,000ක් දෙනාට පළමු අදියර යටතේ දීමනා පත්‍ර පිරිනැමේ.

## ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම

මේ වැඩසටහන යටතේ ගොවිතැනින් ජීවත්වෙන අඩු ආදායම්ලාභීන් සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත. ඔවුන්ට ඉඩම්වල හිමිකම පැවරීමෙන් ආදායම් මට්ටම වැඩිකර ගැනීමට සෘජු බලයක් සැපයීම රජයේ අපේක්ෂාව වේ. දීමනා පත්‍රලාභීන්ට සිය ඉඩමේ නිවෙසක් තනා ගැනීම, කෘෂිකාර්මික අවශ්‍යතා සපුරා ගැනීම, වෙනත් බෝග වගා සහ ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගත හැකිය.

ඵලදායී ඉඩම් උපයෝජනයෙන් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට දායක වීම ඉඩම්ලාභීන්ගෙන් අපේක්ෂා කෙරේ. ජනාධිපතිවරයාගේ ප්‍රදානයක් වන දීමනා පත්‍රය සින්නක්කර ඔප්පුවක් සේ සලකනු ලැබීම මෙහි ඇති විශේෂත්වයකි.

ඒ අනුව මේ ඔප්පුව ඇපයට තබා බැංකු ණයක් ගැනීමේ හැකියාව දීමනාලාභීන්ට හිමි වෙන සුවිශේෂ වරප්‍රසාදයකි. මේ වසර අවසාන වීමට පෙර හිමිකම්පත් ලක්ෂයක් දීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අපේක්ෂා කරන බව අවධාරණය කොට ඇත. එසේම ගැටලු නැති ඉඩම්වලට මාස 03ක් ඇතුළත ඔප්පු ලබාදෙන ලෙස ද ජනාධිපතිතුමා නිලධාරීන්ට උපදෙස් දී ඇත. ඉඩම් ඔප්පු නොතිබීම දිවයින පුරා චාරිකා කළ තමාට දිස්ත්‍රික්ක රැසක ජනතාවගෙන් ඉදිරිපත් වූ ප්‍රධානතම ගැටලුව බව ජනාධිපතිතුමා පෙන්වා දී ඇත.

තරුණ පරපුරේ දායකත්වය රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක කරගැනීමට ජනාධිපතිතුමා ගත් තවත් වැදගත් පියවරක් වශයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වගාවට නොගත් ඉඩම් සුදුසු වගාවන් සඳහා භාවිත කිරීමේ වැදගත්කම පෙන්වා දී ඇත. ඒ ඉඩම් තරුණ ව්‍යවසායකයන්ට බදු දීමෙන් ජාතික ආර්ථිකයට තරුණ ශ්‍රමය තරුණ ශක්තිය දායක කරගැනීමට පුළුවන් වීම ද ඉතාම අගය කළ යුත්තකි. පෙරළුණු නැවුම් පසෙන් හෙට දිනයේ සාරවත් දේශයක් ගොඩනැඟීම අප සියලුදෙනාගේම ඒකායන අරමුණයි.

**මහින්ද ආරියවංශ**



# ශ්‍රී ලංකාව සුරක්ෂිතයි කියලා ලෝකයේ ලොකු පිළිගැනීමක් තිබෙනවා

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්
**ධම්මිකා විජේසිංහ**

**කොරෝනා වසංගතයත් සමඟ බිඳ වැටී තිබූ ශ්‍රී ලංකාවේ සියලු ආර්ථික ක්‍රමෝපායන් සහ සංවර්ධන කටයුතු යළිත් සුපුරුදු වේගවත් ආකාරයෙන් සිදු නොවුණ ද ඒවා යළිත් ආරම්භ වී තිබේ. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ද ගුවන් තොටුපළ වසා දැමීම හේතුවෙන් සම්පූර්ණයෙන් බිඳ වැටී තිබුණු අතර එම නිසා රටට සිදු වූ පාඩුව සුළුපටු නොවේ. සංචාරක ව්‍යාපාරය ද නැවත ආරම්භ කොට ඇති අතර නව සෞඛ්‍ය මාර්ගෝපදේශයන් යටතේ එය කුමන ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේ ද යන්න සහ එම ක්ෂේත්‍රයේ නියැළෙන්නන්ට මුහුණ දීමට ඇති ගැටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ධම්මිකා විජේසිංහ මහත්මිය සමඟ කරන ලද සාකච්ඡාවකි මේ.**

**● සංචාරක ව්‍යාපාරය ආරම්භ වුවත් එය නිසි පරිදි ආරම්භ වී නැති බවයි පෙනෙන්නට තිබෙන්නේ. මෙය ක්‍රියාශීලි අන්දමින් පටන් ගන්නේ කවදා ද?**

සෞඛ්‍ය අංශයේ නීති රීති මාලාව යටතේ දැනටමත් අප රටේ සංචාරක ව්‍යාපාරය ආරම්භ වී තිබෙනවා. සංඛ්‍යා ලේඛනවලට අනුව පසුගිය වසරේ දෙසැම්බර් 28 වෙනිදා සිට මේ මාසයේ 7 වෙනිදා වෙනකොට සංචාරකයන් 6579ක් මෙරටට පැමිණ තිබෙනවා. කලින් සංචාරකයන් මෙහි වැඩිපුර පැමිණියේ දවස් දෙක තුනක් පමණක් මේ රටේ රැඳී සිටින්නයි. නමුත් දැන් දවස් 7කට වඩා වැඩියෙන් මෙහි රැඳී සිටින අයයි වැඩිපුර පැමිණෙන්නේ. දවස් 14ක් පමණ දීර්ඝ කාලීනව මෙරට සංචාරය කරන්නට කැමති සංචාරකයන්ගේ ඉල්ලීම් ද මේ වන විට ඇවිත් තිබෙනවා.

සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දැනට තිබෙන සෞඛ්‍ය නීතිරීති සහ නිර්ණායකයන් ලිහිල් කර ගැනීමට අපි සෞඛ්‍ය අමාත්‍යංශය සමඟ සාකච්ඡා කරමින් සිටිනවා. සෞඛ්‍ය අමාත්‍යංශය එකඟතා කිහිපයකට පැමිණ තිබෙනවා. ඒ වගේම ලබන සතියේ ඒ පිළිබඳව අපට දැනුම් දෙන බවත් දන්වා තිබෙනවා. එම ලිහිල්වීමත් සමඟ අප ඉල්ලීම් කළා සංචාරක ක්ෂේත්‍රයේ ඉදිරිපෙළ කොටසේ සිටින පිරිස එන්නත් කර දෙන ලෙස. එම අවශ්‍යතාවන් සපුරා දුන්නාට පසු සංචාරක ව්‍යාපාරයේ වෙනසක් සහිතව රට විවෘත කරන්න අපට පුළුවන් වේවි.

ඒ වගේම පී.සී.ආර් පරීක්ෂණ 3ක් කරන්නේ නැතිව පී.සී.ආර්. පරීක්ෂණ 2ක් කිරීමට සෞඛ්‍ය අංශ කැමැත්ත පළ කළා. මෙරටට පැමිණි දින කරන පී.සී.ආර්. පරීක්ෂණය සහ නිරෝධායන දින 14ට පසුව සමාජයට යෑමට කලින් කරන පී.සී.ආර්. පරීක්ෂණය පමණක් ප්‍රමාණවත් බව ඔවුන් නිර්දේශ කළා. එන්නත් තොගයක් නැවත ශ්‍රී ලංකාවට ගෙනෙන තුරු අපේ අයට දෙන්න නොහැකි බවයි එන්නත් ප්‍රශ්නයේදී සෞඛ්‍ය අංශ කියා සිටියේ. වෙනත් මාර්ගයකින් හෝ එන්නත් අවශ්‍යතාවය සපුරා ගන්න අප උත්සාහ කරනවා. දැනට තිබෙන සීමාවන් අඩු කර ගෙන ඉදිරියට යෑමට එන්නත්කරණය අත්‍යවශ්‍යයි.



**● සංචාරක ව්‍යාපාරය කඩා වැටීම නිසා රටට විශාල පාඩුවක් සිදු වුණා. එය කෙතරම් ප්‍රමාණයක් ද?**

2018 සිට 2019 පාස්කු ප්‍රහාරය වන තෙක්ම අමෙරිකානු ඩොලර් බිලියන 4.8ක පමණ ප්‍රමාණයක් වසරකට ආදායම ලබා ගත්තා. දැන් රටේ බරපතළම ගැටලුව විදේශ විනිමය අර්බුදයයි. අපේ විදේශ ශ්‍රමිකයනුත් විශාල පිරිසක් කරදරේ වැටිලයි ඉන්නේ. එම රටවලත් ආර්ථිකය බිඳ වැටීම මීට හේතුවයි. දැනට විදේශ විනිමය පැත්තෙන් බැලුවොත් ප්‍රධානම අංශ දෙක තමයි සංචාරක කර්මාන්තය සහ අපනයන කර්මාන්තය. අතිගරු ජනාධිපතිතුමා 2018-2019 වසරවල මුල් කාලයට සමාන්තරව අපට දීලා තිබුණේ අමෙරිකානු ඩොලර් බිලියන 10ක ඉලක්කයක්. මේ තත්ත්වයත් එක්ක අපට ඉක්මනින් ඒ ඩොලර් බිලියන 10 ඉලක්කයට යන්න බැහැ. නමුත් මේ තත්ත්වය නැවත ගොඩනගා ගැනීම තුළ 2025 වන විට බිලියන 6ක ඉලක්කයකටවත් යන්න අපට ලොකු වැඩ කොටසක් කරන්න තිබෙනවා.

**● එම පාඩුව පියවා ගැනීම සඳහ ඔබට තිබෙන නව සැලසුම් මොනවා ද?**

සංචාරක ක්ෂේත්‍රයට අපේ පැත්තෙන් අපි ප්‍රවර්ධන කටයුතු කර ගෙන යනවා. රටක් වශයෙන් ප්‍රවර්ධනය කරන ගමන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල නියැළී සිටින අය වෙනුවෙනුත් අපි අපේ වෙබ් අඩවි හරහා ඩිජිටල් තාක්ෂණය උපයෝගි කර ගෙන ප්‍රවර්ධන කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. නමුත් ඒ අංශයෙන් අපට තිබෙන බරපතළම ගැටලුව තමයි හෝටල් සහ සංචාරක නියෝජිත ආයතන හිමිකරුවන් මේ මොහොතේ මුහුණ දී තිබෙන ප්‍රාග්ධන අර්බුදය. හෝටලයක් ගත් විට එහි සංචාරකයන් සිටියත් නැතත් නඩත්තු කටයුතු තිබෙනවා. එම නඩත්තුව නිසියාකාරව සිදු වුණේ නැතිනම් එම හෝටලයේ තත්ත්වය පහළ වැටෙනවා. සංචාරක කර්මාන්තය හොඳ තැනකට ගේන්න නම් ඒ හෝටල් හිමියන්ට දෙන සේවා සැපයුමත් හොඳ තත්ත්වයකට ගේන්න ඕනෑ. සංචාරක ක්ෂේත්‍රයේ නියැළී සිටින හෝටල් සහ නියෝජිත ආයතනවල නඩත්තු කටයුතු සඳහා ඔවුන් ලබා ගෙන තිබෙන ණය සම්බන්ධයෙන් කිසියම් සහනයක් ලබා දෙන ලෙස. අපි අද දවසෙත් මහ බැංකුව සමඟ සාකච්ඡා කළා. ණය වාරික ගෙවීමට ඇති කාලසීමාව තව මාස 6කට දීර්ඝ කර දෙන්නට මහ බැංකුව අපට පොරොන්දු වුණා. ණය සහන පැකේජය පමණක් දීර්ඝ කිරීමෙන් පමණක් මේ ගැටලුව විසදෙන්නේ නැහැ. හේතුව මෙතනදී ණය සහ පොලියක් එකතු වීමක් පමණයි සිදු වෙන්නේ. එතැන ලොකු බරක් ඔවුන්ට එකතු වී තිබෙනවා. ඒ නිසා මෙය විසඳීමට නම් මෙම ණය පියවීම සඳහා ඊට වඩා අඩු පොලියකට වෙනත් ණය මුදලක් ලබා දිය යුතුයි. ඒ සම්බන්ධවත් අපි මහ බැංකුව ඇතුළු බැංකු ක්ෂේත්‍රය සමගත් මහ භාණ්ඩාගාරය සමගත් සාකච්ඡා කළා.

**● මීට අමතරව විදෙස් සංචාරකයන් මෙරටට ගෙන්වා ගැනීම සඳහා මෙරට සුරක්ෂිත බව තහවුරු කිරීම සඳහාත් නව සැලසුම් තිබෙනව ද?**

ඔව්. දැනටමත් ශ්‍රී ලංකාව සුරක්ෂිතයි කියලා ලෝකයේ ලොකු පිළිගැනීමක් තිබෙනවා. සමහර රටවල් අපේ රටේ සිට ඔවුන්ගේ රටවලට ගියාමත් නිරෝධයානයක් අවශ්‍ය නැති බව පවසනවා. Green Country කියන කාණ්ඩයට අපේ රට ඇතුළු කර තිබෙනවා. එය අපට ලොකු දෙයක්. අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ක්‍රියාත්මක වුණ ආකාරයටත් සංචාරක අංශය ගත්තත් හෝටල් සහ මාර්ගෝපදේශකයන් ඇතුළු සැම කෙනෙක්මත් සුරක්ෂිතයි යන සහතිකය නිසා අපේ රට සංචාරය කරන්න සුදුසු රටක් මෙන්ම සෞඛ්‍යාරක්ෂිත රටක් කියන පිළිගැනීම දැනට තිබෙනවා. ඒවත් එකතු කරගෙනයි අපි ප්‍රවර්ධන කටයුතු කර ගෙන යන්නේ.

**● සංචාරක බුබුළ සංකල්පය ක්‍රියාත්මක වන්නේ කොහොම ද?**

අප දැනට රට විවෘත කර තිබෙන්නේ එම සංකල්පය යටතේයි. සංචාරකයෙක් පැමිණියාම නිරෝධායනය ක්‍රියාත්මක රටක නම් පළමු දින 14 ඔවුන් නවාතැන් ගත් හෝටලයේම නිරෝධායනය වෙනවා. හෝටලයේ පහසුකම් පවත්වා ගැනීම පිළිබඳ යම් යම් නිර්ණායකයන් දීලා තිබෙනවා. ඔවුන් සඳහා වෙන්වුණු සේවක පිරිස, සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් මෙහිදී ඇතුළත් වෙනවා. මෙහිදී සංචාරකයන්ට හෝටල් කාමරය ඇතුළෙම ඉන්නේ නැතිව 'ජිම්' එක, 'ස්පා' එක, 'පූල්' එක ආදි දේවල් භාවිත කරන්න පුළුවන්. සාමාන්‍ය ආකාරයට කෑම කාමරයේදි කෑම ගන්න පුළුවන්. මුහුදු වෙරළ අසල හෝටලයක් නම් ඔවුන්ට මුහුදු වෙරළට යෑමට පුළුවන්. මේ වගේ ලොකු නිදහසක් මේ හෝටලය ඇතුළෙ තිබෙනවා. ඔවුන් මෙරටට පැමිණෙන විටම ගන්නා පළමු පී.සී.ආර්. වාර්තාව 'නෙගටිව්' වුණාට පසුව බුබුළ කියන එක ඇතුළෙම එයාලට සංචාරක මඟපෙන්වන්නන්ව අනුමත කර තිබෙනවා. අපි අනුමත කර තිබෙන සංචාරක වාහන සහ සංචාරක ස්ථාන කරා යෑමට ඉඩ සලස්වා තිබෙනවා. මෙය සුළුපටු කාර්යයක් නෙමෙයි. මෙය පිටුපස විශාල කාර්යභාරයක් තිබෙනවා.

හෝටලය හෝ සංචාරක නියෝජිත ආයතනය තුළ සංචාරයක් සංවිධානය කිරීමේදී කළ යුතු කාර්යයන් ගොඩක් තිබෙනවා. උදාහරණයක් විදියට බෙන්තර සිටින කෙනෙක් සංචාරක කණ්ඩායමක් රැගෙන සීගිරියට යනවා නම් ඔවුන් යන්නේ කවද ද, කී දෙනෙක් යනව ද, ඔවුන් යන්නේ කුමන වාහනවල ද සහ එම වාහනවල අංක, රියැදුරන්ගේ තොරතුරු, සංචාරක මඟපෙන්වන්නා කවුද, අතරමඟ යන විට තේ පානය සඳහා නවත්වන්නේ කොතැනද, නැරඹීමට යන ස්ථාන උදාහරණ ලෙස පේරාදෙණිය උද්භිද උද්‍යානයට යන්නේ ද ඒ කීයටද, සීගිරියට එන්නේ කීයටද යනාදී කරුණු සියල්ල ඇතුළත් කර වැඩසටහනක් හදලා අපට දෙන්න ඕනෑ. ඊට පසු එම ස්ථානවලට සහ සෞඛ්‍ය අංශවලටත් දැනුම් දීලා එම සංචාරය අපි අනුමත කරනවා. අපි අනුමත කළාට පසුව ඒ අය එම මාර්ගෝපදේශ අනුව එම ගමන යා යුතුයි. සංචාරකයනුත් හෝටල් කාමරයේ සිර වී සිටිය යුතු නැහැ. ඔවුන්ට සංචාරක ස්ථාන නැරඹීමට හැකි වෙනවා. මෙහිදී වෙනසක් ලෙස සැලකෙන්නේ ශ්‍රී ලාංකිකයන් සමඟ අන්තර් ක්‍රියා කිරීමේ අවස්ථාව මෙම පළමු දින 14 තුළ හිමි වන්නේ නැහැ.

අප රටක් ලෙස අපේ ආගන්තුක සත්කාර සහ අපේ සිනහව පිළිබඳව ලෝකයේම ප්‍රසිද්ධයි. දැන් මේ වෙස් මුහුණු නිසා අපේ සිනහව පේන්නෙත් නැහැ.

දින 14 ඉවර වෙලා තවදුරටත් ශ්‍රී ලංකාවේ රැඳී සිටිනවා නම් ඔවුන් දින 14 නිම කර, පී.සී.ආර්. පරීක්ෂණ ද අවසන් කර සුරක්ෂිත කෙනෙක් බවට සංචාරක සංවර්ධන අධිකාරියෙන් ඔවුන්ට ලිපියක් නිකුත් කරනවා. එවිට ඔවුන්ට සාමාන්‍ය ජනතාව සමඟ හැසිරෙන්න පුළුවනි.

**● සංචාරක ව්‍යාපාර ක්ෂේත්‍රයේ නියැළී සිටින විශාල පිරිසකට මේ වන විට ඔවුන්ගේ ආදායම අහිමි වෙලා. ඔවුන් විවිධ ගැටලුවලට මුහුණ දී සිටිනවා. ඔවුන්ට සහන සැලසීම සඳහා මොනවද කරන්න බලාපොරොත්තු වන්නේ?**

මේ අය කොටස් දෙකකට බෙදෙනවා. එක කොටසක් සංචාරක ව්‍යාපාරයේ නියැලි සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි අය, එවැනිම තවත් පිරිසක් සිටිනවා අප සමඟ ලියාපදිංචි නොවුණු අය. කනගාටුවෙන් වුණත් කියන්න තිබෙන්නේ අප ලබා දුන් සහන වැඩි කොටසක් ලැබුණේ සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදංචි වී සිටින අයටයි. එක් අවස්ථවක් පමණක් සංචාරක මඟපෙන්වන්නන්ට රුපියල් 20,000ක් බැගින් සහ සංචාරක රියැදුරන්ට රුපියල් 15,000 බැගින් අපි ලබා දුන්නා. නමුත් අපි හොඳටම දන්නවා එක වතාවක් පමණක් එවැනි මුදලක් ලබා දී ඔවුන්ගේ ජීවිත ගෙන යන්න එය ප්‍රමාණවත් වන්නේ නැහැ කියලා. එහෙත් ඒ හැරුණාම හෝටල්වලට විදුලි බිල් සහ ජල බිල්පත් ගෙවන්න වසරක සහන කාලයක් ලබා දුන්නා. එම වසර තුළ එම බිල් ගෙවන්න අවශ්‍ය නැහැ. නමුත් සේවා විසන්ධි නොකර පවත්වා ගෙන යෑම සඳහා එකතු වුණු සමස්ත බිල් වසරක කාලයකදී කොටස් වශයෙන් ගෙවන්න පුළුවනි. මේ සහන අදාළ වන්නේ සංචාරක සංවර්ධන අධිකාරිය තුළ ලියාපදිංචි අයට පමණයි.

මීට අමතරව ණය සහන පැකේජය හඳුන්වා දී තිබෙනවා.

වාහන ලීසිං ක්‍රමය තුළ අදාළ ලීසිං වාරිකය නොගෙවූ විට වාහන සීස් කිරීම සිදු වෙනවා. මෙහිදී අප මහ බැංකුව සමඟ කතා කොට එවැනි සීස් කිරීමක් සිදු නොකරන පරිදි චක්‍ර ලේඛයක් මහ බැංකුවෙන් නිකුත් කර සහන සලසා දුන්නා. තවදුරටත් ඉල්ලීමක් කළා මෙය තවත් දීර්ඝ කර දෙන ලෙස. ඒ වගේම බැංකු නොවන මූල්‍ය ආයතන මඟින් කෙරෙන ණය සහ ලිසිං ක්‍රියාපටිපාටියේදීත් මෙවැනි ක්‍රමවේදයක් සකස් කරන ලෙස අප ඉල්ලා සිටියා. මෙම චක්‍රලේඛ නිසියාකාරව සිදු නොකරන ආයතන නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකසන ලෙසත් අප මහ බැංකුවෙන් ඉල්ලීම් කළා.

**සෞඛ්‍ය නීතිරීති සහ නිර්ණායකයන් ලිහිල් කර ගැනීමට අපි උත්සාහ කරනවා**

**2025 වන විට බිලියන 6ක ඉලක්කයකට යන්න ලොකු වැඩ කොටසක් කරන්න ඕනෑ**

**සෞඛ්‍ය මාර්ගෝපදේශවලට පරිබාහිරව සංචාරකයන් මෙරටට ගෙන්වන්න කාටවත් බැහැ**

**● සංචාරක ව්‍යාපාරය කඩාවැටීම නිසා මෙරට ගුවන් තොටුපළ කාර්ය මණ්ඩලයට සිදු වුණු පාඩුව පිළිබඳ සඳහන් කළොත්?**

ලෝකයේ සෑම තැනකම ගුවන් සේවා සහ ගුවන් තොටුපළවල්වලට ඉමහත් පාඩුවක් සිදු වී තිබෙනවා. එහි මෙහෙයුම්වලින් ලැබෙන ආදායම පසුගිය කාලය තුළම ලැබුණේ නැහැ. ජනවාරි 21 දින තෙක් විදෙස් ශ්‍රමිකයන් ගෙන්වා ගැනීමේ ගුවන් යානා පමණයි ක්‍රියාත්මක වුණේ. එම නිසා ආදායම අහිමි වුණා. ඒ වගේම මත්තල ගුවන් තොටුපළ ප්‍රවර්ධනය කිරීම සඳහා එහි ගාස්තු අය කිරීමක් පසුගිය කාලයේදී සිදු වුණේ නැහැ. මීට අමතරව ගුවන් සේවා පිළිබඳ සැලකීමේදී ශ්‍රීලංකන් ගුවන් සේවාවට වගේම ලෝකයේ බොහෝ ගුවන් සේවාවලට යානයන් නවතා තැබීමට සිදු වූ නිසා විශාල පාඩුවක් සිදු වුණා. බොහෝ රටවල සේවකයන්ගේ රැකියා අහිමි වුණා. අපේ රටේ නම් එවැනි රැකියා අහිමිවීම් හැකිතාක් වළක්වන්නයි රජය හැම විටම උත්සාහ කළේ. පෞද්ගලික අංශයට ගැටලුවක් වුණා ආදායමක් නොමැතිව සේවකයන්ට වැටුප් ගෙවීම සම්බන්ධව.

**● තමන්ගේම වෙබ් අඩවි හරහා සංචාරක ව්‍යාපාරය කර ගෙන යන පිරිසක් ද අප රට තුළ සිටිනවා. විදෙස් සංචාරකයන් මෙරටට ගෙන්වා ගැනීමේදී ඔවුන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය කුමක් ද?**

ඒ අය සම්බන්ධවත් අප මේ වන විට සාකච්ඡා කර තිබෙනවා. මේ සෞඛ්‍ය මාර්ගෝපදේශවලට පරිබාහිරව සංචාරකයන් මෙරටට ගෙන්වන්න ඔවුන්ටත් හැකියාවක් නැහැ. දැන් තිබෙන ක්‍රමවේදය අනුව 'ලෙවල් වන්' හෝටලයකට හැරුණාම වෙනත් හෝටලයකට මේ අවස්ථාවේදී සංචාරකයන් ගෙන්වන්න බැහැ. 'වීසා' ලබා දෙන්නේ ETA (Electronic Travel Authorization) එක හරහා පමණයි. 'ඔන් ලයින් වීසා' අනුමත කරන්න නම් සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමත කිරීමකට යා යුතුයි. අපි එය ලබා දෙන්නේ සියලුම නිර්ණායකයන් සම්පූර්ණ වී ඇත්නම් පමණයි. ඉන් පරිබාහිරව කිසිවකුට වීසා ලබා දීමක් සිදු වන්නේ නැති නිසා එය වෙනත් ආකාරයකට කළ නොහැකියි.

**චතුමී පිටිපන**




## ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ඉහළ යන සුබ ලකුණු

ශ්‍රී ලංකාවේ ජාතික ආදායම පිළිබඳ ගණන් හිලව් සකස් කිරීමේ වගකීම් පැවරී තියෙන්නේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවටය. එම දෙපාර්තමේන්තුව විසින් ඊයේ (17දා) 2020 වර්ෂයේ ජාතික ආදායම් පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කළේය. ඒ අනුව 2020 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 3.5කින් පහළ වැටී ඇත. මෙය 1950දී ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවා රටේ වාර්ෂික ජාතික ආදායම පිළිබඳ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කිරීමෙන් පසු වාර්තා වූ විශාලතම ආර්ථික පසුබෑමයි.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය මුල්වරට ආර්ථික පහළ වැටීමකට ගොදුරු වූ අවස්ථාව වන්නේ 2001 වර්ෂයයි. එම වසරේදී රටේ ආර්ථිකය සියයට 1.5කින් පහළ වැටුණි. ආර්ථික වර්ධන වේගය සියයට එකට වඩා අඩු මට්ටමකට වැටී එහෙත් ඍණ මට්ටමකට පත් වීම යන්තම් වැළකී ගිය වර්ෂ කීපයක් ඇත.1956 දී ආර්ථික වර්ධන වේගය සියයට 0.7ක් විය. 1971 දී ඒ සියයට 0.2ක් විය. ඒ හැරෙන්නට අනෙක් සෑම වර්ෂයකදීම ආර්ථික වර්ධනය අඩුම තරමින් සියයට එකකටත් වඩා වැඩි අනුපාතයකින් වර්ධනය වී ඇත.

2001 දී වාර්තා වූ ඍණ 1.5ත් පසුගිය වසරේ වාර්තා වූ ඍණ 3.5ත් ආර්ථිකය පහළ වැටුණු අවස්ථාවන් දෙක වේ. 2020 දී සියයට 3.5කින් පහළ වැටීම 2001 දී ඇති වූ පරිහානියට වඩා තරමක් විශාල එකක් බව පැහැදිලිය. 2001 වසරේදී ශ්‍රී ලංකාවේ දේශපාලන හෝ වාර්ගික අර්බුද ඇති වීමක් සිදු නොවූ අතර ලෝක ආර්ථික අර්බුදයක් ද නොතිබුණි. එහෙත් 2020 වසර ඊට සපුරාම වෙනස්ය. කොවිඩ් වසංගතය පැතිරී යෑම නිසා රට තුළ ඇති වූ සෞඛ්‍ය සහ සමාජ අර්බුදය හේතුවෙන්ම රට තුළ ආර්ථික අර්බුදයක් ද ඇති ව තිබේ.

එමෙන්ම ලොව රටවලින් බොහොමයක්ම කොවිඩ් වසංගතය හමුවේ තම ආර්ථිකයන් පහළ වැටීම පිළිබඳ අර්බුදයට මුහුණ දී තිබේ.

2020 දී ලෝකයේ සියලුම රටවල් සමස්තයක් ලෙස ගෙන සලකා බැලුව හොත් ලෝක බැංකු වාර්තාවලට අනුව ලෝක ආර්ථිකය සියයට 43කින් පහළ වැටී ඇත. 2020 වසරේදී අමෙරිකා එක්සත් ජනපදයේ ආර්ථිකය සියයට 3.5කින් පහත වැටී ඇත. එය 1946 ලෝක යුද්ධ අවස්ථාවෙන් පසු අමෙරිකාව මුහුණ දුන් විශාලතම ආර්ථික පසුබෑසීමයි. මහා බ්‍රිතාන්‍යයේ ආර්ථිකය සියයට 9.9කින් අඩු විය. ජපානයේ ආර්ථිකය සියයට 4.8කින් පහළ වැටුණි. ඉන්දියාවේ පහළ වැටීම 10.29කි. කොවිඩ් හමුවේ ලොව සියලුම රටවල ආර්ථිකයන් උඩු යටිකුරු වෙමින් පවතින ආකාරය ඉහත සඳහන් රටවල් ලබා ඇති ආර්ථික පරිහානිය තුළින් පැහැදිලි වේ. මෙම තත්ත්වයෙන් ගොඩ ඒමට ශ්‍රී ලංකාවටත්, ලෝකයටත් කවර අවස්ථාවක දී ඉඩ ලැබේ ද? ලෝක බැංකුවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් ප්‍රකාශ කරන්නේ මේ වසරේදී රටවල් බොහොමයක ආර්ථික තත්ත්වයන් හොඳ අතට හැරෙන බවයි. එයට හේතු ලෙස ඔවුන් පෙන්වන්නේ කොවිඩ් එන්නත සාර්ථක වීමත්, 2021 වසර අවසන් වන විට ලොව ජන සංඛ්‍යාවෙන් විශාල පිරිසකට එන්නත ලබා දීමට හැකි වීමත් නිසා ආර්ථික පසුබෑසීම අවසන් වන බවයි. මේ වන විට අමෙරිකාවේ එන්නත් කිරීමේ ව්‍යාපාරය සැලකිය යුතු මට්ටමකින් ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ අතරම ට්‍රම්ප්ගේ පාලනය අවසන් වීමෙන් පසු රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක වන රිපබ්ලිකන් සහ ඩිමොක්‍රටික් පක්ෂ අතර කොවිඩ් වසංගත තත්ත්වයෙන් ඇති ව තිබෙන ආර්ථික පසුබෑස්ම වළක්වා ගැනීම වෙනුවෙන් රටේ ආර්ථිකය තුළට ඩොලර් ට්‍රිලියන 1.9 ක මුදලක් මුදා හැරීම සඳහා එකගතාවක් ඇති කරගෙන ඇත. ඒ අනුව ඒ තුළින් අමෙරිකානු ආර්ථික පසුබෑසීම නවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර ඒ හේතුවෙන් ලෝක ආර්ථිකය ද ඉහළ වර්ධනයක් අත් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාව අනෙකුත් බොහෝ රටවලට වඩා වෙනස් වූ, ආර්ථික කටයුතු වැඩි වශයෙන්ම විදේශ ගනුදෙනු මත තීරණය වන රටක් බවට පත් ව තිබේ.අපි අපනයනවලින් ලබන්නා වූ ආදායමට වඩා ආනයන සඳහා වියදම් කරන්නෙමු. දශක කිහිපයක සිටම එය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පවත්නා සාමාන්‍ය තත්ත්වයක් බවට පත්ව ඇත. අපනයන ආදායම ආනයන වියදම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් හිඟය පියවා ගැනීමට වෙනත් ආදායම් මත යැපීමට සිදුව ඇත. කොවිඩ් වසංගතය ආරම්භ වනතුරුම අපට ඒ සඳහා පිහිට වූයේ විදේශ ශ්‍රමිකයන් විසින් ශ්‍රී ලංකාවට එවනු ලබන මුදල් සහ සංචාරක ව්‍යාපාරය හේතුවෙන් රටට ලැබුණු ආදායමයි. විදේශ ශ්‍රමිකයන් විසින් එවනු ලබන මුදල් ප්‍රමාණය අඩු වීමක් සිදුව නැත. එහෙත් සංචාරක ව්‍යාපාරයෙන් දැන් ශ්‍රී ලංකාවට කිසිදු ආදායමක් නොලැබෙන අතරම අපනයන කලට වේලාවට විදේශවලට යැවීමට නොහැකි වීම නිසාත් අපනයන සඳහා වූ භාණ්ඩ නිෂ්පාදනය පහත වැටීම නිසා අපනයන එම ආදායම ද අඩු වී ඇත.

එවැනි තත්ත්වයක් පැවතීම නිසා කොවිඩ් හමුවේ ශ්‍රී ලංකාවට අනෙක් රටවලට වඩා භයානක වූ ආර්ථික අර්බුදයකට මුහුණ දීමට සිදු විය. එසේ වුව ද නිෂ්පාදන කටයුතු හැකි සෑම අයුරකින්ම පවත්වාගෙන යමින් කොවිඩ් අර්බුදයට මුහුණ දිය යුතු බව පසු කලෙකදී රජයේ ප්‍රතිපත්තිය බවට පත් විය. රෝගයේ පළමු රැල්ල ඉතා සාර්ථක ලෙස මර්දනය විය. පළමු රැල්ල මර්දනය කිරීම සඳහා විවිධාකාරයේ සීමාවන් ඇති කිරීමටත් බොහෝ ආයතන වසා දැමීමටත් සිදු විය. එනිසා ආර්ථික වශයෙන් විශාල කඩාවැටීමක් ද බලාපොරොත්තු විය යුතුව තිබුණි. පසුගිය වසරේ ආර්ථික පසුබෑස්මක් ඇතිවීමට ද හේතු වූයේ ඒ ආකාරයට සිදු වූ සීමා කිරීම සහ වසා දැමීමය.

එහෙත් කොවිඩ් දෙවන රැල්ල ආරම්භ වූ අවස්ථාවේදී රජය අනුගමනය කළේ ඊට වඩා වෙනස් ප්‍රතිපත්තියකි. මුළු රටම හෝ දිස්ත්‍රික්ක වසා දැමීම වෙනුවට තනි තනි ප්‍රදේශ ග්‍රාම සේවා වසම් මට්ටමින් පමණක් වසා දැමීමටත් අනෙක් ප්‍රදේශ හැකි සෑම ආකාරයකින්ම විවෘතව තැබීමටත් ක්‍රියා කළේය.

නිෂ්පාදන ආයතන විවෘතව තැබීමටත් හැකි සෑම අවස්ථාවකදීම ඒවායේ නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යෑමටත් කටයුතු කළේය.

ඒ හේතුවෙන් 2020 වසර අවසන් වන විට ආර්ථිකය තුළ වූ බිඳ වැටීම පාලනය කර ගැනීමට රජයට හැකි විය. 2020 අවසන් කාර්තුවේ එනම් ඔක්තෝබර් - නොවැම්බර් කාලය තුළ ආර්ථිකය පහළ වැටීම නවත්වා ගැනීමට හැකි විය. ඒ හේතුවෙන් ආර්ථිකය සියයට 1.3කින් ඉහළ නංවා ගැනීමට හැකි විය. මුලදී ඇති වූ ආර්ථික කඩා වැටීම වෙනුවට මේ වන විට ආර්ථික වර්ධනයක් ඇති කර ගැනීමට හැකිව තිබෙන අතර එය මේ වසරේදී අඛණ්ඩව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

රජයේ කොවිඩ් මර්දන පිළිවෙත ඉතා සාර්ථක වී ඇති බව පෙනී යයි.

දිනකට දාහකට වැඩි රෝගීන් සිටි බවට වාර්තා වූ තත්ත්වය වෙනස් වී ගොස් එය භාරසියයකට අඩු මට්ටමකට පත් වී ඇත. ඒ අතරම අන් බොහෝ රටවලට වඩා ඉක්මනින් කොරෝනා එන්නත ලබා ගැනීමටත් ඒවා ජනතාවට ලබා දීමටත් කටයුතු කර ඇත. සංචාරක ව්‍යාපාරය යළි ආරම්භ කිරීමටත් විවිධාකාර ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. එවැනි තත්ත්වයක් තුළ ශ්‍රී ලංකාවට මේ වසරේදී ඉහළ ආර්ථික වර්ධනයක් අත් කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. ලෝක බැංකුව මේ වසරේදී ජනවාරි මාසයේදී ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා ආර්ථික 2021 වසරේදී සියයට 3.3ක වර්ධනයක් ඇති කර ගන්නා බවයි. ලෝක බැංකුව 2020 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 6.7කින් පහළ වැටෙනු ඇතැයි ප්‍රකාශ කර තිබුණි.

එහෙත් එම පහළ වැටීම සියයට 3.6ක මට්ටමකට සීමා කර ගැනීමට රජයට හැකි විය. එබැවින් ලෝක බැංකුව පුරෝකථනය කර ඇති සියයට 3.3ක වර්ධනයට වඩා ඉහළ මට්ටමක වර්ධනයක් ළඟා කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වනු ඇත.

**මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර**

# බිලූමැන්ඩල් සංබගේ කෝටි 2ක කුඩු සමඟ අයෙක් අත්අඩංගුවට

**රක්ෂණා ශ්‍රියන්ත සහ නුගේගොඩ සමූහ**

මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු වන බිලූමැන්ඩල් සංබ විසින් මෙරටට එවන ලද රුපියල් කෝටි දෙකකට අධික වටිනාකමකින් යුත් හෙරොයින් කිලෝ 02 ග්‍රෑම් 245 මිලිග්‍රෑම් 560ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු වැලිකඩ පොලිස් වසමේ රාජගිරිය ප්‍රදේශයේදී පෙරේදා (16) පොලිස් විශේෂ කාර්ය බළකාය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. අත්අඩංගුවට ගත් සැකකරුගෙන් වැඩිදුර ප්‍රශ්න කිරීමේදී දැනට විදේශගතව සිටින සංවිධානාත්මක අපරාධ කල්ලි නායකයකු හා මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු වන සංබ ශිරන්ත නොහොත් බිලූමැන්ඩල් සංබ නමැත්තා විසින් මේ හෙරොයින් තොගය මෙරටට එවා ඇති බවත් ඔහුගේ මෙරට හෙරොයින් ජාවාරම් කරනු ලබන දැනට රක්ෂිත බන්ධනාගාරගතව සිටින රාජගිරිය ප්‍රදේශයේ අමිත නමැත්තකු විසින් වෙනත් පාර්ශ්වයකට දීම සඳහා මේ හෙරොයින් තොගය දී ඇති බව අනාවරණය වී තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40ක් වන රාජගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. සැකකරු වැඩි දුර විමර්ශන සඳහා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වෙත භාරදී ඇති අතර සැකකරු අධිකරණයට ඉදිරිපත් කර දින හතක රැඳවුම් නියෝග ගැනීමට නියමිතව තිබුණි. ජයවර්ධනපුර පොලිස් විශේෂ කාර්ය බළකා කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මේ වැටලීම කර තිබේ.

# එක පාරක් විද්දම ඇති ජොන්සන් ඇන්ඩ් ජොන්සන් ගේන්න අවධානය

එක් මාත්‍රාවක් පමණක් ප්‍රමාණවත් වන ජොන්සන් ඇන්ඩ් ජොන්සන් කොවිඩ් මර්දන එන්නත මෙරට එන්නත්කරණ වැඩසටහන සඳහා යොදා ගැනීමට අවධානය යොමුව ඇති බව රාජ්‍ය ඇමැතිනි විශේෂඥ වෛද්‍ය සුදර්ශනි ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පැවසුවාය.

කොළඹදී ඊයේ (17) පෙරවරුවේ පැවති මාධ්‍ය හමුවකදී රාජ්‍ය ඇමැතිවරිය පැවසුවේ මේ වන විට මෙරට තුළ කොවිඩ් රෝගීන් වාර්තා වීමේ අඩුවීමක් දක්නට ලැබෙන බවය.

"මේ වන විට කොවිඩ් රෝගීන්ගේ අඩු වීමේ ප්‍රවණතාවක් තියෙනවා. විවිධ එන්නත් කෙරෙහි අපේ අවධානය යොමු වෙලා තියෙනවා. ඒ ආයතනවලින් කවුරු හරි නියෝජිතයෙක් ඉල්ලුම් කරන්න ඕනේ ලියාපදිංචි කරන්න. ඊයේ SPC ආයතනයේ සභාපතිවරයා කිව්වා ෆයිසර් ආයතනයට දන්වලා තියෙනවා කියලා ලියාපදිංචිය සඳහා අවශ්‍ය තොරතුරු එවන්න කියලා." යැයිද ඇය කීවාය.

# විදෙස් ශ්‍රමිකයන් ගැන ආණ්ඩුවට වගකීමක් නෑ

## සඹප පා.ම නලින් බණ්ඩාර

**පහන් විජේසේකර**

විදෙස් ශ්‍රමිකයන් වෙනුවෙන් මේ රජය වගකීමෙන් කටයුතු නොකරන බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් බණ්ඩාර මහතා විපක්ෂ නායක කාර්යාලයේදී ඊයේ (17) පැවති මාධ්‍ය හමුවට එක්වෙමින් ප්‍රකාශ කළේය. ඒ වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිටදී මේ සිකුරාදා (19) උද්ඝෝෂණයක් පැවැත්වෙන බවද හෙතෙම පැවසීය. විදෙස් ශ්‍රමිකයන්ට වෙන් කළ මුදල් ගැන කෝප් කමිටුවේදී ප්‍රශ්න කළ නමුත් රජය ඒ අය වෙනුවෙන් ඉතා සුළු මුදලක් පමණක් වෙන් කර ඇතැයිද හෙතෙම කීවේය.

# ශ්‍රී ලංකාවට එරෙහිව ඉන්දියාවේ සහාය ගන්න බ්‍රිතාන්‍යය දත කයි

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාවට එරෙහිව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයට ඉදිරිපත් කර තිබෙන යෝජනාවට ඉන්දියාවේ සහාය ගැනීමට එක්සත් රාජධානිය උත්සාහයක නිරතව සිටින බව වාර්තා වේ.

එක්සත් රාජධානියේ විදේශ පොදුරාජ්‍ය මණ්ඩල සංවර්ධන රාජ්‍ය ඇමැති තරික් අහමඩ් මහතා සිය ඉන්දීය සංචාරය අතරතුර එරට ඉහළ පෙළේ නියෝජිතයන් සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබෙන බව පැවසේ.

# ස්වර්ණමහල් අධ්‍යක්ෂවරු සිව්දෙනා 30 දක්වා රිමාන්ඩ්

**සුභාෂිණී සේනානායක**

ස්වර්ණමහල් ජුවලර්ස් ආයතයේ වූ මූල්‍ය වංචා සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඊයේ අත්අඩංගුවට ගත් එම ආයතනයේ අධ්‍යක්ෂවරුන් වන ජීවක එදිරිසිංහ, නාලක එදිරිසිංහ, දීපා එදිරිසිංහ සහ අසංක එදිරිසිංහ යන සැකකරුවන් මාර්තු මස 30 වැනි දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කොළඹ කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියන්ගේ මහතා ඊයේ (17) නියෝග කළේය.

ස්වර්ණමහල් ජුවලර්ස් ලිමිටඩ් ආයතනය මහ බැංකුවේ මුදල් මණ්ඩලය දී තිබූ උපදෙස් නොතකමින් වසර 2012 වන විට රුපියල් බිලියන 7.2ක් නීති විරෝධී ලෙස තැන්පත්කරුවන්ගේ මුදල් ගෙන ඇති බව සැකකරුවන් සිව් දෙනා අධිකරණයට ඉදිරිපත් කරමින් කරුණු දැක්වූ රජයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් හරිප්‍රියා ජයසුන්දර මහත්මිය පැවසුවේ සැකකරුවන්ට ඇප දීම ප්‍රතික්ෂේප කරන බවයි.

සැකකරුවන් සිව්දෙනා සම්බන්ධයෙන් මින් පෙර නඩුකරයක් ඉදිරිපත් කරමින් අවස්ථා තුනකදී කරුණු දක්වමින් ඇප නොදෙන ලෙස එකම කොමිෂන් සභා වාර්තාව පදනම් කරමින් මොවුන් සිරගත කිරීමට නීතිපතිවරයා කරුණු දක්වා ඇති බව සැකකරුවන් වෙනුවෙන් කරුණු දක්වමින් ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න මහතා අධිකරණය හමුවේ කියා සිටිමින් ඔවුන්ට ඇප දෙන ලෙස ඉල්ලීය. ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප කළ මහේස්ත්‍රාත්වරයා මාර්තු 30 දක්වා සැකකරුවන් රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස දන්වා සිටියේය.

# ගැටලුවලට විසඳුම් නොදී ආණ්ඩුව බොරු ගොතනවා

## ජවිපෙ නායක අනුර කුමාර

වත්මන් ආණ්ඩුව ජනතා ගැටලුවලට විසඳුම් දීම වෙනුවට විවිධ වර්ගයේ බොරු ගොතමින් සිටින බව ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මහතා පැවසීය.

ඔහු මේ බව පැවසුවේ පෙරේදා (16) කොළඹදී පැවති රැස්වීමකදීය. "රටේ ප්‍රශ්නයක් එනකොට අග්‍රාමාත්‍යවරයා කියනවා මොකක්ද, මම ගව ඝාතනය තහනම් කරනවා. තහනම් කළා ද? ඒක පුස් වෙඩිල්ලක්. තහනම් කළේ නෑ. නිකං කියනවා. එතකොට මොකද වෙන්නේ. පහුවදා මාධ්‍යවල ප්‍රධාන ප්‍රවෘත්තිය. ගව ඝාතනය නතර කරයි. අපේ උපාසක අම්මලා, සාදු සාදු කියනවා පත්තරේ බලලා. අද මතකද ඒක. සමහර අය කියනවා, මිනිස්සු විතරක් නෙමෙයි රැවටිටුවේ, ගවයොත් රැවට්ටුවා කියලා" යනුවෙන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මහතා පැවසීය.

බේරා නොගත් රන් භාණ්ඩ වෙන්දේසිය

2021.03.20 දිනට කුරුණෑගල ශාඛාවේ පැවැත්වීමට නියමිතව තිබූ භාණ්ඩ වෙන්දේසිය 2021.04.03 වන දින ට කල් දමන ලද බව මෙයින් දන්වා සිටිමු.

සහකාර සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම් හා පරිපාලන)
නො. 450, ගාලුපාර, කොළඹ 03.

පෑන් ඒෂියා බැංකුව
සැබවින්ම ශ්‍රී ලාංකීයයි

# උත්සව සමයේ අවශ්‍ය වුණොත් සංචරණ සීමා කරනවා

## යුද හමුදාපති

**නුවන් කොඩිකාර**

එළඹෙන උත්සව සමයේ අවශ්‍ය වුවහොත් සංචරණ සීමා පැනවීමට කටයුතු කරන බව යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවසීය. පසුගිය නත්තල් උත්සව සමයෙන් පසු මෙරට කොවිඩ් වයිරස ව්‍යාප්තිය ඉහළ යෑම මගින් එවැනි කලසීමා තුළ ජනතාව සෞඛ්‍ය උපදෙස් නිසි පරිදි නොපිළිපදින බවට තහවුරු වූ බව හෙතෙම කීවේය.

# 'ලූසී' ට නිදහස ඉල්ලා කැනඩා අගමැතිට සන්දේශයක්

**උපාලි කරුණාරත්න**

වසර 44කට අධික කාලයක් කැනඩාවේ සත්ත්වෝද්‍යානයක දුක් විඳිමින් සිටින 'ලූසී' නමැති ශ්‍රී ලාංකේය ඇතින්න මුදා ගන්නා ලෙස සඳහන් සන්දේශයක් ඕමල්පේ සෝභිත හිමියෝ මෙරට කැනඩා මහ කොමසාරිස්වරයා වෙත පෙරේදා (16) භාර දුන්හ. ඒ කැනඩා අග්‍රාමාත්‍යවරයා වෙත භාර දීම සඳහාය.

මේ පිළිබඳ අදහස් දක්වමින් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක JUSTICS FOR ANIMALS & NATURE සංවිධානයේ සභාපති ඕමල්පේ සෝභිත නාහිමියෝ ප්‍රකාශ කළේ මේ ලූසී නැමැති ඇතින්න 1977 වර්ෂයේදී රුපියල් 10,000ක් වැනි මුදලකට ජර්මන් ජාතිකයකු විසින් ශ්‍රී ලංකාවෙන් මිලදී ගෙන පසුව කැනඩාවේ සත්ත්වෝද්‍යානයක් වෙත ඩොලර් 9,000කට විකුණා ඇති බවයි.

01 පිටුවෙන් ...

## අසාද් සාලිගෙන් ...

අත්අඩංගුවට ගත් සැකකරු සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ක්‍රියා කළ බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශකයෙක් දිනමිණට ඊයේ (17) කියා සිටියේය.

සිද්ධියට අදාළව අසාද් සාලි මහතාගෙන් ප්‍රකාශ සටහන් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කරන බව ඒ මහතා පැවසීය.

අසාද් සාලි මහතාගේ මෝටර් රථයේ තිබී සොයා ගත් විදේශ රටක නිෂ්පාදිත ගිනි අවිය සම්බන්ධයෙන් වෙනම පරීක්ෂණයක් කරන බවද හෙතෙම කීවේය.

# බැඳුම්කර සිද්ධියට රවි ඇතුළු අටක් රිමාන්ඩ්

## චූදිතයෝ සති 2ක් වැලිකඩ නිරෝධායනයට

**රෝෂන් තුෂාර සහ බුද්ධිකා ඉඹුලාන**

2016 වසරේ වූ මහ බැංකු බැඳුම්කර වෙන්දේසියේ රුපියල් බිලියන 36.98ක අලාභයක් ජාතික ආර්ථිකයට කළේ යැයි චෝදනා ලද හිටපු මුදල් ඇමැති රවි කරුණානායක මහතා ඇතුළු විත්තිකරුවන් 08 දෙනකු ලබන 23 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කොළඹ මහාධිකරණ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල ඊයේ (17) නියෝග කළේය.

විත්තිකරුවන්ට ඇප දීමට තරම් සුවිශේෂ කරුණු ඉදිරිපත් නොවීම සහ නීතිපතිවරයාගේ අනුමැතියකින් තොරව ඇප දීමට නොහැකි බව සඳහන් කරමින් ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප කළ විනිසුරු මඩුල්ල ඇප ඉල්ලීම සම්බන්ධයෙන් බෙදුණු තීන්දුවක් ප්‍රකාශයට පත් කළේය.

විත්තිකරුවන්ට එරෙහිව පොදු දේපළ පනත යටතේ චෝදනා ගොනු කර ඇති හෙයින් ඇප දීමට තරම් සුවිශේෂ කරුණු විත්තිය මගින් ඉදිරිපත් වී නොමැති හෙයින් ඇප දිය නොහැකි බව සභාපති විනිසුරු දමිත් තොටවත්ත මහතා සහ විනිසුරු මොහොමඩ් ඉර්ෂඩීන් මහතා සිය නියෝගය ප්‍රකාශ කරමින් පැවසීය. මහාධිකරණ විනිසුරු මංජුල තිලකරත්න මහතා සිය නියෝගය ඉදිරිපත් කරමින් සඳහන් කළේ දණ්ඩ නීති සංග්‍රහයේ 450 (6) උප වගන්තිය යටතේ නීතිපතිවරයාගේ අනුමැතියකින් තොරව ඇප දිය නොහැකි බැවින් ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවය.

විත්තිකරුවන්ට එරෙහිව පොදු දේපළ පනත යටතේ හා දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදවල් කිරීම සම්බන්ධයෙන් චෝදනා 32ක් යටතේ නීතිපතිවරයා මේ නඩුව පසුගිය 12 වැනිදා පැවරූ අතර ඊයේ (17) දින විවෘත අධිකරණයේ කරුණු දැක්වීමෙන් පසු මේ නියෝගය නිකුත් කළේය. අධිකරණයේ පෙනී නොසිටි හිටපු මහ බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන් මහතා හා පර්පචුවල් ට්‍රෙෂරීස් සමාගමේ අධ්‍යක්ෂ ගාර්දියා පුංචිහේවාට එරෙහිව වරෙන්තු නිකුත් කිරීම සම්බන්ධව ඉල්ලීම ලබන 23 වැනිදා කරන ලෙස විනිසුරු මඩුල්ල නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරියට දන්වා සිටියේය.

විත්තිකරුවන්ගේ ඇඟිලි සලකුණු ගන්නා ලෙසට නියෝග කළ විනිසුරු මඩුල්ල ඉදිරි දින විත්තිකරුවන් අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට බන්ධනාගාර අධිකාරිවරයාට නියෝගයක්ද නිකුත් කළේය. පස්වරු 5.55ට මේ නියෝග දුන් අතර නඩුවේ ඉදිරි කටයුතු ලබන 23 වැනිදා කරන බවත් චෝදනා 32ට අදාළ ලේඛන එදිනට ඉදිරිපත් කරන ලෙසටත් දන්වා සිටියේය.

2016 මාර්තු මස කළේ යැයි කියන දෙවැනි බැඳුම්කර වෙන්දේසියෙන් රජයට රුපියල් කෝටි 3,698ක (බිලියන 36.98ක) අලාභයක් කරමින් පොදු දේපළ පනත යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කළේ යැයි සඳහන් කරමින් නීතිපතිවරයා අධිචෝදනා 32ක් යටතේ මේ නඩුව පැවරීය.

හිටපු මුදල් ඇමැතිවරයා ඇතුළු අධිකරණයේ පෙනී සිටි විත්තිකරුවන් අට දෙනාට අධිචෝදනා පත්‍ර භාරදීම කිරීමෙන් අනතුරුව නීතිපතිවරයා වෙනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් හරිප්‍රියා ජයසුන්දර මහත්මිය කරුණු දැක්වූවාය.

ජාතික ආර්ථිකයට, පොලී අනුපාතයන්ට සහ මහජනතාවට විශාල අගතියක් කළ විත්තිකරුවන්ට ඇප දීමට විරුද්ධ වන බව ජයසුන්දර මහත්මිය පැවසුවාය.

මේ චෝදනා මිනීමැරුමක් වැනි චෝදනාවක් නොවන බවත්, ජාතික ආර්ථිකයට බලපාන සුවිශේෂ නඩුවක් හෙයින් ඇප දීමට තරයේ විරුද්ධ වන බවත් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරිය පැවසුවාය.

මහා භාණ්ඩාගාර බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් රටේ පොදු මහජනතාව යුක්තිය ඉල්ලා සිටින බවත් මෙය රටේ මුදල් ඇමැතිවරයකු මහජන විශ්වාසය අපගමනය කිරීමට එරෙහිව පැවරූ නඩුවක් බව පැවසූ ජයසුන්දර මහත්මිය මුදල් ඇමැතිවරයකු මහ බැංකු අධිපතිවරයකු එකම නඩුවක විත්තිකරුවන් බවට පත් කරමින් පැවරූ ලෝකයේ සුවිශේෂී එකම නඩුව බවද කීවාය.

මේ නඩුවේ විත්තිකරුවන් ලෙස පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම, හිටපු මුදල් ඇමැති රවි කරුණානායක, හිටපු මහ බැංකු අධිපති ලක්ෂ්මන් අර්ජුන් මහේන්ද්‍රන්, පර්පෙචුවල් ට්‍රෙෂරීස් අධිපති අර්ජුන් ජෝශප් ඇලෝසියස්, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ප්‍රධාන විධායක නිලධාරී කසුන් ඕෂධ පළිසේන, අධ්‍යක්ෂවරුන් වන පී. ජෝශප් ඇලෝසියස්, රන්ජන් හුලුගල්ල, එන්. සුරේන්දාස්, ගාර්දියේ පුංචිහේවා, මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියකු වූ සංගරපිල්ලේ පදුමනාදන් සහ සේවක අර්ථසාධක අරමුදලේ විධායක නිලධාරියකු වූ ඉන්දික සමන්කුමාර නම් කර තිබිණි.

හිටපු මහ බැංකු අධිපතිවරයා සහ 09 වැනි විත්තිකරු විදෙස්ගතව ඇති බැවින් ඊට අදාළ නියෝග නිකුත් කරන ලෙසද නීතිපතිවරයා වෙනුවෙන් ඉල්ලා සිටියාය.

විත්තිකාර හිටපු මුදල් ඇමැතිවරයා නඩුවේ 04 වැනි විත්තිකරුගෙන් නිවෙසක් ත්‍යාගයක් ලෙස ගෙන ඇති බව පෙන්වා දුන් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරිය ඔවුන් අතර රාජකාරියට එහා ගිය සම්බන්ධයක් තිබීම, රටේ මුදල් සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු පුද්ගලයකු වීම, මහජන මුදල් අවභාවිතය, මහජන කැලඹීමක් ඇති වීම සහ සමස්ත සමාජයටම බලපාන වරදවල් කිරීම යන කරුණු මත ඇප දීමට විරුද්ධ වන බවද පැවසුවාය.

විත්තිකරුවන් විසින් මාස 23ක් වැනි කෙටි කාලයකින් මෙවන් බැඳුම්කර වෙන්දේසි තුනක් කර රජයට, රටේ බැංකු පද්ධතියට පාඩුවක් කර ඇති බවත් පළමු බැඳුම්කර වෙන්දේසිය 2015 පෙබරවාරි 27 කර ඇති බවත්, ඊට අදාළ නඩුව ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ පවරා ඇති බවත් කීවාය.

කරුණු සලකා බැලූ දමිත් තොටවත්ත මහාධිකරණ විනිසුරුවරයාගේ සභාපතීත්වයෙන් යුතු ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල ඇප දීමේ හෝ නොදීමේ නියෝගය නිකුත් කිරීම පස්වරු 5.00 දක්වා කල් තැබීය. ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල මඟින් පස්වරු 5.55ට රක්ෂිත බන්ධනාගාරගත කිරීමේ නියෝග නිකුත් කළේය.

බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් චෝදනා මත අධිකරණය මඟින් රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියම කළ හිටපු මුදල් ඇමැති රවි කරුණානායක ඇතුළු සැකකරුවන් 08 දෙනා වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා අංශයේ ස්ථාපිත කර ඇති විශේෂ නිරෝධායන මධ්‍යස්ථානය වෙත යොමු කර ඇත.

ඔවුන් දින 14ක කාලයක් නිරෝධායනයේ තබන බව බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා කියයි.

"ඔබට නිවන් සුව"



උපත : 1979.12.14 විපත : 2021.03.16

පී. ජී. එම්. ආර්. අයි. පියදාස

සොයුර, ඔබ අපගේ සාර්ථකත්වයේ
කොටස්කරුවෙක් විය.
ඔබගේ හදිසි වියෝව අප කම්පා කරවීය.

අපි ඔබගේ පවුලේ සාමාජිකයන් සමග
සංවේගය බෙදා ගන්නෙමු.

ගුවන්තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගම,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොල,
කටුනායක.

01 පිටුවෙන් ...

## අස්ගිරි මහනාහිමියෝ ...

හාරිස්පත්තුව වරකාගොඩ දුල්දෙණිය රාජකරුණා නවරත්න අතපත්තු වාසල මුදියන්සේලාගේ මුදියන්සේ සහ හිගුල්වල අලකොලදෙණියේ දුග්ගන්නා රාළලාගේ පිංචි අම්මා දම්පතීන්ගේ තෙවන දරුවා ලෙස උන්වහන්සේ උපත ලැබුවේ 1942 මාර්තු 18 වැනිදාය.

මෙරට ජාතික, ආගමික හා ශාසනික ගැටලුවලදී ඍජුව මෙන්ම මධ්‍යස්ථව අදහස් දක්වමින් උන්වහන්සේ ඉටු කරනු ලබන මෙහෙවර සුවිශාලය. මහානායක ධුරයෙන් බැබළෙනු වෙනුවට ක්‍රියාවෙන් මහා නායක ධුරය බබළවන්නට ගතවූ පස් වසරේදී උන්වහන්සේ කටයුතු කළේ දෙස් විදෙස් බෞද්ධ අබෞද්ධ සැමගේ ගෞරවාදරයට පාත්‍ර වෙමිනි. තවත් චිරාත් කාලයක් ලෝසත වෙත කායික මෙන්ම මානසික ශක්තියෙන්ද යුක්තව සෙත සලසන්නට උන්වහන්සේට ශක්තිය හා ධෛර්යය ලැබේවායි අපි ආසිරි පතමු.

## අගමැති හෙට ...

බංග්ලාදේශ ජනරජයේ ජාතියේ පියා ලෙසට සැලකෙන බංගබන්දු ෂෙයික් මුජිබර් රහ්මාන් (Bangabandhu Sheikh Mujibur Rahman) මහතාගේ ජන්ම ශත සංවත්සරය හා බංග්ලාදේශයේ නිදහස් ස්වර්ණ ජයන්තිය සැමරීමට සමගාමීව බංග්ලාදේශ මහජන සමූහාණ්ඩුවේ අගමැතිනී ෂෙයික් හසීනා (Sheikh Hasina) මහත්මියගේ ආරාධනයකට අනුව අගමැතිවරයා මේ සංචාරයේ නිරත වෙයි.

බංගබන්දු ෂෙයික් මුජිබර් රහ්මාන් (Bangabandhu Sheikh Mujibur Rahman) මහතාගේ 100 වැනි ජන්ම දිනය සහ බංග්ලාදේශයේ නිදහස් ස්වර්ණ ජයන්තිය සැමරීම සඳහා ප්‍රකාශයට පත් කරන ලද "මුජිබ් වර්ෂය" (Mujib Year) නිමිත්තෙන් හෙට (19) පස්වරුවේ අගමැති මහින්ද රාජපක්ෂ මහතා දේශනයක් පැවැත්වීමට නියමිත අතර දෙරට අතර ගිවිසුම් කිහිපයකට අත්සන් තැබීමට ද නියමිතය.

## රන්ජන්ගේ දුරකතනය ...

ඔහු රඳවා සිටින අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ, Y විශේෂ අංශය අසල තිබී, ඉමි (IMEI) අංක සඳහන් නොවන Samsung J2 වර්ගයේ ජංගම දුරකතනයක් බන්ධනාගාර බුද්ධි ඒකක නිලධාරීන් විසින් සොයා ගනු ලැබුවේ පසුගිය 15වැනිදායි.

බන්ධනාගාර බුද්ධි ඒකකයට ලැබුණු තොරතුරකට අනුව බුද්ධි ඒකකයේ නිලධාරීන් විසින් Y විශේෂ අංශය හා එම අංශය අවට එදින (15) පෙ. ව. 11.40ට පමණ සෝදිසි කළ අතර එහිදී Y විශේෂ අංශය හා තාප්පය අතර කොටසේ පොළොවෙහි වළ දමා තිබී මේ ජංගම දුරකතනය සොයා ගෙන තිබේ.

මේ ජංගම දුරකතනයද එම බන්ධනාගාරයේ Y අංශය තුළ සිටින රන්ජන් රාමනායකට දීමට රැගෙන ආ දුරකතනයක් දැයි බන්ධනාගාර බුද්ධි අංශය සැක පළ කර තිබිණි.

## අසාද් සාලිගේ රියේ ...

අසාද් සාලි මහතා පෙරේදා (16) කොල්ලුපිටියේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන තිබෙන අතර ඔහු ගමන් කළ මෝටර් රථය පරීක්ෂාවට ලක් කිරීමේදී මේ පිස්තෝලය, මැගසිනය සහ උණ්ඩ සොයා ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු සම්බන්ධයෙන් ත්‍රස්ත්‍රවාදය වැළැක්වීමේ පනත යටතේ කටයුතු කරනු ලබන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

## හේමසිරි-පූජිත් ...

මේ නඩුව කොළඹ අතිරේක මහේස්ත්‍රාත් රජින්ද්‍රා ජයසූරිය මහත්මිය ඉදිරියේ ඊයේ (17) කැඳවූ අවස්ථාවේ ඇප මත මුදා හැර සිටින සැකකාර හේමසිරි ප්‍රනාන්දු සහ පූජිත් ජයසුන්දර යන අය අධිකරණයේ පෙනී සිටියහ.

මේ සිද්ධියට අදාළ විමර්ශන කටයුතු අවසන් කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත උද්ධෘත යොමු කර ඇති බව එහිදී අධිකරණයට දැනුම් දුන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැවසුවේ ඊට අදාළ නීතිපති උපදෙස් මෙතෙක් ලැබී නොමැති බවය. අනතුරුව පැමිණිල්ල ඔක්තෝබර් මස 27 වැනිදා කැඳවීමට නියම කළ අතිරේක මහේස්ත්‍රාත්වරිය නීතිපති උපදෙස් සම්බන්ධයෙන් නීතිපතිවරයා වෙත සිහිකැඳවීමේ ලිපියක් යොමු කරන ලෙසද නියෝග කර තිබේ.

ජාතික තවුහිත් ජමාත් සංවිධානය විසින් පාස්කු ඉරු දින එල්ල කළ ප්‍රහාර සිද්ධිය පිළිබඳ කලින්ම ප්‍රමාණවත් බුද්ධි තොරතුරු ලැබී තිබියදී එය වළක්වා ගැනීමට ක්‍රියා නොකිරීම තුළින් සාපරාධි ලෙස රාජකාරිය පැහැර හැර මිනී මැරීමේ සිද්ධිය සම්බන්ධයෙන් හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු සහ හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර යන අයට එරෙහිව මේ පැමිණිල්ල ගොනු කර තිබේ.

# අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේදී විෂය මාලා නවීකරණය ප්‍රධානයි

## ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස්

**තමරසිරි විජේසේකර**
**දෙයියන්දර සමූහ**

දැනට පවත්නා පාසල් විෂය මාලා අන්තර්ගතය රටේ වත්මන් ආර්ථික අවශ්‍යතා සහ රැකියා අවස්ථා සමඟ එකිනෙකට නොගැළපෙන බවත්, රජය විසින් හඳුන්වා දෙනු ලබන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ විෂයමාලා නවීකරණය ප්‍රමුඛ අංගයක් වන බවත් අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා පවසයි.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ ඉදිරි සංවර්ධන කටයුතු පිළිබඳව පසුගියදා පැවති සාකච්ඡාවකට සහභාගි වූ අවස්ථාවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.



'පාසල් විෂය මාලාව පමණක් නොව, මෙරට විශ්වවිද්‍යාල පාඨමාලා ද නූතන රැකියා වෙළෙඳපොළ අවස්ථා සමඟ බද්ධ නෑ. තොරතුරු තාක්ෂණය, පරිගණක තාක්ෂණය වැනි විෂයයන්වල දැනුම විෂය මාලා අන්තර්ගතයට එක් කිරීමට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා පියවර ගන්නවා.'

විද්‍යාලයේ අඩක් වැඩ නිම කර තිබෙන ගොඩනැගිලිවල වැඩ කටයුතු කඩිනමින් නිම කිරීම පිළිබඳවත්, විද්‍යාලයේ ඉදිරි සංවර්ධන කටයුතු පිළිබඳවත් මෙහිදී සාකච්ඡා කෙරිණි.

කතානායක මහින්ද යාපා අබේවර්ධන, විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම, රාජ්‍ය ඇමැති කංචන විජේසේකර, මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහත්වරුන් ඇතුළු ජනතා නියෝජිතයෝ සහ රාජ්‍ය නිලධාරීහු මේ අවස්ථාවට සහභාගි වී සිටියහ.

**ඡායාරූපය - දෙයියන්දර සමූහ**

# මධ්‍යම පළාතේ බෙදා හරින නළ ජලයෙන් ඝන මීටර් ලක්ෂ 22ක් මාසිකව අපතේ යනවා

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම හා සබරගමුව) ජේ. එච්. මීගොඩ

**අසේල කුරුළුවංශ**

ජාතික ජල සම්පාදන මණ්ඩලයෙන් මධ්‍යම පළාතේ බෙදා හරින නළ ජලයෙන් ඝන මීටර් ලක්ෂ 22ක් පමණ මාසිකව අපතේ යන බව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම හා සබරගමුව) ජේ. එච්. මීගොඩ මහතා පවසයි.

ඒ මහතා මේ බව පැවැසුවේ මහනුවර ගැටඹේ ජල සම්පාදන මණ්ඩල කාර්යාලයේදී පසුගියදා (15) පැවති මාධ්‍ය හමුවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'පසුගිය මාසයේ මධ්‍යම පළාතේ ජලය ඝන මීටර් 7286,027ක් බෙදා හැර තිබෙනවා. භාවිත කර තිබෙන බවට මනු කියැවීමේදී වාර්තාවී තිබෙන්නේ ඝන මීටර් 5085,479ක්. මණ්ඩලයෙන් බෙදා හරින ජලය නිවෙස්වල සහ ව්‍යාපාරික ස්ථානවල ජල මනුව වෙත පැමිණීමට පෙර මේ ජලය අපතේ යෑම සිදු වෙනවා. ඉන් පසුව නිවෙස් සහ ව්‍යාපාරික ස්ථානවල සිදු වන ජලය අපතේ යෑම මේ ගණනයට ඇතුළත්ව නෑ.

ජල නළයෙන් කාන්දු වීම, ජලය හොරෙන් ගැනීම ඇතුළු සිදුවීම් ගණනාවක් මෙයට හේතුවී තිබෙනවා. මධ්‍යම පළාතේ මණ්ඩලයෙන් බෙදා හරින නළ ජලයෙන් 25%ක් පමණ සාමාන්‍යයෙන් අපතේ යනවා. මෙය 15%ක් දක්වා අඩු කර ගැනීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනවා.

මාතලේ දිස්ත්‍රික්කයේ ජලය අපතේ යෑම බෙදා හරින සමස්ත ජල ධාරිතාවයෙන් 35%ක්. එම ප්‍රදේශයේ ජල නළවල පවතින දුබලතා නිසා මේ තත්ත්වය ඇතිව තිබෙනවා. ජලය ලීටර් 1000ක් නිෂ්පාදනය කිරීමට මණ්ඩලයට රුපියල් 49.00ක් වැය වෙනවා. මධ්‍යම පළාතේ සමස්ත ජනගහනයෙන් 43%කට ජල සම්පාදන මණ්ඩලයෙන් ජලය බෙදා හරිනවා. එය 85%ක් දක්වා ඉහළට ගෙන ඒමට පස් අවුරුදු සැලසුමක් ක්‍රියාත්මකයි.'

# මඩු වන්දනාවේ යන බැතිමතුන්ට නිවාස ඒකක 144ක් ඉදි කිරීමට පියවර



**මහින්ද අලුත්ගෙදර**

මඩු වන්දනාවේ යන බැතිමතුන්ගේ නවාතැන් අවශ්‍යතාවට අතරමැදි නිවාස ඒකක 144ක් ඉදි කිරීමට රජය තීරණය කරයි.

ඒ අනුව එම අතරමැදි නිවාස ඒකක 144ක් ඉදිකිරීම පසුගියදා මඩු දේවස්ථාන භූමියේදී ආරම්භ කෙරිණි.

මේ නිවාස ඒකක ඉදි කරන්නේ ඉන්දියානු රජයේ ආධාර යටතේ වන අතර, ඒ සඳහා ඉන්දියානු රජය රුපියල් මිලියන 300ක් දී තිබේ.

මේ නිවාස ඉදි කිරීමට මුල්ගල් තැබීම සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග, මෙරට ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බග්ලේ, මන්නාරම් රදගුරු ආචාර්ය එමානුවල් ප්‍රනාන්දු පියතුමාගේ සහභාගීත්වයෙන් සිදු කෙරිණි.

වන්නි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී කාදර් මස්තාන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන කුලසිංහම් තිලීපන්, සෙල්වම් අඩෙක්කනාදන්, සංචාරක අමාත්‍යාංශ ලේකම් එස්. හෙට්ටිආරච්චි මහත්වරු සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාල යාපනයේ කොන්සල් ජනරාල්වරයා ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

# වැලිමඩට අංග සම්පූර්ණ අධිකරණ සංකීර්ණයක්

**රෝෂන් තුෂාර**

වැලිමඩ ජනතාවගේ අධිකරණ කටයුතු පහසු කිරීම වෙනුවෙන් ඉදිවෙමින් පවතින මහල් තුනකින් සමන්විතව අංග සම්පූර්ණ අධිකරණ සංකීර්ණය ලබන වසරේදී ජනතා අයිතියට පත් කරන බව අධිකරණ අමාත්‍යාංශය පවසයි.

නව අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් මේ වන විට කඩිනමින් සිදු කරමින් පවතින අතර, රුපියල් මිලියන 428.7ක් රජය ඇස්තමේන්තු කර ඇත. නව අධිකරණ සංකීර්ණය දිසා අධිකරණ, මහේස්ත්‍රාත් අධිකරණ, කාර්යාල පහසුකම් ඇතුළු සියලු පොදු පහසුකම්වලින් සමන්විතවේ. ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය ඉදිකිරීම ද සිදු කරයි.

දැනට අධිකරණ කටයුතු සිදු කරන වැලිමඩ අධිකරණ සංකීර්ණය 1999දී ජනතා අයිතියට පත් කර තිබෙන අතර, ඌව පරණගම, වැලිමඩ, ඇටන්පිටිය, අඹගස්දෝව, බෝගහකුඹුර පොලිස් වසම් යටතේ ඇති නඩු සහ බණ්ඩාරවෙල පොලිස් වසමේ වංචා විමර්ශන අංශයට අයත් නඩු කටයුතු වැලිමඩ අධිකරණය යටතේ විභාග වේ.

නව අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් කඩිනම් කිරීමට අධිකරණ අමාත්‍යාංශය උපදෙස්දී ඇති අතර, මේ හරහා අවම කාලයකින් වැඩි පහසුකම් යටතේ නඩු කටයුතු අවසන් කර ගැනීමේ හැකියාව ජනතාවට හිමි වෙයි.

# අඩු ආදායම්ලාභීන්ගේ ඉඩම් ධනවතුන් භුක්ති විඳිනවා

## මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ. ගමගේ

**අසේල කුරුළුවංශ**

රජයෙන් අඩු ආදායම්ලාභීන්ට බලපත්‍රවලින් දී තිබෙන ඉඩම් නීත්‍යානුකූල පවරා ගැනීමකින් තොරව ධනවතුන් භුක්ති විඳින බවත්, මාතලේ දිස්ත්‍රික්කයේ එවැනි ඉඩම් 250ක් පමණ තිබෙන බව හෙළිවී ඇති බවත් මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ. ගමගේ මහතා පවසයි.

ආණ්ඩුකාරවරයා මේ බව පැවැසුවේ අභ්‍යාසලාභී උපාධිධාරී සංවර්ධන නිලධාරීන් ලෙස රාජ්‍ය සේවයට එක්ව පුහුණුව අවසන් කළ 329 දෙනකු රජයේ ස්ථිර සේවයට එක් කර ගැනීම නිමිත්තෙන් පසුගියදා (15) ආණ්ඩුකාර කාර්යාලීය ශ්‍රවණාගාරයේ පැවති උත්සවයේදීය.



එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ආණ්ඩුකාරවරයා මෙසේ ද කීය.

'මේ ඉඩම්වලට කූට ලේඛන හරහා නීත්‍යායිනුකූල භාවයක් එක් කිරීමට ඇතැම් රාජ්‍ය සේවකයන්ගේ සහයෝගය ලැබෙනවා. ඒ සම්බන්ධයෙන් නීතිය දැඩිව ක්‍රියාත්මක කරනවා. කූට ලේඛන සකස් කර සීගිරියේ ඉඩමක් පවරා ගැනීමට ගත් උත්සාහය සම්බන්ධව පොලිසියෙන් ද විශේෂ පරීක්ෂණයක් ආරම්භ කර තිබෙනවා. නෑදෑ හිත මිත්‍රකම් දැන හැඳුනුම්කම් මත රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය නොවෙනස් විය යුතුයි.'

මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් ගාමිණී රාජරත්න මහතා ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

# ආරණ්‍යගත ස්වාමීන් වහන්සේලාට කැපකරු ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර සේවාවක්

**සන්ධ්‍යා කරුණාරත්න**

ආරණ්‍යගත ස්වාමීන් වහන්සේලා උදෙසා කැපකරු ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර සේවාවක් අලුතින් ආරම්භ කිරීමට දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය තීරණය කරයි.

ආරණ්‍ය සේනාසනවල භාවනානුයෝගීව වැඩ වෙසෙන ස්වාමීන් වහන්සේලා වෙත ගොස් ආයුර්වේද ප්‍රතිකාර සේවා දීම මේ වැඩපිළිවෙළෙන් සිදු කරයි. මේ නව වැඩපිළිවෙළ අම්බලන්ගොඩ, කහව ගල්දූව ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම ආරණ්‍ය සේනාසනයේදී දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ඇමැති නීතිඥ සිසිර ජයකොඩි මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (09) ආරම්භ කෙරිණි.



**අම්බලන්ගොඩ, කහව ගල්දූව ආරණ්‍ය සේනාසනාධිපති ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද කහගොල්ලේ සෝමවංශ ස්වාමීන් වහන්සේට ආයුර්වේද ප්‍රතිකාර දීම දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ඇමැති නීතිඥ සිසිර ජයකොඩි මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කළ අයුරු.**

දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයෙන් දීප ව්‍යාප්තව දීර්ඝ කාලීන ජංගම වෛද්‍ය සේවා වැඩසටහනක් ලෙස ආයුර්වේද දෙපාර්තමේන්තුව, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු, ආයුර්වේද රෝහල්, පළාත් පාලන ආයතන, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සම්බන්ධීකරණය කර ගනිමින් මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කෙරේ.

මේ වැඩපිළිවෙළේ සමාරම්භක අවස්ථාව සනිටුහන් කරමින් අම්බලන්ගොඩ, කහව ගල්දූව ආරණ්‍ය සේනාසනාධිපති ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද කහගොල්ලේ සෝමවංශ ස්වාමීන් වහන්සේට ආයුර්වේද ප්‍රතිකාර දීම සිදු කෙරිණි.

මේ අවස්ථාවට ආරණ්‍යගත ස්වාමීන් වහන්සේලා ඇතුළු දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් කුමාරි වීරසේකර, ආයුර්වේද කොමසාරිස් චතුර කුමාරතුංග, දකුණු පළාත් ආයුර්වේද කොමසාරිස් සී. එල්. ගුරුගේ, හම්බන්තොට චමල් රාජපක්ෂ පර්යේෂණ රෝහල් අධ්‍යක්ෂ ලක්මී වරුෂවිතාන මහත්ම මහත්මීහු සහභාගී වූහ.

# මහජන නියෝජිතයන් සිය තනතුරේ ගෞරවය රැකෙන පරිදි කටයුතු කළ යුතුයි

## ගලේවෙල ප්‍රාදේශීය සභාවේ සභාපති ඇම්. පී. ආර්. ජයතිලක

**මාතලේ දිස්ත්‍රික් සමූහ**

'පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන් රජයේ කුමන හෝ ස්ථානයක සිය තනතුරේ ගෞරවය රැකෙන පරිදි කටයුතු කිරීමට සිතා ගත යුතුයි. අද වන විට එදා මහජන නියෝජිතයන්ට හිමිව තිබූ එම තත්ත්වය හෑල්ලුවට ගොස් තිබීම කනගාටුවට කරුණක්. එයට ප්‍රධානතම හේතුවවී ඇත්තේ පසුගිය පාලන සමයේදී පැවති පළාත් පාලන ආයතන මැතිවරණයෙන් පසු බෝනස් මන්ත්‍රීවරුන් පත් කිරීමයි. එනිසා මේ බෝනස් මන්ත්‍රී ක්‍රමය මීළඟ මැතිවරණයේදී වෙනස් විය යුතුයි.' යනුවෙන් ගලේවෙල ප්‍රාදේශීය සභාවේ සභාපති ඇම්. පී. ආර්. ජයතිලක මහතා පැවැසීය.



සභාපතිවරයා මෙසේ සඳහන් කළේ ටී. බී. තෙන්නකෝන් ගුණානුස්මරන ශාලාවේ පැවති ගලේවෙල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේ මුලසුන හොබවමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ සභාපතිවරයා මෙසේ ද කීය.

'පළාත් පාලන ආයතන සඳහා නව බෝනස් මන්ත්‍රීවරුන් පත් කිරීම පිළිබඳ පළාත් පාලන පනතට කිසිවක් ඇතුළත්වී නෑ. හිටපු අග්‍රාමාත්‍යවරියක් වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය වරක් පළාත් පාලන මහජන නියෝජිතයන් කොළඹට කැඳවූ මොහොතේ මා ද එයට සහභාගි වුණා. එම අවස්ථාවේදී මැතිනිය අපගේ තනතුරු පවත්වාගෙන යෑම පිළිබඳ නොයෙකුත් උපදෙස් දුන්නා. එහිදී එතුමිය පැවැසුවේ මේ නියෝජිතයන් අතර විවිධ තරාතිරමේ පුද්ගලයන් සිටිය හැකි බවයි.

සමාජයේ කුමන මට්ටමක සිටියත් මහජන නියෝජිතයකු සිය තත්ත්වය මෙන්ම ඔහුට පැවරෙන වගකීම ගැන මනා අවබෝධයක් ගත යුතුයි. එපමණක් නොව, සිය සේවා ඉටු කරවා ගැනීමට රාජ්‍ය ආයතනවලට මෙන්ම වෙනත් තැන්වලට යෑමේදී නොපැකිලව අදාළ නිලධාරීන් සමඟ තම ගෞරවය ද රැකගෙන කටයුතු කළ යුතු බව එතුමිය එදා පැවැසුවා. නමුත් වර්තමානයේ එම තත්ත්වය මේ පළාත් පාලන මන්ත්‍රීවරුන්ගෙන් ගිලිහී ගොස් තිබෙනවා.

පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන්ට එවැනි තත්ත්වයක් හිමි කරදී ඇත්තේ ඇතැම් මන්ත්‍රීවරුන් විසින්මයි. මන්ත්‍රීවරුන්ගේ මේ හැසිරීම නිසා පළාත් පාලන පනතට අනුව අපේක්ෂිත සේවාවන් කිරීම අපහසුවී තිබෙනවා. එනිසා මහජන නියෝජිතයන් තම තමන්ගේ ගෞරවය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමට අදිටන් කර ගත යුතුයි.

**ඡායාරූපය - මාතලේ දිස්ත්‍රික් සමූහ**




**ග්‍රාමීය ප්‍රදේශවල වෘත්තීය පුහුණුව ලැබූ අය ව්‍යාවසායකයන් ලෙස ශක්තිමත් කිරීම අරමුණු කර ගත් උපදේශන වැඩසටහනක් තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පසුගියදා පැවති අතර එහිදී ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති සම්පත් අතුකෝරළ මහතා වෘත්තීය පුහුණුව ලැබූවකුට සහතික පත්‍ර ප්‍රදානය කළ අයුරු. වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපති දමිත වික්‍රමසිංහ, තවලම ප්‍රාදේශීය සභාවේ සභාපති වෛද්‍ය බන්දුල විජේසේකර මහත්වරු මේ අවස්ථාවට සහභාගී වූහ.** *ඡායාරූපය - හිනිදුම සමූහ*

# වවුනියාව කංජිවේරුමුට්ටෙයිහි විශාල වන විනාශයක් සිදු වෙනවා

## පාර්ලිමේන්තු මන්ත්‍රී කුලසිංහම් දිලීපන්



**උතුරු පළාත් විශේෂ**
**රසුල දිල්හාර ගමගේ**

වවුනියාව කංජිවේරුමුට්ටෙයි ප්‍රදේශයේ විශාල වශයෙන් වන සංහාරයක් සිදුව ඇතැයි වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී (ඊ.පී.ඩී.පී.) කුලසිංහම් දිලීපන් මහතා පැවැසීය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'ගම්වාසීන් කළ පැමිණිල්ලකට මා එම ගම්මානයට ගොස් තොරතුරු විපරම් කිරීමේදී කුඹුක් ඇතුළු දැව විශාල ප්‍රමාණයක් කපා ඇති බව හෙළි වුණා. කපන ලද දැව කඳන් විශාල ප්‍රමාණයක් රැගෙන ගොස් තිබෙනවා. තවත් එසේ රැගෙන යෑමට සූදානම් කර තිබූ දැව කඳන් තොගයක් ද තිබුණා.

යුද්ධයෙන් පසුව ජනතාව යළි පදිංචි කළ ගම්මානයක් මේ. නමුත් මේ ගම්මානය සංවර්ධනයට පසුගිය යහපාලන රජය මූලික පියවරක් හෝ ගෙන නෑ. ගම්මානයේ වැසියන්ගෙන් වැඩි පිරිසකට නිවාස නැති නිසා ඔවුන් පැල්පත්වල ජීවත් වෙනවා.

**ඡායාරූපය**
**උතුරු පළාත් විශේෂ**

# රජයේ වියදමින් කලාකරුවකුට රක්ෂණයක් දුන් පළමු අවස්ථාවයි

## අගමැති කියයි



**'ප්‍රේක්ෂා' රක්ෂණය වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයට අලුත් පරිච්ඡේදයක්**

**කොවිඩ් වසංගතය හමුවේ සියලු කලාකරුවන්ගේ ජීවිත නඟාසිටුවීමට සහන පොලියට ලක්ෂ 5ක ණයක් දුන්නා**

**නාට්‍යවේදීන් 500කට රජයේ සම්පූර්ණ ප්‍රතිලාභ**











ගාමිණී ජයලත්, වසන්ත විට්ටච්චි, ශ්‍රියන්ත මෙන්ඩිස්, ලයනල් ගුණතිලක, නීතිඥ ඩග්ලස් සිරිවර්ධන ප්‍රේක්ෂා රක්ෂණ ප්‍රතිලාභ අගමැතිවරයා අතින් ලබා ගනිමින්.



විජයරත්න වරකාගොඩ, රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක, චිත්‍රා වරකාගොඩ



අගමැතිවරයා 'ප්‍රේක්ෂා' රක්ෂණ ඔප්පුවක් කියවමින්



උලෙළට පැමිණි කලාකරුවෝ

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලාංකේය වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයට නව පරිච්ඡේදයක් එක්කරමින් වේදිකා නාට්‍ය කලාකරුවන් වෙනුවෙන් රජයේ වියදමින් රක්ෂණාවරණයක් ලබාදෙන්නේ ඉතිහාසයේ පළමු වරට බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා පැවසීය.

එය සුවිශේෂී රක්ෂණාවරණයක් බව පෙන්වා දුන් ඒ මහතා රෝගාබාධයක දී ලබා ගන්නා ප්‍රතිකාර මෙන්ම රෝහලක නැවතී ලබා ගන්නා ප්‍රතිකාර සඳහා, ද මේ මගින් ප්‍රතිලාභ හිමිවන බවත් රජය රක්ෂණ වියදම් ගෙවා මෙම රක්ෂණාවරණය ලබා දෙන බවත් කීවේය.

අගමැතිවරයා මේ බව සඳහන් කළේ වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයේ කලාකරුවන් වෙනුවෙන් "ප්‍රේක්ෂා" හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය ප්‍රදානය කිරීම වෙනුවෙන් අරලියගහ මන්දිරයේ දී පෙරේදා (16) පස්වරුවේ පැවැති සමාරම්භක අවස්ථාවට එක් වෙමිනි.

එහිදී වැඩි දුරටත් අදහස් පළ කළ අගමැති මහින්ද රාජපක්ෂ මහතා- මා සභාපතීත්වය දරන ටවර් හෝල් රඟහල පදනම ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාව පිළිබඳ, නාට්‍යවේදීන් පිළිබඳ කටයුතු කරන අන්තර්ජාතික නාට්‍ය ආයතනයේ ශ්‍රී ලංකාවේ නියෝජිතත්වය දරන ආයතනයක්. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සමස්ත ලෝකවාසීන් මහා ව්‍යසනයකට ගොදුරුව ඇති අවස්ථාවක සියලු කලා මාධ්‍යයන්හි නියුතු ශිල්පීන් සහ එම කලා මාධ්‍ය දැඩි අර්බුදයකට ලක්ව තිබුණා. එවැනි අවස්ථාවක ශ්‍රී ලාංකේය කලාකරුවන්ගේ ඉල්ලීම සලකා බලමින් ඔවුන්ගේ ජීවිත නඟාසිටුවීම සඳහා සහන පොලියක් මත රුපියල් ලක්ෂ 5ක ණය මුදලක් ලබා දීමට අපට හැකිවීම පිළිබඳ මා සතුටු වනවා.

### 'ප්‍රේක්ෂා' රක්ෂණය

- අභාවයකට ලක්ෂ 2යි
- හදිසි අනතුරකින් වන මරණයකදී ලක්ෂ 6ක්
- පූර්ණ කාලීන ආබාධිත ලක්ෂ 4යි
- අසාධ්‍ය රෝග ලක්ෂ 3යි
- රෝහල්ගත වීමකදී වසරකට උපරිම 150,000යි
- බාහිර රෝගී අංශ ප්‍රතිකාර වසරකට 15,000යි

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ටෙලි නාට්‍ය රූගත කිරීම් නැවතී තිබුණු අවස්ථාවේ නිරෝධායන නීති රීති සහ සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට යටත්ව ටෙලි නාට්‍ය රූගත කිරීම සඳහා අප අවස්ථාව ලබා දුන්නා.

එම හේතුවෙන් එම ටෙලි නාට්‍ය අඛණ්ඩව රූගත කිරීමට අවස්ථාව ඔවුන්ට උදා වුණා. මෙම කොවිඩ් අර්බුදය හමුවේ වේදිකා නාට්‍යවේදීන්ට තම නාට්‍ය නිර්මාණ වේදිකාගත කිරීමට අවස්ථාවක් ලැබුණේ නැහැ. ඔවුන්ගේ ප්‍රේක්ෂකයන් රංග ශාලාවලින් ඈත්ව සිටින අවස්ථාවක ටවර් හෝල් රඟහල පදනමෙන් සංවිධානය කළ ප්‍රේක්ෂා රංගකලා මහෝත්සවය තුළින් නාට්‍යවේදීන්ට, රංගන ශිල්පීන්ට මෙන්ම ප්‍රේක්ෂකයන්ට, තම ජීවිත යථා තත්ත්වයට පත් කර ගැනීමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණයක්. ඒ තුළින් නාට්‍ය කලාවේ නව පිබිදීමක් ඇති වුණා කියා ඔබ සියලු දෙනා දන්නවා. දෙවන කොවිඩ් වසංගතය හමුවේ, නැවත් සියලු කලාවන් බිඳ වැටුණු අවස්ථාවක ඔවුන්ගේ ජීවන තත්ත්වයන් ඉතා පහත් තත්ත්වයන්ට බිඳ වැටුණා. එවැනි අවස්ථාවක මෙම ප්‍රේක්ෂා රක්ෂණාවරණය හඳුන්වා දෙමින් නාට්‍යවේදීන් 500 දෙනකු සඳහා රජයේ සම්පූර්ණ වියදමින් මෙම රක්ෂණාවරණය අප හඳුන්වා දුන්නා.

රජය රක්ෂණ වියදම් ගෙවා ලබාදෙන මෙම ප්‍රේක්ෂා රක්ෂණාවරණය ලබා දෙන්නේ ලංකා ඉතිහාසයේ පළමුවතාවටයි. එය සුවිශේෂී රක්ෂණාවරණයක්. රෝගාබාධයක දී ලබා ගන්නා ප්‍රතිකාර මෙන්ම රෝහලක නැවතී ලබා ගන්නා ප්‍රතිකාර සඳහා, ද මේ මගින් ප්‍රතිලාභ හිමි වනවා. හදිසි මරණයකදී ඔවුන්ට විශේෂිත සහනයක් ලබා දෙන මෙම රක්ෂණාවරණය, සුවිශේෂී රක්ෂණාවරණයක්. මේ තුළින් රැකවරණයක් ලබා ගනිමින් ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාව පෝෂණය කිරීමට ඔබට ශක්තිය ධෛර්යය හා නිරෝගී සුවය ලැබේවායි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරනවා. එමෙන්ම මෙම ප්‍රේක්ෂා රක්ෂණාවරණය ලබාදීම සඳහා මූලිකව කටයුතු කළ ජාතික උරුම, ප්‍රසංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී, ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මැතිතුමාටත්, එතුමාගේ අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයටත්, ටවර් හෝල් රඟහල පදනමේ භාරකාර මණ්ඩලයේ සියලුම සාමාජික සාමාජිකාවන්ටත්, ටවර් හෝල් රඟහල පදනමේ කාර්යය මණ්ඩලයේ සියලු දෙනාටත්, මෙම රක්ෂණාවරණය ලබා දෙන ජන ශක්ති ආයතනයටත් මාගේ ස්තූතිය පළ කරනවා.

ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සහ ටවර් හෝල් රඟහල පදනම එක්ව සංවිධාන කළ මෙම "ප්‍රේක්ෂා" හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය ප්‍රදානය "ජනශක්ති" රක්ෂණ සමාගම ඔස්සේ ක්‍රියාත්මක වේ. ඒ අනුව සාමාජිකයකුගේ අභාවයක දී රුපියල් ලක්ෂ දෙකක්, හදිසි අනතුරකින් වන මරණයක දී රුපියල් ලක්ෂ හයක්, පූර්ණ කාලීන ආබාධිත තත්ත්වයක දී රුපියල් ලක්ෂ හතරක්, අසාධ්‍ය රෝග ආවරණයක් වෙනුවෙන් රුපියල් ලක්ෂ තුනක්, මුදල් රහිත රෝහල්ගත වීමේ ප්‍රතිලාභය වසරකට උපරිම රුපියල් එක්ලක්ෂ පනස් දහසක්, බාහිර රෝගී අංශ ප්‍රතිකාර සඳහා වසරකට රුපියල් පහළොස් දහසක් දක්වා මුදල් රක්ෂණාවරණයකට මෙමගින් හිමිකම් ලැබේ.

ශ්‍රී ලංකා කලා මණ්ඩලය ප්‍රකාශිත "කලා සඟරාව" හා "බුද්ධ ප්‍රතිමා නිර්මාණ කලාව" කෘතීන්හි මුල් පිටපත් මෙහි දී ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපති මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ මහතා අගමැති මහින්ද රාජපක්ෂ මහතාට පිරිනැමුවේය.

"ප්‍රේක්ෂා" හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය ප්‍රදානය කිරීම සංකේතවත් කරමින් වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කලාකරුවන් වෙනුවෙන් අගමැතිවරයා අතින් මෙහි දී සංකේතාත්මකව රක්ෂණාවරණ හිමිකම් ඔප්පු ප්‍රදානය කෙරිණි.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ උප සභාපති පාතේගම ඥාණිස්වර ස්වාමීන් වහන්සේ මෙම උත්සව සභාවට වැඩම කළහ.

ජාතික උරුමයන් ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක, අගමැති ලේකම් ගාමිණී සෙනරත්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන, රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් කේ. ඒ සී. ආර්. නිශාන්ති ජයසිංහ, ටවර් හෝල් රඟහල පදනමේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ ඩග්ලස් සිරිවර්ධන, ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපති මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ, ජනශක්ති රක්ෂණ ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී රවී ලියනගේ මහත්වරු අමාත්‍යාංශ නිලධාරීන් ටවර් හෝල් රඟහල පදනමේ සාමාජිකයෝ, ජනශක්ති රක්ෂණ ආයතනයේ නිලධාරීහු සහ වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයේ කලාකරුවෝ රැසක් මෙම අවස්ථාවට සහභාගි වී සිටියහ.



ප්‍රවීණ කලාකරු බන්දුල විජේවීරගෙන් මධුර ගීතයක්



මහාචාර්ය ජයසේන කෝට්ටෙගොඩ මහතා රචිත ග්‍රන්ථය අගමැතිවරයාට පිරිනමමින්.



කුසුම් රේණු, රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක, ශ්‍රියන්ත මෙන්ඩිස්.





'ප්‍රේක්ෂා' රක්ෂණ ආවරණය කලාකරුවන්ට ලබාදීමට වෙහෙස මහන්සි වූ 'ටවර් රඟහල පදනම' නිලධාරී මඬුල්ල

ඡායාරූප - උපුල් නිශාන්ත



# පර්යේෂණාත්මක ග්‍රන්ථය ජනගත කිරීම ජනපති ප්‍රධානත්වයෙන්

කපිලවස්තුපුර ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා පිළිබඳ තොරතුරු ඇතුළත් 'කපිලවස්තුපුර ශ්‍රී සර්වඥ ධාතු පුරාණය හා රාජගුරු වස්කඩුවේ ශ්‍රී සුභූති මාහිමි' පර්යේෂණාත්මක ග්‍රන්ථය ජනගත කිරීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ, බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී ඊයේ (17දා) සිදු කෙරුණු අතර අමරපුර ශ්‍රී සම්බුද්ධ ශාසනෝදය මහා සංඝ සභාවේ මහානායක වස්කඩුවේ මහින්දවංශ නාහිමියන් අතින් ජනාධිපතිවරයා වෙත ග්‍රන්ථය පිළිගැන්වීම සහ වෙබ් අඩවිය නිල වශයෙන් විවෘත කළ අයුරු.

ඡායාරූපය - සුලෝචන ගමගේ

## ජිනීවා යෝජනාවට සහාය දෙන

# ශ්‍රී ලංකාවට එරෙහි රටවල් 28කට ඡන්දය නැහැ

## විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් අද්මිරාල් ජයනාත් කොළඹගේ



**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාවට එරෙහිව ජගත් මානව හිමිකම් කවුන්සිලය වෙත ඉදිරිපත් කළ යෝජනාවට සහාය දැක්වූ රටවල් 40ක් අතුරින් ඡන්ද බලය ඇත්තේ රටවල් 12 කට පමණක් බව විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් අද්මිරාල්, මහාචාර්ය ජයනාත් කොළඹගේ මහතා ප්‍රකාශ කරයි.

බොහෝ රටවල් ඉන්දියාවේ පියවර දෙස බලා සිටිය ද, මෙම තීරණාත්මක අවස්ථාවෙහි දී ඉන්දියාව සිය සහයෝගය ශ්‍රී ලංකාවට දෙනු ඇතැයි අපේක්ෂා කරන බව පෙන්වා දෙන ලේකම්වරයා ජිනීවාහි පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල සැසි වාරයේ දී ශ්‍රී ලංකාවට අගතියක් වීමට ඉඩ නොදෙන බවට ඉන්දියාව සහතික වූ බවද කියා සිටී.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දී පැවැති අන්තර්ජාල සාකච්ඡාවක් සඳහා එක්වෙමින් ඒ මහතා මේ බව සඳහන් කළේය.

ඉන්දියාවට අමතරව ශ්‍රී ලංකාවට එරෙහිව එක්සත් ජාතීන්ගේ යෝජනාවේ දී පාකිස්තානය, බංග්ලාදේශය සහ නේපාලය යන රටවල් සහාය ද ශ්‍රී ලංකාවට අවශ්‍ය බව පෙන්වා දුන් ලේකම්වරයා මෙවර කවුන්සිල සැසි වාරයේ දී ශ්‍රී ලංකාව වෙනුවෙන් රටවල් 21ක් පෙනී සිටින බවත් ඒ අතර චීනය, රුසියාව, පාකිස්ථානය ඇතුළු බලවත් රාජ්‍යයන් ද වන බවද පැවසීය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරිය විසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධයෙන් වන වාර්තාවක් එම කවුන්සිලය තුළ සභාගත කිරීමෙන් පසුවත් මෙලෙස රටවල් රැසක් ලංකාවට සහාය දැක්වීම ශ්‍රී ලංකා රජය ලැබූ ජයග්‍රහණයක් බවද හෙතෙම සඳහන් කළේය.

ශ්‍රී ලංකාවේ භෞමික ස්වෛරීභාවය රැක ගැනීම වෙනුවෙන් ඉන්දියාවේ එම ස්ථාවරය බෙහෙවින් අගය කරන බව සඳහන් කළ ජයනාත් කොළඹගේ මහතා දැනට ක්‍රියාත්මක විවිධ ද්විපාර්ශ්වික වැඩසටහන් හරහා පාකිස්තානය සිය සහයෝගය ප්‍රකාශ කර ඇති නමුත් ඉන්දියාව මේ වන විටත් මධ්‍යස්ථ ප්‍රවේශයක් පවත්වා ගෙන යන බවද පැවසීය.

විදේශ අමාත්‍යාංශ ලේකම් අද්මිරාල් ජයනාත් කොළඹගේ මහතා සඳහන් කළේ අපේරල් මාසයේ තමිල්නාඩුවේ මැතිවරණය ඇතුළු විවිධ හේතු නිසා ඉන්දියාව මේ වන විට මධ්‍යස්ථව සිටින බවයි. කෙසේ වෙතත්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ශ්‍රී ලංකාවේ භෞමික ස්වෛරීභාවය ආරක්ෂා කිරීමට ඉන්දියාව පොරොන්දු වී ඇති බවද හෙතෙම කියා සිටී.

# සරසවි විවෘත කිරීම ගැන මේ සතියේ සාකච්ඡාවක්

**සිතාරා සේනානි**

විශ්වවිද්‍යාල නැවත ආරම්භ කිරීමට සුදුසු තත්ත්වයක් පවතින්නේදැයි යන්න සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ ලබන සතිය මුල සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා පවසයි.

පවතින තත්ත්වය හමුවේ විශ්වවිද්‍යාල නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් මත පමණක් බවත් ඒ මහතා අවධාරණය කරයි.

විශ්වවිද්‍යාල නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් දිනමිණ කළ විමසුමකදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා මේ බව සඳහන් කළේය.

ඇතැම් විශ්වවිද්‍යාලවල සිසුන් හත්දහස් පන්සීයයක්, නව දහසක් පමණ නේවාසිකාගාරවල සිටින බවත්, ඒවායේ පාවිච්චි කිරීමට ඇති පහසුකම් සියල්ල පොදු පහසුකම් බවත් පැවසූ සභාපතිවරයා, කොවිඩ් රෝගයට අත වනන තැන් අතර ප්‍රධාන තැනක් ගන්නේ පොදු පහසුකම් බැවින් විශ්වවිද්‍යාල විවෘත කිරීමේදී ඒ කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු බවද සඳහන් කළේය.

පාසලකට වඩා විශ්වවිද්‍යාලය වෙනස් බවද කන්කසන්තුරේ සිසුවාත්, කතරගම සිසුවාත් එහි අධ්‍යාපනය ලබන බවද පැවසූ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා, ඔවුන්ට අනිවාර්යයෙන් ම පොදු පහසුකම් දිය යුතු බවද පෙන්වා දුන්නේය.

සිසුන් හැටදෙනකු පමණ එක් වී විශ්වවිද්‍යාල නැවත විවෘත කරන ලෙස ඉල්ලා කෑගැසුවේ යැයි කියා දැවැන්ත වැඩපිළිවෙළක් පසෙකට දමා වැඩේ කළ නොහැකි බවද ඒ මහතා අවධාරණය කළේය.

ලෝකයේ කිසිම රටක විශ්වවිද්‍යාල විවෘත කර නැති බවත්, එයට හේතුව පහසුකම් පිළිබඳ ගැටලුව බවත් පෙන්වා දුන්නේය. එසේම, විශ්වවිද්‍යාල විවෘත කිරීමේදී සිසුන්ගේ මෙන්ම, ආචාර්යවරුන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් ද එකසේ අවධානය යොමු කළ යුතුව ඇතැයි ද පැවසීය.

අතීතයේ විශ්වවිද්‍යාල වසා දැමූ විට සිසුන්ට දේශන අහිමි වුවද, අද තත්ත්වය ඊට වෙනස් බවත්, අද විශ්වවිද්‍යාල තුළ පන්ති නොපැවැත්වුණත්, මේ මොහොතේ ද මාර්ගගත ක්‍රමය ඔස්සේ දේශන අඛණ්ඩව පැවැත්වෙන බවත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.



## සිසුන්ගේ සහායට නිහඬ විරෝධතාවක්

අපොස (උ/පෙළ) කඩ ඉම් ලකුණු ගැටලුව නිසා අසාධාරණයක් සිදු වූයේ යැයි පවසමින් තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ එම විභාගයට පෙනී සිටි සිසුන් විසින් ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඊයේ (17දා) කොළඹ අලුත්කඩේ ශ්‍රේෂ්ඨාධිකරණයේදී කැඳවිණි.

ශ්‍රේෂ්ඨාධිකරණයේදී ඉදිරිපිටදී එයට සහාය පළ කරමින් සිසු ජන ව්‍යාපාරය නිහඬ විරෝධතාවක නිරත වූ අයුරු.

## දුම්රිය වර්ජනය අත්හිටුවයි

**සුභාෂිණී සේනානායක**

දුම්රිය රියැදුරන් සහ නියාමකවරුන් ඊයේ (17දා) මධ්‍යම රාත්‍රියේ සිට ආරම්භ කිරීමට නියමිතව තිබූ දුම්රිය වැඩ වර්ජනය අත්හිටු වීමට තීරණය කළ බව දුම්රිය රියැදුරු සංගමයේ ලේකම් ඉන්දික දොඩංගොඩ මහතා පැවසීය.

# ව්‍යාජ ඡායාරූපයක් සැකසූ ප්‍රාදේශීය සභා මන්ත්‍රී තවදුරටත් රිමාන්ඩ්

**සිරන්ජනි කුමාරි**

ව්‍යාජ ඡායාරූප සකස් කර අන්තර්ජාලයට මුදා හැරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කර සිටි මාතලේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු ලබන 23 දින දක්වා තවදුරටත් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් බුද්ධික ශ්‍රී රාගල මහතා ඊයේ (17දා) නියෝග කළේය.

මාතලේ ප්‍රාදේශීය සභාවේ හිටපු උප සභාපති ස්වාධීන මන්ත්‍රී යටවත්ත මාතලේ පදිංචි මලල බණ්ඩාර ඒකනායක යන අය මෙලෙස රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණි.

පාස්කු ඉරිදා ප්‍රහාර මාලාවට සම්බන්ධ බෝම්බකරුවන්ගේ ඡායාරූප හා ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ ඡායාරූප එකතු කර ව්‍යාජ ඡායාරූප සකසා අන්තර්ජාලයට මුදා හැරි බව කියන සිද්ධිය සම්බන්ධයෙන් වූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම සැකකරු අත්අඩංගුවට ගෙන අධිකරණය හමුවේ ඉදිරිපත් කර තිබිණි.

සැකකරු වෙනුවෙන් නීතිඥ ගුණරත්න වන්නිනායක හා නීතිඥ උපුල් ජයසූරිය යන මහත්වරුන් අධිකරණය හමුවේ පෙනී සිටි අතර සැකකරුට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනා ගොනු කර ඇති බවත් මෙකී වරදට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අදාළ වන්නේ කෙසේ ද යන්න අධිකරණය හමුවේ ප්‍රශ්න කළේය.

මහේස්ත්‍රාත්වරයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මේ වරද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතට අදාළ වන්නේ කෙසේදැයි ප්‍රශ්න කර සිටියේය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් නිසි පිළිතුරක් නොදීම මත ඉදිරි දින මේ සම්බන්ධයෙන් කරුණු වාර්තා කරන ලෙස මහේස්ත්‍රාත්වරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත නියෝග කළේය. පාස්කු ඉරිදා ප්‍රහාර මාලාවට සම්බන්ධ බෝම්බකරුවන්ගේ ඡායාරූප හා ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ ඡායාරූප එකතු කර ව්‍යාජ ඡායාරූප සකසා අන්තර්ජාලයට මුදා හැරි බව සඳහන් කරමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සැකකරුට එරෙහිව චෝදනා ගොනු කර තිබිණි.

## හිටපු නි. නගරාධිපති ඇවිත් නෑ

# කොළඹ එජාප නාගරික මන්ත්‍රීවරු රහසේ සජිත් හමු වෙති

**මැදකොළඹ සමූහ - ආරියරත්න ගණේගොඩ**

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාගේ ඉල්ලීම මත කොළඹ මහනගර සභාවේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් පිරිසක් පසුගිය (12දා) පස්වරුවේ ඇතුල්කෝට්ටේ පිහිටි සමඟි ජන බලවේග කාර්යාලයේදී සාකච්ඡාවක් පවත්වා තිබේ.

මෙම සාකච්ඡාව සඳහා පාලක පක්ෂයේ සංවිධායක යූ.එල්. ටයිටස් පෙරේරා, ඒ.එම්. සරත් ඩින්, කිත්සිරි රාජපක්ෂ, දුමින්ද ආටිගල යන මන්ත්‍රීවරු එම සාකච්ඡාවට සහභාගීව නැතැයි වාර්තා වෙයි.

# ධනුනගේ තහනම් ගිණුම්වල විමර්ශන වාර්තා උසාවිය ඉල්ලයි

**සුභාෂිණී සේනානායක**

යුද හමුදාවට ආම්පන්න සැපයීමේදී අක්‍රමිකතා කළ බවට චෝදනා කරමින් හිටපු යුද හමුදාපති සරත් ෆොන්සේකා මහතාගේ බෑනා වන දනුන තිලකරත්නට එරෙහිව පවරා තිබූ නඩුවට අදාළව කොටුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් අත්හිටුවා ඇති බැංකු ගිණුම් 6ට අදාළව කළ විමර්ශනවලට අදාළ අවසන් වාර්තාවක් ලබන අප්‍රේල් මස 21 වැනිදාට පෙර අධිකරණයට ඉදිරිපත් කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ (17) නියෝග කළේය.

## ලොවින් සමු ගන්නා උතුම් මිනිසා හේමචන්ද්‍ර හේවාවිතාරණ



ස්වාර්ථ සාධනය පිණිස මුළු දිවියම ගෙවන මිනිසුන් වසන ලොවෙහි පරාර්ථ සාධනය පිණිස කැපව ගන්නෝ දුර්ලභය. වසර 89ක දිගු දිවි ගමනෙකින් පසු අද අපගෙන් සමුගන්නා හේමචන්ද්‍ර හේවාවිතාරණ මහතා එබඳු දුර්ලභ සත්පුරුෂයෙකි. එතුමාගේ ජීවිතයෙන් වැඩි කොටස ගෙවුණේ සමාජ සේවාව පිණිසමය.

1932 දී කොළඹදී උපන් හේවාවිතාරණ මහතාට තම පියා දුගී දුප්පතුනට උදව් කරන අයුරු දැක සමාජ සේවාව පිණිස ඇල්මක් ඇති විය. තැපැල් දෙපාර්තමේන්තුවේ සේවකයකු වූ හෙතෙම පරම විඥානාර්ථ බෞද්ධ සමාගමය, සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය, ලංකා මහාබෝධි සමාගම, තරුණ බෞද්ධ සංගමය, අමද්‍යප සභාව ආදී බෞද්ධ සංවිධාන ගණනාවෙක උසස් නිලතල හෙබවීය. පරම විඥානාර්ථ බෞද්ධ සමාගමයේ ලේකම් වූ හේවාවිතාරණ මහතා බෞද්ධ සම්මේලනයේ ද අමද්‍යප මහා සභාවේ ද උප සභාපති තනතුරු හෙබවීය.

තුරුණු වියේ සිටම කාව්‍යකරණයෙහි යෙදුණු හෙතෙමේ අගනුවර තරුණ කවි සමාජය, සමස්ත ලංකා සිංහල කවි සම්මේලනය. අගනුවර රජිත හවුල ආදියේ ඉදිරිම පෙළේ සාමාජිකයෙක් විය. ද්විභාෂිත උගතකු වූ හෙතෙමේ චතුර කථිකයෙක් ද විය. එමෙන්ම 'ගුවන්විදුලියේ' නිපුණ හඬ නළුවකු වූ හෙතෙම 'මුවන්පැලැස්සේ' පිංචා මාමා, 'වජිරා' නාට්‍යයේ වජිරාගේ පියා ආදී ජන හද දිනූ චරිත ගණනාවකට සිය හඬින් පණ දුන්නේය.

දිගු කලක් නවසීලන්තයේ විසූ හේමචන්ද්‍ර හේවාවිතාරණ මහතාගේ අවසන් කටයුතු අද (18) හැමිල්ටන් නගරයේදී සිදු කැරේ.

**ශ්‍රීනාත් ගණේවත්ත**

# ශානිගේ පෙත්සමට විරෝධතා ගොනු කරන්නැයි නියෝග

**නෙල්කා මැදගෙදර**

හිටපු නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන මහතා ඇතුළු විත්තිකරුවන්ට එරෙහි නඩුවකට අදාළව බොරු සාක්ෂි සෑදූ බවට සැක පිට අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර සිටින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර මහතා ඇප මත මුදා හරින ලෙස ඉල්ලා ගොනු කර ඇති ප්‍රතිශෝධන පෙත්සම සම්බන්ධ විරෝධතා ලබන අප්‍රේල් මස 29 දින හෝ ඊට පෙර ගොනු කරන ලෙස නීතිපතිවරයා ඇතුළු වගඋත්තරකරුවන්ට අභියාචනාධිකරණය ඊයේ (17) නියම කළේය. එම ප්‍රතිශෝධන පෙත්සම සලකා බැලූ අවස්ථාවේදී නිශ්ශංක බන්දුල කරුණාරත්න සහ ආර් ගුරුසිංහ යන අභියාචනාධිකරණ විනිසුරු මඬුල්ල විසින් මේ නියෝගය කරන ලදි.

එහිදී පෙත්සම්කාර ශානි අබේසේකර මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ විරාන් කොරයා මහතා සඳහන් කළේ සිය සේවාදායකයා මේ වන විට රෝගාබාධ කිහිපයකින්ම පෙළෙන බවය.

මේ නිසා සෞඛ්‍යමය හේතූන් මත ඔහුගේ ජීවිතය තර්ජනයකට ලක්ව ඇති බවද ඒ මහතා කීය.

යම් පුද්ගලයකු රිමාන්ඩ් භාරයට පත් කිරීම දඬුවමක් ලෙස සැලකිය යුතු නැතැයිද හෙතෙම කීය. මේ පෙත්සම ඉතා වැදගත් හදිසි කරුණු මත ගොනු කර ඇති අතර කඩිනමින් අධිකරණයේ අවධානය ඊට යොමු විය යුතු බව සඳහන් කළ ඒ මහතා තව දුරටත් කල් දැමීමකින් තොරව පෙත්සම ආසන්නම දිනයක කැඳවන ලෙස ඔහු අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

ඒ අනුව පෙත්සම් ලබන අප්‍රේල් මස 29 වැනිදා කැඳවීමට නියම කෙරිණ.

හිටපු නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන මහතා ඇතුළු විත්තිකරුවන් පිරිසකට එරෙහිව ගොනු කර තිබූ නඩුවකට අදාළව අසත්‍ය සාක්ෂි නිර්මාණය කළේ යැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් සැක පිට ශානි අබේසේකර සහ සුගත් මෙන්ඩිස් යන මහත්වරුන් අත්අඩංගුවට ගැනීමෙන් පසු ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණය මඟින් රක්ෂිත බන්ධනාගාරගත කර තිබිණි.

## එස්අයිගේ ඇප ඉල්ලීමට කරුණු දක්වන්න

# නීතිපතිට නොතීසි

**නෙල්කා මැදගෙදර**

දැනට රක්ෂිත බන්ධනාගාරගත කර සිටින තමන් ඇප මත මුදා හරින ලෙස ගම්පහ මහාධිකරණයෙන් කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක සුගත් මෙන්ඩිස් මහතා ගොනු කර ඇති ප්‍රතිශෝධන පෙත්සම පිළිබඳ කරුණු දැක්වීමට ලබන අප්‍රේල් මස පළමු වැනිදා අධිකරණයේ පෙනී සිටින ලෙස අභියාචනාධිකරණය ඊයේ (17දා) නීතිපතිවරයාට නොතීසි නිකුත් කළේය.

නිශ්ශංක බන්දුල කරුණාරත්න සහ ආර්. ගුරුසිංහ යන අභියාචනාධිකරණ විනිසුරු මඬුල්ල හමුවේ එම ප්‍රතිශෝධන පෙත්සම කැඳවන ලදී.

එහිදී පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥ චමින්ද අතුකෝරළ මහතා සඳහන් කළේ සිය සේවා දායකයා මාස හතකට ආසන්න කාලයක් රක්ෂිත බන්ධනාගාර ගත කර සිටින බවය. අපරාධ විමර්ශන කොට්ඨාස නිලධාරීන් සිය සේවා දායකයාට විවිධ බලපෑම් සිදු කරන බව ද ඒ මහතා කීය. ඔහු ගම්පහ අධිකරණයට රහසිගතව ප්‍රකාශයක් දී ඇති බව ද ඔහු සඳහන් කළේය.

මෙම පෙත්සම ඉතා වැදගත් හදිසි කරුණු මත ගොනු කර ඇති අතර කඩිනමින් අධිකරණයේ අවධානය යොමු කර සිය සේවා දායකයාට ඇප දීමට පියවර ගන්නා ලෙස ඔහු අධිකරණයෙන් ඉල්ලා සිටියේ ය. එබැවින් එය ආසන්නම දිනයක කැඳවන ලෙස ඔහු අධිකරණයෙන් ඉල්ලා සිටියේය. ඒ අනුව පෙත්සම් ලබන අප්‍රේල් මස පළමු වැනිදා කැඳවීමට නියම කෙරිණ.

හිටපු නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන මහතා ඇතුළු විත්තිකරුවන් පිරිසකට එරෙහිව ගොනු කර තිබූ නඩුවකට අදාළව අසත්‍ය සාක්ෂි නිර්මාණය කළේ යැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගැනීමෙන් පසු ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණය මඟින් පෙත්සම්කරු සහ ශානි අබේසේකර බන්ධනාගාර ගත කර තිබුණි.

තමන්ව ඇප මත මුදා හරින මෙන් ඉල්ලා එම සැකකරුවන් විසින් ගම්පහ මහාධිකරණය වෙත ප්‍රතිශෝධන පෙත්සමක් ඉදිරිපත් කළේය.

එම ප්‍රතිශෝධන පෙත්සම විභාග කළ ගම්පහ මහාධිකරණය ඉකුත් දෙසැම්බර් 08 වැනිදා එම සැකකරුවන් දෙදෙනාගේ ඉල්ලීම සහ පෙත්සම ප්‍රතික්ෂේප කර තිබේ. ගම්පහ මහාධිකරණයේ එම තීන්දුව ප්‍රතිශෝධනය කර තමන්ව ඇප මත මුදාහරින සුගත් මෙන්ඩිස් මහතා අධිකරණයෙන් ඉල්ලා සිටිති.

# කොවිඩ් නිසා ලෝක වෙළෙඳ පොළේ සමහර භාණ්ඩවල මිල ඉහළ ගිහින් තිබෙනවා

## මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා

සීනි ආනයනය කරන ආයතන හයෙන් කිසිම ආයතනයකට විශේෂ බද්දක් පනවන්නට ආණ්ඩුව කටයුතු නොකළ බව පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා මහතා ඊයේ (17) පැවැසීය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂ මාධ්‍ය සාකච්ඡාවට එක් වෙමින් ඒ මහතා මේ බව පැවැසීය.

එහිදී වැඩිදුරටත් අදහස් පළ කරමින් ඒ මහතා මෙසේ ද පැවසීය.

ආණ්ඩුව වෙළෙඳ භාණ්ඩ සඳහා තනි අගයකින් විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනවා තිබෙන්නේ අවශ්‍ය වේලාවල් හීදී බදු ඉහළ දැමීම හා පහළ දැමීම සඳහායි. ඒ අනුව කාරණා දෙකක් යටතේ බදු පහළ දමනු ලැබුවා. ගිය වසරේ කොවිඩ් නිසා බස්නාහිර පළාතේ සංචාරක සීමා පනවා තිබුණා. ඒ වගේම කොවිඩ් නිසා ලෝක වෙළෙඳ පොළ සමහර භාණ්ඩවල මිල ඉහළ යමින් තිබුණා. වෙළෙඳ පොළ ඇතුලේ භාණ්ඩ ගෙන ඒමේ ව්‍යුහයේ යම් කිසි ආකාරයේ විකෘති වීමක් සිදු වෙලා තිබුණා. එවැනි අවස්ථාවේදී තමන්ගේ බදු ඉහළ පහළ දාලා මේ පිළිබඳ ක්‍රමවේදයක් පහසුවට ලබා ගැනීමට සලස්වන එක ආණ්ඩුවේ යුතුකමක් වෙනවා. ඒ අනුව ඔක්තෝම්බර් මාසයේ මුල් සතියේ ආණ්ඩුව ප්‍රධාන දේවල් කිහිපයක බද්ධ සත 25 දක්වා අඩු කළා. බොම්බයි ලූණු, පරිප්පු, සැමන්, සිනි ඇතුළු විශේෂ භාණ්ඩ මිල අඩු කළා. ප්‍රශ්නයක් ආවේ මේ සිනි පිළිබඳ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු විශාල හඬක් නගලා තිබ්බා මේ සිනි වලින් වංචාවක් වෙලා තියෙනවා කියලා. මේ සාමාන්‍ය කාලය තුළ සිනි මිල ක්‍රමානුකූලව ඉහළ යමින් තිබුණා. සාමාන්‍යයෙන් ලංකාවට දළ වශයෙන් මෙක්ට්‍රින්ටොන් 45,000ක් 55,000ක් ඕනෑ වෙනවා. ඒ අනුව රු.127 ගිය මිල ඊට පසුව රු.112ක් අඩුවෙලා තිබෙනවා. වරායට ගොඩබාන කොට මිල රු. 78 ක් ඉඳලා රු.90 ට වැඩිවෙලා තිබෙනවා. මෙතන ප්‍රශ්නය තමයි සිනි ආනයනය කරන්නේ ප්‍රධාන වශයෙන් ආනයනයකරුවන් 14ක්. මේ ආනයනකරුවන් විවිධ ප්‍රමාණයේ ආනයනය කරනවා. ඒ අනුව ආයතන 6න් ගෙන්නලා තිබෙනවා මුළු තොගයෙන් 85% ක්.



ඉතිරි අය ගෙන්නලා තිබෙන්නේ 15%ක් ප්‍රමාණයක්. කවුරු හරි හිතනවා නම් සිනිවල බද්ධ 49.75න් අඩු කරනවා කියලා කියනවා නම් එක වැරදි. ඒ නිසා මෙම ආනයනය බද්ධ කිසිම කෙනෙකුට විශේෂයෙන් පැනෙව්වේ නෑ. කවුරුහරි මේක වංචාවක් කියනවා නම් අපි ඒකට සම්පූර්ණයෙන් විරුද්ධයි. කමිටුවක් හැටියට. මේක දේශපාලන කතාවක් විදිහට එළියට ආවට මේක ඇත්ත කතාවක් නොවේ. ඒ අනුව අපිට පෙනි යනවා පහුගිය කාලයේ සිට මේ දක්වා මේ වෙළෙඳ භාණ්ඩ බද්ධ අඩු කරපුවාම සිනි මිල ක්‍රමානුකූලව අඩුවෙලා තියෙනවා. එකපාර අඩු වෙලා නෑ. ඇත්තටම මේක හුදු කාර්යයක් නෙවේ. උපරිම සිල්ලර මිල නියම කරද්දි පාරිභෝගික අධිකාරිය උපරිම සිල්ලර මිල නිවැරදි ආකාරයට ඉදිරිපත් කරනවා. ඒ නිසා අපිට ඕනෑ වුණේ මේ පිළිබඳ සැබෑ තත්ත්වයට ආණ්ඩුව පෙන්වලා දිලා ඒ හරහා නෛතික වශයෙන් කළයුතු දෙවල් ටික කරන්නයි. අපේ කමිටුවට තියෙන ප්‍රධාන වගකීම තමයි ආණ්ඩුව බලාපොරොත්තු වෙන ප්‍රතිපත්තිය තින්දුව ඒක ගලාගෙන ගියාද කියලා හොයා බලා වාර්තා කිරිමයි. අපි ඒ වාර්තා කිරිමක් කරලා තිබෙනවා. අද වෙන කොට සිනි මිල ඉතාමත් අඩු බලාපොරෙත්තු වුණු තත්ත්වයක තිබෙනවා. මේක අද ඊයේ ආපු ප්‍රශ්නයක් නෙවේ. 1960 ගණන්වල ද සාකච්ඡා වෙලා තිබෙනවා. මේක මේ වංචාවක් කිව්වට අපිට එහෙම එකක් පෙන්නේ නෑ. අපිට පෙන්නේ වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වයේ අඩුපාඩුවක් තිබුණා. යම් වාසියක් පාරිභෝගිකයාට ගියා. බලාපොරෙත්තු වුණු වාසිය එන්න නිශ්චිත කාලයකට වඩා කාලයක් ගත වුණා. මේක තමයි වෙච්ච සිද්ධිය. මේ සිද්ධිය දඩමීමක් කර ගෙන සම්පූර්ණයෙන් වෙනත් තර්කයක් ගෙන එන්ට ඉදිරිපත් කිරීම මම හිතන්නේ සාධාරණ නෑ. කිසිම කෙනෙකුට විශේෂ වාසියක් හෝ අවාසියක් ගේන්න ආණ්ඩුව කටයුතු කරෙත් නෑ කරන්නෙත් නෑ. අපි ඉදිරියේදී අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරනවා.

**රාජ්‍ය ඇමැති සුසිල් ප්‍රේමජයන්ත මහතා-**

පසුගිය දින කිහිපය තුළ දේශපාලඥයන් විවිධ ස්ථානවල ප්‍රවෘත්ති සාකච්ඡා වල විවිධ කරුණුවලින් විවිධ කරුණු දක්වලා තිබෙනවා. අද දවසේ මුද්‍රිත මාධ්‍ය සියල්ල පාහේ අසාද් සාලි මහත්මයා අත්තඩංගුවට ගැනීම පිළිබඳ සඳහන් කර තිබෙන්නේ. අසාද් සාලි මහත්මයා මම දන්න තරමින් එතුමා කොළඹ මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති හැටියට ඡන්දයෙන් පත් වුණාට පස්සේ මැතිවරණ තරඟ කරලා එයින් සාර්ථක බාවයක් ලබා ගන්න බැරිවුණා. පසුගිය කාලයේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා හැටියට කටයුතු කළා. එතුමා කරන ප්‍රකාශ පරස්පර විරෝධි. එතුමා ආණ්ඩුකාරවරයා ලෙස හිටපු කාලයේ කරපු ප්‍රකාශ නොවේ සම්පූර්ණ පටහැනි ප්‍රකාශයන් මේ මැතක ඉඳන් කරන්නේ. ඒවගේම ඒ කරන ප්‍රකාශ තුළින් ජනවාර්ගයන් අතර යම් ආකාරයක නොසන්සුන්තාවයක්, යම් වෛරී හැඟිමක් ඇතිවන ස්වරූපයේ ඒවා වෙන්න පුළුවන්. ඊළඟ කාරණය තමයි රටේ තියන සාමාන්‍ය නීතියට කොයිතර මිදුරට බලපානවාද කියලා කාරණය. මෙවැනි හේතු නිසා තමයි ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත 1980 දශකයේ මුල් භාගයේ දී එවක ආණ්ඩුව ගෙනාවේ. විශේෂයෙන් LTTE ත්‍රස්තවාදය මැඩපැවැත්වීම සඳහා. ඊට පස්සේ වෙනත් සංවිධාන කටයුතු පාලනය කිරීම සඳහා ද මේ පනත යොදාගනු ලැබුවා

. වර්තමාන සහරාන් ප්‍රහාරයේ ප්‍රතිඵල හැටියට යම් යම් සැකකරුවන් අත්තඩංගුවට ගැනීම නඩු පැවරීම ඒ කටයුතුවලදී ත්‍රස්තවාදි වැලැක්වීමේ පනත භාවිතා කෙරෙනවා. ඔය නිසා ත්‍රස්තවාදි වැලැක්වීමේ පනත හැල්ලු කිරීමට ජිනිවාවල 30/1 යෝජනා අතර එක යෝජනාවක් ඕකත්. ඒ අනුව ප්‍රති ත්‍රස්ත පනතක් පවා කෙටුම්පත් කළා.

ඒක පනතක් හැටියට සම්මත වුණේ නෑ. නමුත් දැනට බල පවතින වලංගු නීතිය හැටියට අපරාධ නිතියත් , විශේෂ ත්‍රස්ත්‍රවාදයේ වැලැක්වීමේ පනත නීතිය යටතටත් එතුමා කළ ප්‍රකාශ බැලු බැල්මට සමහර ප්‍රකාශ ඒකට යටත්වන ස්වරූපයක් තිබෙනවා. ඒ නිසා තමයි නීතිපතිතුමාගේ උපදෙස් අනුව පොලිසිය අත්තඩංගුවට අරගෙන ප්‍රකාශ අරගෙන තිබෙන්නේ.

# සමගි ජන බලවේගයට ගිය පිරිස් නැවත එජාපයට එමින් සිටිනවා

## වාරියපොළ එජාප සංවිධායක

**මැදකොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ**

එක්සත් ජාතික පක්ෂය අත්හැර සමගි ජන බලවේගයට එකතු වූ පිරිස දැන් දැන් යළිත් එක්සත් ජාතික පක්ෂයට එකතු වෙමින් සිටින බවද, එය එජාපයේ අනාගතයට සුබ නිමිත්තක් බවද වාරියපොළ මැතිවරණ කොට්ඨාසයේ එජාප ප්‍රධාන සංවිධායක ධනුෂ්ක බාලසූරිය මහතා ප්‍රකාශ කෙළේය.

ඒ මහතා මේ බව සඳහන් කෙළේ පිටකෝට්ටේ සිරිකොත මන්දිරයේ පැවැති මාධ්‍ය හමුවේදීය.

මෙහිදී මාධ්‍යවේදීන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් වාරියපොළ එජාප ප්‍රධාන සංවිධායක ධනුෂ්ක බාලසූරිය මහතා මෙසේද කීය.

සමගි ජන බලවේගය වැරදි මාවතක ගමන් කරන බව පෙනෙන්නට තිබෙනවා. ඉකුත් යහපාලන ආණ්ඩුව සැලසුම් කළ කිසිම දෙයක් සිදු කෙළේ නැහැ. ඉදිරි කාලය තුළදී ප්‍රදේශයේ ජනතාවට සත්‍ය පහදා දී ක්‍රියා කරන අතර තවමත් මුළු කුරුණෑගල දිසාවේ පොදු මහ ජනතාවට අලියත් කොළපාටත් අමතක වී නැතැයි ද මන්ත්‍රීධුර අපේක්ෂක ධනුෂ්ක බාලසූරිය මහතා පැවසීය.

වත්මන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ආණ්ඩුවට මේ දක්වා රටේ බඩු මිල අඩු කරන්න බැරි වුණා. ඉදිරි කාලය තුළදී ගෑස් සිලින්ඩරයට රුපියල් 600ක මුදලක් වැඩි කිරීමේ අපේක්ෂාවෙන් ඒගොල්ලන් කටයුතු කරනවා. මේ දක්වා පාසල් ළමුන්ට නිළ ඇඳුම් හා පොත්පත් ලබාදීම ප්‍රමාද වී තිබෙනවා. අපගේ කල්පනාව විපක්ෂ කණ්ඩායමක් ලෙස ඉදිරියේ සටන් කොට ආණ්ඩුව පෙරළා දැමීමයි.

**වාරියපොළ ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් මායාදුන්නේ මහතා,**

බටහිර ජැටිය වෙනුවට දැන් නැගෙනහිර ජැටිය ලබාදීමට කටයුතු කරගෙන යන බව දැන ගැනීමට තිබෙනවා. එදා යහපාලන ආණ්ඩුව කාලයේ 1990 ගිලන් රථ සේවයක් ලබාදුන්නේ ඉන්දීය අගමැති මෝදි මහතාගෙන් කළ ඉල්ලීමකට. එය අද මුළු ලංකාවේම ජනප්‍රිය වී තිබෙනවා. රටේ එජාපය වරින් වර පාලනය කළ අවස්ථාවලදී ප්‍රාදේශීය සභා, නගර සභා ලෙසත් නගර සභා මහ නගර සභා ලෙසත් උසස් කරනු ලැබුවා.

**වාරියපොළ ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩබ්ලිව්. එම්. දේවිකා පද්මිණි පියසීලි මහත්මිය,**

එක්සත් ජාතික පක්ෂය දෙකඩ වී තිබුණු නිසා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු ආණ්ඩුවක් පත් වුණා. ඉදිරි කාලයේදී මෙයට වඩා දැඩි පියවරක් අපි ගත යුතුව තිබෙනවා. එදා රැවටුනු ජනතාව ඉදිරි මැතිවරණවලදී නොරැවටෙනු ඇතැයි ද අප සිතනවා.

වාරියපොළ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීධුර අපේක්ෂික කාවින්ධ්‍යා මාධවී වීරසිංහ මහත්මියද කතා කළාය. මෙම අවස්ථාව වාරියපොළ මැතිවරණ කොට්ඨාසයට අයත් විශාල පිරිසක් පැමිණ සිටියහ.

# පාස්කු ප්‍රහාරය දියාරු කිරීමේ උත්සාහයක මේ ආණ්ඩුව නිරත වෙනවා

## මන්ත්‍රී නලීන් බණ්ඩාර

**පහන් විජේසේකර**

පාස්කු ප්‍රහාරය දියාරු කිරීමේ උත්සාහයක මේ ආණ්ඩුව නිරත වෙන බවත් ඒ සඳහා විවිධ මාතෘකා ඉදිරිපත් කරමින් සිටින බවත් පාර්ලිමේන්තු මන්ත්‍රී නලීන් බණ්ඩාර මහතාපැවැසීය.

ඒ මහතා මේ බව පැවැසුවේ විපක්ෂ නායක කාර්යාලයේ ඊයේ (17) පැවැති මාධ්‍ය හමුවේදීය.

දැන් බුර්කාව තහනම් කරන්න ආණ්ඩුව කටයුතු කරගෙන යනවා. ආණ්ඩුව මවන්න හදන චිත්‍රය අද අපිට හිතා ගන්න පුළුවන්. සහරාන්ට වැටුප් ගෙවූ බව මා සහභාගී වු දේශපාලන විවාදයක දී කෙහෙළිය ඇමැතිවරයාත් පිළිගත්තා. 2012 සිට වැටුප් ගෙවු සහරාන් පිටුපස හිටපු ඩීආයිජී නාලක සිල්වා බුද්ධි අංශය සමඟ ලුහුබැන්දා.

එහිදී එතුමා විසින් විවෘත වරෙන්තුවක් ගත්තා සහරාන් අත්අඩංගුවට ගන්න පසුව සහරාන් නීති විරෝධී ආකාරයට රටින් පිටවෙලා ඉන්පසු ජාත්‍යන්තරයට කිව්වා ඔහුව අත්අඩංගුවට ගන්න කියලා. මෛත්‍රීපාල සිරිසේන මහතා හා ගෝඨාභය රාජපක්ෂ ඝාතන සැලැස්මක් නාලක සිල්වා ක්‍රියාත්මක කරන බවට නාමල් කුමාර බොරු පැමිණිල්ලක් ඉදිරිපත් කළා. එම පැමිණිල්ල නිසා නාලක සිල්වා අත්අඩංගුවට පත්වෙනවා. නාලක සිල්වා යනු දක්ෂ නිලධාරියෙක් . නාමල් කුමාරගේ පැමිණිල්ල නිසා නාලක සිල්වා 2018 ඔක්තෝම්බර් මාසයේ අත්අඩංගුවට ගත්තා. ඉන්පසුව තමයි මේ රට තුළ සහරාන් ක්‍රියාත්මක වෙන්නේ.



# වැඩිම ජනතා මෙහෙවරක් සිදු කළේ වත්මන් ආණ්ඩුවයි

## පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්

**මාතලේ දිස්ත්‍රික් සමූහ**

අපගේ විරුද්ධවාදීන් රජයට කුමන විවේචන එල්ල කළත් ඉතා කෙටි කලකදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නායකත්වය යටතේ වැඩිම ජනතා මෙහෙවරක් සිදු කළ මේ රජය ඉතිහාසයට එක් වීම කිසිවකුටත් වැළැක්විය නොහැකි බව මාතලේ දිස්ත්‍රික් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා පැවැසීය.



මන්ත්‍රීවරයා එසේ පැවැසුවේ පසුගියදා (13) දඹුල්ල යාපාගමදී පැවති මාතලේ දිස්ත්‍රික් ශ්‍රී ලංකා නිදහස් වෘත්තීය සමිති සම්මේලනයේ රැස්වීමකට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා මෙසේ ද සඳහන් කළේය.

'මේ රජය බලයට ගෙන ඒමට වෘත්තීය සංගම් විශාල මෙහෙවරක් සිදු කළා. එය සැමදා අප විසින් අගය කළ යුතුයි. පොදුජන පෙරමුණේ ජයග්‍රහණයට වෘත්තීය සංගම් දැක්වූ දායකත්වය විශාල පිටිවහලක් වූ බව අප කිසි දිනෙක අමතක නොකළ යුතුයි. වසර ගණනාවක් පුරා රැකියා නොමැතිව අසහනයෙන් පසු වූ උපාධිධාරීන් 67,000කට මේ කෙටි කාලයේදී රැකියා දීමට මේ රජයට හැකි වුණා. අඩුආදායම්ලාභී පවුල්වල ආර්ථිකය නංවාලීමේ අරමුණෙන් විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන් ලක්ෂයකට රැකියා දීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කළා. එයින් නොනැවතී අඩුආදායම්ලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනයට ද රජය වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර තිබෙනවා.

පසුගිය පාලන සමයේ සම්පූර්ණයෙන් කඩා වැටී තිබු ආර්ථිකය නැවත ගොඩගැනීමට දේශීය කර්මාන්ත මෙන්ම කෘෂිකාර්මික කටයුතු ද නංවාලීමට රජය වෙන කවර රජයක්වත් සිදු නොකළ ආකාරයෙන් විශාල වැඩ කොටසක් ආරම්භ කර තිබෙනවා.

මෙරටේ නිෂ්පාදනය කළ හැකි ආහාර ද්‍රව්‍ය ආනයනය සම්පූර්ණයෙන් නතර කිරීමත් සමගම ගොවි ජනතාව වගාවට නැඹුරු වුණේ පෙරටත් වඩා මහත් ධෛර්යයකින්. රජයේ මේ ක්‍රියාදාමය ගොවි ජනතාවට විශාල සහනයක් වුණා.

කෘෂිකර්මාන්තය දියුණුවට ජලය ගොවීන්ට දීමේ අරමුණෙන් දිවයින පුරා වැව් අමුණු පන්දහසක් සම්පූර්ණයෙන් පිළිසකර කිරීමට රජය මේ වන විට පියවර ගෙන තිබෙනවා. එහි පළමු අදියර යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ වැව් අමුණු තිස්අටක් මේ වසරේදී පිළිසකර කරනවා. එයින් වැඩිම සංඛ්‍යාවක් ලැබී තිබෙන්නේ දඹුල්ලට.'

# අසාද් සාලි වැනි කාඩ්බෝඩ් වීරයන් නිහඬ කිරීම ආණ්ඩුවක වගකීමක්

## රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ

**කැබිතිගොල්ලෑව සමූහ**



අසාද් සාලි අත්අඩංගුවට ගැනීම ගැන කාටවත් ආණ්ඩුවට දෝෂාරෝපණය කරන්න බෑ. ඉදිරියේදී විශේෂයෙන්ම මේ වගේ ජාතිවාදී ආගම්වාදී මෙන්ම ත්‍රස්තවාදී ප්‍රකාශ සිදු කරන පුද්ගලයන් පිළිබඳ වර්තමානයේදී අපි නීතිමය කටයුතු ක්‍රියාත්මක නොකළහොත් මේ විදිහට පටු අරමුණු ඇති කණ්ඩායම් රාශියක් මේ රටේ බිහි වෙනවා. ඒක රටේ ආරක්ෂාවට , කලාපයේ ආරක්ෂාවට තර්ජනයක්. ඔය විදිහට තමයි සෑම තැනකම ත්‍රස්ත්‍රවාදය හිස එසවුයේ.

ජාතිවාදී , ආගම්වාදි, ත්‍රස්තවාදී ප්‍රකාශ කරන පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොකරන්නේ නම් අසාත් සාලි මෙන් පටු අරමුණු ඇති කණ්ඩායම් රාශියක් රට තුළ බිහි විය හැකි බවත් රාජ්‍යයට ද්‍රෝහි වන ප්‍රකාශ සහ ක්‍රියාකලාපයන් සිදු කරන කාඩ්බෝඩ් වීරයෝ නිහඬ කිරීම ආණ්ඩුවක වගකීමක් බව සමෘද්ධි රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා ප්‍රකාශ කෙළේය.

හිටපු බස්නාහිර ආණ්ඩුකාර අසාත් සාලි මහතා අත්අඩංගුවට ගැනීම පිළිබඳ ඊයේ(16) සවස මාධ්‍ය කළ විමසීමකදී රාජ්‍ය ඇමැතිවරයා එසේ පැවසුහ.

වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා මෙසේද පැවසීය.

යහපාලන ආණ්ඩුව නිර්මාණය වීමත් සමඟ අසත් සාලි රාජ්‍යයට ද්‍රෝහි වන ප්‍රකාශ සහ ක්‍රියා කලාප සිදු කළ අයුරු දක්නට තිබුණා. එය සුළුවෙන් තැකීම රට තුළ ත්‍රස්තවාදීන්ට හිස එසවීමට අනු බල දීමක්.

එක්කෙනකුගේ දෙන්නෙකුගේ ප්‍රකාශ සුළුවෙන් හිතනවා. ඒවට නීතිය ක්‍රියාත්මක කරන්නේ නෑ. සමහර අයට දේශපාලන රැකවරණය තියෙනයවා. එහෙම වුණාම ඒ අය මහා විනාශයක් කරා ගමන් කරනවා.

අසාත් සාලි යහපාලන ආණ්ඩුව නිර්මාණය වීමත් සමගම රාජ්‍යයට ද්‍රෝහි වන ප්‍රකාශ සහ ක්‍රියාකලාපයන් සිදු කරන අන්දම අපි දැක්කා. මේ වගේ කාඩ්බෝඩ් වීරයෝ නිහඬ කිරීම ආණ්ඩුවක වගකීමක්. නැත්නම් ඒක ත්‍රස්තවාදයට අනුබල දීමක් , උල්පන්දම් දීමක් වෙනවා.එවැනි ප්‍රකාශ කරන සියලු දෙනාට ඒ නිසා නීතිය ක්‍රියාත්මක කරන්න ඕනේ.

# බුර්කාව තහනම් කිරීමට ආණ්ඩුව සූදානම් වන්නේ සීනි වංචාව වසන් කරන්නයි

## මන්ත්‍රී රවුෆ් හකීම්



**අසේල කුරුළුවංශ**

බුර්කාව තහනම් කිරීමට ආණ්ඩුව සූදානම් වන්නේ සීනි වංචාව සම්බන්ධ ජනතා අවධානය වෙනත් පැත්තකට යොමු කිරීමට බව මුස්ලිම් කොංග්‍රස් නායක පාර්ලිමේන්තු මන්ත්‍රී රවුෆ් හකීම් මහතා පවසයි.

මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමෙන් අනතුරුව ඊයේ (17) මාධ්‍ය හමුවේ අදහස් දක්වමින් හකීම් මහතා මේ බව ප්‍රකාශ කෙළේය.

තවදුරටත් ඒ මහතා මෙසේද පැවසීය.

කොවිඩ් ආසාදිත මෘත දේහ භූමදානය කිරීමට ආණ්ඩුව අවසර ලබාදුන්නේ ජත්‍යන්තර බලපෑම් නිසායි. ආණ්ඩුව කෙරෙහි ජනතා අප්‍රසාදයක් මතුවන සෑම අවස්ථාවකම ඊට හේතු වූ කරුණු පිළිබඳ අවධානය වෙනතකට යොමු කිරීම පිණිස වෙනත් කාරනයක් හිටි හැටියේ කරළියට ගෙන ඒම වත්මන් ආණ්ඩුවේ ක්‍රියාපිළිවෙතයි. අසාද් සාලි මහතා යම් යම් අවස්ථාවල ජනතාව කුපිත වන ආකාරයේ ප්‍රකාශ කළත් මේ අවස්ථාවේ සිදුව තිබෙන්නේ එතුමා කළ ප්‍රකාශය වැරදි ලෙස වටහා ගැනීමක්.

# ඉස්ලාම් අන්තවාදීන්, ත්‍රස්තවාදීන් බිහි කරන්න අනුබල දුන්නොත් වැඩ වරදිනවා

## ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු



**ක්‍රිසන්ති විතාරණ**

ඉස්ලාම් අන්තවාදීන්, ත්‍රස්තවාදීන් බිහි කිරීමට ව්‍යංගයෙන් හෝ අනුබල දෙන්නේ නම් ඔවුන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කළ යුතු බව ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පැවසීය.

ඇමැතිවරයා මේ අදහස් පළ කෙළේ පසුගිය දා සීමාසහිත කුරුණෑගල විවිධ සේවා සමුපකාර සමිතියේ 50 වැනි ස්වර්ණ ජයන්තියට සමගාමීව අභිනවයෙන් ඉදිකරන ලද පොල්අත්තාපිටිය නව කෝප්සිටි වෙළෙඳ සල විවෘත කිරීමේ උත්සවයෙන් අනතුරුව මාධ්‍යවේදියකු නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා මෙසේද පැවසීය.

ඉස්ලාම් අන්තවාදීන් ත්‍රස්තවාදීන් නිර්මාණය කරන්න යම් කිසි ප්‍රකාශයක් ව්‍යංගයෙන් හරි කරනවා නම් ඔවුන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. ඒ අසාද් සාලි ද, ජොන්ස්ටන් ප්‍රනාන්දු ද එහෙම නැත්නම් වෙන කවුද කියන එක නොවෙයි ප්‍රශ්නය. සාමාන්‍යයෙන් එහෙම දෙයක් වුණා නම් කියන්නේ දේශපාලන පලිගැනීමක් කෙරුවා කියලයි. රිශාඩ් බදියුර්දීන්ව අත්අඩංගුවට ගනිද්දී සජිත් ප්‍රේමදාස මහත්තයා කිව්වේ දේශපාලන පළිගැනීම් කරනවා කියලයි. හැබැයි දැන් පාස්කු ප්‍රහාර කොමිෂන් වාර්තාවේ රිශාඩ් බදියුර්දීන්ගේ නම සඳහාන් වෙනවා.

මෙම අවස්ථාවට වයඹ පළාත් ආණ්ඩුකාර රාජා කොල්ලුරේ ඇතුළු පිරිසක් සහභාගි වූහ.

ක්‍රීඩා SPORTS

## ප්‍රසාද ලකුණු සටහනේ දෙවැනි තැනට දැමූ

# ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් පිල හෙට දකුණු අප්‍රිකාව සමඟ ගැටෙයි



## ඩිල්ෂාන් තුන් ඉරියව්වෙන්ම උඩින්



මාර්ග ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ඉන්දියාවේ රායිපූර්හිදී පැවැත්වෙන රෝඩ් සේෆ්ටි වර්ල්ස් සීරිස් ක්‍රිකට් තරගාවලියේ දෙවැනි අවසන් පූර්ව තරගයශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායම සහ දකුණු අප්‍රිකා ලෙජන්ඩ්ස් පිල අතර හෙට (19) පැවැත්වේ.

තිලකරත්න ඩිල්ෂාන්ගේ නායකත්වයෙන් තරග කරන ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් පිල මූලික වටයේදී එංගලන්ත පිල පරාජය කිරීමත් සමඟ ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගැනීමට සමත් විය.

කෙසේ වෙතත් අනතුරුව තරගාවලියේ සංවිධායකයන් විසින් ප්‍රසාද ලකුණු සටහන සංශෝධනය කරමින් ඉන්දීය ලෙජන්ඩ් පිලට එහි පළමු ස්ථානය හිමි කර දුන්නේය.

ඒ අනුව දෙවැනි ස්ථානයට පත් වීම හේතුවෙන් ශ්‍රී ලංකා පිල හෙට ප්‍රසාද ලකුණු සටහනේ තෙවැනි තැන පසුවන දකුණු අප්‍රිකාව සමඟින් දෙවැනි අවසන් පූර්ව තරගයට මුහුණ දෙනු ඇත.

ඉන්දීය පිල මෙන්ම ශ්‍රී ලංකාව ද ක්‍රීඩා කළ තරග 6න් 5ක් ජයගෙන ප්‍රසාද ලකුණු 20 බැගින් හිමි කර ගැනීමට සමත් විය. දළ ලකුණු ලබාගැනීමේ වේගය මත ශ්‍රී ලංකාවට +1.771ක් හිමිව ඇති අතර, ඉන්දියාවට හිමිව ඇත්තේ +1.733ක් පමණි. කෙසේ වෙතත් ඉන්දීය පිල ශ්‍රී ලංකා පසු කර ඉදිරියට ගොස් තිබේ.

මේ පිළිබඳ අදහස් දක්වමින් තරගාවලි සංවිධායකයන් සඳහන් කර ඇත්තේ මූලික වටයේදී ඉන්දීය පිල හමුවේ ශ්‍රී ලංකා පිල පරාජය වීම මත ඉන්දීයාවට පෙරමුණ හිමිව ඇති බවයි.

එහෙත් තරගාවලිය ආරම්භයේදී එවන් අදහසක් පළ වී නොතිබීම විශේෂත්වයකි.

මේ තරගාවලියේ පළමු අවසන් පූර්ව තරගය ඉන්දීය ලෙජන්ඩ්ස් පිල සහ බටහිර ඉන්දීය කොදෙව් ලෙජන්ඩ්ස් පිල අතර, ඊයේ රාත්‍රියේ පැවැත්වීමට නියමිතව තිබිණි.

තරගාවලියේ අවසන් තරගය 21 වැනිදා පැවැත්වීමට නියමිතය.

මේ අතර, තරගාවලියේ වැඩිම ලකුණු ලාභීන් සහ වැඩිම කඩුලු ලාභීන් යන ලැයිස්තු ද්විත්වයේම පෙරමුණ ගැනීමට තිලකරත්න ඩිල්ෂාන් සමත්ව තිබීම කැපී පෙනෙන සිදු වීමකි.

ඔහු තරග 6කේදී අර්ධ ශතක 2ක් සමඟ ලකුණු 232ක් රැස් කර ඇති අතර, දෙවැනි තැන පසුවන දකුණු අප්‍රිකාවේ ඇන්ඩෘ පුටික් සහ උපුල් තරංග (තෙවැනියා) තරග 4කදී ලකුණු 185 බැගින් රැස් කර තිබේ.

තරගාවලියේ හොඳම ඉනිම (99) ද ශ්‍රී ලංකාවේ උපුල් තරංගගේ නම ඉදිරියේ සටහන්ව තිබේ.

පන්දු යැවීමේදී ඩිල්ෂාන් කඩුලු 12ක් බිඳ දමා ඇත්තේ ලකුණු 6කට කඩුලු 4ක් ලෙස හොඳම පන්දු යැවීමක් ද සටහන් කරමිනි. එය මේ තරගාවලියේ ඉනිමක හොඳම පන්දු යැවීමද වෙයි.

## ගුණතිලකටත් අයිසීසීයෙන් දඬුවම්



අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලය විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ආරම්භක පිතිකරු ධනුෂ්ක ගුණතිලකට දඬුවම් පැන වීමට කටයුතු කර තිබේ.

කොදෙව් පිල සමඟ පැවැති තෙවැනි එක්දින තරගයේදී අයිසීසී විනය නීති උල්ලංඝනය කිරීම හේතුවෙන් ඔහුට මෙලෙස දඬුවම් පනවා ඇති අතර, ඒ අනුව ඔහුගේ විනය වාර්තාවට දඬුවම් ලකුණක් එක් කිරීමට කටයුතු කර ඇත.

කොදෙව් පිතිකරු නිකලස් පූරාන් දවා ගැනීමෙන් අනතුරුව එය සැමරීමේදී ගුණතිලක විසින් පූරාන් වෙත නුසුදුසු භාෂාවෙන් ආමන්ත්‍රණය කළ බවට එල්ල වී ඇති චෝදනා මේ සඳහා හේතු වී ඇති අතර, එය අයිසීසී පළමු මට්ටමේ වරදක් බවත් සඳහන් වෙයි. ගුණතිලක මේ වරද පිළිගෙන ඇති නිසා ඒ සම්බන්ධයෙන් වැඩි දුර විභාගයක් සිදු නොවන බව ද අයිසීසී නිවේදනය කර තිබේ. මින් පෙර එම තරගයේදී නියමිත කාලය තුළ ඕවර 50 සම්පූර්ණ කිරීමට අසමත් වීම හේතුවෙන් ශ්‍රී ලංකා කණ්ඩායමට තරග මුදලින් 40%ක දඩයක් පැනවීමට ද අයිසීසීය පියවර ගෙන තිබිණි.

## එංගලන්තය ඉදිරියට



ජොස් බට්ලර්

ඉන්දීය කණ්ඩායම සමඟ අහමදාබාද්හිදී පැවැති තෙවැනි විස්සයි20 තරගයෙන් කඩුලු 8ක ජයක් හිමි කර ගැනීමට සංචාරක එංගලන්ත පිල සමත් විය.

මේ සමඟ තරග 5කින් සමන්විත් විස්සයි20 තරගාවලිය තරග 2-1ක් ලෙස පෙරමුණ ගැනීමට ද සංචාරකයෝ සමත් වූහ.

තරගයේ පළමුව පන්දුවට පහර දුන් ඉන්දීය ඉනිම ලකුණු 156කින් නතර කළ එංගලන්ත ක්‍රීඩකයන් පන්දු 10ක් ඉතිරිව තිබියදී ජය හිමිකර ගත්තේ කඩුලු 2ක් පමණක් අහිමි කර ගනිමිනි.

තරගයේ වීරයා වෙමින් එංගලන්ත පිල ජයග්‍රහණය වෙත ගෙන ගිය ජොස් බට්ලර් නොදැවී ලකුණු 83ක් රැස් කිරීමට සමත් විය. පන්දු 52කින් ගොඩනැගුණු ඔහුගේ ඉනිම හතරේ පහර 5කින් සහ හයේ පහර 4කින් වර්ණවත් විය. ජොනී බෙයාර්ස්ටෝව් පන්දු 28කින් නොදැවී ලකුණු 40ක් ඉනිමට එක් කළේය.

පළමුව පන්දුවට පහර දුන් ඉන්දීය පිල වෙනුවෙන් නායකත්වයෙන් ඉනිමක් දියත් කළ විරාට් කෝලි නොදැවී ලකුණු 77ක් රැස් කිරීමට සමත් විය. හතරේ පහර 8කින් සහ හයේ පහර 4කින් වර්ණවත් වූ ඔහුගේ ඉනිමට වැය වූයේ පන්දු 46ක් පමණි. පන්දු යැවීමේදී මාක් වුඩ් කඩුලු 3ක් දවා ගත්තේය.

දෙපිල අතර සිව්වැනි විස්සයි20 තරගය අද (18) අහමදාබාද්හිදීම පැවැත්වේ.

## ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස්ට ඩයලොග් අත

ඉන්දියාවේ රායිපූර් නගරයේ මේ දිනවල පැවත්වෙන 'රෝඩ් සේෆ්ටි වර්ල්ඩ් සීරිස්' හිටපු විශිෂ්ට ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ විස්සයි20 තරගාවලිය නියෝජනය කරන ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායමට අනුග්‍රාහකත්වය පිරිනැමීමට ඩයලොග් ආසියාටා සමාගම ඉදිරිපත් වී තිබේ.

ශ්‍රී ලංකා පිලේ හිටපු නායකයකු හා තුන්ඉරියව් ක්‍රීඩකයකු වන ටී.එම් ඩිල්ෂාන්ගේ නායකත්වයෙන් යුතු ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායම මේ වන විට රෝඩ් සේෆ්ටි වර්ල්ඩ් සීරිස් තරගාවලියේ ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගනිමින් සිටින අතර, අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබීමට ද සමත් විය. මේ වන විට තරග 5කින් 4ක්ම ජයගෙන සිටින ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායමට ඩිල්ෂාන්ගේ නායකත්වයෙන් සනත් ජයසූරිය, රංගන හේරත්, උපුල් තරංග, ෆර්වේස් මහරූෆ්, අජන්ත මෙන්ඩිස්, චාමර සිල්වා, කෞශල්‍ය වීරරත්න, නුවන් කුලසේකර සහ රසල් ආනල්ඩ් ක්‍රීඩා කරති.

# 2021 මංචි ජාතික වොලිබෝල් ශූරතාවය - ලංවිම දිනා ගනී

**ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන මංචි ජාතික වොලිබෝල් ශූරතාවලියේ අවසන් මහා තරඟය පසුගිය මාර්තු 13 දින මහරගම තරුණසේවා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විනි. එහිදී ලංවිම වොලිබෝල් කණ්ඩායම හා බිටුලින්ක් වොලිබෝල් කණ්ඩායම අතර පැවති තියුණු තරඟයෙන් තරඟ වට 4 - 1 වශයෙන් ලංකා විදුලිබල කණ්ඩායම විශිෂ්ඨ ජයක් වාර්තා කිරීමට සමත් විය.**

ලංවිම නියෝජනය කරමින් කණ්ඩායම් නායක දීප්ත රුමේෂ්, උපනායක කසුන් ප්‍රනාන්දු, ලසන්ත ප්‍රනීත්, ඒ.ඩබ්. ලක්මාල්, බී.ඒ.සී. හිරුෂාන්, ජී.වී. ප්‍රභාත් පෙරේරා, රුචිර සම්පත් ජයතුංග, කේ.බී.එස්.ඩී. ජයරත්න, ශෙහාන්, නිෂාන්, ඔබේසේකර, කුලාර, සඳුන් ඇතුළු කණ්ඩායම දස්කම් දැක්වූහ.

ලංවිම කණ්ඩායමේ ක්‍රීඩකයන් වන නායක දීප්ති රුමේෂ් දක්ෂතම ප්‍රහාරකයා ලෙසද, දක්ෂතම පන්දු ඔසවන්නා ලෙස කසුන් ප්‍රනාන්දුද, දක්ෂතම පන්දු වලක්වන්නා ලෙස ලසන්ත ප්‍රනීත්ද, දක්ෂතම පන්දු ගොඩගන්නා ලෙස ඒ.ඩබ්. ලක්මාල්ද සම්මානයට පාත්‍ර විය.

මංචි තරඟාවලියේ වටිනාම ක්‍රීඩකයාට හිමි සම්මානය ලංකා විදුලි බල මණ්ඩල කණ්ඩායමේ - බී.ඒ.සී. හිරුෂාන් ක්‍රීඩකයා දිනා ගත්තේය.

කණ්ඩායම් පුහුණුකරු චමින්ද ජයරත්න සහ සහායක පුහුණුකරු ලෙස සඳුන් විමලසේන කටයුතු කල අතර, ශාරීරික අභ්‍යාසක ලෙස චානක අමරසිංහද, එච්.මාරඹගේ - කාය වර්ධන පුහුණුකරු, කණ්ඩායම් කළමනාකරු වශයෙන් ඒ.යූ.පී.බී. නෙල්ලිගහවත්ත මහතාද කටයුතු කලේය.

ලංවිම කණ්ඩායම දිරිමත් කරමින් මෙම අවස්ථාවට විදුලිබල අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමන් හා ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති, නියෝජ්‍ය කථානායක ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමන්ද එක්ව සිටි අතර, ලංවිම සභාපති ඉංජිනේරු විජිත හේරත්, උප සභාපති එන්.එස්. ඉලංගකෝන්, ලංවිම සාමාන්‍යාධිකාරී ඉංජිනේරු එන්.ඩබ්. කුමුදුනී හේරත්, අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීම් අංශ 04)ඉංජිනේරු රොහාන් සෙනෙවිරත්න, හිටපු සාමාන්‍යාධිකාරී ඉංජිනේරු කීර්ති කරුණාරත්න, ලංකා විදුලිබලමණ්ඩල ක්‍රීඩා සමිතියේ උප සභාපති, අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ) ඉංජිනේරු කේ.කේ.එස්. දසනායක, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය) ඉංජිනේරු නොයෙල් ප්‍රියන්ත සහ ලංවිම ක්‍රීඩා සමාජයේ ප්‍රධාන ලේකම් ජේ.එම්.ඩී. විජේවීර (අතිරේක මුදල් කළමනාකරු - බෙදා. අ. 01), සහ යන මහත්ම මහත්මීන් රැසක් මෙම තරඟය නැරඹීමට සහභාගිවී සිටියහ.



ප්‍රධාන ආරාධිත අමුත්තන්ට ලංවිම වොල්බෝල් කණ්ඩායම හඳුන්වා දෙමින්



මංචි ජාතික වොලිබෝල් ශූරතා තරඟාවලියේ අවසන් මහා තරඟයේ ශූරතා කුසලානය විදුලි බල අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මහතා සහ වොලිබෝල් සම්මේලනයේ සභාපති ගරු රංජිත් සියඹලාපිටිය මහතා අතින් ලබා ගත් අයුරු



ජයග්‍රහණයෙන් අනතුරුව ලංවිම ජාතික වොලිබෝල් කණ්ඩායම ප්‍රධාන හා ආරාධිත අමුත්තන් සමඟ ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාවක්
ඉදිරි පෙළ වමේ සිට : ශෙහාන්, නිශාන්, කසුන් (උප නායක), ළහිරු, ලක්මාල්, දීප්ති (නායක), ලක්මාල්, ඔබේසේකර, කුළාර, සඳුන්
පසු පෙළ වමේ සිට : සංබ, හිරුෂාන්, චානක(ශාරීරික අභ්‍යාසක), විදුර,ආශා (උප ලේකම්-ලංවිම ක්‍රීඩා සමිතිය), ලසන්ත, අයේෂ්, ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා, චමින්ද (පුහුණුකරු- ලංවිම වොලිබෝල් කණ්ඩායම), කාංචන ජයරත්න මැතිතුමා (වොලිබෝල් සම්මේලනයේ උප සභාපති), ඉංජිනේරුවිජිත හේරත් මහතා (සභාපති), ඉංජිනේරු කීර්ති කරුණාරත්න මහතා (හිටපු සාමාන්‍යාධිකාරී), ඉංජිනේරු එන්.ඩබ්.කේ හේරත් මිය (ලංවිම සාමාන්‍යාධිකාරී), රොහාන් සෙනවිරත්න මහතා (අතිරේක සාමාන්‍යාධිකාරී බෙදා. අං. - 04) කේ.කේ.එස්. දසනායක මහතා (අතිරේක සාමාන්‍යාධිකාරී- වත්කම් කළමනාකරණ), ජේ.එම්.ඩී. විජේවීර මහතා (අතිරේක මුදල් කළමනාකරු - බෙදා.අ.- 01), ඒ.යු.පී.බී. නෙල්ලිගහවත්ත මහතා (කළමනාකරු- ලංවිම වොලිබෝල් කණ්ඩායම)



තරඟයේ උද්වේගකර අවස්ථාවක්



ලංවිම වොලිබෝල් කණ්ඩායම ජයග්‍රහණයෙන් අනතුරුව සතුට සැමරූ අවස්ථාවක්









# ලෝක ශූරයන්ගේ සාර්ථකත්වයේ රහස කණ්ඩායම් හැඟීමයි සහෝදරත්වයයි

## 1996 ක්‍රිකට් විජයග්‍රහණයේ රිදී ජුබිලියේදී අගමැති කියයි

විනයානුකූලව ලබා ගත් පුහුණුවත්, සාමූහිකත්වයත් හේතුවෙන් 1996 ලෝක ශූර ක්‍රිකට් ක්‍රීඩකයන් අද ශ්‍රේෂ්ඨයන් බවට පත් වී ඇතැයි විසිපස් වසරක් සපිරෙන එක්දින ලෝක කුසලාන සැමරුම නිමිත්තෙන් අරලියගහ මන්දිරයේ ඊයේ පැවති විශේෂ උත්සවයේදී අගමැති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය.

ලෝක කුසලාන ජයග්‍රහණයට මං විවර වූ සිදුවීම් කිහිපයක වැදගත්කම පෙන්වා දුන් අගමැතිවරයා එම සිදුවීම් ජයග්‍රහණයේ සාධක බවට පත් වූ අයුරු පැහැදිලි කළේය.

'ඒ ජයග්‍රහණය අද ඊයේ වගේ තවමත් රැඳිලා තියෙනවා. දැන් පිට්ටනියේ සිද්ධවෙන දේවල් නිසා මේ ජයග්‍රහණය නිතර නිතර අපේ ක්‍රීඩා ලෝලීන්ටත් මතක් වෙනවා ඇති. වර්තමානයට අතීතය හරිම වැදගත්. එදා සෙල්ලම් කළේ නිකම්ම නිකම් ක්‍රීඩකයන් පිරිසක් නෙවෙයි. රට දිනවන්න ඕනෑය කියන හැඟීමෙන් හිතන තරුණ පිරිසක්. මේ ජයග්‍රහණය මුළු ආසියාවම සැලකුවේ මේ කලාපයේ ජයග්‍රහණයක් විදියටයි. එල්ටීටීඊ ත්‍රස්තවාදය නිසා කොළඹ බෝම්බ පිපිරෙද්දී දකුණු අප්‍රිකාව, නවසීලන්ත, කොදෙව් පිල, ඔස්ට්‍රේලියාව අපේ රටේ සෙල්ලම් කරන්න ආවේ නෑ. බෝම්බ පිපිරීම ඉස්සරහට දාලා මඟ හැරියා. ඒ නොඑන්න හේතුව ලංකාව දිනනවාට තිබුණු අකමැත්ත. ඒත් ඉන්දියාව, පාකිස්තානය වගේ අපේ අසල්වැසි රටවල් අපට සහෝදරත්වයේ දෑත දිගු කළා. ඒ දෙරටේ ක්‍රීඩකයන් එකතු වෙලා අපේ රටට ඇවිත් ප්‍රදර්ශන තරග කිහිපයකට සහභාගි වුණා.'

'ඒ විතරක් නෙවෙයි ලෝක කුසලාන තරගාවලියට කලින් ලෝක පූජිත අපේ දඟපන්දු යවන්නා මුරලිදරන් පිටියෙන් ඉවත් කරන්න ලොකු උත්සාහයක් තිබුණා. ඉතා අසාධාරණ තීන්දු දුන්නා. නමුත් එදා හිටපු නායකත්වය මුරලි රැක ගන්න ලොකු සේවයක් කළා මට මතකයි.'

'එදා ඉන්දියාවේ පැවැති අවසන් පූර්ව තරගයේ අවසන් භාගයේ ඉන්දීය ක්‍රීඩාලෝලීන් කලබල වෙලා ගල් බෝතල් පිට්ටනියට එව්වා. මේ දර්ශනය මුළු ලෝකයම දැක්කා. ඒ වෙලාවේ හතරේ සීමාව අසල පන්දු රකිමින් සිටියේ අරවින්ද ද සිල්වා. එතකොට උපුල් චන්දන ඇවිත් ඔහුට කියා තිබෙනවා ඔයා යන්න. මම ඉන්නම් මෙතැන. ගල් වැලි බෝතල් වැදුණොත් ඔයාට අවසන් තරගයට සෙල්ලම් කරන්න බැරි වේවි කියලා. ඒක මම අහපු කතාවක්. මේක මනුෂ්‍යත්වයේ කතාවක්. මේ වගේ සිදුවීම් තමයි ලෝක කුසලානයේ ජයග්‍රහණයට අවශ්‍ය කණ්ඩායම් හැඟීම, සහෝදරත්වය ගොඩ නැඟුවේ. හැමෝම කණ්ඩායම් හැඟීමෙන් ක්‍රීඩා කරලා රටට ලෝක කුසලානය ගෙන දුන්නා.'

එදා අපි ලෝක කුසලානය දිනා ගත්තේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනපති ධුරය දැරූ අපේ ආණ්ඩුවක් තිබුණු කාලයේ. අර්ජුනගේ පියා එතකොට ඇමතිවරයෙක්. ජයග්‍රහණයෙන් පස්සේ ශ්‍රී ලංකාවට ඇවිත් අර්ජුන ලෝක කුසලානය අරගෙන ගියේ එල්ටීටීඊ බෝම්බ ප්‍රහාරයට හසු වී ජීවිතක්ෂයට පත් වුණු ගාමිණී දිසානායකගේ ගෙදරටයි. එයා තමයි ලෝක කුසලානය දක්වා යන්න ක්‍රිකට් ක්‍රීඩාවට අඩිතාලම දමා තිබුණේ. ඒකත් මනුෂ්‍යත්වයේ කතාවක්.'

'අප අපිට ක්‍රිකට් ක්‍රීඩාව ගොඩනගා ගන්න හොඳම පාඩමකට තියෙන්නේ ඒ අතීතය. ඒ අතීතය වර්තමානයට ගෙනාවොත් අපි අද වැටිලා ඉන්න අභාග්‍යයෙන් මිදෙන්න පුළුවන් වේවි කියලා මම හිතනවා. ඒ නිසා අපි පාඩම් ඉගෙන ගෙන ඉදිරියට යමු.' අගමැතිවරයා වත්මන් ක්‍රිකට් කණ්ඩායමට එවැනි පණිවුඩයක් දීමටත් අමතක නොකළේය.

මෙහිදී විශේෂ පදක්කම් පිරිනැමීමක් ද සිදු කෙරුණු අතර, එම පදක්කම් අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලය මඟින් ලෝක කුසලාන ජයග්‍රහණයෙන් කලෙකට පසු එවනු ලැබූ බවත්, පසුගිය වසර ගණනාවක කාලය පුරා එම පදක්කම් ක්‍රිකට් ආයතනයේ තැන්පත් කර තිබූ බවත් වාර්තා විය.

නායක අර්ජුන රණතුංග, අරවින්ද ද සිල්වා, රොමේෂ් කළුවිතාරණ, රොෂාන් මහනාම, හෂාන් තිලකරත්න, චමින්ද වාස්, කුමාර් ධර්මසේන, මුත්තයියා මුරලිදරන්, මාවන් අතපත්තු, උපුල් චන්දන සහ රවීන්ද්‍ර පුෂ්පකුමාර අගමැතිවරයා අතින් ලෝක කුසලාන පදක්කම් ලබා ගත්තේය.

ශ්‍රී ලංකා පිල ලෝක කුසලානය දිනා ගන්නා මොහොතේ ක්‍රීඩා ඇමතිවරයාව සිටි එස්.බී. දිසානායක මහතා ද එම අවස්ථාවට එක් විය. ලෙජන්ඩ්ස් ක්‍රිකට් තරගාවලියට සහභාගී වීමට ඉන්දියාවට ගොස් සිටින බැවින් සනත් ජයසූරියත්, ඔස්ට්‍රේලියාවේ පදිංචිව සිටින බැවින් අසංක ගුරුසිංහත්, ශ්‍රී ලංකා පිලේ කොදෙව් සංචාරයට එක් වී සිටින බැවින් ප්‍රමෝද්‍ය වික්‍රමසිංහත් මේ අවස්ථාවට එක් නොවූහ.

පාකිස්තානයේ ලාහෝර් නුවර ගඩාෆි ක්‍රීඩාංගණයේදී ලොව ප්‍රබලතම කණ්ඩායම වන ඔස්ට්‍රේලියාව පරාජය කරමින් කඩුලු 7ක විශිෂ්ට ජයක් ලබා ශ්‍රී ලංකාව ලෝක සිතියමේ ඉහළට ඔසවා තැබූ නායක අර්ජුන රණතුංග ඇතුළු කණ්ඩායමේ ජයග්‍රහණයේ රිදී ජුබිලය සැමරීමට මැති ඇමැතිවරුන් මෙන්ම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හිටපු සහ වත්මන් පරිපාලකයෝ ද සහභාගි වූහ. ක්‍රිකට් ලෝක කුසලාන විසිපස් සැමරුම නිමිත්තෙන් මේ උත්සවයේදී තැපැල් දෙපාර්තමේන්තුව මඟින් විශේෂ සමරු මුද්දරයක් ද නිකුත් කර තිබිණි.

**ෆවුස් මොහොමඩ්**











# චන්ද්‍රන් රත්නම්ගේ ජෝකී මං

මිනිස්සු







> ඉස්සරෝම මගේ ඉහට ගහලා තිබුණේ පෝනි පිස්සුව. කොම්පඤ්ඤ වීදියේ සාරිපුත්ත ඉස්කෝලෙට මං දෙකේ පන්තියේදී ආයුබෝං කිව්වා. එදා ඉඳන් ඉලන්දාරි කාලේ පෝනියෝ එක්කමයි මං ඔට්ටු වුණේ. මං නුවරඑළියේ මුලින්ම අස්ස රේස් පැද්ද කීප දෙනාගෙන් කෙනෙක්.

මේ මගේ ගේ කැල්ල. මගේ ගැලරියත් මෙතැනමයි. නෑයෙක් කියලා මගේම කෙනෙක් මං ළඟ නෑ. හැබැයි ගාමිණීලා, ජෝතිලා, විජේලා මැරුණේ නැහැ. හැමදාමත් ඒ කට්ටියත් එක්කයි මං මේ ලෑලි ගෙදරට වැදිලා නින්දට යන්නේ.

මං ජෝතිගේ මිතුරු සමාජයේ කෙනෙක්. මිත්‍රයෙක් විදියටයි ජෝති මාව ඇසුරු කළේ. චන්ද්‍රන් රත්නම්ගේ ජෝකී මං.

සයිප්‍රස් රටේ අයට අස්සයෝ පදින්න හුරුකරන්න මං ගියේ රුපියල් 20,000 පඩියට. එහේදී මිනීමරු අස්සයෙක් මෙල්ල කළාම ඒ අය මගේ පඩිය 30,000ක් කළා.

මට පෝනියෝ තුන්දෙනෙක් හිටියා. දවසට ඒ එකෙකුගෙන් රුපියල් තුන්දාහක් විතර මං හෙව්වා. ඔයින් මෙයින් රන්මුතුදූව පිච්චර් එකෙන් මං සිනමාවට වහ වැටුණා නේ. ඒ කාලේ එක ෆිල්ම් එක 25 වතාවක් විතර බැලුවා.

පොලිසියයි, කොළඹ නගර සභාවයි කීප වතාවක් මගේ පුංචි කලාගාරේ බිමට සමතලා කළා. මං අඬ අඬා ඒ කෑලි එකතු කරලා හරි අමාරුවෙන් තමයි ආපහු හදා ගත්තේ.

මං කොලු කාලේ බ්‍රේක් ඩාන්ස්, ඩිස්කෝ ඩාන්ස් දාන්ඩ හපනා.

දැන් ගිහින් බලන්ඩ තරම් හරිහමන් බයිස්කෝප් හැදෙන්නේ නැති නිසා යන්නේ නැහැ.

'පුතේ උඹ බජාර් එකේ බිම ඉඳගත්තාට කමක් නෑ. හැබැයි උඹ හැදෙන්න දැන ගනින්. මට ඒ ගැන අනිත් මිනිහාට දොස් කියන්න බැහැ' ඉලන්දාරිකමට පේව්මන්ට් එකේ ඉඳ ගත්තාම තාත්තා මට එහෙම කිව්වා. ඉතින් අදටත් මං කාටවත් වරදක් කරලා නැහැ.

එංගලන්තේ චැම්පියන් ජෝකී 1974 දී ලංකාවට ආවාම මගේ දස්කම් දැකලා සුබ පැතුවා.

මළහම අම්මා තාත්තාගේ පින්තූරය වුණත් මුල්ලකට වීසිකරන ලෝකේ මං ආදරේ කරන අයගේ පින්තූරත් එක්කලා ජීවිතේ ඉතිරි ටිකත් ගෙවා දානවා.

මට අකුරු කියවන්න, ලියන්න බැහැ. හැබැයි මං කුලී වැඩෙන් හොයා ගන්නා සල්ලි වෙන අයට දීලා මගේ ජීවිත කතාව පොත්වල ලියවනවා.

'තේ කඩේ කලූ', 'සියඹලා ගහයට කලූ', 96 වත්තේ ජෝකී', 'ජෝකී ෂෙල්ටන්', 'පිච්චර් ෂෙල්ටන්', ඔය කොයි කොයි නමත් ඇඳිලා තියෙන්නේ එකම එක්කෙනකුට. ඒ වෙනින් කාටවත් නෙවෙයි, හේවාගමගේ දොන් ෂෙල්ටන් පෙරේරාට. ඒ මං. හැබැයි මං තුන් වතාවක් වාසගම් වෙනස් කෙරුවා. ඒ සිනමාවට තියෙන ආදරේට.

අම්මා බන්දුවතී පෙරේරා. තාත්තා මේ ගෙන්දගම් පොළොවේ ඉස්සර උන්නු මයිනර් කාර්වලට නම ගිය ඇල්ෆ්‍රඩ් බාසුන්නැහේ. ඒ පවුලේ කොල්ලොම 7යි. එක කෙල්ලයි. ඒ ගොඩේ පස් වැනියා මං.

ඉස්සරෝම මගේ ඉහට ගහලා තිබුණේ පෝනි පිස්සුව. කොම්පඤ්ඤ වීදියේ සාරිපුත්ත ඉස්කෝලෙට මං දෙකේ පන්තියේදී ආයුබෝං කිව්වා. එදා ඉඳන් ඉලන්දාරි කාලේ පෝනියෝ එක්කමයි මං ඔට්ටු වුණේ. මං නුවරඑළියේ මුලින්ම අස්ස රේස් පැද්ද කීප දෙනාගෙන් කෙනෙක්. එහේ පීටර් ඔබේසේකර හාමුගේ පෝනියෝ පැද්ද ජෝකී මං. රේස් දිනුවාම ඒ කාලේ රුපියල් 50ක් ලැබෙනවා. ඒක ඒ කාලේ ලොකු ගාණක්.

ඒ කොයි හැටි වෙතත් අකුරු කියවන්න, ලියන්න අදටත් මට බැහැ. ගණන් මිනුම් මට හරි අමාරුයි. ඒත් මං සිනමාව ගැන පින්තූර බලලා තේරුම් ගන්නවා. අද මෙහෙම හිටියාට ඉස්සර මං පෝනියෝ තුන්දෙනකුගේ අයිතිකාරයෙක්. ඒ එකෙක්ගෙන් දවසකට රුපියල් තුන්දාහක් විතර මං හෙව්වා. ඒත් පස්සේ මං උන්ව එක එක්කෙනාට දීලා දැම්මා.

ඉස්සර මං නොබැලුව පිච්චර් එකක් නැහැ. ගාමිණී හෝල් එකේදියි වැඩිපුර බැලුවේ. ඒකේ ඒ කාලේ ටිකට් එක ශත 55යි. ටවර්හෝල් එකේ ඊට ටිකක් අඩුයි. එහේ ටිකට් එකක් ශත 50ක් විතර වුණා. 'චණ්ඩියා', 'ධීවරයෝ', 'ආත්ම පූජා' ඔය විදියට පැය ගාණක් වුණත් මට කියාගෙන යන්න පුළුවන්. හැබැයි ආත්ම පූජා තමයි මං ආසම පිච්චර් ඒක. ඒකේ ගාමිණී ෆොන්සේකාගේ කඩු ෆයිට් එක ටොප්. ඊට පස්සේ කාලෙක චන්ද්‍රන් රත්නම්ගේ ජෝකී වෙන්න ලැබීම මට ලොකු සතුටක්.

හුණුපිටිය හරස් පාරේ පෙට්ටි කඩයක් තිබුණත් මං ඒක වෙළෙඳාමකට යොදා ගන්නේ නැහැ. මං මෙතැන සිනමාවට වෙන් කරලා තියෙන්නේ. කවදා හරි මං මැරුණු දාකටත් මං වගේ පිච්චර්වලට ආදරේ මිනිහෙක් මේ පින්තූර පරිස්සම් කරන් මෙතැන ඉන්නවා නම් ඒකයි මගේ සතුට.

ඉස්සර අයියයි, මමයි මෙතැන තේ කඩේ කළේ. 2012දී මගේ අයියා මිය ගියා. ඉන් පස්සේ මං මෙතැන තනි වුණා. ටිකෙන් ටික මං මේ පින්තූරවල ජීවත් වෙන ඒ අමරණීය මිනිස්සු එක්ක ජීවත් වෙන්න හුරු වුණා.

මේ අවට පිරිසුදුව තියාගන්න මං ආසයි. පාන්දර නැගිටලා මං අවට අතුපතු ගානවා. ඉන් පස්සෙයි දවස පටන් ගන්නේ. එහෙම කිවුවාට මට කිසිම ආදායම් මාර්ගයක් නැහැ. කොළඹ අවට ලොකු ගෙවල්වල කවුරු කවුරු හරි ගස්වල අතු කපන්න නැතිනම් වත්තේ පිටියේ වැඩකට කතා කළොත් මං යනවා. ඒකෙන් ලැබෙන දෙයින් මොක මොකවත් කාලා ඉතිරි එකෙන් පරණ නළු නිළියෝ ඉන්න පත්තර, සඟරා ගේනවා. ඒවයේ තියෙන පරණ පිච්චර්වල මතක කපාගෙන ලැමිනේට් කරලා ගෙනැත් මෙතැන එල්ලනවා. හැබැයි, කොරෝනා නිසා දැන් හුඟක් වැඩ අඩුයි.

ජෝතිට මං පණ ඇරලා ආදරෙයි. මං මගේ පරණ රේඩියෝ එකේ එයාගේ සින්දු අහනවා. ඒත් වැඩක් පලක් නොලැබුණු දාට මට කෑමවත් රේඩියෝවට බැටරි කෑලිවත් ගන්න විදියක් නැහැ. එහෙම දාට අහල පහළ කඩේකින් දෙන දෙයක් කාලා ඉන්නවා. මගේ ගැලරියත් මෙතැනමයි. ඉස්සර 'රන්මුතු දූව' ෆිල්ම් එකෙන් තමයි මං සිනමාවට වහ වැටුණේ.

ඒ ඉස්සර මතක මට හරි රසයි. ඒ කාලේ 'හඳයා' චිත්‍රපටියේ වේගෙන් අස්සයෝ පදින සීන් කළේ අපි. හැබැයි අපිව කැපී පෙනුණේ නැහැ. අපි සහාය නළුවෝ විතර නේ. හැබැයි අපිත් ඒ කාලේ බ්‍රේක් ඩාන්ස්, ඩිස්කෝ ඩාන්ස් දාන්න හපන්නු.

'සූරයෝ', 'වැඩකාරයෝ' ෆිල්ම් එකට පෝනියෝ පදින්න රන්ජන් රාමනායකට පුරුදු කළේ මං. එයා හපනා. ඉක්මනටම වැඩේ අල්ල ගත්තා. මං හිතන්නේ රඟපාන්න ලස්සන ඕනම නැහැ. ඇක්ටිං තමයි තියෙන්න ඕනෑ. මං පිච්චර් දහයක විතර ඇක්ට් කරලා තියෙනවා.

මගේ මේ ඇහේ අමාරුව රණ්ඩුවකදී වීදුරු කැල්ලක් වැදිලා වුණු එකක්. ඒත් මං වෛර බැන්දේ නැහැ. මට ගැහැව්ව කෙනාව නිදහස් කරගන්න වියදම් කළෙත් මමමයි. එයා දිවි නසා ගත්තා. අන්තිම මොහොතේ මාව එයා ළඟට එක්කරන් එන්න කියලාත් කියලා තියෙනවා. අදටත් මගේ ඒ මනුස්සයා එක්ක තරහක් නැහැ.

මගේම අයත් එක්ක වුණත් එහෙමයි. මං විවාහකයි. දරුවෝ දෙන්නෙක් ඉන්නවා. ඒත් ඒ කවුරුවත් මා ළඟ නැහැ. ඒත් මං ඒ අයට සුබ පතනවා. ආදරෙයි මං ඒ හැමෝටම.

තරුණ කාලේ සයිප්‍රස් රටට දෙමාසයකට විතර ගියාම මුලින්ම මට පැවරුණේ මිනීමරු අස්සයෙක් මෙල්ල කරන් ඌව දුවවන්නයි. මං අමාරුවෙන් ඒ වැඩේ කළා. ඒකට ඒ රට පුදුම වුණා. මං ඒ රටේ අයට අස්ස රේස් පුරුදු කරවන්නයි ගියේ. ඒ සතුටට එයාලා මට පොරොන්දු වුණු රුපියල් 20,000 පඩිය 30,000 ක් කරලා ගෙව්වා.

අද වනතුරු මං මගේ තාත්තා දුන්නු උපදෙස සිහි කරනවා. මං පේව්මන්ට් එකේ ඉඳන් ඉන්නවා දැකලා තාත්තා මට 'පුතේ උඹ බජාර් එකේ බිම ඉඳගත්තාට කමක් නෑ. හැබැයි හැදෙන්න උඹ දැන ගනින්. මට ඒ ගැන අනිත් මිනිහාට දොස් කියන්න බැහැ' කියලායි කිවුවේ. මං කවදාවත් කාගේවත් දෙයක් අසාධාරණ විදියට කඩා වඩාගෙන නැහැ.

මං උපයන දෙයක් වියහියදම් කළේත් පෝනියන්ටයි, සිනමාවටයි තමයි. මේ මං උපන් ගම. අද එදාට වඩා මෙහේ හරි වෙනස්. ඉස්සරහටත් තව හුඟක් වෙනස්කම් සිදුවේවි. ඒ කොයික වුණත් මෙතැනින් උදේ හවා මෙතැනින් හැල්මේ දුවන දෙනෝදාහක් මිනිස්සු දිහෑ මං මගේ නවාතැනේ ලැගුම් ගත්ත සිනමා තරු එක්කම පිච්චර් එකක් බලන්නා වාගේ නිස්කලංකව ඔහේ බලා ඉන්නවා.'

මං
ෂෙල්ටන් පෙරේරා

**හමුව - නුවන් මහේෂ් ජයවික්‍රම**
**ඡායාරූප - සාලිය රූපසිංහ**





දිසත
දිනමිණ
දස අත ම එක තැන

අත්තක් දෙකක් කැපුවම Tv වලින් ලොකුවට පෙන්වනවා



පිටුව 17

දීඝවාපී පරිවාර චෛත්‍යයේ අසිරිමත් මල් පූජාව



පිටුව 18

රැමස්සල සුරැකීමේ එකමුතුව පාරට බසී



පිටුව 17



ඩී. එස්. ගුණතිලක ඌව වෙල්ලස්ස විශේෂ

# රජයේ වාහන රැසක් මොනරාගල කොටන් උඩ

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්‍යාලයට අයත් රජයේ වාහන රැසක් දීර්ඝ කාලයක් තිස්සේ භාවිතයට නොගැනීම නිසා දිරාපත්වෙමින් පවතින බව දිනමිණට අනාවරණ වෙයි.

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ වාහන හයක් ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන පහක් ද මෙලෙස දිරාපත්වෙමින් පවතී.

මේ පිළිබඳව මොනරාගල අතිරේක දිස්ත්‍රික් ලේකම් චන්දන ලොකුහේවගේ මහතාගෙන් කළ විමසුමක දී මෙසේ කීය.

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ කැබ්රථ හතරක්, ජීප් රථයක් ඇතුළු වාහන කිහිපයක් ප්‍රයෝජනයට ගැනීමට නොහැකිවීමෙන් ගාල්කර තිබෙනවා. ඇතැම් වාහන වසර දහයක් තිස්සේ මෙලෙස පවතිනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද වාහන කිහිපයක් භාවිතයට ගැනීමට නොහැකිව තිබෙනවා. මේ පිළිබඳව අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනුවත්කර අනුමැතිය ලබාගෙන වෙන්දේසි කිරීමට හැකි වාහන වෙන්දේසි කිරීමටත් භාවිතයට ගැනීමට නොහැකිම වාහන අපද්‍රව්‍ය ලෙස ඉවත් කිරීමටත් කටයුතු කරන බව හෙතෙම සඳහන් කළේය. මේ පිළිබඳව මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ අත්තනායක මහතාගෙන් කළ විමසුමකදී පැවසුවේ භාවිතයට නොගෙන ගාල්කර තිබෙන වාහන වලින් කිහිපයක් රාජ්‍ය ආයතනවලට මේ වන විට ලබාදී ඇති බවයි. අනෙකුත් වාහන කිසිදු ප්‍රයෝජනයකට ගැනීමට නොහැකිව පවතින බවයි.









නුවන් ජයසේකර - සූරියවැව විශේෂ, රාහුල් සමන්ත හෙට්ටිආරච්චි අම්බලන්තොට සමූහ සහ සනත් ගමගේ - ලුණම සමූහ

# හම්බන්තොට වරායෙන් නැව්වලට ඉන්ධන තොග

හම්බන්තොට ජාත්‍යන්තර වරායෙන් දැනට ක්‍රියාත්මක සේවාවන්ට අමතරව නැව් සඳහා ඉන්ධන තොග වශයෙන් ලබා දීමේ කටයුතු හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි තිස්ස වික්‍රමසිංහ මහතා ඇතුළු පිරිසකගේ ප්‍රධානත්වයෙන් පසුගිය දින ඇරඹිණි.

ඒ අනුව IMO 2020 හෙවත් අවම සල්ෆර් සංයුතියකින් යුත් ප්‍රථම ඛනිජ තෙල් (VLSFO) තොගය මිලදී ගත් ප්‍රථම ගැනුම්කරු බවට පත් වුයේ වෙළෙඳ නෞකා සඳහා ඉන්ධන සැපයීමේ වෙළෙඳපොළ ප්‍රමුඛයා වන ලංකා මැරීන් සර්විසස් සමාගම (LMS), හම්බන්තොට වරායේද සහාය ඇතිව තම සේවාදායකයා වූ ඉන්දියාවේ චෙන්නායි සිට සූවස් දක්වා යාත්‍රා කරමින් තිබූ එම්.වී. සූවස් හාන්ස් නමැති ඉන්ධන ප්‍රවාහන නෞකාවයි.

හම්බන්තොට ජාත්‍යන්තර වරාය තම සේවාවන්හී නව සන්ධි ස්ථානයක් සනිටුහන් කරමින් ලොව ප්‍රමුඛ පෙළේ ගෝලීය ක්‍රියාකරුවකු වන සයිනොපෙක් ඔයිල් සමාගමේ මෙරට නියෝජිත සමාගම වන සයිනොපෙක් ලංකා සමාගම (SFOL) සමඟ හවුල් වී වරාය සතු එම්.වී. කුමන ඉන්ධන යාත්‍රාව හරහා මෙම ඉන්ධන තොග වශයෙන් සැපයීමේ කටයුතු සිදු කරණු ලබයි.

රූපිකා කේ. බණ්ඩාර - කුරුවිට සමූහ

# කොස් ගෙඩියට ගුටි කෙළගත් බෑනා නැන්දම්මාගේ අත කඩලා

කොස් ගෙඩියක් නිසා ඇතිවූ ආරාවුලක් දුරදිග යෑමෙන් බෑනා විසින් නැන්දම්මාගේ අත කැඩීම නිසා ඇය මේ වන විට සිංහල වෛද්‍ය ප්‍රතිකාර ලබමින් සිටී. මෙම සිද්ධිය වී ඇත්තේ රත්නපුරය අවට ගම්මානයකය.

මෙම බෑනාගේ නිවෙස හා නැන්දම්මාගේ නිවෙස තිබෙන්නේ ආසන්න වන අතර බෑනා විසින් අසළ නිවෙසක කුලි වැඩකට ගොස් එන විට කොස් ගෙඩියක් රැගෙනවිත් ඇති අතර එය පිළියෙළ කිරීමට එම අවස්ථාවේ බිරිය නිවෙසේ නොසිටි බැවින් ආසන්නයේ පිහිටි නැන්දම්මාග් නිවෙසට කොස් ගෙඩිය ගෙන ගොස් එය සකස් කරන ලෙස පවසා ඇත.

පසුව රාත්‍රී කාලයේදී නැන්දම්මාගේ නිවෙසට ගිය විට කොස් පිළියෙළ කර නැති බව දැනගත් ඔහු නැන්දම්මාට බැණ වදින විට ඇයද ඔහුට බැණ වදිමින් පවසා ඇත්තේ ඔහු කොස් පිළියෙළ කරන්නට කියන්නේ මත්පැන් බීමට බැවින් සකස් නොකළ බවයි. මේ පිළිබඳ දෙදෙනා අතර ඇතිවූ කතාබහ දුරදිග ගොස් බෑනා විසින් පොල්ලකින් පහරදීම නිසා ඇගේ අත කැඩී තිබේ.

සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමූහ

# නිවෙසකට ඇතුළු වී දේපළ කොල්ල කාලා

දෙල්ගොඩ නාරංවල ප්‍රදේශයේ නිවෙසකට හොර රහසේ ඇතුළු වූ පුද්ගලයන් දෙදෙනකු විසින් නිවෙසියන් සතු සවර්ණාභරණ සහ මුදල් සොරාගෙන පලාගොස් සිටියදී එම සැකකරුවන්ගෙන් එක් අයකු පෙරේදා (16) මීගහවත්ත පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. නිවෙසියන් මංගල උත්සවයකට ගොස් සිටි අවස්ථාවේ රාත්‍රී කාලයේ එම නිවෙසේ ජනේලයකින් නිවෙසට ඇතුළු වී ඇති සැකකරුවන් විසින් අල්මාරියක් විවෘත කර එහි තිබූ රන් මාල දෙකක් සහ මුදල් සොරාගෙන පලා ගොස් ඇති බව පොලීසිය කියයි.

ලද තොරතුරකට අනුව නාරංවල ප්‍රදේශයේම පදිංචි විසිදෙහැවිරිදි තරුණයකු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී සැකකරුවන් විසින් සොරාගත් රන් භාණ්ඩ දෙල්ගොඩ ප්‍රදේශයේ උකස් මධ්‍යස්ථානයකට උකස් කර තිබියදී පොලීසිය විසින් සොයාගෙන ඇත.

සොරකමට සම්බන්ධ තවත් සැකකරුවකු ප්‍රදේශයෙන් පලාගොස් ඇති අතර ඔහු අත්අඩංගුවට ගැනීමට පොලීසිය විසින් විමර්ශන ආරම්භ කර ඇත.

වත්තල විශේෂ - ජෝශප් පයස්

# හරිත පැහැ තිළිණයක් රැගෙන මිත්‍රත්වයේ චාරිකාවක් දකුණින් උතුරට

## පැළ 1500ක් සිටුවීමේ ව්‍යාපෘතියක් යාපනයේදී





තිස් අවුරුදු යුද්ධය නිසා නැතිවූ උතුර දකුණ සිංහල දමිළ මිතුදම යළි ස්ථාපිත කිරීමේ සහ දිනාගත් සාමය රැකගැනීමේ අරමුණින් කතෝලික සභාවට අයත් කරිටාස් ආයතනය යාපනයේ එළිතුමන්තුවාල්හිදී පැළ සිටුවීමේ ව්‍යාපෘතියක් පසුගියදා ආරම්භ කරන ලදී.

දිවයිනේ විවිධ පදවිවලින් ලබාගත් ඖෂධීය පැළ, පළතුරු භෝග පැළ, ආහාර භෝග පැළ වැනි විවිධ වර්ගයේ පැළ වර්ග 1500ක් අක්කර 300ක භූමි භාගයක සිටුවීමට කටයුතු කර තිබිණි.

ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පාප්වහන්සේ විසින් නිකුත් කළ 'Landato Si' විශ්ව ලේඛනයට අනුගත වෙමින් ස්වභාවධර්මය ආරක්ෂා කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද බවත්, කතෝලික සභාව භාරයේ දෙවසරක් පමණ කාලයක් අදාළ පැළ රැකබලාගෙන නැවත භාරදීමට කටයුතු කරන බවත් මේ පිළිබඳව කරන ලද විමසීමකදී කරිටාස් ජාතික අදියුරු මහේන්ද්‍ර ගුණතිලක ගරු පියතුමා පවසා සිටියහ.

පරිසරය රැකෙන්නේ ගහ කොළ රැකගත හොත් පමණක් බව පෙන්වා දෙන ගුණතිලක පියතුමා මෙම පැළ සිටුවීමේ ව්‍යාපෘතිය මඟින් යුද්ධය හේතුවෙන් මුඩුබිමක් බවට හැරුණු බිමක් යළි හරිත බිමක් බවට පත්වනු දැකීම අපේ සතුටට හේතුවනු ඇති බවත් වැඩිදුරටත් පැවසූහ.

යාපනය පදවියේ රදගුරු අතිඋතුම් ජස්ටින් ඥාණප්‍රගාසම් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම පැළ සිටුවීමේ ව්‍යාපෘතියට අන්‍යාගමික නායකයින් යුද හමුදා නිලධාරීන් ඇතුළු ගිහි පැවිදි විශාල පිරිසක් සහභාගී වී සිටියහ. එහි විශේෂ අවස්ථා කිහිපයකි මේ.

ඩී. මිහිඳුකුල කොච්චිකඩේ

# ඒ අත්අකුරු කෙල්ලගෙ නෙමේලු

මීගමුව වැල්ලවීදිය පදිංචිව සිටි තරුණියක ගෙල වැලලාගෙන මිය යාමේ සිද්ධියට චෝදනා ලැබ සිටින හෝටල් හිමියා මියගිය තරුණියගේ සිරුරේ සඟවාගෙන සිටි බව කියන ලිපියේ අත්අකුරු එම තරුණියගේ නොවන බව නාගරික හදිසි මරණ පරීක්ෂකවරයා ඉදිරියේ 15දා ප්‍රකාශ කිරීම නිසා එම අත් අකුරු පිළිබඳ පරීක්ෂණයක් කළ යුතු යයි හදිසි මරණ පරීක්ෂක ජයන්ත වික්‍රමරත්න මහතා මීගමුව පොලිසියට ප්‍රකාශ කර සිටියේය.

මියගිය තරුණිය විසින් ලියා ඇතැයි සිතන අත්අකුරු සඳහන් ලිපි ලේඛන සහ සටහන් නිවසේ හෝ වෙනත් ස්ථානයක ඇත්නම් පොලිස් භාරයට ගෙන නඩු භාණ්ඩ වශයෙන් තබා ගන්නා ලෙස ද මීගමු පොලිසියට නියම කළේය. එසේම එම තරුණියගේ අත් අකුරු හඳුනාගැනීම සඳහා ඇගේ මව්පියන්ට සහ සහෝදරයාව තමන් වෙත ඉදිරිපත් කරන ලෙස ද පොලිසියට නියම කරන ලදී. මියගිය තරුණිය තම බිරිය සමඟ තමාට අයත් හෝටලයේ සේවය කළ බව ද මරණ පරීක්ෂක අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඔහු කියා සිටියේය.

ඩී. මිහිඳුකුල කොච්චිකඩේ

# ඉන්දියාවෙන් හොරාට කහ කිලෝ 2000ක් පන්නලා




මීගමුව කුට්ටිදූව මුහුදු තීරයේ වරායක් හෝ දුටු පළක් නොවන ස්ථානයකින් ඊයේ (17) අලුයම තීරු බදු නොගෙවා මෙරටට බහුදින යාත්‍රාවලින් හොර රහසේ ඉන්දියාවේ සිට ගෙනඑන ලදයි කියන රුපියල් ලක්ෂ හැටක් (60) පමණ වටිනා කහ කිලෝ දෙදහසක් (2000) සමඟ සැකකරුවන් තිදෙනකු සැකපිට අත්අඩංගුවට ගත් බව මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශය පවසයි.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ කළඑලියේ පදිංචි ලොරි රථයේ රියැදුරුද, සහයක සහ තවත් පුද්ගලයෙකි.

හොර රහසේ ගෙන එන ලද බෑග්වල අසුරා තිබුණු කහ තොගය දහයියා (වී පොතු) දමන ලද බෑග්වලින් වසා ගෙන ලොරියකින් ප්‍රවාහනය කරන ලද බවට ලැබුණු තොරතුරක් මත මීගමුව තිල්ලන් දූව හන්දියේ දී මාර්ග බාධක යොදා මෙම ලොරි රථය අත්අඩංගුවට ගෙන තිබුණි.

හිරිඋල්ල විශේෂ

# කොළඹ-කටුනායක අධිවේගී ලංගම බස් සේවය අන්තිමයි



කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයේ ධාවනය වන ශ්‍රී ලංගම බස් රථ සේවය දිනෙන් දින දුර්වල වෙමින් පවතින බව මඟී ජනතාව පවසති. වැඩිපුරම මඟීන් ගමන්ගන්නා උදෑසන මෙන්ම සවස 4.00න් පසුව මෙම මාර්ගයේ බස් ධාවනය ඉතා මන්දගාමී ස්වභාවයක් ගනී. පසුගිය මාර්තු (05) සිකුරාදා සවස 3.30ට පමණ මධ්‍යම බස් නැවතුම්පළින් මීගමුව දක්වා ගමන් කිරීමට පැමිණියත් සවස 5.45 වනතුරුත් අධිවේගී මාර්ගයේ එකදු බස් රථයක්වත් පැමිණියේ නැත. පැයකුත් විනාඩි 15ක් ගතවූ පසු ධාවන මැදිරියෙන් නිවේදනය කළේ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ බස් රථ ධාවනය ප්‍රමාද වන බවයි.

දැඩි අසීරුතාවකට පත් මඟීන් ඉන් පසුව ගුණසිංහපුර පෞද්ගලික බස් නැවතුම්පළ වෙත ගමන් කරනු දක්නට ලැබිණි. සුව පහසුවෙන් හා කඩිනමින් ගමන් පහසුව සපයා ගැනීම සඳහා වැඩි පිරිසක් අධිවේගී මාර්ගයේ බස් රථවල ගමන් කිරීමට කැමැත්තක් දක්වති. වැඩිපුර මුදලක් ගෙවා හෝ මඟීන්ට අවශ්‍ය වන්නේ තම ගමන කඩිනමින් යාමටය. ඒත් අවශ්‍ය වේලාවට ලංගම බස් සේවාව කාර්යක්ෂම නැත්නම් මඟීන්ට සිදුවන්නේ කබලෙන් ලිපට වැටීමටය. විශේෂයෙන්ම සිකුරාදා වැනි සති අන්ත දිනවල වැඩි මඟී පිරිසක් ගම් බිම් බලා යාමට පැමිණෙති. එවැනි විශේෂ දිනවලදීවත් අධිවේගී මාර්ගයේ ලංගම බස් ධාවනය මීට වඩා කාර්යක්ෂමව විය යුතු බව මඟී ජනතාව පවසති..

සුඛෝපභෝගී ලංගම බස් රථ නොමැති වේලාවන්හි ඊට විකල්පයක් ලෙස සාමාන්‍ය ලංගම බස් රථ ධාවනය එකතු කළද ඉකුත් (05)දා එවැනි සාමාන්‍ය ලංගම බස් රථයක්වත් ධාවනය කරවීමට මධ්‍යම බස් නැවතුම්පළේ ධාවන කළමනාකරුවන් කටයුතු නොකිරීම මඟීන්ගේ දැඩි දෝෂදර්ශනයට ලක් විය. ප්‍රවාහන ඇමැතිතුමනි කටුනායක - කොළඹ අධිවේගී මාර්ගයේ ලංගම බස් ධාවනය මීට වඩා කාර්යක්ෂම කිරීමට කඩිනම් වැඩපිළිවෙළක් සැකසිය යුතු බවට මඟී ජනතාව රජයෙන් ඉල්ලා සිටිති.

කුරුවිට සමූහ - රූපිකා කේ.බණ්ඩාර

# කරපිංච - පාතගම පාර මංතීරු දෙකක් ලෙස සංවර්ධනයට

කරපිංච - පාතගම පාර මංතීරු දෙකක් ලෙස සංවර්ධනයට පියවර. කරපිංච - පාතගම මාර්ගය කිලෝමීටර් 4ක් පමණ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වන අතර එය දැනට මංතීරු දෙකකට කාපට්කර ඇත. ඉතිරි කොටස ප්‍රාදේශීය සභා පාරක් බැවින් කාපට් කිරිමට අනුමත වී ඇත්තේ එක් මංතීරුවකි. මෙය මංතීරු දෙකක් බවට පත්කර ගැනිම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට පවරාගෙන උසස් ශ්‍රේණිගත කිරීමට කුරුවිට සම්බන්ධිකරණ කමිටුවේ උප සභාපති රංජිත් බණ්ඩාර මහතා කටයුතු කරමින් සිටී.

එමෙන්ම හිග්ගස්හේන හංදියේ සිට දෙවිපහල හරහා දැරණියගල දක්වා මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ මංතීරු දෙකම කාපට් කිරීමටද පියවර ගැනේ.

මහරගම සමූහ - ටී. ඩී. සිරිසේන

# 'මඝ ගිය මඟ' දොරට වඩී



ප්‍රවීණ ලේඛක දෙනගම සිරිවර්ධනයන් විසින් රචිත යොවුන් නව කථාව 'මඝ ගිය මඟ' පසුගියදා මහරගම තරුණ බෞද්ධ සංගම් ශාලාවේදී එළිදැක්විණි. කතුවර දෙනගම සිරිවර්ධන මහතා තරුණ සේවා බෞද්ධ සංගම් සභාපති තිලක් හේරත් මහතාට කෘතිය පිළිගැන්වූ අයුරුයි මේ. තරුණයන් තුළ සමාජයට සේවයක් කිරීමේ වැදගත්කම කියාපාන ආදර්ශවත් කථාවක් මෙහි අන්තර්ගත වේ.

ජී.එස්. තැලිගම - කිරිඳිවැල සමූහ

# නිවෙසක ගෙවත්තේ බැඳ සිටි මී ගවයන් දෙදෙනකු උස්සලා

දොම්පෙ පොලිස් වසමේ කරංගොඩ නිවෙසක ගෙවත්තක ඇති කරමින් සිටි මී ගවයන් දෙදෙනකු පෙරේදා (16) සොරකම් කරගෙන ගොස් ඇති බවට දොම්පෙ පොලීසියට ලැබුණු පැමිණිල්ලක් අනුව වහා ක්‍රියාත්මක වූ එම නිලධාරීහු උඩමාපිටිගම සහ කොරතොට ප්‍රදේශයේ පදිංචි දෙදෙනකු අත්අඩංගුවට ගෙන තිබේ.

වැඩිදුර ප්‍රශ්න කිරීමේදී කොට්ටාව මාකුඹුර ප්‍රදේශයේ 'ලොක්කා' නමැති ගවයන් ඇති කරන අයකුට විකුණු බව අනාවරණය කරගෙන ඇත.

ඒ අනුව එම ස්ථානයට ගිය දොම්පෙ පොලිසියේ නිලධාරීන්ට එම ගවයන් දෙදෙනා පොලිසිය භාරයට ගැනීමට හැකිවී ඇත. සැකකරුවන් දෙදෙනා වයස අවු 45ත් 50ත් අතර අය වන අතර අද (18) දින පූගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිපත් කිරීමට නියමිතය.

බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්ධු තෙන්නකෝන්, ගම්පහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කේ.කේ. ඉන්දික සිල්වා, සහකාර පොලිස් අධිකාරී ගම්පහ 111 වින්තක පීරිස් යන මහත්වරුන්ගේ උපදෙස් අනුව දොම්පෙ පොලීසියේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පො. පරීක්ෂක ආර්.පී.ඒ. ප්‍රියංක මහතා ඇතුළු අපරාධ අංශයේ උ.පො.ප. කරුණාරත්න, පො.සැ. අබේරත්න, පො.සැ. බාලසූරිය යන නිලධාරීන් මෙම වැටලීම සිදු කර ඇත.

වජිර පූජිත ගුණවර්ධන තෙලිජ්ජවිල සමූහ

# ගම සමඟ පිළිසඳර මීළඟ අදියර මාතර දෑරංගලදී

ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක ගම සමඟ පිළිසඳර වැඩසටහනේ මීළඟ අදියර මාර්තු 27වන දින මාතර දිස්ත්‍රික්කයේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෑරංගල ජනපදයේ පවත්වන්නට නියමිතය. ඒ පිළිබඳ පැවති පූර්ව හමුවක් දෑරංගල මහ විද්‍යාලයේ දී 15 දින පවත්වන ලදි. එම අවස්ථාවට විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම, ධීවර රාජ්‍ය අමාත්‍ය කංචන විජේසේකර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන වීරසුමන වීරසිංහ, නිපුණ රණවක යන මහත්වරු සහ රාජ්‍ය නිලධාරී පිරිසක් ද ඊට සහභාගී වූහ.




මියන්මාර්හි සිදුවූ හමුදා කුමන්ත්‍රණයට එරෙහිව උතුරු නැගෙනහිර ඒකාබද්ධ සංවිධානවල සංවිධායකත්වයෙන් ඊයේ සවස මඩකලපුව ගාන්ධි උද්‍යානයේ පැවති උද්ඝෝෂණයේ අවස්ථාවක්.

මඩකලපුව සමූහ - ජ්වෆර් කාන්

ඉබ්බාගමුව සමූහ කුමාරි දිසානායක

# සිවු නිවුන් දරුවන්ට උගන්වන්න ඔබේ අතහිත දෙන්න



ඉබ්බාගමුව ප්‍රදේශයේ සිව් නිවුන් දැරියෝ මේ වසරේ සිය පාසල් ගමන ආරම්භ කළහ. කුරුණෑගල මහින්ද මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන මේ සිව් දෙනා පාසල් ගියේ සීයා සමඟ ය. ඒත් හිටිහැටියේ ම සීයා අංශභාග රෝගියකු වීම නිසා මේ දරුවන්ට ගැටලු ගණනාවක් මතුව තිබේ. ගොකරැල්ල පොල්ගොල්ල දේවපාල විද්‍යාලේ 4 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන වැඩිමහල් දරුවා වන රන්දිව් රත්නායකගේ අධ්‍යාපනය ගැන ද පවුලේ අයට අලුතෙන් සිතීමට සිදුව තිබේ. කුඩා දැරියන් ගේ සියලු කටයුතු වෙනුවෙන් කැපවීම් කළ කිරි අම්මාට ද වැඩි කාලයක් දැන් ගෙවා දැමීමට සිදුව ඇත්තේ ඇගේ ආදරණීය ස්වාමියා ගේ කටයුතු සඳහා ය. " දුවගේ සිව් නිවුන් දැරියන් හතර දෙනා මේ අවුරුද්දේ අපි ඉස්කෝලෙට බාර දුන්නා. ඒ සියලු කටයුතු වෙනුවෙන් ඉස්කෝලෙට ගියෙ මේ දරුවන්ගේ සීයා. දුව රජයේ රැකියාවක් කරනවා. ඒ වුණත් දරුවන්ට අධ්‍යාපනය දීමේ දී ගැටලු ගණනාවක් මතු වෙනවා. මේ කාරණා එක්ක සියලුම අධ්‍යාපන බලධාරීන්ගේ අවධානය දරුවන් කෙරෙහි යොමු වුණා. දරුවන් පාසලට ඇතුළත් කර ගත්තට පස්සේ දරුවන් ව ඉස්කෝලෙ එක්ක ගියෙත් මගේ මහත්තයා තමයි. පහු ගියදා 14වැනිදා උදේ මහත්තයා රෝගී තත්ත්වයට පත්වුණා. ඒකත් එක්ක අපි ඉතාමත් අසරණ වුණා. අපට දරුවන්ට උගන්න ගන්න කාගේ හෝ උදව් උපකාර දැන් අවශ්‍ය වෙලාව යැයි මේ කිරි අම්මා කියයි. යම් පරිත්‍යාගශීලියකු වෙතොත් 037-2259072 දුරකථනයට කතා කොට වැඩිදුර විස්තර දත හැකිය.

තමරසිරි විජේසේකර - දෙයියන්දර සමූහ

# මාතර මොලොක්ගමුව මලයන්කැටිය මාර්ගයට කාපට්



සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව දිවයිනේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් ලක්ෂයක් සංවර්ධනය කර කාපට් ඇතිරීමේ ජාතික වැඩසටහන යටතේ මාතර දිස්ත්‍රික්කයේ මොලොක්ගමුව - දෙන්කදලිය, මලයන්කැටිය මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීම කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා ආරම්භ කෙරිණි.

මේ සඳහා වැය කරන ලද මුදල රුපියල් මිලියන 75.78 ක් වන අතර කාපට් අතුරා සංවර්ධනය කිරීමට නියමිත මාර්ගයේ දුර ප්‍රමාණය කිලෝමීටර් 5.005 කි. ග්‍රාමීය මාර්ග සහ අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මඟින් වැඩසටහන ක්‍රියාවට නංවයි.

තලාතුඔය විශේෂ

# අනතුරින් තරුණයා මරුට

රැකියාව නිමවා යතුරුපැදියෙන් නිවෙස කරා යමින් සිටි තරුණයකු කැබ් රථයක ගැටීමෙන් බරපතළ තුවාල ලබා මරණයට පත්වී තිබේ. තලාතුඔය කොස්සින්කැටවල ලෙව්ල පදිංචිව සිටි චමෝද් හිමන්ත ගවුඩර් (19) මේ අවාසනාවන්ත ඉරණමට මුහුණ පෑවේය.

එස්. ලොකුකරවිට - කරාපිටිය සමූහ

# කරාපිටියේ මිය ගිය කොවිඩ් ආසාදිතයා භූමදානය මඩකලපුවේ

කරාපිටිය රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකයට ඇතුළත් කර සිටියදී මියගිය පුද්ගලයකු කොරෝනා ආසාදිත බව ඊයේ (17) ලැබුණු පී.සී.ආර්. ප්‍රතිඵල අනුව තහවුරු වූයේ යැයි රෝහලේ අධිකරණ වෛද්‍ය අංශය පවසයි.

මෙලෙස මියගොස් ඇත්තේ ගාල්ල, දංගෙදර පදිංචි වයස අවුරුදු 72ක් වූ පිරිමි පුද්ගලයෙකි. පෙරේදා (16) සවස නිවෙසේ සිටියදී ඇතිවූ රෝගී තත්ත්වයක් හේතුවෙන් හෘද රෝග විශේෂඥ වෛද්‍යවරයකු හමුවීමට ගිය අවස්ථාවේ දී කරාපිටිය ශික්ෂණ රෝහලට ඇතුළත් වන ලෙස ලැබුණු උපදෙස් අනුව ඔහු රෝහලට ඇතුළත්ව ඇත. ඉන් පසු එහි හදිසි ප්‍රතිකාර ඒකකයේ සිටිය දී රාත්‍රියේම ඔහු මියගොස් තිබේ. මියගිය පසු කරන ලද පී.සී.ආර්. පරීක්ෂණයෙන් තහවුරු වී ඇත්තේ ඔහු කොරෝනා ආසාදනය වී සිටි අයෙක් බවයි. මෙම සිරුර භූමදානය සඳහා මඩකළපුව දිස්ත්‍රික්කයේ ඕට්ටමාවඩි ප්‍රදේශයට ගෙන යෑමට නියමිත බව ද සෞඛ්‍ය අංශ පැවසීය.

ඩී. මිහිඳු කුල කොච්චිකඩේ

# වැල්ලවීදියේ කාන්තා මළ සිරුරෙන් හමු වූ ලියුමෙන් සැකකරු අල්ලයි

මීගමුව වැල්ලවීදිය ග්‍රාමයේදී ගෙල වැළලාගෙන මියගිය තරුණිය විසින් ලියන ලද බව කියන ලිපියේ සඳහන් කරුණු මත එම මරණයට චෝදනා කරන සැකකරුවකු අත්අඩංගුවට ගත් බව මීගමුව පොලීසියේ අපරාධ විමර්ශන අංශය පවසයි.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ මීගමුව වැල්ලවීදිය අංක 14/ 4 පීටර් මෙන්ඩිස් පාර කුඩාපාඩුව මීගමුව පදිංචි (48) සිව් දරු පියෙකි.

මේ තැනැත්තා අවුරුදු දහයක් විදේශ රැකියාවක සිටි බව කියයි. පෙරළා ලංකාවට පැමිණ මාදැල් සහ හෝටල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් ඇත. මියගිය තරුණියා මෙම හෝටලයේ තම බිරිය සමඟ සේවය කළ බව පැවසේ. දැරිය සමඟ ඇය අවුරුදු 14 වියේ සිටියදී එකට හැසිරෙමින් ගත් ඡායාරූප මුහුණු පොතට මුදාහරින බව සැකකරු පැවසීම නිසා ඇය භීතියට පත්ව සිටි බව කියයි. මිය යන විට ඇය 24 වන වියේ පසුවිය.

මීගමුව පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ පොලිස් පරීක්ෂක ජේ.එම්.එස්. ජයනාථ මහතා ප්‍රකාශ කළේ මේ තැනැත්තාව ඊයේ (17) මීගමුව රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත යොමු කිරීමෙන් පසු අධිකරණයට ඉදිරිපත් කරන බවයි.

එම්.පී. කුමාර - කොටදෙණියාව සමූහ

# රෝහලේ වෛද්‍ය අධිකාරි මාරු කළාට විරෝධයක්



මීරිගම මූලික රෝහලේ වෛද්‍ය අධිකාරි ජයන්ත අභයරත්න මහතා හිටිහැටියේ මිනුවන්ගොඩ රෝහලට මාරු කිරීමට විරෝධය පල කරමින් මීරිගම මූලික රෝහලේ වෛද්‍යවරු හෙදහෙදියන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය ඊයේ (17) දහවල් පැයක විරෝධතාවක නිරත වූහ.

මීරිගම රෝහලේ වැඩි දියුණුව සඳහා ඇප කැපවී කටයුතු කරන වෛද්‍ය අධිකාරිවරයා මෙසේ හිටිහැටියේ මාරු කර යැවීමෙන් රෝහලේ සිදු කෙරෙන සියලු සංවර්ධන කටයුතුවලට බාධා පැමිණෙන බවටද විරෝධතාවයේ නිරතවූවෝ සඳහන් කළහ.

සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමූහ සහ මහානාම විතානගේ - මල්වාන සමූහ

# ශ්‍රී ජය බෝධි විහාරය සඟසතු කරයි



බියගම යබරළුව කොළඹහේන වත්ත ප්‍රදේශයේ අභිනවයෙන් ඉදි කළ සංඝාවාසය සහිත ශ්‍රී ජය බෝධි විහාරය බියගම ත්‍රෛනිකායික භික්ෂු සංවිධානයේ ලේඛාධිකාරී බියගම සුදර්මාරාමාධිපති බෙලිගල අමරසිරි මාහිමියන් ඇතුළු මහා සංඝරත්නය වෙනුවෙන් සඟසතු කොට පූජා කිරීම පෙරේදා (16) පෙරවරුවේ සුබ මොහොතින් සිදු විය.

බියගම කොළඹහේන වත්ත ප්‍රදේශයේ ආගමික, ශාසනික සේවාවන් සිදු කිරීම වෙනුවෙන් යබරළුව ප්‍රදේශයේ පදිංචි එන්. ජයසෝම, අයි. පී. ගුණවතී, කේ. පී. සුනන්දා සහ එස්. නන්දසීලි යන මහත්ම මහත්මීන්ට අයත් අක්කරයක පමණ භූමියක් මෙසේ අභිනව විහාරස්ථානය ඉදි කිරීම වෙනුවෙන් පූජා කර තිබිණි. බියගම සුදර්මාරාමාධිපති බෙලිගල අමරසිරි මාහිමියන්ගේ ආරාධනයෙන් කොළඹ නව කෝරළයේ හා නව තොටමුණේ ප්‍රධාන සංඝනායක තැඹිලිගස්මුල්ල ශ්‍රී සුදර්ශනාරාම මහා විහාරාධිපති, ශ්‍රී ධීරානන්ද විද්‍යායතන පිරිවෙනේ පරිවේණාධිපති පානකාවේ ජේමරතන මාහිමියෝ මෙහිදී අභිනව සංඝාවාසය විවෘත කළහ. විහාරස්ථානයේ ස්ථාපිත අභිනව බුද්ධ ප්‍රතිමා වහන්සේ වෙත සදාතුක ධාතු කරඬුව පූජා කිරීම බියගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආනන්ද ගනේපොළ මහතා විසින් සිදු කරන ලදි. විහාරාධිපති බෙලිගල අමරසිරි මාහිමියන්ගේ 53 වැනි ජන්ම දිනය වෙනුවෙන් සිදු කළ මේ මාහැඟි පින්කම සඳහා ප්‍රධාන වූ අභිනව සංඝාවාසය යබරළුව ප්‍රදේශයේ පදිංචි එන්. ආරියරත්න, එන්. පී. සෙනෙවිරත්න, එල්. ඩබ්ලිව්. යුගන්තනන්ද යන මහත්වරුන්ගේ මූලිකත්වයෙන් ප්‍රදේශවාසීන්ගේ ද ආධාර උපකාර ඇතිව ඉදි කර තිබේ.

කේ. ඩී. දේවප්‍රිය - කතරගම සංවාරක

# හෙලිකොප්ටර් තටුවල වදින අතු කැපුවම නාලිකාවලින් මහා පරිමාණ විනාශයක් කියලා පෙන්නනවා

## කතරගම ප්‍රාදේශීය සභාවේ සභාපති





කතරගම අංක 03 පාලම ආසන්නයේ මැණික් ගඟ අසබඩ බැතිමතුන් දිය නාන ස්ථානයේ තිබූ දිරාපත් වූ ගසක අත්තක් කපා ඉවත් කිරීම සහ ඒ අසල ඇති හෙලිකොප්ටර් අංගණය ආසන්නයේ පැවති ගස්වල අතු කපා දැමීම මුල් කරගෙන මහා පරිමාණයේ පරිසර විනාශයක් කළා යැයි පවසා ඇතැම් පෞද්ගලික නාලිකා මඟින් බොරු ප්‍රචාරයන් සිදු කරනා බව කතරගම ප්‍රාදේශීය සභාවේ සභාපති චානක අමිල් රංගන මහතා පැවසීය.

සෑම වසරකදීම මැණික් ගඟේ බැතිමතුන් දිය නාන ස්ථාන මෙන්ම නගරයේ ජනයා ගැවසෙනා මාර්ග තුළ ඇති දිරාපත් වන අන්තරාකාරී ගස් අතු ඉවත් කිරීම සිදු කරනා බව පැවසූ චානක මහතා වැඩිදුරටත් මෙසේ පවසා සිටියේය.

"මේ දිනවල මහ ඉහළින් පෞද්ගලික නාලිකා මඟින් ඇතැම් පටු දේශපාලන අරමුණු ඉටු කරමින් රජය අපහසුතාවට පත් කිරීම පිණිස අසත්‍ය පුවත් ප්‍රචාරය කරනවා. අංක 03 පාලම අසල පවතිනා හෙලිකොප්ටර් ගොඩබස්ස වන ස්ථානයට ඉහළින් ගසක අතු තුනක් යානාවල තටුවල වැදෙනා ලෙස පැවතියා. එය කතරගම ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතිව ඇතිව රාජ්‍ය දැව සංස්ථාව මඟින් ඉහළ අතු කීපයක් කපා දැමුවා. මේක ගස් කැපීමක් නෙමේ. මේ අතු පෙන්නා තවත් පැරණි දර්ශන පෙන්වා මහා පරිමාණ ගස් කැපීමක් බවට හුවා දැක්වීම මා ප්‍රතික්ෂේප කරනවා. මෙහෙව විනාශයක් වෙලාද කියලා ඒ ප්‍රදේශයට එන් ඕනෑම කෙනෙකුට තේරුම්ගන්න පුළුවන්."

විපුල එස්. කුමාරතුංග - රඹුක්කන උතුර සමූහ

# භාරතීට ඉක්මන් සුවය පතා ආශිර්වාද පිරිත් පින්කමක්

වසර ගණනක් තිස්සේ අසනීපව ප්‍රතිකාර ලබමින් පසුවනා පින්නවල අලි අනාථාගාරයේ භාරතී කෙණෙරට ජීවදාන පින්කමක් පසුගියදා අලි අනාථාගාර පරිශ්‍රයේදී පැවැත්විණි. මේ පින්කම ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා ඉෂිනි වික්‍රමසිංහ, නියෝජ්‍ය අධ්‍යක්ෂිකා රේණුකා බණ්ඩාරනායක, පින්නවල අලි අනාථාගාරයේ සහකාර අධ්‍යක්ෂ මිහිරාන් මැදවල යන මහත්ම මහත්මියන්ගේ උපදෙස් පරිදි පැවති අතර, රඹුක්කන අශෝක බෝධිරාජාරාම විහාරාධිපති ඇකිරියගල මංගල හිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නය වැඩම කර ආශිර්වාද පිරිත් දේශනා සිදු කරමින් භාරතීට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කළ අයුරුයි මේ.



ටී. කේ. මහින්ද - වැලිගම සමූහ

# බෙරලිඅතුර මාර්ගය ජනතා අයිතියට



සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව දිවයිනේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කර කාපට් ඇතිරීමේ ජාතික වැඩසටහන යටතේ කාපට් අතුරා සංවර්ධනය කරන ලද මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රන්සෑගොඩ හන්දිය - සුදු බෝක්කුව බෙරලිඅතුර මාකඳුර මාර්ගය ජනතා අයිතියට පත් කිරීම කතානායක මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදු කරන ලදි.

මේ සඳහා වැය කළ මුදල රුපියල් මිලියන 145.74ක් වන අතර කාපට් අතුරා සංවර්ධනය කරනා ලද මාර්ගයේ දුර කිලෝමීටර 7.5කි. ග්‍රාමීය මාර්ග සහ අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මඟින් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. මේ අවස්ථාවට ප්‍රදේශයේ ජනතා නියෝජිතයන්, රාජ්‍ය නිලධාරීන් හා ප්‍රදේශවාසීන් පිරිසක් සහභාගි වී සිටියහ.

දිනමිණ දසත
දස අත ම එක තැන

ධර්මදාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංවාරක

# ආපදා අවම කරන්න කෝටි 07ක ව්‍යාපෘති

ආපදා අවම කිරීම අරමුණු කර ගනිමින් 2021 වසරේ ගාල්ල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 10ක් ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඒ අනුව වැලිවිටිය දිවිතුර, ඉමදුව, නාගොඩ, ගෝනපිනුවල, බද්දෙගම, කඩවත්සතර, අක්මීමණ, හික්කඩුව යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 08ක් ඉලක්ක කර ගනිමින් මේ ව්‍යාපෘති 10 ක්‍රියාත්මක කිරීමට නියමිතය. මේ ව්‍යාපෘති සඳහා මූල්‍ය වටිනාකම රුපියල් කෝටි 7.05කට ආසන්න බව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රකාශ කළේය.

නාඋල සමූහ

# කලා හැකියාවන් ඇති අයට අවස්ථාවක්

මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචි කලා හැකියාවන් ඇති අයවලුන්ගේ විශේෂ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට නාඋල පහන් කන්ද කලා හවුල තීරණය කර තිබේ. එළැඹෙන 26 වැනිදා පෙරවරු 10.00 සිට පස්වරු 3.00 දක්වා නාඋල - අරංගල සංස්කෘතික මධ්‍යස්ථානයේදී මෙය පැවැත්වීමට නියමිතය. ගායනය, රංගනය, නර්තනය, වේදිකා පසුතල නිර්මාණය, අධ්‍යක්ෂණය, තිර රචනය, අංග රචනය, නිවේදනය ආදි අංශ රැසක් සම්බන්ධයෙන් හැකියාවන් උරගා බැලීම මෙහිදී සිදු වන බව පහන්කන්ද කලා හවුලේ ලේකම් ජයන්ත අත්තනායක මහතා කියා සිටියේය. විවිධ කලා හැකියාවන්ගෙන් පිරිපුන් එහෙත් සිය හැකියාවන් එළිදැක්වීම සඳහා අවස්ථාවක් නොලබන පිරිස් සඳහා ඉදිරි වැඩපිළිවෙළක් සැකසීම අරමුණු කර ගනිමින් මේ වැඩසටහන ක්‍රියාවට නන්වා තිබේ. සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන්නන් සිය හැකියාවන් පෞද්ගලිකවම විනිශ්චය මණ්ඩයක් ඉදිරියේ ඉදිරිපත් කළ යුතුය.

එස්. දියගහගේ - දකුණු පළාත් සංවාරක

# පාරේ ඉතිරි කොටස හදාගන්න රුමස්සල සුරැකීමේ එකමුතුව පාරට බසී



උණවටුන යද්දෙහිමුල්ලේ සිට රුමස්සල හරහා ජපන් සාම චෛත්‍ය දක්වා ඇති මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා රුමස්සල සුරැකීමේ එකමුතුව විසින් සංවිධානය කරනා ලද උද්ඝෝෂණයක් පෙරේදා (16) දහවල් උණවටුන බොනවිස්ටා හන්දියේදී පැවැත්විණි. ඔවුන් කියා සිටියේ මේ මාර්ගය දෙපැත්තෙන් සංවර්ධනය කර ඇති අතර සංවර්ධනය කිරීමට ඇත්තේ මීටර් දෙසියක කොටසක් පමණක් බවය. එම කොටස සංවර්ධනය නතර කිරීමට උණවටුනේ පදිංචිකරුවන් නොවන වෙනත් බාහිර පුද්ගලයන් බලපෑම් කරනා බවද උද්ඝෝෂකයෝ කියා සිටියහ. රුමස්සල පදිංචිකරුවෝ විශාල පිරිසක් මේ උද්ඝෝෂණයට එක්ව සිටි අතර පසුව ඔවුන් ගාල්ල මාතර ප්‍රධාන මාර්ගයද අවහිර කරමින් උද්ඝෝෂණයේ නිරත වීම හේතුවෙන් විනාඩි පහළොවක කාලයක් වාහන ගමනාගමනයට ද බාධා සිදු විය. ඒ සමඟම හබරාදුව පොලිස් ස්ථානාධිපතිවරයා එම ස්ථානයට පැමිණීමත් සමඟ උණුසුම් තත්ත්වයක් ඇති වී තිබූ අතර උද්ඝෝෂකයෝ මාර්ගයෙන් ඉවත් වී සාමකාමී ලෙස උද්ඝෝෂණය කර විසිර ගොස් තිබුණහ.



එස්. ජී. උබේපාල - කැබිතිගොල්ලෑව සමූහ

# වී ගබඩා සංකීර්ණයෙන් වැඩක් ගනිමු ද?

ගලෙන්බිඳුණුවැව සමුපකාරයට අයත් යැයි කියන වී ගබඩා සංකීර්ණයක් සහ වී කෙටීමේ මධ්‍යස්ථානයක් මේ වන විට අභාවයට ගොස් ඇති බවත් දිනෙන් දින එම උපකරණ දිරාපත්ව යන බවත් ගොඩනැගිල්ල වවුලන්ගේ සහ මත්ලෝලීන්ගේ පාරාදීසයක් බවට පත්ව තිබෙනා බවටත් ප්‍රදේශවාසීහු පවසති.

මේ ගොඩනැගිල්ල මීට වසර ගණනාවකට පෙර සමුපකාරයට අයත් ධාන්‍ය ගබඩාවක් ලෙස සහ වී කෙටීම සඳහා භාවිත කර ඇත. එහි 50කට ආසන්න සේවකයන් හට රැකියා අවස්ථාවන්ද හිමිව තිබූ බවට ඔවුහු පෙන්වා දෙති. මේ ස්ථානය අද වන විටත් භාවිතයට ගත හැකි අයුරින් තිබෙනා බවත් එහි යන්ත්‍රෝපකරණ පවා සුළු නඩත්තු කටයුතු කිරීමකින් භාවිතයට ගත හැකි බව ද ප්‍රදේශවාසීහු පවසති.

සී. ගමගේ - සොරණාතොට සමූහ

# පාරේ අරක්කු බිව්ව 6කේ පොලිස් කූඩුවේ

ප්‍රසිද්ධ ස්ථානයක මත්පැන් පානය කරමින් සිටි පුද්ගලයන් හයදෙනකු පසුගියදා (15) ලූනුවත්ත ලකීලෑන්ඩ් මාර්ගයේදී අත්අඩංගුවට ගත් බව ඌවපරණගම පොලිසිය ප්‍රකාශ කළේය.

ලූනුවත්ත, සපුගොල්ල, ලකීලෑන්ඩ් වත්ත ප්‍රදේශයේ පදිංචි අවුරුදු 35ත් - 40ත් අතර පසුවන හයදෙනකු මෙසේ අත්අඩංගුවට ගෙන ඇත. මොවුන් ලූනුවත්ත ලකීලෑන්ඩ් මාර්ගයේ ප්‍රසිද්ධ ස්ථානයක මත්පැන් පානය කරමින් සිටියදී ලැබුණු තොරතුරක් මත අත්අඩංගුවට ගෙන තිබේ.

බදුල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ජී. කේ. ජේ. අපොන්සු, බණ්ඩාරවෙල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අතුල ද සිල්වා, සහකාර පොලිස් අධිකාරි ii ඩී. බී. එච්. කළණසිරි යන මහත්වරුන්ගේ උපදෙස් මත ඌවපරණගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බුද්ධික ඒකනායක මහතා ඇතුළු නිලධාරීහු වැටලීමට එක් වූහ.

ආර්. එම්. විජේරත්න - හාලිඇළ සමූහ

# අයිරෝඩ් ව්‍යාපෘතියෙන් අපිට තිබුණු පාරත් නැතුව ගියා

ඉකුත් යහපාලන රජය සමයේ ආරම්භ කෙරුණු අයිරෝඩ් මාර්ග සංවර්ධන වැඩසටහන හරහා සංවර්ධනය කිරීමට යෝජිත වූ පස්සර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි පැල්ගහතැන්න ගල්බොක්ක කිරිමඩුතැන්න මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය අතරමග නතර වීමෙන් තමන් දැඩි අසීරුතාවකට පත්ව සිටිනා බව ප්‍රදේශවාසීහු පවසති. බදුල්ල පස්සර ප්‍රධාන මාර්ගයේ පැල්ගහතැන්න පාසල් හන්දියෙන් හැරෙනා මේ මාර්ගයෙන් පැල්ගහතැන්න නව ජනපදය, ගල්බොක්කගම හරහා කිරිමඩුතැන්න ප්‍රදේශයටත් එතැන් සිට හල්ගහපතන බ්ලානිවත්ත හරහා යළි පස්සර නගරයටත් පිවිසිය හැකිය. වර්ෂ 2019 දී පමණ අයිරෝඩ් වැඩසටහන හරහා මේ මාර්ගය සංවර්ධනය කිරීම ආරම්භ කෙරුණද වැඩබැරි සමාගම්වලට කොන්ත්‍රාත් දීමෙන් තමනට කාපට් මාර්ග තබා තිබූ පාර පවා අහිමි වූ බව කියන ගම්වාසීහු ඒ පිළිබඳව මෙසේ අදහස් දක්වා සිටියහ.

**නන්ද වීරසිංහ මහතා,**

"මේ පාර අපට කිසිම රජයකින් හදා දීපු පාරක් නෙවෙයි. ඉස්සර අඩි පාරක්ව තිබූ මේ පාර අපි 1977දී පමණ ග්‍රාම සංවර්ධන සමිතිය මුල් වෙලා ගමේ මිනිසුන්ගේ දාඩිය මහන්සියෙන් කපාගත් පාරක්. එදා සිට කිසිම රජයකින් අපට පාර හදා දුන්නේ නෑ. අන්තිමට පහුගිය යහපාලන ආණ්ඩුව කාලෙ අයිරෝඩ් කියලා ව්‍යාපෘතියක් ගෙනත් මේ පාර කාපට් කරනවා කියලා වේලි කපලා තිබුණු පාරත් කඩා දාල අතරමඟ වැඩ නවත්තලා යන්න ගියා. දැන් හැමතැනම වළවල්, මඩ ගොහොරු. වර්ෂා කාලෙට මනුස්සයකුට තබා සතකුටවත් මේකේ යන්න බෑ. මම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පැල්ගහතැන්න ශාඛාවේ සභාපති. අපි ඇප කැපවෙලා දුක්විඳලා ආණ්ඩුවක් පත්කර ගත්තා. ඒත් තාම මේ ආණ්ඩුවවත් අපේ ප්‍රශ්න ගැන බැලුවේ නෑ."


**ආර්. එම්. සමන්ත කුමාර මහතා,**

"පහුගිය ආණ්ඩුව කාලෙ මේ පාර හදන්න කියලා දේශපාලන අධිකාරිය ඇවිත් කීපවරක්ම මුල්ගල් තිබ්බා. දැන් ඒ මුල්ගල් සේරම පැළ වෙලා. මුල්ගල් තියපු අය හොයාගන්නත් නෑ. අපේ මේ ගම්වලින් ඡන්ද ගත්ත මැති ඇමැතිවරු හතර දෙනෙක් විතර පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒත් දැන් ඒ අයගේ වැඩේ හරිනේ. මේ ගම්වල මිනිස්සු ඕන වෙන්නේ ආපහු ඊළඟ ඡන්දෙටනේ. ඒ නිසා මේ ප්‍රශ්න ගැන කවුරුත් බලන්නේ නෑ. අපට දැන් මේ ගැන එක එක අයට කියලාම එපා වෙලා. පාරක් නැතිකමින් ගමේ අයගේ එදිනෙදා වැඩ පවා අඩාළ වෙනවා. ජීවිකාවන් අඩාළ වෙනවා. ගෙයක් දොරක් හදන කෙනකුටවත් හදිසියකට බඩු ටිකක් වාහනයක ගේන්න විදිහක් නෑ."

**කුසුම් පතිරණ මහත්මිය,**

"අපට කාපට් පාරවල් දෙනවා කියලා සංවර්ධනේ කියලා තිබුණු පාරත් නැති කරලා තියෙන්නේ. වැහි කාලෙට මේ පාරෙ යන්න බෑ. තනිකරම මඩ ගොඩක්. ඉස්කෝලෙ යන දරුවෝ සපත්තු අතේ අරගෙන ඇඳුම්වල මඩ තවරාගෙන යන්නේ. පොඩි දරුවෝ නම් උස්සගෙන හරි අරන් යනවා. පායන කාලෙට මේක තනිකර දූවිල්ල. දැන් ජල ව්‍යාපෘතියක් හැදෙනවා. ඒකෙ බට ටික එළාගන්නවත් විදිහක් නෑ. සමහර තැන්වල පස් ගොඩවල් ගහලා. දරුවෙක් ඉස්කෝලෙකට යවන්න හදිසියකට ටවුමකට යන්න ත්‍රීවීල් එකක්වත් ගෙන්නගන්න අමාරුයි. පාර අබලන් නිසා කවුරුත් එන්න කැමති නෑ. ආවත් වෙනදට වැඩිය කුලියක් ඉල්ලනවා. ඉතින් මේ ගම්වල දුප්පත් මිනිස්සු කොහොමද ජීවත් වෙන්නේ. අපි ඉල්ලන්නේ මේ පාසල් යන දරුවන් ගැන හිතලාවත් ඉක්මනින් මේ පාර හදාදෙන්න කියලයි."





සමන්ත කුමාර



නන්ද වීරසිංහ



කුසුම් පතිරණ

මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල මැතිවරණ කොට්ඨාසයේ සමෘද්ධි පවුල් 450ක් සම්බන්ධ කර ගනිමින් අක්කර 450ක බී ලූනු වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට මාතලේ දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය පියවර ගෙන තිබේ.

නාඋල සමූහ

# අක්කර 450ක බී ලූනු වගාවට පියවර

මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල මැතිවරණ කොට්ඨාසයේ සමෘද්ධි පවුල් 450ක් සම්බන්ධ කර ගනිමින් අක්කර 450ක බී ලූනු වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට මාතලේ දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය පියවර ගෙන තිබේ. රටට අවශ්‍ය බී ලූනු සැපයීමේ ක්‍රියාවලියට දායක වීමේ අරමුණින් මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනා බව මාතලේ දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂ ගාමිණී අබේවික්‍රම මහතා කියා සිටියේය. මාතලේ දිස්ත්‍රික් ලේකම් එස්. එම්. ජී. කේ. පෙරේරා මහතාගේ උපදෙස් පරිදි දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය හා ඒකාබද්ධව මේ වැඩසටහන ක්‍රියාවට නංවා තිබේ.


## ඉංග්‍රීසියෙන් ප්‍රවෘත්ති කියවා සරසවි සිසුවිය ත්‍රිවිද්‍යා පළමු තැනට



මෙරට අන්තර් විශ්ව විද්‍යාලයීය සුපර්නෝවා -21 ප්‍රවෘත්ති නිවේදන තරගයේ ඉංග්‍රීසි මාධ්‍යයේ දක්ෂතම ප්‍රවෘත්ති නිවේදිකාව ලෙස ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ ව්‍යාවහාරික විද්‍යා පීඨයේ ත්‍රිවිද්‍යා ලියනආරච්චි ශිෂ්‍යාව පළමුතැන දිනා ඇත. ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලවල සිසුන් 300ක් පමණ මෙම තරගයට සහභාගිවූ අතර එය සිංහල හා ඉංග්‍රීසි අංශ දෙකෙන්ම පැවැත්විණ.අවසන් තරගය පැවැත්වුයේ Zoom තාක්ෂණය ඔස්සේය.ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ J' pura News by J'pura Voice විසින් මෙය සංවිධාන කරන ලදි.ත්‍රිවිධ්‍යා ලියනආරච්චි කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවකි.

අරණායක ප්‍රදීප් කුමාර ධර්මරත්න

## ලීලාගම සීලරතන හිමියෝ කෑගල්ලේ ප්‍රධාන සංඝනායක ධූරයට



කෑගල්ල අලපලාවල ශ්‍රීබෝධිමළු විහාරාධිපති හා අලපලාවල ශ්‍රී ඥාණතිලක පිරිවෙනේ නියෝජ්‍ය පරිවේණාධිපති ලීලාගම සීලරතන ස්වාමින් වහන්සේට කෑගලු දිසාවේ ප්‍රධාන සංඝනායක පදවිය පිළිබඳ සන්නස් පත්‍රය සහ විජිනිපත පිරිනැමීමේ උත්සවය ලබන 20 වෙනිදා වැලිතර අම්බරුක්ඛාරාම මුල මහා විහාරස්ථානයේදි පස්වරු 3.00 ට සිදු කෙරේ.මෙම උත්සවය සඳහා අමරපුර මූලවංශික පාර්ශවයේ මහා නායක අහුන්ගල්ලේ විමලධම්ම මහා නාහිමිපාණන් වහන්සේ ප්‍රධාන අමරපුර මූලවංශික පාර්ශවයේ කාරක සංඝ සභාව නියෝජනය කරන ස්වාමින්වහන්සේ සහභාගි වෙති.

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදි උපාධිය ලබාගත් උන්වහන්සේ ජාතික, ආගමික, සාමාජීය හා සංස්කෘතික වශයෙන් සුවිශේෂි සේවාවන් රැසකට නිසි නායකත්වය ලබා දුන් අතර කෑගල්ල, මොලගොඩ සද්ධර්මෝදය මූලික පිරිවනේ පරිවෙණාධිපති ලෙසත්, ඉන් අනතුරුව කෑගල්ල අලපලාවල ශ්‍රී ඥණතිලක පිරිවනේ නියෝජ්‍ය පරිවෙණාධිපති ලෙසද වර්තමානයේ සේවය කරති.

ඒ. සුමනසේන කොළොන්නාව සමූහ



## දීඝවාපී පරිවාර චෛත්‍ය විහාරස්ථානයේ අසිරිමත් මල් පූජාවෙන්...





කොළොන්නාව සාලමුල්ල සුනන්දාරාම සිල්මාතාශ්‍රමාධිපතිනී අම්පාරේ සුධම්මිකා සිල්මෑණියන් වහන්සේ හා එම සිල්මාතාශ්‍රමාධිකාරිනීන් වන රඹුක්කන අමරනන්දා සිල්මෑණියන් වහන්සේගේ අනුශාසනා පරිදි එම ආශ්‍රමයේ දායක දායිකාවන් විසින් අම්පාරේ දීඝවාපී චෛත්‍ය රාජයාණන් වහන්සේට අනුබද්ධිතව ස්ථාපිත බුදුන් වහන්සේගේ ප්‍රථම ශ්‍රාවකයන් වහන්සේ හැට නමගේ අනුරූ ප්‍රතිමා වහන්සේ වෙත දීඝවාපී පරිවාර චෛත්‍ය විහාරස්ථානයේ වාර්ෂිකව සිදුකරනු ලබන අසිරිමත් මල් පහන් පූජාව හා භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා, වෙනුවෙන් දෙනු ලබන මහා දානමය පින්කම පසුගියදා පැවැත්විණි.

ඉන් අනතුරුව එම ප්‍රදේශයේ වෙසෙන ගැබිනි මාතාවන් හැට දෙනෙකුට දහවල් දානය හා දරු ප්‍රසූතියේදී අවශ්‍ය රුපියල් 15,000ක පමණ වටිනා කමකින් යුත් රෙදිපිළි හා උපකරණ රැසක්ද මෙහිදී පරිත්‍යාග කරන ලදි. නැගෙනහිර පළාතේ ප්‍රධාන අධිකරණ සංඝ නායක දීඝවාපී පරිවාර චෛත්‍ය රජමහා විහාරාධිපති පෝද්දිවල සද්ධර්ම කීර්ති ශ්‍රී චන්දානන්ද නාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් මෙම පින්කම පැවැත්විණි.

මිහිර විජේසේකර-මාරවිල සමූහ

## යතුරුපැදිකරුවන් දහසකට 'හෙල්මට්' දේශන



පාරිභෝගික අයිතිවාසිකම් දිනයට සමගාමීව යතුරු පැදිකරුවන් භාවිතා කරනු ලබන හිස් වැසුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පුත්තලම දිස්ත්‍රික්කයේ පොලිස් බල ප්‍රදේශ ගණනාවක පසුගිය 15වැනි දින සිදුවු බව පුත්තලම දිස්ත්‍රික් පාරිභෝගික සේවා අධිකාරියේ ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි ඊ.යු. රන්ජන් මහතා පැවසීය. යතුරු පැදිකරුවන් ප්‍රමිතියෙන් තොර හිස් වැසුම් භාවිතා කිරීම හේතුවෙන් බරපතළ ගැටලු රැසකට මුහුණ පා ඇති බව පාරිභෝගික සේවා අධිකාරිය පවසයි. මේ අනුව හලාවත හා මුන්දලම මදුරන්කුලිය නගරවලදි යතුරු පැදිකරුවන් දහසක් පමණ දැනුවත් කිරිමක් සිදු වුණි.ඒ අනුව හිස් වැසුම් මිලදී ගැනිමේදී එස්.එල්.එස් .සහතිකය සහිත හිස් වැසුම් භාවිතා කිරීම ගැන යතුරු පැදිකරුවන් දැනුවත් කෙරිණි.

හිස් වැසුම් සඳහා එස්.එල්.එස් ප්‍රමිති සහතිකය ලබා දී ඇති බවත් එසේ ප්‍රමිතියෙන් යුත් හිස් වැසුම් පමණක් අලෙවි කිරීමට හිස් වැසුම් අලෙවි කිරිම්වල නිරත වී සිටින ව්‍යාපාරිකයන් දැනුවත් කිරීමද නිරන්තරයෙන් සිදුවන බවත් එසේ අදාළ නීති කඩ කරන්නන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කර නඩු පැවරීමටත් කටයුතු කරන බව පාරිභෝගික සේවා නිලධාරීන් පවසති.

ඩී.එස්. ගුණතිලක ඌව වෙල්ලස්ස විශේෂ

# මොනරාගල පවුල් 5150ක් රැය ගෙවන්නේ කුප්පි ලාම්පු එළියෙන්

විදුලිය නොමැතිවීම නිසා මොනරාගල දිස්ත්‍රික්කයේ නිවාස පන්දහස් එකසිය පනහක ජීවත්වන ජනතාවට විවිධ දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුවී ඇත. සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සිදුකළ සමීක්ෂණකදී ඇත එපිට ගම්මානවල පමණක් නොව නගරය අසන්නේ පිහිටි ඇතැම් නිවාසවලටද විදුලිය නොමැති බව හෙළිවී තිබේ. විදුලිය නොමැති වීම නිසා රාත්‍රී කාලයේ කුප්පිලාම්පු එළියෙන් නිවෙස්වල වැඩකටයුතු කිරීමට සිදුවී තිබෙන අතර පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පාඩම් කටයුතු කිරීමද දුෂ්කර වී තිබේ. ඇතැම් ගම්මාන වල නිවාස දුරස්ව හා හුදෙකලාව පිහිටීම නිසා එම නිවාසවලට විදුලිය ලබාදීමට විශාල මුදලක් වැයවන බව දැනගන්නට ඇත. මේ පිළිබඳ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයෙන් විමසූ විට එහි උසස් නිලධාරියෙක් පැවසුවේ එක් නිවෙසක් සඳහා විදුලිය සැපයීමට මණ්ඩලයට වැයකළ හැක්කේ රුපියල් ලක්ෂ තුනක මුදලක් බවයි.නිවාස දුරස්ව හා හුදෙකලාව පිහිටීම නිසා එක් නිවෙසක් සඳහා විදුලිය සැපයීමට විශාල මුදලක් වැය කිරීමට සිදුවීම නිසා 5000කට ආසන්න නිවාසවලට විදුලි සම්බන්ධතා ලබාදීම ගැටලුවක් වී ඇති බව දැනගන්නට ඇත. මේ පිළිබඳ මොනරාගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති පා.ම කුමාරසිරි රත්නායක මහතාගෙන් කළ විමසුමකදී පැවසුවේ දැනට මොනරාගල දිස්ත්‍රික්කයේ මුළු නිවාසවලින් 95% කට විදුලිය ලබාදී ඇති බවයි. නමුත් නිවාස පන්දහසකට පමණ විදුලිය ලබාදීමට නොහැකි වී තිබෙනවා.මේ පිළිබඳ රජයේ අවධානය යොමුවී තිබෙන අතර අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදී මෙම වසර අවසන් වීමට පෙර සියලුම නිවාසවලට විදුලිය බලය ලබාදීමට කටයුතු කරන බවද හෙතෙම සඳහන් කළේය.

නාඋල සමූහ

## රාජ්‍ය ළමා චිත්‍ර උලෙළට අයැදුම්පත් බාරගැනීම 31දා දක්වා

දේශිය ළමා සිත්තරුන්ගේ චිත්‍ර ඇගයිමට ලක් කෙරෙන රාජ්‍ය ළමා චිත්‍ර උළෙල සඳහා උතුරු නැගෙනහිර ඇතුළු දිවයිනේ සෑම පළාතක්ම නියෝජනය වන පරිදි සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අයැදුම් පත් කැඳවා තිබේ. බුද්ධශාසන,ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යංශය,සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය දෘශ්‍ය කලා උපදේශක සභාව වැඩසටහන සංවිධාන කරනු ලබයි.

නිර්මාණ භාර ගැනීම මේ මස 31වැනිදා දක්වා කොළඹ 07 ජාතික කලාභවනේ දි සිදුකිරීමට නියමිතය.

ලැබෙන චිත්‍ර අතරින් නිර්මාණ 150ක් තෝරා නිර්මාණකරුවන් දෙවන වටය සඳහා යොමු කරනු ලැබේ.

පළමු වටයේ ජයග්‍රාහකයන් සියළු දෙනාට සහතික පත්‍ර පිරිනැමීම ද සිදුකරනු ලබයි.

දෙවැනි වටයේ දී ජයග්‍රහණය කරනු ලබන චිත්‍ර අවසන් වටය සඳහා තොරාගන්නා අතර ජයග්‍රහණය කරන අය සඳහා සම්මාන, සහතික පත්‍ර හා මුදල් ත්‍යාග පිරිනැමීමට සංවිධායකයෝ පියවර ගෙන තිබේ.

ඒ අනුව ප්‍රථම ස්ථානය සඳහා රුපියල් විසිපන්දහසක්,දෙවන ස්ථානය සඳහා රුපියල් විසි දහසක් සහ තෙවන ස්ථානය සඳහා රුපියල් පහළොස් දහසක් පිරිනමනු ලබයි. මීට අමතරව විශිෂ්ඨ සම්මාන 10ක් සඳහා එක් අයකුට රුපියල් හත් දහස් පන්සීයක් සහ කුසලතා සම්මාන 10ක් සඳහා එක් අයකුට රුපියල් පන්දහසක් ද ලබාදීමට නියමිතය.

සෙනවිරත්න කහටපිටිය බොරලැස්ගමුව සමූහ

## කොහුවල වාහන සේවා ආයතනයක ගින්නක්

කොහුවල, සුනේත්‍රා දේවි පාරේ සුපිරි වෙළෙඳසලක් පිටුපස පිහිටි මහා පරිමාණයේ වාහන සේවා ස්ථානයක ඉකුත් 16 වැනි දින රාත්‍රී හදිසි ගින්නක් ඇතිවී එහි දේපලවලට හානි සිදුව ඇතැයි දෙහිවල , ගල්කිස්ස නගරසභා ගිනි නිවීම් ඒකකය පවසයි. ගින්න ඇතිවූ සැණින් දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ගිනිනිවීම් ඒකකයේ ස්ථාන භාර නිලධාරි එල්.සුනන්ද පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් ගිනි නිවීම් රථ 3ක් සමඟ ගිනි භට නිලධාරීන් එහි ගොස් ගින්න මැඩ පවත්වා එහි සේවා කටයුතු සඳහා තිබූ මෝටර් රථ 3ක්ද බේරා ගැනීමට කටයුතු කර ඇත.




ජී.අයි.ආර්. ගරුසිංහ වැල්ලවාය විශේෂ

## තණමල්විල කෝටියක කංසා හේනකට ගිනි



රුපියල් කෝටියකට අධික වටිනාකමකින් යුත් කංසා පැළ දසදහසකින් යුත් කංසා හේනක් අත්අඩංගුවට ගැනීමට බුත්තල පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරිහු පිරිසක් පෙරේදා (16) සමත් වුහ.

තණමල්විල පොලිස් වසමේ ඇදකෝන ප්‍රදේශයේ සිදුකළ විශේෂ සෝදිසි මෙහෙයුමකදී කැපීමට ආසන්න තත්ත්වයේ තිබු අක්කර භාගයක මෙම කංසා හේන මෙසේ වටලා තිබේ. මෙම හේනේ තිබී අඩි හයක් පමණ උසින් යුත් සරුවට වගා කර තිබු කංසා පැළ දසදහසකට අධික ප්‍රමාණයක් ගලවා ගිනි තබා විනාශ කිරීමටද එම නිලධාරිහු කටයුතු කළහ.වැටලීමේදි එක් සැකකරුවෙක් අත්අඩංගුවට ගෙන තිබු අතර ඔහු හම්බෙගමුව ප්‍රදේශයේ පදිංචි 50 හැවිරිදි පුද්ගලයෙකි.සැකකරු තණමල්විල පොලිස් ස්ථානයට බාරදීමට කටයුතු කරන ලදි.

# කොවිඩ්වලට සුව සේවා කඩා වැටීමෙන් දකුණු ආසියාවේ මාතෘ - ළමා මරණ වැඩිවන අවදානමක්



## මරණ 239,000ක් සිදුවණු ඇතැයි ගණන් බලලා

එක්සත් ජාතීන්ගේ නව වාර්තාවකට අනුව, කොවිඩ් -19 මඟින් සෞඛ්‍ය සේවා කඩාකප්පල්වීම හේතුවෙන් දකුණු ආසියාවේ මාතෘ හා ළමා මරණ 239,000ක් සිදුවනු ඇතැයි ගණන් බලා තිබේ. බිලියන 1.8ක ජනතාවක් වාසය කරන ඇෆ්ගනිස්තානය, නේපාලය, බංග්ලාදේශය, ඉන්දියාව, පකිස්තානය සහ ශ්‍රී ලංකාව කෙරෙහි එය අවධානය යොමු කර තිබේ. කාන්තාවන්, ළමයින් සහ නව යොවුන් වියේ දරුවන් වැඩිපුරම පීඩාවට පත්ව ඇති බව වාර්තාවෙන් අනාවරණය විය. දකුණු ආසියාවේ මේ වන විට කෝවිඩ් රෝගීන් මිලියන 13කට ආසන්න සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර 186,000 කට වැඩි පිරිසක් මියගොස් තිබේ. දකුණු ආසියාවේ රටවල් ඇතුළු බොහෝ රටවල් වසංගතයට දැඩි ලෙස අගුලු දමා ප්‍රතිචාර දැක්වීය. රෝහල්, ෆාමසි සහ සිල්ලර වෙළඳසල් විවෘතව පැවතුනද අනෙක් සියල්ලම පාහේ වසා දමා ඇත. දකුණු ආසියාවේ කොවිඩ් -19 වසංගත හා ප්‍රතිචාරයේ සෘජු හා වක්‍ර බලපෑම් පිළිබඳ වාර්තාව - සෞඛ්‍ය සේවා, පාසල් ඇතුළු සමාජ සේවා සහ ආර්ථිකය කෙරෙහි මෙම රජයේ උපායමාර්ගවල බලපෑම විමර්ශනය කරයි. පෝෂණ ප්‍රතිලාභවල සිට ප්‍රතිශක්තිකරණය දක්වා වූ තීරණාත්මක සේවාවන් හේතුවෙන් මෙම රටවල් හය තුළ වයස අවුරුදු පහට අඩු ළමයින්ගේ අතිරේක මරණ 228,000ක් සිදු වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. දරුණු මන්දපෝෂණය සඳහා ප්‍රතිකාර ලබන දරුවන්ගේ සංඛ්‍යාව බංග්ලාදේශයේ සහ නේපාලයේ 80% කට වඩා අඩුවී ඇති අතර ඉන්දියාවේ සහ පාකිස්තානයේ ළමුන් අතර ප්‍රතිශක්තිකරණය පිළිවෙලින් 35% සහ 65% කින් පහත වැටී තිබේ. 2020 දී ඉන්දියාවේ ළමා මරණ අනුපාතය 15.4% කින් ඉහළ ගොස් ඇති අතර බංග්ලාදේශය 13% ක් දක්වා ඉහළ ගොස් ඇති බව ද වාර්තාව පවසයි. මාතෘ මරණවල තියුණු ම වැඩිවීම ශ්‍රී ලංකාවේ දක්නට ලැබිණි - 21.5% සහ පකිස්තානය 21.3%. 03. නේපාලයේ ඖෂධ නියාමකයන් බහරේන් කුමාරයකුට කොවිඩ් -19 එන්නත අවසරයකින් තොරව රට තුළට ගෙන යාමට හැකි වූයේ කෙසේදැයි සොයා බලයි.



මොහොමඩ් හමාඩ් මොහොමඩ් අල් කලීෆා සඳහා නේපාලයට පැමිණියේ ඇස්ට්‍රාසෙනෙකා එන්නත මාත්‍රාව 2,000ක් පමණ රැගෙනය. නේපාලයට ඖෂධ ආනයනය කිරීම සඳහා පූර්ව අනුමැතිය අවශ්‍ය වේ. ගෝර්කා දිස්ත්‍රික්කයේ ගම්වැසියන්ට මෙම එන්නත පරිත්‍යාග කිරීමට කුමරුගේ කණ්ඩායමට අවශ්‍ය බව බහරේන් තානාපති කාර්යාලය නේපාල මාධ්‍යයට පැවසීය. අල්-කලීෆා කුමරුගේ ගමන සංවිධානය කරන සමාගම වන සෙවන් සමිට්ස් ට්‍රෙක් හි ප්‍රකාශකයෙකු වන තනේෂ්වර් ගුරගයින් හිමාලයාන් ටයිම්ස් පුවත්පතට පැවසුවේ දින හතක් නිරෝධායනය කිරීමෙන් පසුව මෙම කණ්ඩායම ගෝර්කා දිස්ත්‍රික්කයේ චුම්මුර්බි ග්‍රාමීය මහ නගර සභාවට යන බවයි. එහිදී ඔහු කියා සිටියේ "සමගෝන් ගම්මානයේ ජනතාව සඳහා කොවිඩ් -19 ආසාදනයට එරෙහිව ඇස්ට්‍රාසෙනෙකා එන්නත් මාත්‍රා 2,000 ක් බෙදා හැරීමට" ඔවුන් සැලසුම් කර ඇති බවයි. කුමරු සහ ඔහුගේ කණ්ඩායම පසුව එවරස්ට් කන්ද තරණය කිරීමට සැලසුම් කළ බව ගුරගයින් මහතා පැවසීය.




# ජෝර්ජියා සම්බාහන හල් තුනකට වෙඩි ප්‍රහාර

## කාන්තාවන් 3ක් ඇතුළු 8ක් මරුට

අමෙරිකා එක්සත් ජනපදයේ ජෝර්ජියාවේ ඇට්ලන්ටා හි පීඩ්මොන්ට් පාරේ සම්බාහන මධ්‍යස්ථානයක් පිටතදී වෙඩි තැබීමක් සිදු වී ඇති අතර එම ස්ථානය ඇට්ලන්ටා පොලිස් දෙපාර්තමේන්තු නිලධාරීන් විමර්ශනයට ලක්කර ඇත.

එක්සත් ජනපද ජෝර්ජියා ප්‍රාන්තයේ විවිධ සම්බාහන මධ්‍යස්ථාන තුනකට වෙඩි තැබීමෙන් අවම වශයෙන් ආසියානු කාන්තාවන් හය දෙනකු ඇතුළු පුද්ගලයන් අට දෙනෙකු මියගොස් තිබේ. පොලිසිය පැවසුවේ ඇට්ලන්ටා නගරයට උතුරින් පිහිටි ඇක්වර්ත් හි සම්බාහන ශාලාවකදී සිව් දෙනකු සහ නගරයේ ස්පා දෙකක දී තවත් සිව් දෙනෙකු මිය ගිය බවයි. ඝාතනයට ලක්වූවන් සිව්දෙනා කොරියානු සම්භවයක් ඇති අය බව දකුණු කොරියාව පසුව තහවුරු කළේය. 21



හැවිරිදි පුද්ගලයකු අත්අඩංගුවට ගෙන ඇති අතර, ප්‍රහාර තුනෙහිම සැකකරු ඔහු යැයි විශ්වාස කෙරේ. අගහරුවාදා වෙඩි තැබීම් සඳහා බලපෑ කිසිදු චේතනාවක් තවම තහවුරු කර නොමැත. කෙසේ වෙතත්, මෑත කාලයේ දී ආසියානු - අමෙරිකානුවන්ට එරෙහි වෛරී අපරාධ ඉහළ ගොස් ඇති අතර, කෝවිඩ් -19 පැතිරීම සම්බන්ධයෙන් ආසියානු ජනතාවට දොස් පවරන කතා මඟින් එය ඇවිලී තිබේ. පසුගිය සතියේ පැවති දේශනයක දී ජනාධිපති ජෝ බිඩෙන් "පහරදීම්, හිරිහැර කිරීම්, දොස් පැවරීම් සහ පලිගැනීම්වලට ලක් වූ ආසියානු - අමෙරිකානුවන්ට එරෙහි දරුණු වෛරී අපරාධ" හෙළා දුටුවේය.

අමෙරිකා එක්සත් ජනපදයේ ජෝර්ජියාවේ ඇට්ලන්ටා හි පීඩ්මොන්ට් පාරේ ස්පා එකකින් පිටතදී වෙඩි තැබීමක් සිදු වූ ස්ථානය ඇට්ලන්ටා පොලිස් දෙපාර්තමේන්තු නිලධාරීහු විමර්ශනය කළහ. පැයකට අඩු කාලයකට පසුව, ඊසානදිග ඇට්ලන්ටා හි ගෝල්ඩ් ස්පා හි "සොරකමක් සිදුවෙමින් පවතී" යනුවෙන් පොලිසිය කැඳවනු ලැබීය. එසේ "පැමිණි වහාම වෙඩි තැබීමේ තුවාලවලින් කාන්තාවන් තිදෙනකු මියගොස් ඇති බව" පොලිසිය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී. එහි සිටියදී, ඇරෝමැටෙරපි ස්පා නම් වීදිය හරහා පිහිටි ස්පා වෙත නිලධාරීන් කැඳවනු ලැබූ අතර එහිදී තවත් කාන්තාවක් වෙඩි තබා ඝාතනය කර ඇති බව සොයා ගැනිණි.







# ගිනිකොනදිග ඕස්ට්‍රේලියාවේ ගී ගයන කුරුල්ලන් වඳවීමේ තර්ජනයක

කලක් ගිනිකොනදිග ඕස්ට්‍රේලියාවේ බහුලව සිටි රීජන්ට් හනිඊටර් ගී ගයන කුරුල්ලන් දැන් බරපතළ ලෙස වඳවීමේ තර්ජනයට ලක්ව ඇත.

ලෝකයේ ම සිටින්නේ කුරුල්ලන් 300 ක් පමණි. "ඔවුන්ට වෙනත් හනිඊටර්ස් සමඟ සැරිසැරීමට සහ ඔවුන් ශබ්ද කළ යුතු දේ ඉගෙන ගැනීමට අවස්ථාවක් නොලැබේ," ආචාර්ය රොස් ක්‍රේට්ස් පැහැදිලි කළේය. ඔහුගේ සොයාගැනීම් එක්සත් රාජධානියේ රාජකීය සංගමයේ සඟරාවක් වන Proceedings Bහි පළ වේ. කැන්බරා හි ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයේ කුරුළු පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයකු වන ආචාර්ය ක්‍රේට්ස් දැන් මධුසමය ගත කරන්නන්ට ඔවුන්ගේ ඥාතීන්ගේ ගීත ඉගැන්වීමෙන් කුරුල්ලන්ගේ ගීතය ආරක්ෂා කිරීමට උත්සාහ කරයි. පර්යේෂකයෝ රීජන්ට් හනිඊටර්ස් කුරුල්ලන්ගේ ගීතය අධ්‍යයනය කිරීමට නොව කුරුල්ලන්ව සොයා ගැනීමට පිටත්ව ගියහ. "ඒවා ඉතා දුර්ලභයි. ඔවුන්ට වාසය කළ හැකි ප්‍රදේශය විශාලයි - බොහෝ විට එක්සත් රාජධානියට වඩා 10 ගුණයක් විශාලයි - අප පිදුරු මඩුවක ඉඳිකටුවක් සොයමින් සිටියා" යැයි ආචාර්ය ක්‍රේට්ස් පැවසීය. මෙම වේදනාකාරී සෙවීමේදී ඔහු "අමුතු ගීත ගායනා කරන" කුරුල්ලන්ව දැකීමට පටන් ගත්තේය. ඔහු මෙසේ සිහිපත් කළේය. "ඔවුන් රීජන්ට් හනිඊටර්ස් වැනි කිසිවක් ශබ්ද කළේ නැත - ඒවා විවිධ විශේෂ මෙන් විය." මිනිසුන් කතා කිරීමට ඉගෙන ගන්නා ආකාරයටම ගීත ගයන කුරුල්ලන් ඔවුන්ගේ ගීත ඉගෙන ගනී.



# පුටින් ට්‍රම්ප්ට පක්ෂව මැතිවරණයට බලපෑම් කරලා

## බුද්ධි අංශ නිලධාරීහු කියති

හිටපු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ට පක්ෂව පසුගිය වසරේ පැවති එක්සත් ජනපද මැතිවරණයට බලපෑම් කිරීමට රුසියානු ජනාධිපති ව්ලැදිමීර් පුටින් අවසර දී ඇති බව බුද්ධි අංශ නිලධාරීහු පවසති.

එක්සත් ජනපද රජයේ වාර්තාවකට අනුව, අවසාන ජයග්‍රාහකයා වූ ජෝ බයිඩන් ගැන මොස්කව් "නොමඟ යවන හෝ සනාථ නොකළ චෝදනා" පතුරුවා හැරියේය. එහෙත් එහි සඳහන් වූයේ කිසිදු විදේශීය රජයක් අවසාන ප්‍රතිඵල සමඟ සම්මුතියක් ඇති කර නොමැති බවයි. මැතිවරණ මැදිහත්වීම් පිළිබඳ චෝදනා රුසියාව නැවත නැවතත් ප්‍රතික්ෂේප කර තිබේ. පිටු 15 කින් යුත් මෙම වාර්තාවෙන් ජාතික බුද්ධි අධ්‍යක්ෂ කාර්යාලය අඟහරුවාදා නිකුත් කළ වාර්තාව, රුසියාව මෙන්ම ඉරානය කළ "බලපෑම් මෙහෙයුම්" ගෙනහැර දැක්වීය. රුසියානු සම්බන්ධිත පුද්ගලයන් නොවැම්බර් 3 මැතිවරණයට පෙර ජනාධිපති බයිඩන් ගැන සනාථ නොකළ ප්‍රකාශ පතුරුවා හැර ඇති බව එහි සඳහන්ය. පුළුල් මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ විශ්වාසය අඩපණ කිරීමට ව්‍යාජ තොරතුරු ව්‍යාපාරයක් උත්සාහ කළ බව ද එහි සඳහන්ය. රුසියානු බුද්ධි අංශයට සම්බන්ධ සමහර පුද්ගලයන් බයිඩන් විරෝධී ආඛ්‍යාන මාධ්‍ය ආයතන, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ට්‍රම්ප්ගේ සහචරයන් වෙත තල්ලු කළ බව වාර්තාව පවසයි. ජනාධිපති බයිඩන් ට්‍රම්ප් මහතා පරාජය කළ අතර එය ජනවාරි 20 වන දින සිය පාලනය ආරම්භ කෙරිණි.





# සමුදුර සිසාරා සාමය හා ආරක්ෂාව ගෙනෙන AMAN - 21



සාමය යන අරුත ගෙනෙන 'අමාන් - 21' (AMAN-21) නම් වූ බහුජාතික නාවික අභ්‍යාසය පසුගියදා පාකිස්තානයේ කරච්චි මුහුදු කලාපයේදී ඉතා සාර්ථකව නිමාවට පත් විය. විශේෂයෙන් ඉන්දීය සාගර කලාපයේ ක්‍රියාත්මක වන සහ කලාපීය නොවන නාවිකයන් අතර සහයෝගිතාව, අන්තර් ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම මෙම නාවික අභ්‍යාසයේ මූලික පරමාර්ථය විය.

2007 වර්ෂයේ මෙම නාවික අභ්‍යාසය පාකිස්තානය, ආරම්භ කිරීමත් සමඟ අන්තර්ජාතික සහයෝගිතාව තව තවත් ශක්තිමත් වීමට මඟ සැලසිනි. විශේෂයෙන් අප ජීවත්වන කලාපයේ පමණක් නොව ඉන් බැහැර කලාපවල සහයෝගිතාව සහ ස්ථාවරත්වය රැඳා පවත්වා ගැනීමට මේ මඟින් මූලික පදනම සැකසී ඇති බව පෙන්වාදීම ඉතා වැදගත්ය. මුහුදු මංකොල්ලයන්, ත්‍රස්තවාදය, සමුද්‍රීය ආධිපත්‍ය සහ අපරාධවලට එරෙහිව එක්සත් පෙරමුණක් ලෙස ක්‍රියාත්මක වීම මෙම නාවික අභ්‍යාසයේදී එකඟත්වයකට පැමිණීම කැපී පෙනෙන සිද්ධියක් විය. එම එකඟතාව තුළින් සාගරයේ සිදුවන නාවික වෙඩි හුවමාරු හා මුහුදු මංකොල්ලකෑම්වලට එරෙහි මෙහෙයුම්, ඒකාබද්ධ සබ්මැරීන් අභ්‍යාස, සන්නිවේදන උපායන්, ගුවන් ආරක්ෂාව, නාවික උපායමාර්ග, ශිල්පීය ක්‍රම හා ක්‍රමවේද භාවිත කරමින් සාගර කලාප තුළ සාමය ඇති කිරීම මෙම 'AMAN' සංකල්පයේ මූලික පදනම වූ බව කිව යුතුය.

'AMAN-21' 7 වැනි ද්විපාර්ශ්වික නාවික අභ්‍යාසයි. 2007 වර්ෂයේදී 'AMAN' නාවික අභ්‍යාසය පළමුවරට පැවැත්වෙන විට නාවික යාත්‍රා සමඟ ඊට රටවල් 28ක් එක්විය. නිරීක්ෂකයන් ලෙස රටවල් 29ක් සහභාගි විය. 2009දී 'AMAN' දෙවැනි නාවික අභ්‍යාසය සඳහා රටවල් 24ක් ද නිරීක්ෂකයන් ලෙස රටවල් 29ක් ද එක්වූ අතර, 2011 පැවැති 'AMAN' තුන්වැනි අභ්‍යාසයට රටවල් 28ක් ද නිරීක්ෂකයන් 43ක් ද එක්වීම විශේෂත්වයක් විය. 2013 පැවැති 'AMAN' සිව්වැනි නාවික අභ්‍යාසයට රටවල් 29ක් එක්වූ අතර, නිරීක්ෂකයන් 36ක් එක්වී ඇත. පස්වැනි 'AMAN' අභ්‍යාසය 2017දී පැවැති අතර, ඊට රටවල් 34ක නාවික යාත්‍රා සමඟ නිරීක්ෂකයන් 67ක් සහභාගි වී තිබේ. 2019 පැවැති හයවැනි 'AMAN' නාවික අභ්‍යාසයට රටවල් 46ක නාවික යාත්‍රා සමඟ නිරීක්ෂකයන් 113ක් සහභාගි වී ඇත. ක්‍රමයෙන් එම සහභාගිත්වය වැඩි වූ අතර, අමෙරිකාව, රුසියාව, චීනය, ප්‍රංශය, ජපානය, බ්‍රිතාන්‍ය, තුර්කිය, ඕස්ට්‍රේලියාව ආදී ලොව ප්‍රබල රාජ්‍යයන් සිය නාවික යාත්‍රා සමඟ 'AMAN' අභ්‍යාසයට එක්වීම සහ නාවික අත්දැකීම් හුවමාරු කැර ගැනීම මෙහි සාර්ථකත්වයට හා අදාළත්වයට හොඳම පිළිතුරකි.

'AMAN-21' නාවික අභ්‍යාසයට රටවල් 43ක් සහභාගි වූ අතර, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් 'ගජබාහු' නමැති ප්‍රහාරක නෞකාව කපිතාන් හර්ෂ ද සිල්වාගේ නායකත්වයෙන් නැවියන් 180ක් සමඟ මෙයට එක්වීම විශේෂත්වයකි. තවද 'ගජබාහු' නෞකාව අධිකාරි බලය ලැබීමෙන් පසු පළමු විදේශ ගමන් සනිටුහන් කළේ AMAN-21 අභ්‍යාසයට එක්වෙමින් වීම විශේෂත්වයකි. ලෝකයේ දියුණු යැයි සැලකෙන නාවික යාත්‍රා සමඟ කරට කර සිටිමින් 'ගජබාහු' ප්‍රහාරක නෞකාව සහ එහි නැවියන් දැක්වූ නාවික ශිල්පීය නිපුණතාවයන් මෙම අභ්‍යාසය නැරඹීමට පැමිණි ලොව වටා ආරාධිතයන් මවිතයට පත්කළ බව කිව යුතු කරුණකි.

ශ්‍රී ලංකාව කුඩා රාජ්‍යයක් වුව ද එහි නාවික හමුදාව ලබා ඇති නිපුණතා හා අත්දැකීම් අතිවිශාලය. විශේෂයෙන් වසර 30කට වැඩි කාලයක් පැවැති LTTE ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමට කළ මෙහෙයුම් හා ශ්‍රී ලංකා නැවියන්ගේ අත්දැකීම් මේ අභ්‍යාසයට එක්වූ බොහෝ දෙනෙක් අතර නිරන්තර සාකච්ඡාවට බඳුන් වීම විශේෂත්වයකි.

කෙසේ නමුත් AMAN සංකල්පය, සමුද්‍රිය ආරක්ෂාව වටා භ්‍රමණය වනවා පමණක් නොව, නාවික රාජ්‍ය තාන්ත්‍රික භාවයක් (Naval Diplomacy) ඇති කිරීමට දායකත්වය සපයයි. නාවික බලයත්, වඩාත් නම්‍යශීලී, ජංගමශීලී ආදී ගුණාංගවලින් පෝෂණය විය යුත්තේ මේ රාජ්‍ය තාන්ත්‍රිකභාවය ඉදිරියට ගෙන යෑම සඳහාය. මේ නයින් බලන විට AMAN අභ්‍යාසය යනු නාවික රාජ්‍ය තාන්ත්‍රිකභාවය පවත්වා ගැනීම අරඹයා අතිශයින්ම වැදගත් මෙහෙයක් ඉටුකරන ගාමක බලවේගයක් බව පෙන්වාදීම ඉතා නිවැරැදි මෙන්ම කාලෝචිතය. පාකිස්තානයේ විදේශ ප්‍රතිපත්තියේ පරමාර්ථය ඉන් ප්‍රකාශවීම කැපී පෙනෙන තවත් සිද්ධියක් ලෙස හඳුන්වා දීම වැදගත්ය.

අප ජීවත්වන ඉන්දීය සාගර කලාපයේ සිදුවෙමින් ඇති භූ දේශපාලනික, භූ ආර්ථික වෙනස්කම් කලාපීය නාවික හමුදාවන්ට අභියෝගාත්මකය. නිරන්තරයෙන්ම එහි ආරක්ෂිත පරිසරයක් තිබීම කලාපීය වශයෙන් පමණක් නොව ගෝලීය වශයෙන් සමුද්‍රිය වෙළෙඳාමට අදාළ වේ. එමෙන්ම ඉහළ යමින් ඇති අවි සම්බන්ධ ක්‍රියාකාරකම්, මිනිස් ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම, මුහුදු කොල්ලකෑම් සහ නීති විරෝධී ක්‍රියාවන් අපට මැඬපැවැත්විය හැක්කේ නාවික රාජ්‍ය තාන්ත්‍රිකභාවයක් ඇති කිරීම තුළින් බව කිව යුතු කරුණකි. අද වන විට සාගරය කේන්ද්‍ර කැරගනිමින් සිදුවන නීති විරෝධී ක්‍රියාකාරකම් පාලනය කිරීමට, මැඬපැවැත්වීමට ලොව ප්‍රබල රාජ්‍යයන් පවා අපොහොසත් වී තිබීම ප්‍රකට කරුණකි. මේ පසුබිම තුළ AMAN අභ්‍යාස මඟින් සමුද්‍රිය ආරක්ෂාව හා අධිපත්‍ය පිළිබඳ ගැටලු හා විශේෂයෙන් සම්ප්‍රදායික නොවන කාරණා පිළිබඳ තනිව ක්‍රියාත්මක වීමට රටකට ඇති නොහැකියාව හමුවේ එක්ව ක්‍රියා කිරීම පිළිබඳ ඇති වැදගත්කම හා රාජ්‍ය තාන්ත්‍රික පාඩම අපට මැනවින් කියා දෙයි. එසේම කලාපීය වශයෙන් සාමය හා ස්ථාවරත්වය වෙනුවෙන් පෙනී සිටීමේදී ක්‍රියා කිරීමේදී පාකිස්තානයේ ධනාත්මක ප්‍රතිරූපය ලොවට දෙන ආදර්ශය මිල කළ නොහැකි බව මෙහිදී කිවයුතු කරුණකි.



**චන්දන විජේකෝන්**
පාකිස්තාන සංචාරයෙන් පසු...



ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම සංකල්පය යථාර්ථයක් බවට පත් කරමින් 'ගමේ පාලම' ව්‍යාපෘතියෙන් අක්මීමණ හියාරේ සොත්තිගොඩ පාලම ඉදිකිරීම පසුගියදා වැව්ලි කර්මාන්ත ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ මහතා ආරම්භ කළ අයුරු.

හිටපු පළාත් සභා මන්ත්‍රී චානක මාදුගොඩ, අක්මීමණ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් ඇතුළු මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීහු මේ අවස්ථාවට සහභාගී වූහ.

ඡායාරූපය - නාගොඩ සමූහ

# මෙරටට එන ආයෝජකයන්ට පහසුකම් දීමට රජයේ අවධානය

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති සංජය මොහොට්ටාල

**නුවන් කොඩිකාර**

මෙරටට පැමිණෙන ආයෝජකයන්ට ජෛව සුරක්ෂිත බුබුලක් යටතේ සිය කාර්යයන් සිදු කිරීමට අවශ්‍ය පහසුකම් දීම කෙරෙහි රජයේ අවධානය යොමුවී ඇතැයි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති සංජය මොහොට්ටාල මහතා පවසයි.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මෙරටින් විදෙස් ආයෝජකයන්ටත්, විදෙස් ආයෝජකයන්ගෙන් මෙරට ජනතාවටත් කිසිම අයුරකින් වත් කොවිඩ් වැළදීමක් සිදු නොවීමට වග බලා ගන්නවා. ඒ සඳහා අවශ්‍ය සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශ දැඩිව ක්‍රියාත්මක කිරීම කටයුතු කරනවා.

මෙසේ පැමිණෙන ආයෝජකයන්ට තෝරාගත් හෝටල් කිහිපයක් ද, ආරක්ෂිත ප්‍රවාහන පහසුකම් හා අනෙකුත් අවශ්‍යතා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සම්බන්ධීකරණය යටතේ දෙනවා.

පවතින ගෝලීය වසංගතය හමුවේ වුවත් මෙරට ආයෝජනයට විවිධ ක්ෂේත්‍රවල ආයෝජකයන් රැසක් කැමැත්ත පළ කර ඇතත්, මෙරට සෞඛ්‍යාරක්ෂිත වැඩපිළිවෙළ අනුව ඊට අවශ්‍ය පහසුකම් දීමට නොහැකිවී තිබෙනවා. පවතින නව සාමාන්‍යකරණය යටතේ සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් මේ වැඩසටහන ක්‍රියත්මක කිරීමට අපේක්ෂා කරනවා.'

# ලියාපදිංචිය ලබා රට රැකියාවට ගොස් යළි පැමිණෙන්නන්ට නිරෝධායනය නොමිලේ

## ඇමැති නිමල් සිරිපාලද සිල්වා

**අනුර ප්‍රේමලාල්**

කාර්යාංශයේ ලියාපදිංචි වී රට රැකියාවලට ගිය අය ගෙන්වා ගැනීම සහ නිරෝධායනය කිරීම රජයේ වියදමින් කරන බව කම්කරු ඇමැති නිමල් සිරිපාලද සිල්වා මහතා පැවසීය.

ඒ මහතා මේබව සඳහන් කළේ ඊයේ (16) මාධ්‍ය වෙත ප්‍රකාශයක් කරමිනි.

එහිදි වැඩි දුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේද කීවේය. විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මේ වන විට තිස් දහසකට ආසන්න පිරිසක් ශ්‍රී ලංකාවට නැවත පැමිණ ඇති අතර, තවත් විසි 20,000ට ආසන්න පිරිසක් ගෙන්වා ගැනීමට තිබෙනවා. ඔවුන් ගෙන්වා ගැනීමට ප්‍රධාන බාධකය වී ඇත්තේ ශ්‍රී ලංකාවට ඔවුන් පැමිණීමෙන් පසු නිරෝධානය කිරීම සඳහා අවශ්‍ය නිරෝධායන මධ්‍යස්ථානවල ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීමයි. එම නිසා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදෙස් රැකියා සඳහා ගොස් නියමිත කාලය අවසන් කර ශ්‍රී ලංකාවට පැමිණීමට අපේක්ෂාවෙන් සිටින අය කාර්යාංශයේ මුදලින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමටත් ඔවුන්, කාර්යාංශය වියදමින් නිරෝධායනය කිරීමටත් අවශ්‍ය කටයුතු සැලසුම් කර තිබෙනවා.

ඒ අනුව සෑම දිස්ත්‍රික්කයකම හෝටලයක් හෝ නේවාසික පහසුකම් ඇති ස්ථානයක් කුලියට ගෙන නිරෝධායන මධ්‍යස්ථානයක් බැගින් පිහිටුවීමට කටයුතු යොදා ඇති අතර, ඉන් පළමුවැනි නිරෝධායන මධ්‍යස්ථාන අටක් සති දෙකක් ඇතුළත ආරම්භ කරනවා. එම නව නිරෝධායනය මධ්‍යස්ථාන පිහිටුවීමට හඳුනාගත් සුදුසු ගොඩනැගිලි පිළිබඳ ලැයිස්තුව මේ වන විට



covid19 මර්දන කාර්යසාධක බළකායේ ප්‍රධානී යුද හමුදාපති මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා වෙත යොමුකර තිබෙනවා. එම මධ්‍යස්ථානවල සියලු වියදම් දරන්නේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයයි. මෙම විගමනිකයන් ගෙන්වා ගැනීමේ දී ප්‍රමුඛත්වයක් ලබා දෙන්නේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදෙස් රැකියා සඳහා ගිය අයට බවද කිව යුතුයි. ආරම්භක පියවර හැටියට දිස්ත්‍රික්ක අටක පමණ මෙම මධ්‍යස්ථාන ස්ථාපිත කරනවා. එසේම ඉදිරියේ දී සෙසු දිස්ත්‍රික්කවල ද මෙම මධ්‍යස්ථාන ස්ථාපිත කර විදෙස්ගතව සිටින අපේ ශ්‍රමික ජනතාව කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කරනවා. සමහර විට ඉදිරියේදී මෙම විදෙස්ගත ශ්‍රී ලංකිකයන් ශ්‍රී ලංකාවට පැමිණීම සම්බන්ධව කෝවිඩ් මර්දන රෙගුලාසි ලිහිල්වීමට ඉඩ තිබෙනවා. එසේ වුවහොත් විගමනික ශ්‍රකමිකයන් මීට වඩා වැඩි පිරිසක් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට හැකි වේවි.

# ගෘහ සේවිකාවන්ගෙන් ලක්ෂ 10ක් ඒජන්සිකරුවන්ට ලැබෙනවා කීම ප්‍රතික්ෂේප කරනවා

## බලපත්‍රලත් විදේශ සේවා නියුක්ති නියෝජ්‍යාතන

**අනුර ප්‍රේමලාල් සහ මහින්ද අලුත්ගෙදර**

ගෘහ සේවිකාවන්ට මූලික ගෙවීමක් ලෙස රුපියල් ලක්ෂ දහයක් විදේශයන්ගෙන් ඒජන්සිකරුවන්ට ලැබෙනවා කියන කතාව සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරන අතර, ඒ පිළිබඳ සිදු කරන ඕනෑම විගණනයකට සම්පූර්ණ සහයෝගය දෙන බව බලපත්‍ර ලත් විදේශ සේවා නියුක්ති නියෝජ්‍යාතන සංගමය කියා සිටියි. මේ සම්බන්ධයෙන් එම සංගමයේ ලේකම් එම්. එෆ්. එම්. අර්ෂාඩ් මහතා මෙසේ ද කීය. 'ගෘහ සේවිකාවන්ට රුපියල් ලක්ෂය දහයක් ලැබෙන බව සඳහන් කිරීම පදනම් විරහිත ප්‍රකාශයක්. මෙය රටෙන් රටට සහ සේවකයාගේ වයස අනුව වෙනස් වෙනවා. අපට ප්‍රේෂණය වන සියලුම පෙර විගමණික වියදම් වෙනුවෙන් වාර්තාවක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ඉදිරිපත් කරනවා. ඒ වෙනුවෙන් සෙස් මුදල් පවා ගෙවීමට කටයුතු කර තිබෙනවා. එසේම සියලුම ප්‍රේෂණ මහ බැංකුවේ ලියාපදිංචිවී ඇති බැංකු හරහා ගෙන්වා තිබෙනවා.

# බෙරලපනාතර විවිධ සේවා සමුපකාර සමිතියට වසර 50යි



කාර්ය මණ්ඩලය

**තමරසිරි විජේසේකර - දෙයියන්දර සමූහ**

මොරවක් කෝරලයේ කඩ සමිති 15 ක් ඒකාබද්ධ කර ගනිමින් සීමාසහිත බෙරලපනාතර විවිධ සේවා සමුපකාර සමිතිය නමින් 1971-03-06 වැනි දින ආරම්භ කරන ලද බෙරලපනාතර සමුපකාර සමිතිය දකුණු පළාතට පමණක් නොව මුළු මහත් සමුපකාර ව්‍යාපාරයටම ආදර්ශයක් දෙමින් දිවයිනේ සමුපකාර සමිති අතර පෙරමුණ ගනිමින් 2021- 03 -06 වැනි දිනට වසර 50 ක් සම්පූර්ණ කරමින් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ප්‍රජා සත්කාරක සේවාවන් රැසක් දියත් කරමින් සිය 50 වන සංවත්සරය අභිමානයෙන් යුතුව සැමරීමට කටයුතු යොදා ඇත.

එදා ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් තම ධනය, ශ්‍රමය හා කාලය වැය කළ බෙරලපනාතර ගම් සභා කාර්යාලයේ සභාපති ධුරය හෙබ වූ දොන් ඇම්බ්‍රෝස් රාජපක්ෂ මහතා බෙරලපනාතර සමුපකාර සමිතිය බිහි කිරීමේ පුරෝගාමියා විය.

සාමාජිකයන් 21 දෙනෙකුගේ සහයෝගයෙන් ඇරඹි එහි ප්‍රථම සභාපතිවරයා වූයේද ඒ මහතාය.

මොලොක්ගමුව, කිරළපන, ගල්බොක්ක, විජයගම, තලපලකන්ද, බෙරලපනාතර, කැකුන්දෙණිය, ඌරුබොක්ක, හීගොඩ, ගින්නලිය, මැකිලිය තැන්න, බෙන්ගමුව, පස්ගොඩ, රොටුඹ, දෙන්කන්දලිය, පනාකඩුව, ඇහැලකන්ද හා මාවරල, පුවක්ගහහේන යන ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ආර්ථික මෙන්ම සමාජීය හා සංස්කෘතික දියුණුවත් පාරිභෝගික ද්‍රව්‍ය පහසු මිලට ලබාදීමත් බෙරලපනාතර සමුපකාර සමිතිය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වී තිබුණි.

විවිධ සේවාවන් රැසක් යටතේ පාරිභෝගික ජනතාවට වඩාත් සහනදායක සේවාවන් සපයමින් 'සමුපකාර' යන වචනයේ සැබෑ අරුත ලොවටම කියා දෙමින් උදාර මෙහෙවරක නිරත වී සිටින බෙරලපනාතර සමුපකාර සමිතියේ අද වන විට සේවක පිරිස 583 ක් පමණ වන අතර



සභාපති



උප සභාපති



සාමාන්‍යාධිකාරී

සාමාජික සංඛ්‍යාව 44,000ක් පමණ වේ.

ග්‍රාමීය බැංකු ශාඛා 28ක්, කෝප් සිටි හයක්, කෝප් ෂොප් 31ක්, තේ කර්මාන්තශාලාවක්, මගී ප්‍රවාහන බස් රථ හතක්, පෙර පාසල් නවයක්, අවමංගල්‍ය සේවාවාක්, දඹදිව වන්දනා චාරිකා සේවය ලෙසින් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ලබා දෙන සේවාවන් අතුරින් කිහිපයක් පමණි.

එසේ ආ ගමන් මග තවත් අර්ථවත් කරමින් වසර 50ක් සපිරෙන අවස්ථාවේ "දැන් අපි සද්ධන්තයි සන්නද්ධයි" යන තේමාව මුල් කර කරගනිමින් 2025 වන විට දකුණු ආසියාවේ විශිෂ්ටතම සමුපකාර සංවිධානය බවට පත් වීමේ ඉලක්කය සපුරා ගනිමින් ඉදිරියටම ගමන් කරනු ලබයි.

එම ඉලක්ක සපුරා ගැනීම අරමුණු කර ගනිමින් මේ වන විට එම සමුපකාර සමිතිය නව සේවාවන් රැසක්ද විවෘත කර තිබේ. ඒ අතුරින් එම සමිතිය විසින් පසුගියදා ජනතා අයිතියට පත්කරන ලද 'කැමේලියා මව්න්ට්' උත්සව ශාලාව අද වන විට දෙස් විදෙස් සංචාරකයන් අතර අතිශය ජනප්‍රියත්වයට පත්ව තිබීම එම සමිතිය ලබා ඇති සුවිසල් ජයග්‍රහණයකි.

සීමාසහිත බෙරලපනාතර විවිධ සේවා සමුපකාර සමිතිය 50 වන සංවත්සරය සැමරීම නිමිති කොට ගෙන ජනතාව වෙනුවෙන් සේවා රැසක් ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබේ.

ඒ අතුරින් රෝහල් වෛද්‍ය ප්‍රතිකාර සේවා ඒකකයක් ස්ථාපිත කිරීම, ග්‍රාමීය බැංකු ශාඛා සඳහා විදුලි ජනක යන්ත්‍ර ලබාදීම, තේ කර්මාන්තශාලාවක් ආරම්භ කිරීම, ඒ.ටී.එම්. (ATM) කාඩ්පත් මගින් මුදල් ලබා ගැනීමේ සේවාවක් ක්‍රියාත්මක කිරීම වැනි අංශ කිහිපයක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවෙන් සිටී.

එසේම මෙම සමුපකාර සමිතිය සුබසාධන කටයුතු කෙරෙහි වැඩි අවස්ථාවක් ලබා දෙමින් ප්‍රදේශයේ දිළිඳු ජනතාව වෙනුවෙන් ප්‍රජා සත්කාරක සේවාවන් කිහිපයක් ද ක්‍රියාත්මක කර තිබේ. එහි එක් සේවාවක් ලෙස දිළිඳු පවුල් සඳහා නිවාස ඉදිකර දීමට කටයුතු කර තිබේ.

මෙම සමුපකාර සමිතිය ආරම්භ කර වසර 50 ක් සපිරීම නිමිත්තෙන් හෙට (20)බෙරලපනාතර සමුපකාර සමිති පරිශ්‍රය තුළ විශේෂ උත්සවයක් සංවිධානය කර තිබෙන අතර, එයට සමගාමීව ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ප්‍රජා සත්කාරක සේවාවන් රැසක් ක්‍රියාත්මක කිරීමට ද සැලසුම් කර තිබේ.

මාවරල රජයේ රෝහලේ කාන්තා වාට්ටු සංකීරණ නවීකරණය කිරීම, නව නිවාස දෙකක් ඉදිකර සේවකයන් දෙදෙනකුට පිරිනැමීම, ඇඹිලිපිටිය සුවනෙත දෘෂ්ඨි විශේෂඥයෝ විසින් පවත්වනු ලබන නොමිලේ ඇස් පරීක්ෂා කිරීමේ ජංගම සේවය, ගින්නලිය ප්‍රදේශයේ ග්‍රාමීය බැංකු සංකීර්ණය සඳහා නව ගොඩනැගිල්ලක් ආරම්භ කිරීම එදිනට ක්‍රියාත්මක කරනු ලබන නව සේවාවන් අතුරින් කිහිපයකි.

සීමාසහිත බෙරලපනාතර විවිධ සේවා සමුපකාර සමිතියේ වත්මන් සභාපති ජයන්ත සේසිරි මහතාගෙන් ලැබෙන මග පෙන්වීම සහ සහයෝගයෙන් මෙම සමිතිය ඉදිරියටම ගමන් කරනු ලබන අතර ඊට අමතරව සමිතියේ උප සභාපති නිශාන්ත රූබසිංහ මහතා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී හරිස්චන්ද්‍ර විතාරණ මහතා සහ කාර්ය මණ්ඩලය මෙන්ම සමුපකාර සමිතියේ හිටපු සභාපතිවරු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රදේශයේ ජනතාව සහ සමුපකාර දෙපාර්තමේන්තුවේ නව කොමසාරිස් රුවන් කන්නන්ගර මහතා සහ නිලධාරීන් ලබා දෙන සහයෝගය අති විශාල වේ.



අධ්‍යක්ෂ මණ්ඩලය

# ගම සමග පිළිසඳරක්

## පොළොන්නරුවේ ප්‍රගති සමාලෝචනය පසුගියදා

**එච්.එල්. ද සොයිසා**
**ලංකාපුර සමූහ**



ගම සමග පිළිසඳරක් වැඩසටහන යටතේ පැවැත් වූ මැදිරිගිරිය ජනතා හමුවේ දී ඉදිරිපත් වූ ප්‍රශ්න හා ගැටලුවලට ජනාධිපතිවරයා දී ඇති උපදෙස් අනුව මෙතෙක් ලැබුණු විසඳුම්වල ප්‍රගතිය විමසා බැලීමේ ප්‍රගති සමාලෝචන රැස්වීමක් පසුගියදා පොළොන්නරු දිස්ත්‍රික් ලේකම් ඩබ්ලිව්.ඒ. ධර්මසිරි මහතාගේ සහ ජනාධිපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඒ. ආර්. ගංගාධාර මහතාගේ සහභාගිත්වයෙන් පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැතිණි.

එහිදී වනජීවී, මහාමාර්ග, අධ්‍යාපන, සෞඛ්‍ය, වාරිමාර්ග, ඇතුළු දෙපාර්තමේන්තු, විදුලිබල මණ්ඩලය, නිවාස අධිකාරිය ඇතුළු රාජ්‍ය ආයතන රැසක නිලධාරීන් මැදිරිගිරියේ පැවති ගම සමඟ පිළිසඳර වැඩසටහනේදි තම දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළව ඉදිරිපත් වූ ගැටලුවලට ගත වූ මාසයකට වැඩි කාලයක් තුළ විසඳුම් ලබා දීමට කටයුතු කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කරමින් කතා කළත් වනජීවී හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ නිවාස අධිකාරිය ඔවුන් වෙත ඉදිරිපත් වී තිබූ ගැටලු හා ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමේ කටයුතු පිළිබඳව සාර්ථක ප්‍රගතියක් ඉදිරිපත් නොවුණි. වනජීවී පනත අනුව තමන්ට රිසි සේ කටයුතු කිරීමට නොහැකි වූ නිසා විසඳුම් සෙවීමේ බාධාවන් තිබෙන බව එහිදී වනජීවී නිලධාරීන් ප්‍රකාශ කර තිබේ.

ප්‍රගති සමාලෝචන රැස්වීම අවසානයේ කරුණු පැහැදිලි කළ පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් ඩබ්ලිව්. ඒ. ධර්මසිරි මහතා ගම සමඟ පිළිසඳර පවත්වා මාසයකුත් දින විස්සක් පමණ ගත වන විට එම ප්‍රශ්න විසඳීමේදී වන ජීවිය 5%, වාරිමාර්ගය10%,මහා මාර්ගය 15%, නිවාස අධිකාරිය 5%, අධ්‍යාපනය 20%, සෞඛ්‍ය 26% සහ ජල සම්පත් මණ්ඩලය 50% ක් ලෙස ප්‍රගතියක් පෙන්වා තිබුණත් එහි සමස්ථය ගණනය කිරීමේදී පෙන්නුම් කෙරෙන්නේ 25% ක ප්‍රගතියක් යැයි අවධාරණය කළේය.

# ශ්‍රී ලංකා-පාකිස්තාන ද්විපාර්ශ්වික සබඳතා පුළුල් කර ගැනීමේ සාකච්ඡා

**මහින්ද අලුත්ගෙදර**



පාකිස්ථාන අගමැති ඉම්රාන් ඛාන් මහතාගේ ශ්‍රී ලංකා සංචාරයෙන් අනතුරුව, ද්විපාර්ශ්වික සබඳතා පුළුල්කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ පාකිස්ථානය සාකච්ඡා ආරම්භකර තිබේ.

ඒ අනුව මේ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන සහ ශ්‍රී ලංකාවේ පාකිස්ථාන මහ කොමසාරිස් මේජර් ජනරාල් (විශ්‍රාමික) මුහම්මඩ් සාඩ් ඛට්ටාක් මහත්වරු අතර විශේෂ හමුවක් විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී පැවැත්විණි.

පාකිස්තානයෙන් ප්‍රදානය කරන ලද ජංගම පුස්තකාල ස්ථාපිත කිරීම සහ ශ්‍රී ලාංකික සිසු සිසුවියන් සඳහා අතිරේක වෛද්‍ය විද්‍යා ශිෂ්‍යත්ව සියයක් ලබා දීම ඇතුළුව, අගමැති ඉම්රාන් ඛාන් මහතාගේ සංචාරය අතරතුර දී ප්‍රකාශයට පත් කරන ලද ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්ශ්වයම එකඟ විය.

පාකිස්ථානයේ බෞද්ධ සිද්ධස්ථාන ශ්‍රී ලාංකිකයන් සඳහා විවෘත කිරීම පිළිගනිමින් විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා සඳහන් කළේ, ගුවන් සේවා අංශය ශ්‍රී ලංකා සංචාරක අංශය හා එක්ව නොබෝ දිනකින් පාකිස්තාන - ශ්‍රී ලංකා ගුවන් ගමන් පැකේජ පිළිබඳව නිවේදනය කරනු ඇති බවයි. හොඳින් සංරක්ෂණය කොට ඇති බෞද්ධ උරුම ස්ථාන නැරඹීම සඳහා පාකිසතානයේ හුරුපුරුදු වීමේ සංචාරවල නියැළීමට පැමිණෙන ලෙස පාකිස්තාන මහ කොමසාරිස්වරයා බෞද්ධ භික්ෂූන් වහන්සේලාට, මාධ්‍යවේදීන්ට සහ විද්වතුන්ට ආරාධනා කළේය.

මාර්තු 23 වැනි දින කොළඹ දී පවත්වනු ලබන පාකිස්තාන ජාතික දින සැමරුමට සහභාගී වන ලෙස ද මහ කොමසාරිස් ඛට්ටාක් මහතා විසින් ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතාට ආරාධනා කළේය.

# වැලි, කළුගල් හා පස් කැණීම් බලපත් නිකුත් කිරීමේදී සහන වැඩපිළිවෙළක්

**බුද්ධිකා ඉඹුලාන**

වැලි, කළුගල් හා පස් කැණීම් බලපත් නිකුත් කිරීමේ දී බලපත්ලාභීන්ට සහන හිමි වන වැඩපිළිවෙළක් පරිසර අමාත්‍යාංශය මඟින් සැලසුම් කර ඇත. මෙහිදී පරිසර අමාත්‍යාංශය මඟින් වැලි, කළුගල් හා පස් කැණීම් බලපත් නිකුත් කිරීමේ දී සිදු වන ප්‍රමාදයන් වළක්වා එකම ස්ථානයක දී බලපත් ලබා ගැනීමට පහසුකම් සැලසීමේ වැඩපිළිවෙළක් ඇරඹීමට සැළසුම් කර ඇතැයි පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පවසයි. නව වැඩපිළිවෙළ අනුව කැණීම් බලපත්ලාභීන් සඳහා ලබා දීමට යෝජිත සහන අතර එක් වසරක් සඳහා නිකුත් කරන ලද කැණීම් බලපත්‍රය වසර 03ක කාලයකට දීර්ඝ කිරීමට පියවර ගෙන ඇත. එමෙන්ම, ආයතන ඛණිජ කැණීම සඳහා ආයතන කිහිපයකින් ලබා ගත යුතු අවසරයන් එක් ස්ථානයකින් ලබා දීමට ද පියවර ගෙන ඇත. ඒ අනුව පුරාවිද්‍යා, නාගරික සංවර්ධන, ප්‍රාදේශීය සභා, වනසංරක්ෂණ, ඉඩම් ආදී විවිධ ආයතනවලින් අනුමැතිය ලබා ගැනීමට බලපත්ලාභීන්ට සිදු වන බැවින් එම සියලු කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් මින් ඉදිරියේදී සිදු කරනු ඇත. එමෙන්ම මුදල් ගෙවිය යුතු වන්නේ එම කාර්යාංශයට පමණක් වන අතර අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු එම කාර්යාංශය විසින් සිදු කරයි. කැණීම් බලපත් ගාස්තුව සියයට 50කින් අඩු කිරීමටද පියවර ගෙන තිබේ.

# පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් තම රථය ජංගම පුස්තකාලයක් කරයි

**උපාලි කරුණාරත්න**

රටේ ජනතාවගේ කියවීමේ දැනුම වැඩි කිරීමේ අරමුණින් තම රථය ජංගම පුස්තකාලයක් බවට පත් කළ බව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය අනුර මනතුංග මහතා පැවසීය.

තමන් පුරාවිද්‍යා කටයුතු සඳහා රට පුරා ගමන් කරන විට තම රථයේ ග්‍රන්ථ යම් ප්‍රමාණයක් රැගෙන යන බවද කී මහාචාර්යවරයා පුරාවිද්‍යාවට සම්බන්ධ ග්‍රන්ථ මෙන්ම නව කතා, කෙටි කතා, ජන කවි ආදී විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අයත් ග්‍රන්ථ රාශියක් මෙම ජංගම පුස්තකාලයෙන් කියවීමට ලබා ගත හැකි යැයිද ප්‍රකාශ කළේය.

පළමුව පුරාවිද්‍යා ප්‍රාදේශීය කාර්යාලවල සිටින නිලධාරීන්ට සහ සේවකයන්ට මෙන්ම ඔවුන්ගේ දූ දරුවන්ට මෙම ග්‍රන්ථ කියවීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන බවද කී මහාචාර්ය අනුර මනතුංග මහතා ඉදිරියේදී පොදු ජනතාවටද මෙම ග්‍රන්ථ ලබා ගෙන කියවීමේ ක්‍රමවේදයක් සකස් කරන බවද සඳහන් කළේය.

මෙම වැඩසටහන සමඟ සම්බන්ධ වන ජනතාවට ඔවුන්ගේ ඉල්ලීම් අනුව ඉදිරියේදී ග්‍රන්ථ ලබා දිය හැකි යැයිද කී මහාචාර්යවරයා මෙම වැඩපිළිවෙළ අනුව තම රථයේ රියදුරා ඉදිරියේදී ජංගම පුස්තකාලයාධිපතිවරයකු කිරීම තම අරමුණ යැයිද නව වැඩපිළිවෙළ පිළිබඳව 'දිනමිණ'ට පැවසීය.

## දවසේ රාහු කාලය

දහවල් 01.49 - 03.21 දක්වා අලුයම 01.47 - 03.17 දක්වා



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී **අජිත් ධර්මසිරි**

## දින තත්ත්වය

මීන රවි 04 භාග මැදින් පුර විසේනිය තිථිය ලත් ගුරු දින ඉර උදාව 06.16 ට. ඉර බැසීම 06.22 ට. බෙරණ නැකත උදේ 10.36න් ගෙවී කැති නැකත ලබයි. මැදින් පුර විසේනිය තිථිය දවස පුරාම යෙදී පවතී. වෛධෘති යෝගය උදේ 09.57න් ගෙවී විශ්කම්බ යෝගය ලබා පවතී. බව කරණය දහවල් 12.50න් ගෙවී බාලව කරණය උදාව පවතී.
විෂ කලාව - ඇස / අමෘත කලාව - ලිංග - යෝනි
මරු සිටින දිශාව - දකුණ / යෝගිනී සිටින දිශාව - නිරිත / සුබ දිශාව - නැගෙනහිර

## හෝරාවෙන් වැඩ ගනිමු

රවි හෝරාව ප්‍රභූන් දැකීමෙහි ද සඳු හෝරාව සියලු සුබ කටයුතු වලට ද කුජ හෝරාව යුද හා තරග කටයුතු වලට ද බුධ හෝරාව ශාස්ත්‍රීය කටයුතු හා නුවණින් කරන කටයුතු වලට ද ගුරු හෝරාව විවාහාදී කටයුතු වලට ද සිකුරු හෝරාව ගමන් යාම ඇතුළු සියලු සුබ කටයුතු සඳහා ද ශනි හෝරාව මහණ කිරීම, යෝගී භාවනා ආදිය සඳහා ද යොදා ගන්න.

### දවසේ කාල හෝරාව ගෙවී යන අයුරු

**උදේ**
06.16 - 07.16 දක්වා - ගුරු හෝරාව
07.16 - 08.16 දක්වා - කුජ හෝරාව
08.16 - 09.16 දක්වා - රවි හෝරාව
09.16 - 10.16 දක්වා - සිකුරු හෝරාව
10.16 - 11.16 දක්වා - බුධ හෝරාව
11.16 - 12. 16 දක්වා - සඳු හෝරාව

**සවස**
12.16 - 01.16 දක්වා - සෙනසුරු හෝරාව
01.16 - 02.16 දක්වා - ගුරු හෝරාව
02.16 - 03.16 දක්වා - කුජ හෝරාව
03.16 - 04.16 දක්වා - රවි හෝරාව
04.16 - 05.16 දක්වා - සිකුරු හෝරාව
05.16 - 06. 16 දක්වා - බුධ හෝරාව

**රාත්‍රී**
06.16 - 07.16 දක්වා - සඳු හෝරාව
07.16 - 08.16 දක්වා - සෙනසුරු හෝරාව
08.16 - 09.16 දක්වා - ගුරු හෝරාව
09.16 - 10.16 දක්වා - කුජ හෝරාව
10.16 - 11.16 දක්වා - රවි හෝරාව
11.16 - 12. 16 දක්වා - සිකුරු හෝරාව

**අලුයම**
12.16 - 01.16 දක්වා - බුධ හෝරාව
01.16 - 02.16 දක්වා - සඳු හෝරාව
02.16 - 03.16 දක්වා - සෙනසුරු හෝරාව
03.16 - 04.16 දක්වා - ගුරු හෝරාව
04.16 - 05.16 දක්වා - කුජ හෝරාව
05.16 - 06. 16 දක්වා - රවි හෝරාව

**ඔබට නමක්**

මෙදින උදේ 10.36 දක්වා බෙරණ නැකත උදාව පවතින නිසා ලි - ලු - ලෙ අකුරු ද ඉන්පසු කැති නැකත උදාව පවතින නිසා අ - ඉ - උ - එ අකුරු ද දිනට හිමි අකුරු අනුව ත - ද - ධ - න මුල්කොට නම් තැබීම සුබයි.



## දවසේ ලග්න පලාපල

### මේෂ ලග්නය - නිර්මාණශීලී බව ඔප්නැංවේ

මේෂ ලග්නයට අනුව අද දින ඔබගේ කේන්ද්‍රයේ බලවත් පිහිටීමක් සනිටුහන් කරයි. විශේෂයෙන් බොහෝ අයගේ ඇප උපකාර ලැබෙනු ඇත. තමාට රිසි සේ තම අදහස් ක්‍රියාත්මක කිරීමට පුළුවන් වනු ඇත. උරහිස ආශ්‍රිත උවදුරු පෙනේ. උඩ නැගීම්, ගින්දර, විදුලිය ආශ්‍රිත කටයුතුවලදී කල්පනාකාරී වන්න. සිතේ පැවතුණු සංකල්පනාවක් නිර්මාණයක් ලෙස එළිදැක්වීමට ඔබට හැකි වේ. ග්‍රන්ථකරණයට අත තැබීමට සුබ දිනකි.

### වෘෂභ ලග්නය - දිවි ගමනේ බාධා

වෘෂභ ලග්නයට අනුව අද ඔබට තම අරමුණු ඉටුකර ගැනීම සඳහා යන ගමනේ බාධක සහිතයි. තමාගේ නිතර නිතර දුක සැප සොයා බැලූ අය තමා වෙතින් දුරස් වනු ඇත. ආර්ථික ලාභයක් පෙන්නුව ද ශාරීරික දුර්වලතා මත අසාත්මිකතා පැන නඟී. කුසට අගුණයි. සැර, උෂ්ණ ආහාර ගැනීම අවම කරන්න. වියදම් පැත්ත අධික වේ. සකසුරුවම හුරුවන්න.

### මිථුන ලග්නය - අමතර ව්‍යාපාර පලදරයි

මිථුන ලග්නය හිමි ඔබට අද දින චන්ද්‍රයා 11 වැන්නේ පසුවන නිසා හදිසි ධන සම්පත් හිමිවේ. ආදායම් සරු වේ. කරන කියන අමතර ව්‍යාපාර පල දරයි. සතුටුදායක ආරංචි ලැබෙන දිනයකි. කොයි කවුරුත් තමාගේ ඉදිරි ගමනට අතහිත දෙනු ඇත. රස ආහාර භුක්ති විඳීමට හැකි වන දිනයකි. තමාගේ නිවෙසට පැමිණෙන ආගන්තුකයකු නිසා වාසි සැලසේ. ආහාර අජීර්ණ පැවතිය හැක.

### කටක ලග්නය - පිය පාර්ශ්වයෙන් උරුමකම්

කටක ලග්නයට අනුව අද දින රැකියා වාසනාව හිමි වේ. ඔබ මෙතෙක් අස්ථිර සේවයේ පසු වූවා නම් සේවය ස්ථිර වීමට කරුණු යෙදේ. තමාට පැවරෙන වගකීම් රැසක් නොපිරිහෙලා ඉටුකිරීමට සමත් වීම නිසා උසස් නිලධාරීන්ගේ ප්‍රසාදයට පත්වේ. ගෘහ ජීවිතය සැපවත් වේ. පෙර පිං මහිමය නිසා හිමි විය යුතු දේපළක් පිය පාර්ශ්වය වෙතින් ඔබට හිමිවේ. සිතේ නව බලාපොරොත්තු ඉහළ නැංවේ.

### සිංහ ලග්නය - නිවසේ අලංකාරය වෙනුවෙන් කැපවේ

සිංහ ලග්නයට අනුව අද ඔබට ඉතා සුබ දිනකි. ආගමික කටයුතු රැසක නියැළීමට හැකි වේ. සොඳුරු හිතමිතුරන් ඇසුරට ලැබේ. තමා වෙත පැමිණෙන අසරණ අයකුගේ උවමනා එපාකම් ඉටුකර දීමට අවස්ථාව උදාවේ. උරහිසේ ආපදා, යටි බඩේ ආපදා මතුකෙරේ. වෙනත් අයකු විසින් ඔබට කිසියම් උත්සවයකට ආරාධනා කරන දිනක් වනු ඇත. නිවසේ අලංකාරය සඳහා අලංකාර ගෘහ භාණ්ඩ ගෙන එන දිනකි.

### කන්‍යා ලග්නය - චරිතය කැළැල් වේ

කන්‍යා ලග්නයට අනුව අද දින ප්‍රවේසම් විය යුතුම දිනකි. ඔබගේ පිරිසිදු බවට, අවංක බවට කැළැල් සිදුවන දිනකි. ඔබගේ යුගදිවියට එය තදින් බලපායි. ඒ අනුව අභූත චෝදනා, බොරු ප්‍රචාර නිසා ඔබගේ චරිතයට කැළැල් සිදුවිය හැක. ඒ කෙසේ වෙතත් ඔබට ආර්ථික වශයෙන් ලැබීම් ඇති වේ. තමාගේ කටයුතු සඳහා විශ්වාසවන්ත පිරිසකගේ ද සහයෝගය නොඅඩුව ලැබේ.

### තුලා ලග්නය - ආදායම් තත්ත්වය සරුවේ

තුලා ලග්නයට අනුව අද ඔබට ඉතා වාසනාවන්ත දිනයකි. කලක් ඈත්වී සිටි පිරිස ළංවේ. නිවසින් බැහැර වී සිටි කාලය අවසන්කොට යළි නිවසේ පිරිස සමඟ සමීපව කටයුතු කිරීමට හැකිවේ. ආදායම් තත්ත්වය සරුවේ. නව ව්‍යාපාර වැනි කටයුතු සඳහා ආයෝජන සිදු කෙරෙන දිනයකි. නමුත් යම් ලියකියවිලි සඳහා අත්සන් තැබීමේදී දෙවතාවක් සිතා කටයුතු කරන්න. අත්වැරදීම් සිදුවිය හැක.

### වෘශ්චික ලග්නය - දේපළක හිමිකමක්

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට විවිධ බාධා එළඹෙයි. තමාට විශ්වාසයෙන් සිටි අයකු වෙනත් අයගේ ඉගැන්නුම් බස් අනුව නොමඟ ගොස් තමාටම එරෙහිව කටයුතු කරන දිනකි. අලුයම සිට ඔබට ඔබේ නින්ද පවා අහිමි කරමින් සිතට විවිධ බාධක සිතුවිලි එළඹෙනු ඇත. කල්පනාවෙන් කටයුතු කළහොත් තමාට හිමිවිය යුතු දේපළක් හෝ ධනයක් හිමිවීමට පුළුවන.

### ධනු ලග්නය - වෘත්තීය වරප්‍රසාද රැසක්

ධනු ලග්නය හිමි ඔබට බලාපොරොත්තු ඉටුවන දිනයකි. දරු සම්පත් බලාපොරොත්තු වන අයගේ එම පැතුම් ඉටුවේ. නව ආයෝජන සඳහා යොමුවේ. පිටරට අධ්‍යාපන කටයුත්තකට වාසනාව පෑදේ. තම වෘත්තීය මට්ටමේ ලැබිය යුතු වරප්‍රසාද රැසක් හිමිවේ. සම්මුඛ පරීක්ෂණ ආදියෙන් ජය හිමිවේ. දරුවකුගේ ජයග්‍රහණයක් නිසා නිවසේ උත්සවශ්‍රීයක් උසුලනු ඇත. කුස උෂ්ණ මතුකෙරේ. හෘද ස්පන්දන ගැටලු අධික වේ. සැර උෂ්ණ ආහාර අවම කරන්න.

### මකර ලග්නය - ගේදොර අලංකාරයට කැපවේ

මකර ලග්නයට අනුව අද ඔබට සුබ දිනකි. ආර්ථික ලාභ, වාහන, ඉඩම් ලාභ මෙන්ම ඔබට විකුණා ගැනීමට නොහැකිව තිබූ වාහනයක් නිසි මිලකට විකුණා ගැනීමට හැකිවේ. ගේදොර අලංකාරය සඳහා වැඩිපුර කැපවන දිනයකි. වියදම අධික වුවද ලැබීම් අතින් යහපත් නිසා ජීවිතය සමබරතාවකින් ගතකිරීමට හැකිවේ. පපුවේ සෙම ගතිය මතුකෙරේ. සීතල ආහාරපානාදියෙන් වැළකී සිටීම වැදගත් වේ.

### කුම්භ ලග්නය - වියදම ශීඝ්‍රයෙන් ඉහළට

කුම්භ ලග්නයට අනුව අද ඔබට චන්ද්‍රයා 03 වැන්නේය. පැවතුණු නඩුවක් හෝ වෙන යම් නීති ගැටලුවක් අවසන් වන දිනයකි. ආදායම් අතින් අවමයක් සිදු වන අතර වියදම ශීඝ්‍ර වනු ඇත. තම ඥාති පාර්ශ්වයේ යම් යම් බලපෑම් නිසා සිත් තැවුල් මතුකෙරේ. එහෙත් අනාගතය වෙනුවෙන් නව බලාපොරොත්තු ඉහළ නංවා ගැනීමට උනන්දු වේ. උගුරේ අපහසුතා, බෙල්ලේ නහරගත උවදුර සහිතයි.

### මීන ලග්නය - අනිසි චෝදනා

මීන ලග්නයට අනුව අද ඔබට ධන සම්පත් හිමි වුවද සොර සතුරු බලපෑමක් නිසා පාඩු විඳින්නට සිදුවේ. සැළකිලිමත් වුවහොත් එය මඟහරවා ගත හැක. තමා සමඟ එකට වැඩ කරන අයකුගේ වංචනික ක්‍රියාවක් නිසා ඔබට වගකීමට සිදුවේ. ඒ අනුව සිතේ කනස්සල්ල, සිතේ කනගාටුව උත්සන්න වනු ඇත. තම දිවිගමනේ ශක්තියට සිටි අයකු තමා වෙතින් ඈත් වනු ඇත.

# චිරං ජයතු අස්ගිරි මහ නාහිමි!

*ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහානායක වරකාගොඩ ශ්‍රී ඤාණරතනාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ 79 වැනි ජනම දිනය අදට (18) යෙදී ඇත. මේ ලිපිය ඒ නිමිත්තෙනි.*



කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස සියම් දේශයෙන් මෙරටට උපසම්පදාව රැගෙන විත් ලක්දිව යළි උපසම්පදාව පිහිටුවා මේ වන විට වසර 268ක් ගතව තිබේ. වර්ෂ 1753 වසරේදී ලක්දිව උපසම්පදාව පිහිටුවීමෙන් පසු මල්වතු අස්ගිරි උභය මහ විහාර නියෝජනය කරමින් මහනායක ස්වාමින්ද්‍රයන් වහන්සේ දෙනමක් පත්වනු ලැබුවේ 1765 වසරේදීය. උරුලෑවත්තේ ශ්‍රී පියදර්ශී ධම්මසිද්ධි මහනායක ස්වාමින්ද්‍රයන් වහන්සේගෙන් ආරම්භ වූ අස්ගිරි මහ විහාර පාර්ශ්වයේ මහනායක පරපුරේ වත්මන් මහනායක ස්වාමින්ද්‍රයන් වහන්සේ වරකාගොඩ ශ්‍රී ඤාණරතනාභිධාන මහනායක හිමියන්ය. උන්වහන්සේ එම පාර්ශ්වයේ 22 වැනි මහනායක ස්වාමින්ද්‍රයන් වහන්සේය.

පිරිවෙන් ශිෂ්‍ය අවධියේ සිට ම සුපේශල, ශික්ෂාකාමී යතිවරයාණන් වහන්සේ නමක් වූ ඤාණරතන මහනාහිමියෝ ගිහි පැවිදි උභය සමාජයේ ම ගෞරවයට පාත්‍ර වෙමින් මහනායක පදවිය බබළවන්නට ගත වූ පස් වසරේදී කටයුතු කළහ. හාරිස්පත්තුව වරකාගොඩ දූල්දෙණිය රාජකරුණා නවරත්න අතපත්තු වාසල මුදියන්සේලාගේ මුදියන්සේ සහ හිඟුල්වල අලකොළදෙණියේ දුග්ගන්නා රාළලාගේ පිංචි අම්මා දම්පතීන්ගේ තෙවන දරුවා ලෙස උන්වහන්සේ උපත ලැබුවේ 1942 මාර්තු 18 වන දාය.

උඩපිටියේ ශ්‍රී සුමංගල ,මැදගොඩ පඤ්ඤානන්ද , අළුදෙණියේ රතනපාල සහ රඹුක්වැල්ලේ සද්ධානන්ද යන නාහිමිවරුන්ගේ ආචාර්යත්වයෙන් එවකට අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහානායක ධුරන්දර ව වැඩ විසූ යටවත්තේ ධම්මරතන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් අස්ගිරි මහා විහාරීය මංගල උපෝෂිථාගාරයේදී 1955 අප්‍රේල් 07 වන දා පැවිදි බිමට එළැඹි වරකාගොඩ ඤාණරතන හිමි ශාසනික වත් පිළිවෙත් මැනවින් හදාරමින් අස්ගිරි මහා විහාරයීය මංගල උපෝසිථාගාරයේදී උපසම්පදාව ලැබුවේ 1962 ජූනි 09 වැනි දාය.

වත්තේගම ශ්‍රී ධර්මදීප පිරිවෙනින් මූලික පිරිවෙන් අධ්‍යාපනය ලැබූ උන්වහන්සේ අස්ගිරි මහා විහාර පිරිවෙනින් සහ පේරාදෙණිය ශ්‍රී සාරානන්ද පිරිවෙනින් වැඩිදුර අධ්‍යාපනය ලැබූහ.1970 දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලබාගත් වරකාගොඩ ඤාණරතන ස්වාමීන්ද්‍රයන් ගුරු වෘත්තියට ප්‍රවිශ්ඨ වූයේ බදුපොළ විද්‍යාලයෙනි. මහනුවර විද්‍යාර්ථ විද්‍යාලය,කොත්මලේ මඩකුඹුර විද්‍යාලය, පාතදුම්බර මහා විද්‍යාලය, පොල්ගොල්ල මහා විද්‍යාලය යන විදුහල් වල ධර්මාචාර්යයන් වහන්සේ නමක් ලෙස වසර විසිපහක පමණ කාලයක් සේවය කරමින් පාසල් දරුවන්ගේ නැණ ගුණ නුවණ දියුණු කිරීමට උන්වහන්සේ උදාර මෙහෙවරක නිරත වූහ.

ප්‍රාචීන භාෂා අධ්‍යාපනය පිළිබඳ වියත් පඬිරුවනක් වූ වරකාගොඩ ශ්‍රී ඤාණරතන මහනාහිමියෝ පිරිවෙන් ශිෂ්‍ය අවධියේ සිට ම සුපේෂල,ශික්ෂාකාමී සංඝ ගුණයෙන් පෝෂිත යතිවරයාණන් වහන්සේ නමක් ලෙස ගිහි පැවිදි උභය සමාජයේ ම ගෞරවයට පාත්‍රව සිටියහ.ස්වකීය ගුරු දේවයන් වහන්සේලාට මහත්වූ ගෞරවයෙන් කටයුතු කළ උන්වහන්සේගේ ජීවන චරිතය සංඝ සමාජයට මහත්වූ ආදර්ශ සපයන්නකි. ශ්‍රී දළදා වහන්සේ වෙනුවෙන් දෛනිකව පවත්වනු ලබන තේවා කටයුතුවලට සම්බන්ධ වීමේ භාග්‍ය උන්වහන්සේට මුල්වරට හිමිවූයේ 1976 වසරේදීය.

ශාසනික වත් පිළිවෙත් නියමානුකූලව ඉටු කරමින් සංඝ ගුණයෙන් පෝෂිතව ගෙනයන ශාසනික ජීවිතය අගයමින් අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහානායක පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද මහා නායක ස්වාමින්ද්‍රයන් වහන්සේ විසින් වරකාගොඩ ඤාණරතන නාහිමියන් 1990 අස්ගිරි මහා විහාර කාරක මහා සංඝ සභාවට පත් කරනු ලැබූහ.උඩුගම ශ්‍රී ධම්මදස්සී රතනපාල බුද්ධරක්ඛිත මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් 2004 වසරේදී ජ්‍යෙෂ්ඨ කාරක සංඝ සභික තනතුර වරකාගොඩ ඤාණරතන නාහිමියන්ට පිරිනැමූ අතර 2009 වසරේදී කාරක මහා සංඝ සභාවේ උපාධ්‍යාය ධුරයට උන්වහන්සේ පත්වූයේද මහනාහිමියන්ගේ ආශිර්වාදයෙනි. ඓතිහාසික බදුලු මුතියංගණ රජමහා විහාරාධිපති ධුරයට පත් වූ උන්වහන්සේ අස්ගිරිය විජය සුන්දරාරාමයේ සහ පොල්ගොල්ල උඩගුන්නෑපාන බෝධිමල්කඩ විහාරාධිපති ධුරයට පත්ව එම විහාරස්ථානය සංවර්ධනය කළහ.

අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ අනුනායක ධුරයට 2015 අප්‍රේල් 07 වන දා පත්වූ උන්වහන්සේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහානායක ධුරය හෙබවූ අතිපූජ්‍ය ගලගම ශ්‍රී අත්ථදස්සී මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අපවත්වීමෙන් පසු එම පාර්ශ්වයේ මහානායක ධුරයට පත් වූහ. මා හිමිපාණන් වහන්සේගේ ජාතික, ආගමික, ශාසනික හා සාමාජීය මෙහෙවර මතුපරපුර වෙතද සිදුකර ගෙන යෑම සඳහා උන්වහන්සේ උගත් ගුණවත් ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා කිහිප නමක් සසුනට දායාද කළහ.ඒ අතර බදුලු මුතියංගන රාජ මහා විහාරයේ භාරකාර ආචාර්ය මුරුද්දෙණියේ ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛය.

මෙරට ජාතික,ආගමික හා ශාසනික ගැටලු වලදී සෘජුව මෙන්ම මධ්‍යස්ථාව අදහස් දක්වමින් උන්වහන්සේ ඉටු කරනු ලබන මෙහෙවර සුවිශාලය. මහනායක ධුරයෙන් බැබළෙනු වෙනුවට ක්‍රියාවෙන් මහනායක ධුරය බබළවන්නට ගතවූ පස්වසරේදී උන්වහන්සේ කටයුතු කළේ දෙස් විදෙස් බෞද්ධ අබෞද්ධ සැමගේ ගෞරවාදරයට පාත්‍ර වෙමිනි. තවත් චිරාත් කාලයක් ලෝසත වෙත කායික මෙන්ම මානසික ශක්තියෙන්ද යුක්තව සෙත සලසන්නට උන්වහන්සේට ශක්තිය හා ධෛර්යය ලැබේවායි අපි ආසිරි පතමු.

අස්ගිරි මහානායක ස්වාමින්ද්‍රයන් වහන්සේගේ ලේකම්-
**සුනෙල් රඹුක්පොත**

# අසූවියට පා තබන අස්ගිරි මහ නාහිමි

මේ ලිපිය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඥාණරතනාභිධාන, මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ මහා නායක ස්වාමීන් වහන්සේගේ ජන්ම දිනය වෙනුවෙනි.

අදින් වර්ෂ හැත්තෑ නවයකට පෙර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශිකයේ වරකගොඩ ග්‍රාමයේ දූල්දෙණියේදී පුත් කුමරුකු උපත ලැබීය. කුඩා කල සිට පැවති සංවරශීලී ගති පැවතුම් හා ආගම දහමට ඇති ලැදියාව මුල් කරගෙන උපතින් වර්ෂ 13කට පසු එනම් 1955 වර්ෂයේ අප්‍රේල් මස 7 වෙනි දින අස්ගිරි මහා විහාරීය මංගල උපෝෂථාගාරයේදී වරකාගොඩ ඥානරතන නමින් උතුම් පැවිදි දිවියට ඇතුළු වූ සේක. ඉන් සත්වසකට පසුව 1962 වර්ෂයේ ජුනි මස 9 වැනි දින අස්ගිරි මංගල උපෝෂථාගාරයේදී අධිශීල සංඛ්‍යාත උපසම්පදා ශීලයෙහි පිහිටවනු ලැබූ සේක.

අප මහ නාහිමියෝ ධර්ම ශාස්ත්‍ර අධ්‍යාපනයෙන් පෝෂිත, විනීත, සුපේශල ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේ නමකි. සිංහල පාලි සහ සංස්කෘත භාෂාවන් පිළිබඳ පුළුල් දැනුමක් ඇති උන් වහන්සේ පුරා වර්ෂ 25කට අධික කාලයක් පුරාවට දැයේ දුවා දරුවන්ගේ නුවණැස පාදවමින් ගුරු වෘත්තියේ නියැලුණු සංඝ පීතෘ නමකි. එපමණක් නොව බෞද්ධයන්ගේ මුදුන් මල්කඩවන් ශ්‍රී දළදා මාලිගාවේ තේවා කටයුතු සඳහා 1976 වර්ෂයේ සිට සහභාගී වන උන් වහන්සේ 1990 වර්ෂයේදී විංසත්වාර්ගික කාරක සංඝ සභාවේද, 2006 වර්ෂයේ කාරක සංඝ සභාවේ උපාධ්‍යාය පදවියටද, 2009 වර්ෂයේදී විංසත්වාර්ගික කාරක සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝසභික තනතුරටද පත් වූ සේක.

වර්ෂ 2015 මැයි මස 25 වන දින අස්ගිරි මහ විහාර පාර්ශවයේ අනුනායක පදවියට පත්වන අප ඥානරතන හිමියන් බදුලු මුතියංගණ ඇතුළු රජමහා විහාරස්ථාන කිහිපයකම විහාරාධිපති ධුරය හොබවමින් බුද්ධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් උගත් බුද්ධිමත් සංඝ පරපුරක් බිහි කිරීමේ ද දක්ෂ සිසු දරු දැරියන් පිරිසක් මව්බිමේ උන්නතිය උදෙසා ද බිහිකිරීමේද පුරෝගාමියකු වූ සේක. එදා උපසම්පන්න භික්ෂූන් වහන්සේලා නොමැතිව ලක්දිව සඟ සසුන පරිහානියට පත්වෙමින් තිබූ යුගයක කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ පූර්ණ අනුග්‍රහයෙන් වැලිවිට ශ්‍රී අසරණ සරණ සරණංකර සංඝරාජ හිමියන්ගේ මූලිකත්වයෙන් සියම් දේශයෙන් ලක්දිවට උපසම්පදා විනය කර්මය ගෙනඑමත් සමඟ බිහි වූ සියම් මහ නිකායේ අස්ගිරි පාර්ශ්වය නියෝජනය කරමින් වර්ෂ 263ක් පුරාවට සංඝ පීතෘ වහන්සේලා 22 දෙනෙක් නිකැලැල්ව රැගෙන ආ සියම් මහ නිකායේ අස්ගිරි පාර්ශවයේ ශ්‍රී විභූතිය ඉදිරියට රැගෙන යාම වස් වගකීම් දරමින් ද ශාසනික හා සමාජය වෙනුවෙන් වූ තම යුතුකම් කොටස මැනවින් ඉටු කරමින්, රට කරවන පාලකයන්ට අර්ථයෙන්, ධර්මයෙන් අනුශාසනා කරමින් ද වැඩවසන ගෞරවණීය සංඝයාවහන්සේ නමකි.

මා මධ්‍යම පළාතේ ආණ්ඩුකාර ධූරය හොබවන සමයේ මෙන්ම අදටත් මා සමඟ ඉතා සමීප ඇසුරක් පවත්වන උන්වහන්සේ සෑම විටම ලබා දෙන අනුශාසනා සහ උපදෙස් ඉතා වටිනා මෙන්ම කාලෝචිත වේ. අද දින (මාර්තු 18) තම 79 වැනි ජන්ම දිනය සමරන අතිපූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඥානරතනාභිධාන මහා නාහිමියන් වහන්සේට චිරාත් කාලයක් වැජඹෙමින් අප ධර්මදීපය තුළ තව තවත් ශාසනික මෙන්ම සමාජ මෙහෙවර කිරීමට අවශ්‍ය නිදුක් නිරෝගී ශක්තිය ලැබේවායි සුභාශිංසනය කරමි.

**ටිකිරි කොබ්බෑකඩුව**
ආණ්ඩුකාරවර
සබරගමු පළාත

# වයසට නොයන අගනුවර තරුණ කවි සමාජය

*අගනුවර තරුණ කවි සමාජයේ 86 වැනි සම්මේලනය ලෝක කවි දිනයට සමගාමීව මෙම 21වැනි ඉරුදින වැල්ලවත්ත පුද්ගලික හෝටල් ශ්‍රවනාගාරයකදී පැවැත්වේ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.*

1985 අංක 35 දරන පාර්ලිමේන්තු පනතින් පුන්‍යායතයක් ලෙස ආවරණය ලත් ශ්‍රී ලංකාවේ ඇතිඑකම කාව්‍ය සංසදය අගනුවර තරුණ කවි සමාජයයි. වර්තමානයේ කොළඹ විහාර මහාදේවී උද්‍යානය නමින් ප්‍රකට එදාවික්ටෝරියා පාර්ක් නමින් හැඳින්වූ ස්ථානයේ වූ රමණීයචමත්කාර ජනක සුන්දර පරිසරයෙහි වූ තුරු සෙවනක සිය උපන් පියස කොට වර්ෂ 1935 අප්‍රේල් මස 18 වැනි දින එතැනට එක් වූ පී.බී. අල්විස් පෙරේරා, විල්සන් හැගොඩ, ආර් එන් ද අල්විස්, පීටර් පෙරේරා අඇතුළු කවීන් කිහිප දෙනෙක් "කොළඹ කවි සමාජය " යන නමින් පිහිටුවාගත් කාව්‍ය එකමුතුව පසු කලෙක "අගනුවර තරුණ කවි සමාජය" හෙවත් ( අ.ත ක.ස) බවට පත්වීය. අතීතයේදි කොළඹ කවියේ හා කොළඹ කවීන්ගේ පාරාදීසයක්ව පැවති අගනුවර තරුණ කවි සමාජයට එල්ල වූ ප්‍රබලම අභියෝගය වූ කොළඹ බොහෝකවියෝ සමනල ලෝකවල ගස්, ගල්, විල්, මල් උයන්, ගංගා, මිටියාවත්වල අතරමංව පරිසරාත්මක සුන්දර කවි ලියු මුහුකුරා නොගිය පිරිසක්‍ය යන මතයයි. නමුත් මේ වනවිට ඒ දුර්මතය අභිබවමින් කාව්‍ය ලක්ෂණයන්ගෙන් පෝෂිතව ලයට විරිතට අනුව "යවහන්" දෝෂවලින් ස්වායත්තව එළිවැට, එළිසමය රකිමින් සදැස්කවියේ රුව ගුණ සුරකිමින් කවි ලියන ප්‍රශස්ථ ප්‍රබුද්ධ පිරිසක් අදවනවිට ස්ථාවරව ජනගතව සිටීමම 86 වැනි වසර සම්පූර්ණ වනවිට සැමටම සැනසුම් සුසුමක් හෙළීමට බිහිදොරක් වීමම, අපගේ නිහතමානී සන්තුෂ්ටියට සජීවී සාධකයකි. ගෙවුණු කාලපරාසය තුළ ඒ ඒ යුගවලදී එකල්හී ජ්‍යෙෂ්ඨතම හා ප්‍රවීණතම කිවිවරු පහළොස් දෙනෙකු අතකසයේ සභාපති අසුනේ අසුන් ගත්හ. පී.බී අල්විස් පෙරේරා , විමලරත්නකුමාරගම, සාගර පළන්සූරිය, බඹරකොටුවේ සුධර්ම සෙනෙවිරත්න, යූ.ඒ.එස්. පෙරේරා (සිරි අයියා), එච්.එම්. කුඩලිගම, විමලේන්ද්‍ර වතුරේගම, සූරසේන ආටිගල , උපනන්ද බටුගෙදර , විමලසිරි පෙරේරා , බිංගිරියේ විජය කුමාර, චිත්‍රනන්ද අබේසේකර , වල්ගම සෝමතිලකසේසිරි විජේසේකර , හා ගාල්ලේ බර්ලින් ඒ කවීහු වෙති. එතැන් සිට මේ දක්වා අඛණ්ඩව වසර ගණනාවක්ම එම පදවිය දරනුයේ ප්‍රනීත් පෙරේරා මහතායි.

ලන්ඩන් ශාඛාවේ සබාපති ධූරයද දරන අනුර හැගොඩයන් ලන්ඩන් නුවර සිටඅන්තර් ජාලය ඔස්සේ ලන්ඩන් කවි සඟරාව එළි දක්වයි. ලන්ඩන් කවි සඟරාව ලන්ඩනයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ද ජාතික පුවත්පත්වල ඇගයීමට බඳුන්වීම අගය කළ යුතුය.

අගනුවර තරුණ කවි සමාජයේ කවීහු එදා පෙනී සිටියේත්, අද පෙනි සිටින්නේත් හරවත්, අර්ථවත් , රසවත් ප්‍රාගුණ්‍යයෙන් පිරි නවීකරණ යෙන් බලවත් වන සම්ප්‍රදායයන් තුළ මිස අයාලේ යන කවිය තුළ නොවන බව නම් අවධාරණය කළ යුතුමය. මෙය මනාසේ වටහා ගත් එහි වත්මන් නියමුවෝ පාසල් මට්ටමින් ළමා සිත් තුළ සිංහල කවිය ස්ථාවරව ප්‍රතිශ්ඨාපනය කිරීමටත් , යොයොවුන් පරපුර නූතන කවියේ නව,මං සොයා ගමන් කරවීමටත් ආරම්භ කොට ඇති වැඩසටහන් කිහිපයක්ම වේ. ඉදිරි වසරේදී නව නිල මඩුල්ලක් යටතේ එළෙඹෙන අභියෝගවලටප්‍රබලව මුහුණ දෙමින් සියලුම කවි සංවිධාන හා සමඟ සුසංයෝගීව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමු.

ගෙවුණු වසර තුළ අතකසයේ නියමුවෝ කිහිප දෙනෙක්ම අපඅතරින් සමුගෙන සදහටම වෙන්වූවෝය. ඒ අය අතරිනුත් කවියට මිල කළ නොහැකි සේවයක් දිවි හිමියෙන්ඉටු කළ කවියට සක්විති රජේක්වන් ව සිට, අකාලේ වියෝවූ ජී.එම්. අජිත් කිවිසුරුද සෙනෙහසින් සිහිපත් කරමි.

අගනුවර තරුණ කවි සමාජයේ 86 වැනි සංවත්සරය දෙස් විදෙස් දෙකෙහිම විහිදිසිටින සියලුම, කවි කිවිදියෝ එක්සත්ව එක්සිත්ව කවියේ පුනරාවගමනයට අත්වැල් බැඳගැනීමට මේ සුදුසුම කාලයයි. දීපයයි,

මෙම උලෙළේ විශේෂත්වයක් වනුයේ සුපුරුදු පරිදි තෝරාගත් විද්වතුන් කිහිපදෙනකුට අතකස උපහාර සම්මාන පිරිනැමීමයයි.

කලාභූෂණ කිවිපති
කවිධජ සාසනකීර්ති
දෙශාභිමානි
**ඩබ්ලිව්. කේ. සරත් විමලසිරි**
මාධ්‍ය ලේකම් [අ.ත ක ස.]

**හරස් වීදිය**

3වැනි 4වැනි හරස් වීදිය

| | කිලෝ එකක තොග මිල- රු. |
|---|---|
| සුදු සීනි | 1kg-103 |
| රතු සීනි | 1kg-118 |
| මයිසූර් පරිප්පු ලොකු | 1kg- 180 |
| මයිසූර් පරිප්පු මධ්‍යම | 1kg 160 |
| අර්තාපල් දේශීය | 1kg -130 |
| ඉන්දියානු | 1kg-80 |
| පාකිස්ථාන් | 1kg- 90 |
| බොම්බයි ලූනු ඉන්දියානු | 1kg-85 |
| බංගලිදේශීය | 1kg-75 |

# ‘ග්ලැක්සි’ කුසලාන වොලිබෝල් තරගාවලිය
# කණ්ඩායම් 18ක් තරග බිමේ

**ගාල්ල උතුර සමූහ
දික්වැල්ලේ තිලකරත්න**

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය අවුරුදු 25ක ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පළමු වරට සංවිධාන කරන ‘ග්ලැක්සි’ කුසලාන වොලිබෝල් ශූරතාවලිය පෙරේදා (16) ගාල්ල දඩල්ල වොලිබෝල් හවුස් ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී ආරම්භ විය.

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති නියෝජ්‍ය කථානායක රංජිත් සියඹලාපිටිය මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූ තරගාවලියේ මූලික වටයේ තරග 22 වැනිදා නිමාවට පත් වේ. අනතුරුව මේ මස 26 සහ 27 දෙදින අර්ධ අවසන් තරග සමඟින් ලබන මස 10 වැනිදා අවසන් මහා තරගය පැවැත්වෙන්නේ මහරගම ජාතික තරුණ සේවා සභා ක්‍රීඩාංගණයේදීය. මේ තරගාවලියට පිරිමි කණ්ඩායම් 8ක් සහ කාන්තා කණ්ඩායම් 10ක් එක්ව සිටී.

බෝෂැන්ග් ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් පෞද්ගලික ආයතනයේ පූර්ණ අනුග්‍රහයෙන් පැවැත්වෙන තරගාවලියේ ශූරයන්ට මුදලින් රුපියල් ලක්ෂ දහයක් ද අනුශූරයන්ට රුපියල් ලක්ෂ පහක් ද ප්‍රදානය කිරීමට සංවිධායකයන් කටයුතු යොදා තිබේ.

මේ තරගාවලියට ශ්‍රී ලංකා යුද හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ ජාතික තරුණ සේවා සභාව නියෝජනය කරමින්





ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති නියෝජ්‍ය කථානායක රංජිත් සියඹලාපිටිය මහතා ආරම්භක අවස්ථාවට එක් වෙමින්...

පිරිමි හා කන්තා කණ්ඩායම් එක්වන අතර, නාත්තන්ඩිය යුනයිටඩ්, ලංකා විදුලිබල මණ්ඩලය, ජෝශප් වාස් ක්‍රීඩා සමාජය සහ කළුතර ගොල්ඩන් ටයිගර්ස් ක්‍රීඩා සමාජය ද පිරිමි අංශයේ තරගාවලියට එක්ව සිටිති.

හයිඩ්‍රාමනි, මහඋස්වැව, මාෂ් කැෂුවල්ලයින්, ගෝල්ඩන් බර්ඩ්ස්, හුංගම විජයබා සහ අම්පාර තිස්සපුර ක්‍රීඩා සමාජ තරග වදින්නේ කාන්තා අංශයෙනි.

තරගාවලිය ආරම්භ කරමින් පැවැති කාන්තා අංශයේ පළමු තරගයෙන් යුද හමුදාව පරදවා වට 3-1ක ජයක් අත් කර ගැනීමට මාෂ් කැෂුවලයින් පිල සමත් විය. දෙවැනි තරගයෙන් අම්පාර තිස්සපුර පිල වට 3-0කින් පරාජය කිරීමට හයිඩ්‍රාමනී ක්‍රීඩිකාවන් සමත් වෙද්දී තෙවැනි තරගයේ ජය හුංගම විජයබා පිල සතු විය. එම කණ්ඩායම හමුවේ මහඋස්වැව රතනපාල ක්‍රීඩිකාවෝ වට 3-0කින් පරාජයට පත් වූහ. තියුණු මුහුණුවරක් ගත් සිව්වැනි තරගයෙන් ජාතික තරුණ සේවා සභාවට එරෙහිව වට 3-0ක ජයක් ගුවන් හමුදාවට හිමි විය.



# මාතලේටත් පාපැදි සවාරියක්

**නාඋල සමූහ**

මාතලේ දිස්ත්‍රික් පාපැදි සංගමය ප්‍රථම වරට සංවිධාන කරන පාපැදි සවාරිය අප්‍රේල් 25 වැනිදා පැවැත්වෙයි. එදින පෙරවරු 8.00ට මාතලේ එඩ්වර්ඩ් පාක් ක්‍රීඩාංගණය අසලින් එය ආරම්භ වීමට නියමිතය. මේ පාපැදි සවාරිය මාතලේ සිට දඹුල්ල නගරය දක්වා ගොස් නැවත මාතලේ නගරයට පැමිණීමට නියමිත බව සංවිධායකයෝ පවසති. කුසලතා පිරි මධ්‍යම පළාතේ පාපැදි තරගකරුවන් දිරිමත් කිරීමේ අරමුණින් මේ තරගය සංවිධාන කර තිබේ.

පාපැදි සවාරියට අයැදුම්පත් යොමු කිරීමේ කාල සීමාව මේ මස 31 වැනිදා අවසන් වන අතර, අයැදුම්පත් එම සංගමයේ නිලධාරීන් වන සාගර රණසිංහ (071-8322534/076-9614666) හෝ රවි හේරත් (071-9114303/ 076-9884303) මගින් ගත හැකි බව සංවිධායක මණ්ඩලය දැනුම් දෙයි.

SINCE 1978 43rd OBSERVER SLT-MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2021
Recognizing talent, inspiring greatness.
SLTMOBITEL The Connection

# ඔබ්සර්වර්-එස්එල්ටී මොබිටෙල් වසරේ ක්‍රිකට් ක්‍රීඩකයා සම්මාන උලෙළ අප්‍රේල් 20

කොරෝනා වසංගතය හේතුවෙන් කල් දැමූ 42 වැනි ඔබ්සර්වර් - එස්එල්ටී මොබිටෙල් වසරේ ක්‍රිකට් ක්‍රීඩකයාට සම්මාන පිරිනැමීමේ උලෙළ ලබන මස 20 වැනිදා පැවැත්වේ.

සෞඛ්‍ය බලධාරීන්ගෙන් මේ උලෙළ පැවැත්වීම සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබී ඇති අතර සංවිධායකයන් වන ලේක්හවුස් ආයතනයේ සන්ඩේ ඔබ්සර්වර් සහ අනුග්‍රාහකයන් වන ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් අතර මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් ද පසුගියදා පැවැත්විණි.

මේ අතර, 2020/21 අන්තර් පාසල් වාරයේ ප්‍රධාන තරග කොරෝනා වසංගතය නිසා එක්දින තරග මුහුණුවර යටතේ පැවැත්වීමට ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය කටයුතු කළේය. ඒ අනුව එම තරග පසුගියදා 16 වැනිදා ආරම්භ වූ අතර, ඊට සමගාමීව 43 වැනි ඔබ්සර්වර්-මොබිටෙල් ජනප්‍රිය පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා සඳහා වන තරගය ද ආරම්භ වනු ඇත.

2021 සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමේ කූපන් පත් ලේක්හවුස් ජාතික පුවත්පත් වන සන්ඩේ ඔබ්සර්වර්, ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් යන පුවත්පත්වල ළඟදීම ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

මේ සඳහා අඛණ්ඩව 14 වැනි වරටත් එස්එල්ටී මොබිටෙල් අනුග්‍රහ දක්වයි.

අන්තර් පාසල් තරගාවලියේ පළමු කොටස සහ දෙවැනි කොටස යටතේ එක් කොටසකට ‘ඒ’ සහ ‘බී’ ලෙස කාණ්ඩ දෙකක් අනුව තරග පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර, පළමු කොටසට කණ්ඩායම් 36 ක් ඇතුළත් වේ. එම කණ්ඩායම් ‘ඒ’ සහ ‘බී’ කාණ්ඩ යටතේ කණ්ඩායම් 18 ක් බැගින් ඇතුළත් කර තිබේ. එම කාණ්ඩ ද කණ්ඩායම් 6 බැගින් කොටස් තුනකට බෙදා තිබේ. දෙවැනි කොටසේ තරගාවලියට කණ්ඩායම් 35ක් ‘ඒ’ කාණ්ඩයට කණ්ඩායම් 18ක් සහ ‘බී’ කාණ්ඩයට කණ්ඩායම් 17ක් වශයෙන් ඇතුළත් කර තිබේ. එම කාණ්ඩගත කිරීම් සිදුකර ඇත්තේ පසුගිය වසරේ ලීග් තරගාවලියේ දී එක් එක් කණ්ඩායම් දැක්වූ දක්ෂතා සැලකිල්ලට ගනිමිනි.

එක්දින තරගාවලියේ අර්ධ අවසන් පූර්ව වටයේ තරග, අවසන් පූර්ව වටයේ තරග සහ අවසන් මහා තරගය අප්‍රේල් මස 20, 25 සහ 30 දිනවල පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

# වැලිගම අර්ෆා ජාතික පාසලට දිවා රාත්‍රී ක්‍රීඩාංගණයක්

**දෙයියන්දර සමූහ
තමරසිරි විජේසේකර**

වැලිගම අර්ෆා ජාතික පාසලේ ඉදි කළ දිවා රාත්‍රී ක්‍රීඩාංගණය විවෘත කිරීම පසුගියදා කථානායක මහින්ද යාපා අබේවර්ධන සහ විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

තරුණ පරපුර මත් උවදුරෙන් බේරා ගැනීම මෙලෙස දිවා රාත්‍රී ක්‍රීඩාංගණ ඉදිකිරීමේ ප්‍රධාන අරමුණක් බව එහිදී අදහස් දැක්වූ ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා කියා සිටියේය.

එම උවදුරට ගොදුරු වූවන්ට ඉන් මිදීමට විකල්ප අවස්ථා දිය යුතු බවත්, මෙලෙස රාත්‍රී ක්‍රීඩාංගණ ඉදි කිරීමෙන් අඳුරත් සමඟ මත් ද්‍රව්‍ය සොයා ඇදෙන තරුණ පිරිස් ඉන් බැහැරව ක්‍රීඩා කිරීමට ක්‍රීඩාංගණවලට පිවිසෙන බවත් පැවසූ ඇමැතිවරයා පාසල් දරු පරපුර අනාගතයේදී නිරෝගී පරපුරක් බවට පත්කිරීමටත් මේ ක්‍රීඩාංගන ඉදිකිරීමේ ව්‍යාපෘතිය මහත් රුකුලක් වනු ඇතැයි කියා සිටියේය.



විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා ක්‍රීඩාංගණය විවෘත කිරීමෙන් අනතුරුව ක්‍රීඩා උපකරණ පරිත්‍යාග කරමින්. කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා ද මෙහි සිටී. ඡායාරූපය - දෙයියන්දර සමූහ


“මේ රටේ ක්‍රීඩාව සම්බන්ධයෙන් පැවතුනේ ඇල්මැරුණ ස්වභාවයක්. ජනාධිපතිතුමා එතුමාගේ සෞභාග්‍යයේ දැක්ම තුළ ඉදිරිපත් කළ ක්‍රීඩා ආර්ථිකය තුළින් මේ ඇල් මැරුණ තත්ත්වය වෙනස් කිරීමට හැකි වුණා. එදා අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් මාගේ අදහස වූයේ මාතරට ප්‍රධාන ක්‍රීඩාංගණ 5ක් ඉදිකිරීමටයි. ඒත් කංචන විජේසේකර මන්ත්‍රීතුමා යෝජනා කළා, එක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයකට දිවා රාත්‍රී ක්‍රීඩාංගණ 2ක් වගේ ඉදිකිරීම සුදුසුයි කියලා. ඒ යෝජනාවේ අස්වැන්න තමයි අද අප භුක්ති විඳින්නේ. අද මේ දිස්ත්‍රික්කය පුරා දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගණ 34ක් ඉදි වෙලා තිබෙනවා. දිස්ත්‍රික්කයක් වශයෙන් මෙය සුවිශාල ජයග්‍රහණයක් මෙන්ම අපේ ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් ක්‍රීඩාවේ අනාගතය වෙනුවෙන් මෙය ප්‍රගතිශීලි පියවරක්. ඒ වගේම වර්ථමාන ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතාත් අපට ආඩම්බරයක්. එතුමා මේ රටේ ක්‍රීඩා අමාත්‍යවරුන් අතර ක්‍රීඩාව ප්‍රායෝගිකව අතට ගත්තා. ඒ වගේම ක්‍රීඩාව ඇගේ තිබෙන, ජාතික තලයේ ක්‍රීඩකයෙක්. එතුමා පාසල් පද්ධතියෙන් ආරම්භ කර, මේ වන විට සමස්ත රටම ආවරණය වන පරිද්දෙන් සුවිශේෂී සැලස්මක් යටතේ ක්‍රීඩාව දියුණු කරන්න කටයුතු යොදමින් සිටිනවා.” යැයි ද ඇමැතිවරයා පැවසීය.

# 19න් පහළ පාසල් ක්‍රිකට්
# පළමු ශතකය අහන්ගෙන්

**නිරෝෂාන් ප්‍රියංකර**

අන්තර් පාසල් අවුරුදු 19න් පහළ පළමු පෙළ එක්දින ක්‍රිකට් තරගාවලියේ පළමු ශතකය වාර්තා කිරීමට කොළඹ රාජකීය විද්‍යාල කණ්ඩායමේ නායක අහන් වික්‍රමසිංහ සමත් විය.

මහනුවර ත්‍රිත්ව විදුහල සමඟ රාජකීය විදුහල් පිටියේදී අහන් වාර්තා කළ මේ ශතකය හේතුවෙන් ලකුණු 83ක ජයක් අත් කර ගැනීමට රාජකීය පිලට හැකි විය. තරගයේ පළමුව පන්දුවට පහර දුන් රාජකීයයෝ රැස් කළ ලකුණු 239ට පිළිතුරු ලෙස ත්‍රිත්ව විදුහලට සියල්ලන් දැවී රැස් කළ හැකි වූයේ ලකුණු 156ක් පමණි.



රාජකීය - ත්‍රිත්ව තරගයෙන්
ඡායාරූපය - හිරන්ත ගුණතිලක

විශිෂ්ට ඉනිමක් දියත් කළ අහන් පන්දු 119කට මුහුණ දෙමින් ලකුණු 118ක් රැස් කළේ හතරේ පහර 9ක් සහ හයේ පහර 2ක් සමඟිනි.

**රාජකීය - 239 (ඕවර 49.3)** අහන් වික්‍රමසිංහ 118, සදිෂ් රාජපක්ෂ 46 (රනුද සෝමරත්න 22/3)

**ත්‍රිත්ව - 156 (ඕවර 45.2)** රනුද සෝමරත්න 50 (කවිඳු පතිරණ 31/3)

**සා. සෙබස්තියන් පිලට ජය**

මාතර උයන්වත්ත ක්‍රීඩාංගණයේ පැවැති තරගයෙන් මාතර සාන්ත තෝමස් පිල ලකුණු 36කින් පරාජය කිරීමට මොරටුව සාන්ත සෙබස්තියන් විදුහල සමත් විය.

**සා. සෙබස්තියන් - 180/9 (ඕවර 50)** සුකිත ප්‍රසන්න 60 (හිරන්ත ලක්ෂාන් 32/3, සචිත්‍ර රශ්මික 44/3)

**සා. තෝමස් - 144 (ඕවර 44.4)** නිපුන් සමරසිංහ 59 (ක්‍රිෂෙන් පෙරේරා 25/3)

**රිච්මන්ඩ් විදුහලට ජය**

ගල්කිස්ස සාන්ත තෝමස් විදුහල කඩුලු 4කින් පරාජය කිරීමට ගාල්ල රිච්මන්ඩ් විදුහල සමත් වූයේ තෝමස් පිටියේදීය.

**ගල්කිස්ස සා. තෝමස් - 163 (ඕවර 42.1)** රයන් ප්‍රනාන්දු 77, අනුක් පලිහවඩන 40 (හංසමාන ද සිල්වා 12/4)

**රිච්මන්ඩ් - 166/6 (ඕවර 45)** චමත් වික්‍රමසිංහ 74 (නදන් කල්දේරා 26/4)

**ආනන්දයට ජය**

කොළඹ සහිරා විදුහලට එරෙහිව කොළඹ ආනන්ද විදුහල කඩුලු 6ක ජයක් හිමිකර ගත්තේ ආනන්ද පිටියේදීය.

**සහිරා - 151/9 (ඕවර 50)** අදිල් ඉස්මාර්ලි නොදැවී 39 (ඉසුරු අයේෂ් 26/3)

**ආනන්ද - 152/4 (ඕවර 31.5)** හංසජ ජයසිංහ නොදැවී 61

# ‘ටැලන්ට් හන්ට්’ පුත්තලමේ

**ප්‍රසාද් පූර්ණමාල් - පුත්තලම දිසා සමූහ
සහ මුන්නේශ්වරම සමූහ**

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව එක්ව ශ්‍රී ලාංකේය තාරුණ්‍යයේ සැඟවුණ ක්‍රීඩා දක්ෂතා හා කුසලතා හඳුනා ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ටැලන්ට් හන්ට් (Talant Hunt) වැඩසටහන රට පුරා ස්ථාන 12කදී සිදු කිරීමට නියමිත අතර එහි වැඩසටහන් දෙකක් පසුගියදා හලාවත සහ කිලිනොච්චියේදී පැවැත්විණි.

හලාවත ෂර්ලි කොරයා ක්‍රීඩාංගණයේ පැවැති වැඩසටහන සඳහා පුත්තලම, ගම්පහ, අනුරාධපුරය හා කුරුණෑගල දිස්ත්‍රික් නියෝජනය කරමින් තරුණ තරුණියන් 240කට ආසන්න පිරිසක් එක්ව ඇති අතර, ඉන් සියයකට ආසන්න පිරිසක් මෙදින අලුතෙන් ක්‍රීඩාවට සම්බන්ධ විමට පැමිණි තරුණ තරුණියන් බව ජාතික තරුණ සේවා සභාවේ පුත්තලම දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක අනිල් සිරි හේරත් මහතා පැවසීය.

ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ සංකල්පයක් මත ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ක්‍රීඩා කුසලතාවයන් සහිත තරුණ තරුණියන් හඳුනා ගෙන ඔවුන් ක්‍රීඩා සංචිත ගත කර ජාතික හා අන්තර්ජාතික මට්ටමට ගෙන යෑම මෙහි ප්‍රධාන අරමුණ වේ.

මේ වැඩසටහනට ජාතික තරුණ සේවා සභාවේ වයඹ පළාත් අධ්‍යක්ෂ එම්.ඩී. ගුණසේන, ජාතික තරුණ සේවා සභාවේ සහකාර අධ්‍යක්ෂ සමන් අබේවර්ධන යන මහත්වරු ඇතුළු ක්‍රීඩා අමාත්‍යාංශයේ හා ජාතික තරුණ සේවා සභාවේ නිලධාරීන් පිරිසක් එක්ව සිටියහ.

ඡායාරූපය - මුන්නේශ්වරම සමූහ



වැල්ලවත්ත යං සිල්වර් ක්‍රීඩා සමාජය විසින් කොළඹ නාගරික මන්ත්‍රී එල්.ආර්. ස්ටීවන් මහතා විසින් පාපන්දු ක්ෂේත්‍රයට කළ සේවය අගය කරමින් උපහාර පිදීමේ උලෙළක් පසුගියදා වැල්ලවත්ත කුරේ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. එම අවස්ථාවට එක් වූ යං සිල්වර් ක්‍රීඩා සමාජයේ ලේකම් එම්.එච්.එම්. පර්සාන් මහතා විසින් එල්.ආර්. ස්ටීවන් මහතා වෙත සමරු තිළිණයක් ප්‍රදානය කළ අයුරු.




# දකුණු පළාත් වැඩසටහන 20 දා

**වැලිගම සමූහ - ටී.කේ. මහින්ද**

ශ්‍රී ලාංකේය තාරුණ්‍යයේ සැඟවුණ ක්‍රීඩා දක්ෂතා හා කුසලතා හඳුනා ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ටැලන්ට් හන්ට් (Talant Hunt) දකුණු පළාත් වැඩසටහනේ පළමුවැන්න මේ 20 වැනිදා මාතර උයන්වත්ත ක්‍රීඩාංගණයේදී පැවැත්වේ. අදියර 3ක් යටතේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

ක්‍රීඩා අමාත්‍යාංශය, මලල ක්‍රීඩා සංගමය හා ජාතික තරුණ සේවා සභාවේ උපදේශකවරුන්ගේ සහභාගිත්වයෙන් ක්‍රීඩක, ක්‍රීඩිකාවන්ගේ දස්කම් හඳුනා ගැනීමේ වැඩ සටහන ක්‍රියාත්මක වන අතර, පළමුවරට විද්‍යානුකූල ක්‍රමවේදයන් භාවිත කරමින් ඔවුන්ගේ දක්ෂතා මැනබැලීම මෙහි විශේෂත්වයකි.

# මාතලේ වොලිබෝල් ශූරතාව වේරගමට

**උකුවෙල සංචාරක
ප්‍රියන්ත සුමනසේන**

මාතලේ දිස්ත්‍රික් පිරිමි විවෘත වොලිබෝල් තරගාවලියේ ශූරතාව දිනා ගැනීමට වේරගම ක්‍රීඩා සමාජය සමත් විය.

උකුවෙල ප්‍රාදේශීය සභා සභාපති චේතිය දිසානායක අභියෝග කුසලානය සඳහා කණ්ඩායම් 20කගේ සහභාගිත්වයෙන් උකුවෙල එස්. බී. යාලේගම ක්‍රීඩාංගණයේදී පැවැති දිවා රාත්‍රී තරගාවලියේ අවසන් තරගයේදී වේරගම පිල හමුවේ උකුවෙල ප්‍රබුද්ධ ක්‍රීඩා සමාජය පරාජයට පත් විය. තරගාවලියේ ජය සංකේත ප්‍රදානය උකුවෙල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති හා පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

උකුවෙල කොට්ඨාසයේ ක්‍රීඩාව දියුණු කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බවත්, මේ දිවා රාත්‍රී ක්‍රීඩාංගණයට විශාල අඩුපාඩුවක්ව පැවති ආලෝකය සඳහා නවීන පහසුකමින් යුත් විදුලි උපකරණ කට්ටලයක් ලබාදීමට පියවර ගන්නා බවත් දිසානායක මහතා මෙහිදී පැවසීය.

# MARKET PRICE

## පොල් මිල

**පොල් සංවර්ධන අධිකාරිය**
**ප්‍රකාශිත දිනය 2021-03-17**

**1. පොල් මිල**
(අ) වෙළෙඳපොළ මිල ගණන් 2021.02.26-2021.03.04 (මූලාශ්‍රය - HARTI)
තොග මිල සිල්ලර මිල
ලොකු ප්‍රමාණය ගෙඩියක මිල රු.
කුඩා ප්‍රමාණය ගෙඩියක මිල රු.
(ආ) පොල් සංවර්ධන අධිකාරියේ පොල් වෙන්දේසිය (කොළඹ)
(කර්මාන්තයට යොදනු ලබන)
සාමාන්‍ය මිල ලෙලි ගසන (රු.ගෙඩි 1000ක්)
ඉදිරිපත් කළ ගෙඩි විකුණු ගෙඩි
(ඇ) පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය පොල් වෙන්දේසිය (කුලියාපිටිය)
සාමාන්‍ය මිල ලෙලි ගසන (රු./කි.ග්‍රෑ.01 ක් සඳහා
ඉදිරිපත් කළ ගෙඩි විකුණු ගෙඩි
(ඈ) දේශීය ගොවිපළ මිල රු/ගෙඩි 1000ක් (ලෙලි නොගසන)
රු/මෙ.ටො.1ක මිල (ලෙලි ගසන ලද)

| | | |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 45,000 - 55,000 | 95,000 - 105,000 |
| පුත්තලම් දිස්ත්‍රික්කය | 45,000 - 55,000 | 95,000 - 105,000 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 50,000 - 55,000 | 95,000 - 105,000 |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | 60,000 - 65,000 | 95,000 - 100,000 |

**2. කොප්පරා - දේශීය වෙළෙඳපොළ මිල 17/03/2021**

| | | |
|---|---|---|
| කපන ලද කොප්පරා | (රු./කි.ග්‍රෑ.250ක්) - | |
| තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා | (රු./කි.ග්‍රෑ.250ක්) | 80,000 |
| තෙල් සිඳින විශිෂ්ට අංක 2 කොප්පරා | (රු./කි.ග්‍රෑ.250ක්) | 65,000 |
| තෙල් සිඳින සාමාන්‍ය කොප්පරා | (රු./කි.ග්‍රෑ.250ක්) | |

කොප්පරා
පොල් සංවර්ධන අධිකාරියේ කොප්පරා වෙන්දේසිය (කොළඹ)
ඉදිරිපත් කළ කොප්පරා ප්‍රමාණය (කි.ග්‍රෑ.) -
විකුණු කොප්පරා ප්‍රමාණය (කි.ග්‍රෑ.) -
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා ඉහළ මිල (රු./කි.ග්‍රෑ. 250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා සාමාන්‍ය මිල (රු./කි.ග්‍රෑ. 250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා වෙළෙඳපොළ මිල (රු./කි.ග්‍රෑ. 250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 2 සහ 3 කොප්පරා සාමාන්‍ය මිල(රු./කි.ග්‍රෑ. 250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 2 සහ 3 කොප්පරා වෙළඳපළ මිල - (රු./කි.ග්‍රෑ. 250ක්)

**3. දිසිදි පොල්**

| | | |
|---|---|---|
| සියුම් මධ්‍යම ශ්‍රී ලංකා (දේශීය) | (රු./කි.ග්‍රෑ.1 ක්) | 480 - 490සා |
| | (රු./කි.ග්‍රෑ.1 ක්) | 490 - 500 සා |
| ශ්‍රී ලංකා - නැවතෙක් මිල | (රු./කි.ග්‍රෑ.1 ක්) | |

**4. පොල් තෙල් (තොග මිල)**

| | | |
|---|---|---|
| දේශීය මිල | (රු./මෙ.ටො.1ක්) | 505,000 - 525,000 සා |
| පිලිපීන් (මි.ර.ගැ/රොටඩෑම්) ඔයිල් වර්ල්ඩ් (2021.03.11) | (රු./මෙ.ටො.1ක්) | 317,859 |
| **5. පුන්නක්කු** | (රු./මෙ.ටො. 1ක්) | 62,000 - 75,000 වි |
| **6. ශුදිරි කොහු** | (රු/කි.ග්‍රෑ. 50ක්) | 950 - 1,400 වි |
| **7. ඔමැට් කොහු** | (රු/කි.ග්‍රෑ. 50ක්) | 3,750 - 5,000 වි |
| **8. මිශ්‍ර කොහු** | (රු/කි.ග්‍රෑ. 50ක්) | 1,500 - 1,750 වි |
| **9. බ්‍රිස්ටල් කොහු බැමි 1** | (රු/කි.ග්‍රෑ. 50ක්) | 5,000 - 7,000 වි |
| **10. බ්‍රිස්ටල් කොහු බැමි 2** | (රු/කි.ග්‍රෑ. 50ක්) | 7,500 - 8,500 වි |

**11. පොල් ලෙලි මිල** (16-03-2021)

| දිස්ත්‍රික්කය | පොල් ලෙලි 1000ක මිල (රුපියල්) |
|---|---|
| පුත්තලම | 4,500 - 5,000 |
| ගම්පහ | 4,500 - 5,000 |
| මාතර | 4,500 - 5,000 |
| කුරුණෑගල | 4,500 - 5,500 |
| තෙතමනය 50% වැඩි පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) | 7.00 |
| තෙතමනය 40% - 50% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) | 7.50 |
| තෙතමනය 30% - 40% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) | 8.50 |
| තෙතමනය 20% - 30% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) | 9.50 |
| තෙතමනය 10% - 20% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) | 10.50 |
| තෙතමනය 10% අඩු පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) | 13.00 |

**12. පොල් කටු** (රු/මෙ. ටො. 1ක්) 29,500 - 30,500 වි
**13. පොල් කටු අඟුරු** (2021-02-26 - 2021-03-04) (රු/මෙ.ටො. 1ක්) 110,000.00 වි
(තෙතමනය - 12%, අඟුරු කුඩු - 3%)
**14. පොල් ඉරටු** (රු./මෙ.ටො. 1ක්) 42,000 - 46,000 වි

**වි - විකුණුම් මිල** **සා - සාමාන්‍ය මිල**




| | නාරාහේන්පිට ආ. ම. | රත්මලාන ආ. ම. | වැලිසර. ආ. ම. | මීගොඩ ආ. ම. | තඹුත්තේගම ආ. ම. | දඹුල්ල ආ. ම. | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|
| **පහත රට එළවළු** | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | තොග මිල රු. | තොග මිල රු. | තොග මිල රු | | තොග මිල රු. |
| වට්ටක්කා | 120 | 130 | 80 | 65-70 | 60 | 75-80 | ගෝවා | 90 |
| අළු කෙසෙල් | 120 | 110 | 70 | 60-70 | 35 | 55-65 | කැරට් | 140 |
| පිපිඤ්ඤා | 80 | 90 | 40 | 30-50 | 20-22 | 20-30 | ලීක්ස් | 75 |
| වැටකොළු | 200 | 170 | 130 | 110-120 | 140 | - | රාබු | 60 |
| බණ්ඩක්කා | 160 | 130 | 90 | 90-100 | 70 | 110-120 | බීට්රූට් | 70 |
| කරවිල | 200 | 170 | 140 | 120-130 | 130-140 | 150-160 | අර්තාපල් | 115 |
| පතෝල | 140 | 130 | 90 | 70-80 | 100 | 80-100 | අර්තාපල් රතු | 115 |
| මාළු මිරිස් | 240-330 | 290 | 250-270 | 250-270 | 250 | - | නෝකෝල් | 80 |
| බටානා | 140 | 130 | 100 | 80-90 | - | 100-110 | බෙල්පෙපර් රතු | 900 |
| මුරුංගා | 500 | - | | - | - | 350-360 | කහ | 1000 |
| එළබටු | 120 | | 90 | 70/80 | - | 80-90 | කොළ | 500 |
| කැකිරි | 80 | 110 | 50 | 60 | 35-40 | 40-60 | බැසිල් | 330 |
| නෝකෝල් | 140 | 100 | 90 | 90-100 | 80-90 | 90-100 | චයිනීස් කැබේජ් | 220 |
| මඤ්ඤොක්කා | 80 | 90 | 50 | - | 40 | 35-45 | රෙඩ් කැබේජ් | 800 |
| බතල | 100 | 100 | 60 | - | 40 | 35-40 | සැල්දිරි | 140 |
| දඹල | 120 | 130 | 120 | 80 | 60-70 | 90-100 | කොත්ත මල්ලි කොළ | 400 |
| මැකරල් | 120 | 130 | 100 | 80/90 | 70-100 | 80-100 | අයිස්බර්ග් | 300 |
| **උඩරට එළවළු** | | | | | | | සලාද | 550 |
| බෝංචි | 240 | 230 | 210 | 220 | 220 | 300-110 | රතුසලාද | 550 |
| ගෝවා ගෙඩි | 160 | 130 | 120 | 120 | 100 | 70-80 | මිංචි | 170 |
| කැරට් | 200 | 190 | 180 | 160 | 170-180 | 145-150 | පාස්ලි | 550 |
| ලීක්ස් | 140 | 130 | 100 | 90 | 90-100 | 95-100 | රුබා | 80 |
| රාබු | 80 | 90 | 40 | - | 60 | 20-25 | රෝස්මරි | 700 |
| තක්කාලි | 160 | 170 | 140 | 100-120 | 60-70 | 100-110 | බ්‍රොකෝලි | 1000 |
| බීට්රූට් | 140 - 160 | 130 | 100 | 80-90 | 80 | 60-70 | මල්ගෝවා | 850 |
| සලාද | 300 | 200 | 300 | = | 280 | 180-200 | රතුරාබු | 450 |
| ගෝවා කොළ | | | | 30 | - | - | පැවර්ලි | 150 |
| **පලතුරු** | | | | | | | සුකිනි | 270 |
| අන්නාසි | 150 | 150 | 120 | - | 110 | 90 | කහ සුකිනි | 270 |
| ඇඹුල් කෙසෙල් | 120 | 110 | 80 | 70 | 30-50 | - | දිගරාබු | 120 |
| කෝලිකුට්ටු | 230-240 | 190 | 150 | 160 | 120-140 | - | තක්කාලි | 220 |
| සීනි කෙසෙල් | 130 | 160 | 80 | 80 | 30-60 | 60-65 | මාළුමිරිස් | 270 |
| ඇඹුන් | 230. | 190 | 140 | - | 130-150 | - | | |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | | 110 | 130 | - | 80-110 | | | |
| ගස්ලබු | 180 | 120 | 130 | 120 | 30-65 | 100/110 | | |
| ඇපල් (ආනයනික) | 70/80 | 180 | 60 | | - | | | |
| මිදි (දේශිය) | | | | | | | | |
| මිදි (ආනයනික රතු) | 1100 | 1200 | 850 | | 1100 | | | |
| මිදි (ආනයනික කොළ) | 1000 | 1200 | 900 | | | | | |
| **මස්** | | | | | | | | |
| කුකුළු මස්- අලුත් (සම රහිත) | 580-630 | 640 | | | 420 | | | |
| කුකුළු මස් -ශීත කළ (සම සහිත) | 430-480 | 420 | - | | | | | |
| **අනෙකුත්** | | | | | | | | |
| අමු මිරිස් | 280 | 270 | 90 | | | | | |
| දෙහි | 140 | 130 | 50 | | | 90-100 | | |
| අමු ඉඟුරු | 300 | 260 | 80 | | 130 | 180-160 | | |
| **සහල්** | | | | | | | | |
| රතු නාඩු | 96-100 | 110 | 106 | 95 | | | | |
| සුදු නාඩු | 96-105 | 108 | 95 | | | | | |
| රතු කැකුළු | 89-100 | 98 | 95 | 90/92 | | | | |
| සුදු කැකුළු | 93-105 | 100 | 95 | 115 | | | | |
| සුදු කැකුළු සම්බා | 98-125 | 135 | 120 | | | | | |
| තම්බපු කැකුළු සම්බා | 98-125 | 125 | 120 | - | | | | |
| කිරි සම්බා | 125-165 | 170 | 160 | | | | | |



### දැනගෙන ගන්න රන් මිල

| |
|---|
| කැරට් 21 - 91437 |
| කැරට් 22-95791 |
| කැරට් 24-104500 |

## ජීවිත රක්ෂණ අංශයේ වසරේ ප්‍රධාන විධායක නිලධාරි ඉන්දික කිරිවන්දෙණිය



සුප්‍රකට අන්තර්ජාතික ව්‍යාපාර සඟරාව (International Business Magazine) මගින් මේ වසර සඳහා ජීවිත රක්ෂණ අංශයේ ශ්‍රී ලංකාවේ වසරේ ප්‍රධාන විධායක නිලධාරියා (Life Insurance CEO of the Year 2021) ලෙස සණස ලයිෆ් ඉන්ෂුවරන්ස්හි ප්‍රධාන විධායක නිලධාරි ඉන්දික කිරිවන්දෙණිය මහතා නම් කර තිබේ. ලොව පුරා විවිධ තලයන්හි ව්‍යාපාරිකයන් සහ එම ව්‍යාපාර අගයා වාර්ෂිකව පවත්වන මේ සම්මාන ප්‍රදානයෙ ඉතා තරගකාරී වන අතර ශ්‍රී ලාංකේය ජීවිත රක්ෂණ සමාගම් ගණනාවක් අභිභවමින් සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් අත් කර ගත් මේ ජයග්‍රහණය සුවිශේෂ වන්නේ එබැවිනි. ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ කේන්ද්‍ර කර ගනිමින් නිකුත් වන අන්තර්ජාතික ව්‍යාපාර සඟරාව අන්තර්ජාතික ව්‍යාපාර, මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපාර, ව්‍යාපාරික නායකයන් හා ඔවුන්ගේ කුසලතා මෙන්ම එකී ව්‍යාපාර අත් කර ගන්නා ප්‍රගතිය තම සම්මාන ප්‍රදානය සඳහා සලකා බලයි. 2020දී ද සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් International Business Magazine සම්මාන ද්විත්වයකින් පිදුම් ලැබීය. ඒ හොඳම සේවක ප්‍රතිලාභ සපයන්නා 2020 සහ ක්ෂුද්‍රරක්ෂණය සඳහා හොඳම ජීවිත රක්ෂණ සමාගම - 2020 යන සම්මානයි. 1997දී ලිපිකරුවකු ලෙස එවකට රක්ෂණ තැරව්කාර සමාගමක්ව පැවැති සණස බ්‍රෝකර් සමාගම හා එක්වන ඉන්දික කිරිවන්දෙණිය මහතා එතැන් පටන් විවිධ තනතුරු හොබවමින් තම දායකත්වය සණස රක්ෂණ සමාගම වෙත පිරිනැමීය. උත්සාහය හා කැපවීම මත ඉදිරියට යන ඒ මහතා 2011.01.01 සණස රක්ෂණ සමාගමෙහි සාමාන්‍යධිකාරි ලෙස පත්විය. එතැන් පටන් සමාගම දියුණුව කරා මෙහෙයවීමේ පුරෝගාමී දායකත්වයක් දුන් ඒ මහතා සණස රක්ෂණ සමාගම, සණස ලයිෆ් සහ සණස ජෙනරල් යනුවෙන්

සමාගම් දෙකක් ලෙස වෙන්ව ව්‍යාපාර ඇරඹීමත් සමග සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙසත් සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂකවරයා ලෙසත් කටයුතු කරයි.

# කොළඹ කොටස් වෙළෙඳපොළ

2021. 03. 17 දින වෙළෙඳපොළ දත්ත

# MARKET PRICE

| සුරැකුම | ප්‍රමාණය | පෙර වසා දැමූ බර තැබූ සාමාන්‍ය පරිමාව | විවෘත | ඉහළ | පහළ | ඊයේ වසා දැමූ බර තැබූ සාමාන්‍ය පරිමාව | වෙනස (රු.) |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන පුවරුව | | | | | | | |
| එයිට්කන් ස්පෙන්ස් හොටෙල්ස් හෝල්ඩිංග්ස් | 90,951 | 29.90 | 29.80 | 30.00 | 29.10 | 30.00 | 0.10 |
| අබාන්ස් | 254 | 156.00 | 160.00 | 160.00 | 160.00 | 160.00 | 4.00 |
| ඇක්සස් ඉන්ජි. ශ්‍රී ලංකා | 191,934 | 22.50 | 22.60 | 22.80 | 22.00 | 22.40 | 0.10 |
| ඒසීඑල් | 69,004 | 37.50 | 38.00 | 38.00 | 36.60 | 36.80 | 0.70 |
| ඒ.සී.එල්. ප්ලාස්ටික් | 2 | 246.25 | 240.00 | 240.00 | 236.50 | 246.25 | 0.00 |
| ඇක්මී | 26,205 | 6.50 | 6.50 | 6.50 | 6.30 | 6.30 | 0.20 |
| අගලවත්ත | 1,966 | 28.20 | 29.30 | 29.30 | 28.00 | 28.60 | 0.40 |
| ඇහොට් ප්‍රොපටීස් | 11 | 37.00 | 37.00 | 37.00 | 37.00 | 37.00 | 0.00 |
| එයිට්කන් ස්පෙන්ස් | 129,609 | 56.30 | 56.00 | 56.00 | 54.10 | 54.30 | 2.00 |
| එලයන්ස් | 960 | 50.60 | 49.50 | 50.00 | 49.50 | 49.90 | 0.70 |
| අමානා බැන්ක් | 804,100 | 3.30 | 3.30 | 3.40 | 3.20 | 3.30 | 0.00 |
| අමායා ලෙෂර් | 311 | 18.00 | 18.10 | 18.10 | 17.50 | 18.00 | 0.00 |
| ඒෂියා ඇසෙස්ට් | 28,290 | 5.70 | 5.70 | 5.90 | 5.50 | 5.70 | 0.00 |
| ආසිරි | 231,018 | 24.00 | 24.00 | 26.80 | 23.50 | 23.60 | 0.40 |
| ආසිරි සර්ජිකල් | 66,215 | 13.30 | 13.90 | 14.30 | 13.50 | 14.00 | 0.70 |
| ඔටෝඩ්‍රෝම් | 590 | 70.50 | 71.00 | 71.00 | 66.20 | 70.10 | 0.40 |
| බයිරහා ෆාම්ස් | 720 | 135.50 | 132.00 | 132.00 | 132.00 | 132.00 | 3.50 |
| බලන්ගොඩ | 8,712 | 12.60 | 12.50 | 13.00 | 12.00 | 12.00 | 0.60 |
| බුකිට් ධාරා | 43 | 325.50 | 311.50 | 322.00 | 309.00 | 325.50 | 0.00 |
| සී.එම්. හෝල්ඩිංග්ස් | 929 | 87.40 | 88.90 | 88.90 | 85.20 | 88.70 | 1.30 |
| සී. ටී. හෝල්ඩිංග්ස් | 60,400 | 170.00 | 170.00 | 170.00 | 169.75 | 170.00 | 0.00 |
| කාර්ගිල්ස් | 550 | 234.00 | 234.00 | 243.50 | 233.00 | 238.50 | 4.50 |
| කාර්ගෝ බෝට් | 1 | 56.10 | 57.10 | 57.10 | 57.10 | 56.10 | 0.00 |
| කාර්සන්ස් | 809 | 270.00 | 270.00 | 270.25 | 270.00 | 270.00 | 0.00 |
| සී. ඩී. බී. | 1,170 | 113.50 | 106.00 | 107.00 | 106.00 | 106.50 | 7.00 |
| සී.ඩී.බී (CDB. X0000) | 2,455 | 70.00 | 70.00 | 70.00 | 68.00 | 68.10 | 1.90 |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් | 10,287 | 84.20 | 83.50 | 84.00 | 82.50 | 82.80 | 1.40 |
| සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රීස් | 6,065 | 100.00 | 104.00 | 104.00 | 100.00 | 101.25 | 1.25 |
| සෙලින්කෝ ඉන්ෂුවරන්ස් | 25 | 1,920.25 | 1,925.00 | 1,925.00 | 1,925.00 | 1,920.25 | 0.00 |
| සෙලින්කෝ ඉන්ෂුවරන්ස් (CINS.X0000) | 134 | 1,065.00 | 1,010.00 | 1,010.00 | 1,000.00 | 1,001.00 | 64.00 |
| සිලෝන් ගාර්ඩියන් | 13,410 | 115.75 | 115.25 | 116.00 | 115.00 | 115.00 | 0.75 |
| සිලෝන් ඉන්වෙස්මන්ට් | 960 | 60.00 | 58.10 | 61.00 | 56.20 | 57.10 | 2.90 |
| සිලෝන් ටුබැකෝ | 4,073 | 999.75 | 1,000.00 | 1,000.00 | 998.00 | 998.25 | 1.50 |
| කෙමනෙක්ස් | 2 | 79.30 | 77.50 | 77.50 | 75.50 | 79.30 | 0.00 |
| චෙව්රෝන් | 12,943 | 92.30 | 93.00 | 93.00 | 91.50 | 91.60 | 0.70 |
| සී.අයි.සී | 14,665 | 53.20 | 53.10 | 54.90 | 52.10 | 52.40 | 0.80 |
| සී.අයි.සී (CIC.X0000) | 272,498 | 43.10 | 43.50 | 43.80 | 42.90 | 43.00 | 0.10 |
| සිට්‍රස් ලෙෂර් | 20,401 | 8.50 | 8.00 | 8.30 | 8.00 | 8.30 | 0.20 |
| කෝල්ඩ් ස්ටෝර්ස් | 1,212 | 641.50 | 621.00 | 621.00 | 616.00 | 617.75 | 23.75 |
| කළම්බු සිටි | 10 | 875.25 | 884.75 | 884.75 | 876.00 | 875.25 | 0.00 |
| කළම්බු ලෑන්ඩ් | 49,016 | 24.60 | 24.30 | 24.30 | 23.10 | 23.60 | 1.00 |
| කොමර්ෂල් බෑන්ක් | 94,193 | 87.20 | 87.40 | 87.50 | 85.10 | 86.00 | 1.20 |
| කොමර්ෂල් බෑන්ක් (COMB.X0000) | 47,725 | 81.00 | 81.70 | 81.70 | 79.00 | 79.70 | 1.30 |
| කන්වීනියන්ස් ෆුඩ් | 80 | 1,250.25 | 1,240.00 | 1,240.00 | 1,240.00 | 1,250.25 | 0.00 |
| දන්කොටුව පෝසිලේන් | 4,110 | 11.20 | 11.40 | 11.40 | 10.70 | 10.80 | 0.40 |
| ඩී.එෆ්.සී.සී.බෑන්ක් (PLC) | 96,635 | 60.00 | 60.00 | 61.40 | 59.00 | 59.60 | 0.40 |
| ඩයලොග් | 465,089 | 13.20 | 13.20 | 13.20 | 13.00 | 13.10 | 0.10 |
| ඩිමෝ | 1,029 | 515.00 | 510.00 | 510.00 | 510.00 | 510.00 | 5.00 |
| ඩිප්ඩ් ප්‍රඩක්ට්ස් | 991,985 | 48.30 | 47.80 | 48.00 | 45.90 | 46.20 | 2.10 |
| ඩොක්යාඩ් | 3 | 72.20 | 74.90 | 74.90 | 74.90 | 72.20 | 0.00 |
| ඩොල්ෆින් හොටෙල්ස් | 1,050 | 23.30 | 23.30 | 24.60 | 23.30 | 23.40 | 0.10 |
| ඩර්ඩන්ස් (CHLX0000) | 258 | 84.30 | 86.00 | 86.00 | 85.10 | 85.80 | 1.50 |
| ඊ.බී.ක්‍රීසි | 1,015 | 30.60 | 31.40 | 31.40 | 30.30 | 30.50 | 0.10 |
| ඊස්ට් වෙස්ට් | 17,557 | 10.10 | 10.30 | 10.30 | 10.10 | 10.10 | 0.00 |
| එක්ස්පෝ ලංකා | 3,390,050 | 46.00 | 46.30 | 46.30 | 44.40 | 44.70 | 1.30 |
| ෆෝර්ට්ලෑන්ඩ් | 10,452 | 13.00 | 12.80 | 12.80 | 12.20 | 12.40 | 0.60 |
| ගෙස්ට්එන්ටර් | 2 | 99.80 | 99.90 | 99.90 | 85.00 | 99.80 | 0.00 |
| ග්‍රේන් එළිවේටර්ස් | 41,030 | 115.75 | 116.00 | 116.00 | 113.00 | 113.50 | 2.25 |
| හේකාබ් | 135,826 | 97.00 | 95.70 | 95.70 | 94.00 | 94.50 | 2.50 |
| හේලීස් | 1,119,151 | 56.30 | 57.00 | 57.00 | 54.60 | 55.00 | 1.30 |
| හේලීස් ෆැබ්රික් | 156,981 | 14.40 | 15.00 | 15.00 | 14.10 | 14.20 | 0.20 |
| හේලීස් ෆයිබර් | 2,145 | 47.10 | 46.30 | 47.00 | 46.30 | 46.40 | 0.70 |
| එච්.ඩී.එෆ්.සී | 247 | 33.50 | 34.00 | 34.00 | 33.00 | 33.60 | 0.10 |
| හේමාස් හෝල්ඩිංග්ස් | 13,340 | 80.00 | 80.00 | 80.90 | 80.00 | 80.00 | 0.00 |
| එච්.එන්.බී. | 326,438 | 129.00 | 130.00 | 130.00 | 127.50 | 128.00 | 1.00 |
| එච්.එන්.බී. ඇෂුවරන්ස් | 235 | 56.10 | 57.00 | 57.00 | 56.40 | 56.60 | 0.50 |
| එච්.එන්.බී.(HNB. X0000) | 127,694 | 101.00 | 103.75 | 103.75 | 100.75 | 101.00 | 0.00 |
| හොටෙල් සීගිරිය | 30 | 59.10 | 60.00 | 60.00 | 60.00 | 59.10 | 0.00 |
| හොටෙල්ස් කෝපරේෂන්ස් | 135 | 11.30 | 11.10 | 11.10 | 11.10 | 11.10 | 0.20 |
| හන්ටර්ස් | 26 | 610.00 | 607.50 | 611.50 | 607.50 | 610.00 | 0.00 |
| ඉන්ඩස්ට්‍රියල් ඒ.එස්.පී.එච්. | 4,353,116 | 0.40 | 0.40 | 0.50 | 0.40 | 0.40 | 0.00 |
| ජේ.කේ.එච්. | 646,433 | 148.50 | 153.00 | 153.00 | 149.00 | 149.00 | 0.50 |
| කැන්ඩි හොටෙල්ස් | 102 | 5.00 | 4.90 | 5.20 | 4.90 | 4.90 | 0.10 |
| කේගෝල් | 250 | 100.00 | 100.00 | 100.00 | 100.00 | 100.00 | 0.00 |
| කැලණි කේබල්ස් | 1,948 | 112.50 | 119.50 | 119.50 | 110.00 | 111.00 | 1.50 |
| කැලණි ටයර්ස් | 8,758 | 74.10 | 76.50 | 76.50 | 73.50 | 73.60 | 0.50 |
| කැලණිවැලි | 3,689 | 41.70 | 40.50 | 40.50 | 39.00 | 39.40 | 2.30 |
| කිංන්ස්බරි | 32,798 | 5.70 | 5.90 | 5.90 | 5.60 | 5.70 | 0.00 |
| කොටගල | 622 | 5.90 | 6.00 | 6.00 | 5.80 | 5.90 | 0.00 |
| එල්.ඕ.එල්.සී.හෝල්ඩිංග්ස් | 105,735 | 302.50 | 310.00 | 310.00 | 295.00 | 296.00 | 6.50 |
| ලංකා ඇලුමිනියම් | 10,934 | 16.20 | 16.00 | 16.00 | 15.90 | 15.90 | 0.30 |
| ලංකා හොස්පිටල්ස් | 1,100 | 40.00 | 40.10 | 40.10 | 40.10 | 40.10 | 0.10 |
| ලංකා අයි.ඕ.සී | 36,635 | 20.00 | 20.00 | 20.00 | 19.80 | 19.80 | 0.20 |
| ලංකා ටයිල්ස් | 6,562 | 181.25 | 181.25 | 187.00 | 178.00 | 180.25 | 1.00 |
| ලංකා වෙන්ටර්ස් | 100 | 48.60 | 48.60 | 48.60 | 48.60 | 48.60 | 0.00 |
| ලංකා වෝල්ටයිල් | 5,229 | 185.00 | 184.00 | 190.00 | 180.25 | 180.75 | 4.25 |
| ලාෆ් ගෑස් | 616 | 20.00 | 20.00 | 20.00 | 19.70 | 20.00 | 0.00 |
| ලාෆ් ගෑස් (LGL.X0000) | 2,475 | 15.60 | 16.00 | 16.00 | 15.50 | 15.50 | 0.10 |
| ලක්ෂපාන | 10,254 | 14.00 | 14.00 | 14.20 | 13.90 | 13.90 | 0.10 |
| එල්. බී. ෆිනෑන්ස් | 116,464 | 47.38 | 47.40 | 49.90 | 44.80 | 45.20 | 2.18 |
| ලී හෙජර්ස් | 4,600 | 66.70 | 66.70 | 66.70 | 65.00 | 65.40 | 1.30 |
| ලයන් බෲවරි | 385 | 540.00 | 540.50 | 540.50 | 540.00 | 540.25 | 0.25 |
| එල්.එම්.එෆ් | 14,818 | 147.50 | 150.00 | 150.00 | 145.00 | 145.75 | 1.75 |
| එල්.වී.එල්.එනර්ජි | 7,200 | 9.30 | 9.30 | 9.30 | 9.30 | 9.30 | 0.00 |
| මල්වත්ත | 2,201 | 11.40 | 11.30 | 11.90 | 11.10 | 11.90 | 0.50 |
| මල්වත්ත (MAL.X0000) | 5,000 | 7.50 | 7.50 | 7.50 | 7.50 | 7.50 | 0.00 |
| මෙල්ස්ටා කෝප් | 733,756 | 45.50 | 46.10 | 46.10 | 43.60 | 45.00 | 0.50 |
| එම්. ඊ. ආර්. සී. ෂිපින් | 2 | 72.30 | 77.90 | 77.90 | 68.20 | 72.30 | 0.00 |
| මර්චන්ට් බෑන්ක් | 18,492 | 7.00 | 7.20 | 7.30 | 6.90 | 7.00 | 0.00 |
| මුලර්ස් | 38,684 | 1.00 | 1.00 | 1.00 | 0.90 | 1.00 | 0.00 |
| නමුණුකුල | 648 | 180.25 | 175.00 | 180.00 | 168.00 | 179.50 | 0.75 |
| නැෂනල් ඩිවලප්මන්ට් බෑන්ක් එක්ස්.ඩී | 39,604 | 81.80 | 81.90 | 81.90 | 80.00 | 80.00 | 1.80 |
| නේෂන්ස් ට්‍රස්ට් | 61,290 | 55.00 | 55.00 | 55.00 | 54.00 | 54.50 | 0.50 |
| නවලෝක | 41,189 | 5.00 | 5.30 | 5.30 | 4.90 | 4.90 | 0.10 |
| නෙස්ලේ එක්ස්.ඩී | 22 | 1,151.50 | 1,145.00 | 1,147.75 | 1,140.00 | 1,151.50 | 0.00 |
| ඕවර්සීස් රියැල්ටි | 418,243 | 16.00 | 15.70 | 16.00 | 15.60 | 15.70 | 0.30 |
| පෑන් ඒෂියා | 107,105 | 16.00 | 16.00 | 16.70 | 15.50 | 15.60 | 0.40 |
| පෑන් ඒෂියන් පවර් | 252,201 | 3.50 | 3.50 | 3.60 | 3.40 | 3.50 | 0.00 |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් | 40,136 | 31.30 | 31.00 | 31.60 | 30.50 | 30.50 | 0.80 |
| පීපල්ස් ලීසිං | 77,141 | 12.10 | 12.10 | 12.20 | 12.00 | 12.10 | 0.00 |
| පිරමල් ග්ලාස් | 717,292 | 9.50 | 9.50 | 9.60 | 9.40 | 9.50 | 0.00 |
| ප්‍රින්ට්කෙයාර් පී.එල්.සී. | 1,090 | 29.00 | 29.00 | 29.00 | 28.00 | 28.00 | 1.00 |
| ආර්.අයි.එල්.ප්‍රොපර්ටි | 1,082,992 | 6.50 | 6.30 | 6.60 | 5.90 | 6.00 | 0.50 |
| රෙග්නිස් | 5,942 | 45.00 | 45.00 | 45.00 | 44.00 | 44.10 | 0.90 |
| රේණුකා ඇග්‍රි | 215,317 | 3.50 | 3.50 | 3.50 | 3.30 | 3.40 | 0.10 |
| රේණුකා සිටි හොටෙල් | 73 | 225.00 | 236.75 | 240.00 | 225.00 | 225.00 | 0.00 |
| රේණුකා ෆුඩ්ස් | 14,137 | 13.40 | 13.50 | 13.50 | 13.00 | 13.10 | 0.30 |
| රේණුකා ෆුඩ්ස් (COCO.X0000) | 63 | 11.10 | 11.50 | 11.50 | 11.10 | 11.10 | 0.00 |
| රේණුකා හෝල්ඩිංග්ස් | 1,711 | 15.00 | 14.50 | 15.00 | 14.50 | 14.80 | 0.20 |
| රේණුකා හෝල්ඩිංග්ස් (RHL.X0000) | 2,246 | 10.80 | 11.00 | 11.00 | 10.40 | 10.80 | 0.00 |
| රිසර්ස් එනර්ජි | 1,442 | 23.80 | 23.80 | 24.00 | 23.00 | 24.00 | 0.20 |
| රිචඩ් පීරිස් | 238,951 | 15.90 | 15.70 | 16.00 | 15.50 | 15.50 | 0.40 |
| රෝයල් සෙරමික් | 16,124 | 249.00 | 250.00 | 250.00 | 241.50 | 242.25 | 6.75 |
| එස්.එම්.බී. ලීසිං | 6,709 | 0.50 | 0.60 | 0.60 | 0.50 | 0.60 | 0.10 |
| එස්.එම්.බී. ලීසිං (SEMB.X0000) | 272,905 | 0.20 | 0.30 | 0.30 | 0.20 | 0.30 | 0.10 |
| සම්පත් | 589,857 | 154.25 | 154.75 | 154.75 | 153.75 | 154.25 | 0.00 |
| සැම්සන් ඉන්ටර්නැෂනල් | 2 | 142.00 | 149.75 | 149.75 | 134.00 | 142.00 | 0.00 |
| සණස ඩිවලොප්මන්ට් බෑන්ක් | 6,431 | 57.30 | 56.50 | 58.70 | 56.50 | 57.50 | 0.20 |
| සෙලාන් බෑන්ක් | 5,123 | 51.20 | 50.50 | 52.00 | 49.10 | 49.70 | 1.50 |
| සෙලාන් බෑන්ක් (SEYB.X0000) | 142,514 | 44.40 | 45.00 | 45.00 | 42.10 | 43.00 | 1.40 |
| සෙලාන් ඩී.ඊ.වී.ටී.එස් | 4,408 | 15.80 | 15.90 | 16.40 | 15.90 | 16.20 | 0.40 |
| සියරා කේබල්ස් | 24,400 | 6.00 | 6.30 | 6.30 | 6.00 | 6.00 | 0.00 |
| සීගිරිය විලේජ් | 316 | 33.50 | 33.00 | 33.00 | 32.90 | 32.90 | 0.60 |
| සිංගර් ෆිනෑන්ස් | 24,120 | 13.90 | 13.90 | 14.00 | 13.80 | 13.90 | 0.00 |
| එස්.එල්.ටී. | 17,910 | 32.50 | 32.40 | 33.00 | 32.00 | 32.60 | 0.10 |
| සන්ෂයින් හෝල්ඩිංග් | 25,621 | 79.30 | 79.90 | 80.00 | 78.80 | 79.00 | 0.30 |
| ස්විස්ටෙක් | 8,605 | 105.00 | 104.50 | 109.00 | 100.00 | 102.00 | 3.00 |
| තලවකැලේ | 1,387 | 39.50 | 38.70 | 40.00 | 38.70 | 39.40 | 0.10 |
| ටැන්ජරින් | 2 | 40.50 | 42.80 | 42.80 | 38.70 | 40.50 | 0.00 |
| ටී ස්මෝල් හෝල්ඩර් | 1,290 | 38.40 | 38.40 | 38.40 | 37.00 | 37.00 | 1.40 |
| ටී.ජේ. ලංකා | 36,355 | 39.60 | 39.50 | 40.00 | 39.20 | 39.50 | 0.10 |
| ත්‍රී ඒකර් ෆාම්ස් | 130 | 188.00 | 197.00 | 197.00 | 190.00 | 195.75 | 7.75 |
| ටෝකියෝ සිමෙන්ට් | 51,842 | 67.40 | 69.00 | 69.00 | 66.00 | 66.50 | 0.90 |
| ටෝකියෝ සිමෙන්ට් (TKYO.X0000) | 34,735 | 59.90 | 61.00 | 61.00 | 59.00 | 59.40 | 0.50 |
| යූනියන් බෑන්ක් | 364,739 | 10.90 | 10.70 | 10.70 | 10.50 | 10.60 | 0.30 |
| යුනයිටඩ් මෝටර්ස් | 5,118 | 59.90 | 60.00 | 60.00 | 59.80 | 59.90 | 0.00 |
| වැලිබල් | 868,674 | 7.20 | 7.20 | 7.30 | 7.20 | 7.20 | 0.00 |
| වැලිබල් ෆිනෑන්ස් | 3,620 | 105.00 | 100.00 | 108.75 | 100.00 | 101.00 | 4.00 |
| විදුල් ලංකා | 115,130 | 5.60 | 5.50 | 5.60 | 5.40 | 5.40 | 0.20 |
| වටවල | 7,050 | 57.00 | 56.40 | 57.60 | 56.40 | 56.60 | 0.40 |
| යෝර්ක් ආර්කේඩ් | 10 | 161.00 | 161.00 | 161.00 | 161.00 | 161.00 | 0.00 |
| දෙවන පුවරුව | | | | | | | |

| සුරැකුම | ප්‍රමාණය | පෙර වසා දැමූ බර තැබූ සාමාන්‍ය පරිමාව | විවෘත | ඉහළ | පහළ | ඊයේ වසා දැමූ බර තැබූ සාමාන්‍ය පරිමාව | වෙනස (රු.) |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන පුවරුව | | | | | | | |
| අබාන්ස් ෆයිනෑන්සියල් | 7 | 27.70 | 28.00 | 28.00 | 24.70 | 27.70 | 0.00 |
| ඇම්බියෝන් කැපිටල් | 174,151 | 5.00 | 5.00 | 5.00 | 5.00 | 5.00 | 0.00 |
| ආර්පිකෝ | 2 | 180.00 | 182.75 | 182.75 | 176.00 | 180.00 | 0.00 |
| ඒසියා කැපිටල් | 5,002 | 5.30 | 5.50 | 5.60 | 5.30 | 5.60 | 0.30 |
| බ්‍රවුන්ස් බීච් | 5,919 | 11.20 | 10.60 | 11.00 | 10.60 | 11.00 | 0.20 |
| කොමර්ෂල් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් | 130,931 | 6.00 | 6.20 | 6.30 | 5.80 | 5.80 | 0.20 |
| ඩයලොග් ෆිනෑන්ස් | 2 | 59.50 | 59.50 | 59.50 | 55.30 | 59.50 | 0.00 |
| ඩිස්ටිලරීස් | 4,245 | 19.90 | 19.90 | 20.00 | 19.80 | 19.80 | 0.10 |
| ෆස්ට් කැපිටල් | 74,343 | 50.00 | 49.10 | 50.00 | 48.00 | 48.20 | 1.80 |
| ගුඩ් හෝප් | 38 | 1,121.90 | 1,018.00 | 1,018.00 | 950.00 | 1,121.90 | 0.00 |
| හුනස් ෆෝල්ස් | 1 | 152.00 | 156.00 | 156.00 | 156.00 | 152.00 | 0.00 |
| ජනශක්ති ඉන්ෂුවරන්ස් | 10,035 | 28.10 | 28.10 | 28.10 | 27.50 | 27.50 | 0.60 |
| කෙල්සේ | 602 | 39.80 | 39.70 | 39.90 | 33.20 | 39.80 | 0.00 |
| කොත්මලේ හෝල්ඩින්ග්ස් | 2 | 216.50 | 227.00 | 227.00 | 185.00 | 216.50 | 0.00 |
| ලංකා රියැලිටි | 100 | 31.20 | 31.20 | 31.20 | 31.20 | 31.20 | 0.00 |
| එල්.ඕ.එල්.සී. ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් | 101 | 69.90 | 57.10 | 67.50 | 57.10 | 57.20 | 12.70 |
| එල්. ඕ. එල්. සී. ෆිනෑන්ස් | 286,371 | 6.00 | 6.00 | 6.00 | 5.80 | 5.90 | 0.10 |
| මඩොල්සිම | 2 | 8.30 | 8.60 | 8.60 | 8.20 | 8.30 | 0.00 |
| ඔඩෙල් පී.එල්.සී. | 351 | 18.50 | 18.60 | 18.60 | 18.50 | 18.50 | 0.00 |
| ඔරියන්ට් ෆිනෑන්ස් | 217 | 14.30 | 13.10 | 14.10 | 13.10 | 13.40 | 0.90 |
| පී. ඩී. එල්. | 2 | 115.25 | 124.75 | 124.75 | 115.00 | 115.25 | 0.00 |
| පීපල්ස් මර්චන්ට් | 1,110 | 7.10 | 7.20 | 7.40 | 7.20 | 7.40 | 0.30 |
| සෙලිසින් | 2 | 817.25 | 814.75 | 814.75 | 665.00 | 817.25 | 0.00 |
| සිංගර් ශ්‍රී ලංකා | 9,491 | 17.70 | 17.60 | 17.60 | 17.40 | 17.50 | 0.20 |
| දිරිසවි පුවරුව | | | | | | | |
| ඇග්ස්ටාර් පී.එල්.සී. | 12,015 | 7.10 | 7.30 | 7.30 | 7.10 | 7.10 | 0.00 |
| ඇලුමෙක්ස් පී.එල්.සී. | 375,318 | 10.40 | 10.60 | 10.60 | 10.00 | 10.10 | 0.30 |
| අමානා ලයිෆ් | 235 | 9.50 | 9.30 | 9.30 | 9.30 | 9.30 | 0.20 |
| අමානා තකාෆුල් | 3,815 | 7.50 | 7.40 | 7.40 | 7.10 | 7.20 | 0.30 |
| ඇම්බියොන් හෝල්ඩිංග්ස් | 15,216 | 17.40 | 16.10 | 17.40 | 16.10 | 17.20 | 0.20 |
| ඒ.එම්.එෆ්. කම්පැණි ලිමිටඩ් | 488 | 296.75 | 298.00 | 305.00 | 250.00 | 297.75 | 1.00 |
| ඒෂියා සියාකා | 911,607 | 2.60 | 2.60 | 2.60 | 2.50 | 2.60 | 0.00 |
| බ්‍රෙන්සෙයි රෙසෝට්ස් | 2,359 | 8.00 | 7.90 | 9.00 | 7.90 | 8.90 | 0.90 |
| බේරුවල රෙසෝට්ස් | 2,049 | 0.80 | 0.80 | 0.90 | 0.80 | 0.90 | 0.10 |
| බෝගල ග්‍රැෆයිට් | 55 | 24.20 | 25.80 | 25.80 | 24.30 | 24.20 | 0.00 |
| බොගවන්තලාව | 4,823 | 11.60 | 12.20 | 12.20 | 12.20 | 12.20 | 0.60 |
| බී.පී.පී.එල්. හෝල්ඩිංග්ස් | 72,858 | 13.50 | 13.60 | 13.90 | 13.50 | 13.60 | 0.10 |
| බ්‍රවුන්ස් | 3,009 | 160.25 | 162.00 | 163.75 | 157.75 | 158.25 | 2.00 |
| බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් | 9,469,296 | 5.20 | 5.20 | 5.30 | 5.00 | 5.10 | 0.10 |
| සී. ටී. ලෑන්ඩ් | 251 | 28.80 | 27.70 | 27.70 | 27.50 | 27.50 | 1.30 |
| සී.ඩබ්ලිව්. මැකී | 36 | 43.10 | 43.60 | 43.60 | 43.60 | 43.10 | 0.00 |
| සිලෝන් බෙවරේජ් | 2 | 779.75 | 779.00 | 779.00 | 730.00 | 779.75 | 0.00 |
| සිලෝන් ටී බ්‍රෝකර්ස් | 40,101 | 3.30 | 3.20 | 3.30 | 3.10 | 3.10 | 0.20 |
| සී. එෆ්. එල්. | 2 | 67.50 | 71.00 | 71.00 | 65.00 | 67.50 | 0.00 |
| සී. අයි. ටී. | 2 | 109.75 | 116.25 | 116.25 | 100.00 | 109.75 | 0.00 |
| සිට්‍රස් හික්කඩුව | 6,185 | 5.00 | 5.00 | 5.00 | 4.90 | 4.90 | 0.10 |
| සිට්‍රස් වස්කඩුව | 181,674 | 3.10 | 3.10 | 3.10 | 2.90 | 3.00 | 0.10 |
| කොමර්ෂල් ක්‍රෙඩිට් | 186 | 21.60 | 21.50 | 22.80 | 21.50 | 22.10 | 0.50 |
| කොමර්ෂල් ඩිවලොප්මන්ට් | 532 | 100.25 | 100.00 | 100.00 | 100.00 | 100.00 | 0.25 |
| ඩිල්මා සිලෝන් | 1 | 636.75 | 640.00 | 640.00 | 640.00 | 636.75 | 0.00 |
| ඊ-චැනලින් | 16,202 | 5.60 | 5.40 | 5.60 | 5.40 | 5.40 | 0.20 |
| ඒඩ්න් හොටෙල් ලංකා | 32,732 | 10.20 | 10.30 | 10.40 | 9.80 | 10.00 | 0.20 |
| ඇල්පිටිය | 4,050 | 44.00 | 42.80 | 42.80 | 42.70 | 42.70 | 1.30 |
| ඉක්විටි ටූ පී.එල්.සී. | 2,460 | 53.50 | 53.10 | 53.10 | 53.10 | 53.10 | 0.40 |
| ෆෝට්‍රස් රෙසෝට්ස් | 1,114 | 10.00 | 10.00 | 10.10 | 10.00 | 10.10 | 0.10 |
| ගලදාරි | 11,283 | 8.00 | 7.90 | 8.20 | 7.80 | 8.00 | 0.00 |
| ගාඩියන් කැපිටල් | 461 | 28.00 | 27.60 | 27.60 | 27.30 | 27.50 | 0.50 |
| හැටන් | 5,608 | 8.50 | 8.50 | 8.70 | 8.50 | 8.50 | 0.00 |
| එච්. එන්. බී. ෆිනෑන්ස් | 25,000 | 8.00 | 8.20 | 9.00 | 8.20 | 8.90 | 0.90 |
| එච්. එන්. බී. ෆිනෑන්ස් (HNBF X0000) | 3,852 | 7.40 | 6.80 | 7.30 | 6.70 | 6.70 | 0.70 |
| එච්.වී.ඒ. ෆුඩ්ස් | 24,700 | 5.00 | 5.00 | 5.00 | 4.90 | 4.90 | 0.10 |
| ජෙට්වින් සිම්පොනි | 800 | 9.00 | 9.00 | 9.00 | 9.00 | 9.00 | 0.00 |
| කහවත්ත | 193 | 29.00 | 28.00 | 28.00 | 27.30 | 27.70 | 1.30 |
| කීල්ස් ෆුඩ්ස් | 327 | 166.00 | 166.00 | 166.00 | 160.00 | 166.00 | 0.00 |
| කීල්ස් හොටෙල්ස් | 56,311 | 9.60 | 9.50 | 9.50 | 9.40 | 9.50 | 0.10 |
| ලංකෙම් සිලෝන් | 7 | 28.60 | 26.00 | 28.70 | 26.00 | 28.60 | 0.00 |
| ලාෆ් පවර් | 2,500 | 8.90 | 8.80 | 8.80 | 8.60 | 8.60 | 0.30 |
| ලාෆ් පවර් (LPL X0000) | 13,477 | 6.20 | 6.00 | 6.00 | 5.70 | 6.00 | 0.20 |
| ලෝටස් හයිඩ්‍රෝ | 98,939 | 11.70 | 11.80 | 11.90 | 11.60 | 11.70 | 0.00 |
| මහවැලි කොකනට් | 525 | 26.90 | 27.50 | 27.50 | 27.50 | 27.50 | 0.60 |
| මහවැලි රීච් | 11 | 15.00 | 14.90 | 14.90 | 14.80 | 15.00 | 0.00 |
| මාරවිල රෙසෝට්ස් | 2 | 1.90 | 1.80 | 1.80 | 1.80 | 1.90 | 0.00 |
| මස්කෙලිය | 201 | 10.70 | 10.60 | 10.60 | 10.20 | 10.60 | 0.10 |
| මිලේනියම් හවුස් | 3,535 | 5.90 | 6.00 | 6.00 | 6.00 | 6.00 | 0.10 |
| ඔනාලි | 2 | 29.20 | 30.80 | 30.80 | 29.30 | 29.20 | 0.00 |
| ප්ලාම් ගාර්ඩ්න් හොටෙල් | 126 | 23.10 | 28.40 | 28.40 | 26.00 | 28.00 | 4.90 |
| පෙගාසස් හොටෙල් | 100 | 31.70 | 31.00 | 31.00 | 31.00 | 31.00 | 0.70 |
| ප්‍රයිම් ෆයිනෑන්ස් | 25,913 | 12.80 | 13.30 | 13.40 | 12.70 | 13.20 | 0.40 |
| රයිගම් සෝල්ටර්න්ස් | 21,779 | 5.20 | 5.20 | 5.20 | 5.00 | 5.10 | 0.10 |
| රේණුකා කැපිටල්ස් | 31,158 | 6.30 | 6.00 | 6.20 | 5.90 | 6.00 | 0.30 |
| රේණුකා හොටෙල්ස් | 1,001 | 65.00 | 60.00 | 65.00 | 60.00 | 60.00 | 5.00 |
| රිචඩ් පීරිස් එක්ස්පෝර්ට් | 1,512 | 354.25 | 349.50 | 350.00 | 349.50 | 350.00 | 4.25 |
| සෙරන්ඩිබ් ඉංජිනියරින් ගෲප් | 199 | 6.30 | 6.00 | 6.00 | 6.00 | 6.00 | 0.30 |
| සෙරන්ඩිබ් හොටෙල්ස් | 20 | 14.70 | 14.90 | 14.90 | 14.90 | 14.70 | 0.00 |
| සෙරන්ඩිබ් හොටෙල්ස් (SHOT X0000) | 440 | 8.70 | 8.80 | 8.80 | 8.80 | 8.80 | 0.10 |
| සිංගර් ඉන්ඩස්ට්‍රීස් | 400 | 47.00 | 48.00 | 48.00 | 48.00 | 48.00 | 1.00 |
| සිංහ හොස්පිටල්ස් | 139,968 | 2.00 | 2.10 | 2.10 | 1.90 | 1.90 | 0.10 |
| සිංහපුත්‍ර ෆිනෑන්ස් (SFLP0000) | 6,110 | 3.30 | 4.00 | 4.00 | 3.60 | 3.70 | 0.40 |
| සොෆ්ට්ලොජික් | 10,706 | 11.60 | 11.70 | 11.80 | 11.70 | 11.70 | 0.10 |
| සොෆ්ට්ලොජික් කැපිටල් | 43,996 | 3.60 | 3.60 | 3.70 | 3.50 | 3.60 | 0.00 |
| සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් | 2,002 | 9.80 | 10.00 | 10.00 | 9.70 | 10.00 | 0.20 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 283,700 | 32.30 | 33.00 | 33.00 | 32.00 | 32.10 | 0.20 |
| ටී.ඒ.එල්. ලංකා | 4,123 | 12.60 | 12.60 | 12.60 | 10.00 | 12.50 | 0.10 |
| ට්‍රාන්ස් ඒෂියා | 133 | 51.00 | 51.00 | 51.00 | 50.10 | 51.00 | 0.00 |
| උඩපුස්සැල්ලාව | 652 | 21.00 | 21.00 | 21.00 | 21.00 | 21.00 | 0.00 |
| යූනියන් ඇෂුවරන්ස් | 20 | 310.00 | 302.00 | 313.50 | 302.00 | 310.00 | 0.00 |
| වැලිබල් වන් එක්ස් ඩී | 254,706 | 49.70 | 50.70 | 50.70 | 47.50 | 48.00 | 1.70 |
| වොච් ලිස්ට් | | | | | | | |
| ඇනිලානා හොටෙල්ස් | 622,240 | 1.00 | 1.00 | 1.10 | 1.00 | 1.00 | 0.00 |
| බිම්පුත් ෆිනෑන්ස් | 27,814 | 6.80 | 7.20 | 7.20 | 6.60 | 6.60 | 0.20 |
| බ්ලූඩයමන්ඩ්ස් | 3,704,916 | 0.60 | 0.60 | 0.70 | 0.50 | 0.70 | 0.10 |
| බ්ලූඩයමන්ඩ්ස් (Blue-X0000) | 73,616 | 0.30 | 0.30 | 0.40 | 0.30 | 0.30 | 0.00 |
| සිලෝන් ප්‍රින්ටර්ස් | 2 | 51.80 | 57.50 | 57.50 | 51.80 | 51.80 | 0.00 |
| ලංකෙම් ඩිවලොප්මන්ට් | 35,417 | 3.30 | 3.30 | 3.30 | 3.20 | 3.20 | 0.10 |
| මැක්වුඩ්ස් එනර්ජි | 15,027 | 2.70 | 2.60 | 2.70 | 2.60 | 2.60 | 0.10 |
| මුල්ති ෆයිනෑන්ස් | 20 | 7.00 | 7.20 | 7.20 | 7.20 | 7.00 | 0.00 |
| නේෂන් ලංකා | 22,864 | 0.80 | 0.80 | 0.80 | 0.70 | 0.80 | 0.00 |
| ඔෆිස් ඉක්විප්මන්ට් | 25 | 71.20 | 68.00 | 68.00 | 68.00 | 71.20 | 0.00 |
| පැරගොන් | 2 | 48.60 | 58.00 | 58.00 | 42.00 | 48.60 | 0.00 |
| රේඩියන්ට් ජෙම්ස් | 30 | 28.60 | 26.00 | 27.00 | 26.00 | 28.60 | 0.00 |
| සිංහපුත්‍ර ෆිනෑන්ස් | 48,507 | 7.10 | 7.30 | 7.50 | 6.70 | 7.00 | 0.10 |
| ස්ටෑන්ඩර්ඩ් කැපිටල් | 1,102 | 61.80 | 61.90 | 61.90 | 60.00 | 60.00 | 1.80 |
| තෙස් ඇග්‍රෝ | 75,521 | 0.60 | 0.70 | 0.70 | 0.50 | 0.60 | 0.00 |
| තෙස් ඇග්‍රෝ (TESS X0000) | 1 | 0.40 | 0.40 | 0.40 | 0.40 | 0.40 | 0.00 |

**වෙළෙඳපොළ දත්ත**

| කොටස් සම්බන්ධ දත්ත | අද දින | කළින් දින |
|---|---|---|
| පිරිවැටුම් වටිනාකම (රු.) | 853,065,170.15 | 1,227,404,994.25 |
| පිරිවැටුම් ප්‍රමාණය (ගණන) | 38,855,643 | 83,229,179 |
| විකුණුම්කරුවන් (ගණන) | 10,270 | 14,970 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු.) | 3,080,641,200,536.05 | 3,113,500,323,064.70 |

| ආණ්ඩුවේ සුරැකුම් | අද දින | කළින් දින |
|---|---|---|
| පිරිවැටුම් වටිනාකම (රු.) | - | - |
| පිරිවැටුම් ප්‍රමාණය (ගණන) | - | - |
| විකුණුම්කරුවන් (ගණන) | - | - |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු.) | - | - |

| ණය ප්‍රමාණය | අද දින | කළින් දින |
|---|---|---|
| | | 15 - මාර්තු -21 |
| පිරිවැටුම් වටිනාකම (රු.) | | 31,660,800.00 |
| පිරිවැටුම් ප්‍රමාණය (ගණන) | | 326,400 |
| විකුණුම්කරුවන් (ගණන) | | 3 |

| කොටස් දර්ශකය | අද දින | කළින් දින |
|---|---|---|
| මිල දර්ශකය | | |
| සීඑස්ඊ සියලු කොටස් දර්ශකය | 7,044.56 | 7,119.70 |
| එස් ඇන්ඩ් පී එස්එල් 20 දර්ශකය | 2,816.92 | 2,845.51 |
| සමස්ථ ප්‍රතිලාභ දර්ශකය | | |
| සියලුම කොටස්වල ටීආර්අයි දර්ශකය (ඇස්ට්‍රී) | 9,443.23 | 9,543.89 |
| එස් ඇන්ඩ් පී හි ටීආර්අයි එස්එල් 20 දර්ශකය) | 4,646.87 | 4,691.25 |

(එස් ඇන්ඩ් පී එස්එල් 20 (ටී ආර් අයි)

විනිමය අනුපාත 17-03-2021

විනිමය අනුපාත කොළඹ කොමර්ෂල් බැංකුවේ ටෙලිග්‍රැෆික් සේවාවේ දැක්වෙන දත්තයන් ඇසුරිනි.

| | ගැනුම් මිල | විකුණුම් මිල |
|---|---|---|
| අමෙරිකානු ඩොලරය | 195.50 | 202.90 |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | 149.13 | 158.42 |
| බ්‍රිතාන්‍ය පවුම | 270.64 | 282.77 |
| ජපන් යෙන් | 1.7849 | 1.8677 |
| යූරෝ | 231.21 | 242.40 |
| සිංගප්පූරු ඩොලරය | 144.34 | 151.54 |
| කුවේට් ඩිනාර් | 593.58 | 672.12 |
| ඕමාන් රියාල් | 495.38 | 527.03 |
| සවුදි රියාල් | 50.36 | 55.27 |
| එක්සත් අරාබි එමීර් ඩිරාම් | 51.68 | 56.47 |
| භූතාන් ඩිනාර් | 455.28 | 538.20 |

## තැරැව්කරුවන්ගේ කාර්යභාරය

කොටස් වෙළෙඳපොළෙහි මූල්‍ය අතරමැදිකරණය ඉටුකිරීම හෙවත් සේවා සපයන පාර්ශ්වය තැරැව්කාර ආයතන ලෙස හැඳින්වෙයි. කොටස් තැරැව්කාර ආයතන යනු නීතියට අනුකූලව සුරැකුම්පත් වෙළෙඳපොළේ ක්‍රියාකාරකම්වල යෙදෙන හවුල් ව්‍යාපාර සමාගමක් ලෙස ස්ථාපනය කරන ලද නෛතික ආයතනයකි. ඕනෑම රටක තැරැව්කාර කටයුතුවල නියුක්ත වන්නාවූ පුද්ගලයකුට නැතිනම් ආයතනයකට සුරැකුම්පත් හා සම්බන්ධ කොමිෂන් සභාවක අනුමැතිය නොමැතිව කටයුතු කිරීමට හැකියාවක් නැත. කොටස් වෙළෙඳපොළ කටයුතු සඳහා සහයෝගය ලබාදෙන පාර්ශ්වයන් හෙවත් තැරැව්කරුවන් brokers සහ jobbers ලෙස හඳුන්වයි. මෙම දෙපාර්ශවයම කොටස් අලෙවිකරණ කටයුතු සඳහා සම්බන්ධ වේ.

| බෙ.අ.02 (නැගෙනහිර) | DGM [E]/QPPC/21/108<br>විදුලි අධිකාරී (පොතුවිල් විදුලි පාරිභෝගික සේවා මධ්‍යස්ථානය -අම්පාර) ගේ රාජකාරී කටයුතු සඳහා වෑන් රථයක් වසර 02 ක් සඳහා කුලියට ලබා ගැනීම | 31/03/2021<br>14.00 පැය | ප්‍රධාන ඉංජිනේරු (අම්පාර )කාර්යාලය 063-2222387, 063-2222078 හෝ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර කාර්යාලය) ත්‍රිකුණාමලය 026-2222666, 026-2221030 | 1,000.00 | NCB |
| බෙ.අ.02 (නැගෙනහිර) | DGM [E]/QPPC/21/109<br>විදුලි අධිකාරී (වාණිජ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය ත්‍රිකුණාමලය ගේ රාජකාරී කටයුතු සඳහා වෑන් රථයක් වසර 02 ක් සඳහා කුලියට ලබා ගැනීම. | 31/03/2021<br>14.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර කාර්යාලය) ත්‍රිකුණාමලය 026-2222666, 026-2221030 | 1,000.00 | NCB |
| බෙ.අ.02 (බපළ) | WPN/KEL/EC 2/CLEANING CSC/2021/01<br>දෙල්ගොඩ, කිරිල්ලවල හා මාවරමංඩිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානවල දෛනික පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම සඳහා වසරක කොන්ත්‍රාත් පදනම මත පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනීම | 31/03/2021<br>14.00 පැය | ප්‍රධාන විදුලි ඉංජිනේරු (කැලණිය) කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, 624, නුවර පාර, ඇල්දෙණිය, කඩවත. දු.ක : 0112 925880 ෆැක්ස්:0112925885 | 500.00 | NCB |
| බෙ.අ.02 (බපළ) | WPN/FA/CEP/MV-LV (Pole Lines)/2021-2022<br>මධ්‍යම අධිවෝල්ට් ව්‍යාපෘතිය- බපළ වෙනුවෙන් 2021/2022 වර්ෂ සඳහා මධ්‍යම වෝල්තතා හා අඩුසැර රැහැන් මාර්ග ඉදිකිරීම, උපපොළ සහ විවිධ උපකරණ සවි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම (ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තුව රු. 5,000.00) | 31/03/2021<br>14.00 පැය | ව්‍යාපෘති කළමනාකරු ( මධ්‍යම අධිවෝල්ට් ව්‍යාපෘතිය- බපළ) කාර්යාලය, ලං.වි.ම., නො. 18/37, සූරිගම, කඩවත, දු.ක. 011-2975349 | 500.00 | NCB |
| බෙ.අ.02 (බපළ) | WPN/FA/CEP/MV (Tower Lines)/2021-2022<br>මධ්‍යම අධිවෝල්ට් ව්‍යාපෘතිය- බපළ වෙනුවෙන් 2021/2022 වර්ෂ සඳහා ද.වෝ. 33 කුළුණු රැහැන් මාර්ගයන්හී පාදම ඉදිකිරීම, කුළුණු නැංවීම සහ රැහැන් ඇදීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම (ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තුව රු. 5,000.00) | 31/03/2021<br>14.00 පැය | එම | 500.00 | NCB |
| බෙ.අ.02 (බපළ) | WPN/FA/CEP/MV-LV (UG Lines)/2021-2022<br>මධ්‍යම අධිවෝල්ට් ව්‍යාපෘතිය- බපළ වෙනුවෙන් 2021/2022 වර්ෂ සඳහා මධ්‍යම වෝල්තතා හා අඩුසැර යටි බහන් මාර්ග ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම (ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තුව රු. 5,000.00) | 31/03/2021<br>14.00 පැය | එම | 500.00 | NCB |
| බෙ.අ.02 (ව්‍යා.හා අ.සැ.න.) | PHM DD2/DGM/EE(MC&S) /DPC/2020/51<br>වාලච්චේන ගබඩාව සඳහා වසරක කාලයකට ගිනි අවි රහිත පෞද්ගලික ආරක්ෂක සේවයක් සැපයීම - ආරක්ෂක සුපරීක්ෂක - 02යි, ආරක්ෂක නියාමකයන් - 05යි | 07/04/2021<br>14.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යා.හා අ.සැ.න.) කාර්යාලය, බෙදහැරීම් අංශය 2 ලංකා විදුලිබල මණ්ඩලය, තැ.පෙ.18,ළමාගාරය පාර,මහනුවර දුරකථන : 081 2222286/87, ෆැක්ස් : 081 2222286/87 | 1,000.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 02) | CP2/CE(COM)/PPC/2021/025<br>ප්‍රධාන ඉංජිනේරු(සැ. හා සං.) -මධ්‍යම පළාත 2සඳහා ප්ලොටර් යන්ත්‍රයක් මිලදී ගැනීම | 07/04/2021<br>14.00 පැය | ප්‍ර.ඉ. (වාණිජ) - මප 02 කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, ගල්වල පාර, ඊරියගම, පේරාදෙණිය. දු.අ. 081-4949160 | 500.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 02) | CP2/CE(COM)/PPC/2021/037<br>කෑගල්ල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු බලප්‍රදේශයට අයත් මොරොන්තොටවි.පා.සේ.මධ්‍යස්ථානය සඳහා භූමියක් කුලී/බදු පදනම මත වසර 02ක කාලයකට ලබා ගැනීම. සපුරාලිය යුතු අවශ්‍යතා: මොරොන්තොට ප්‍රදේශය තුළ විය යුතුයි, ගොඩනැගිල්ල අවම වශයෙන් ව.අ. 2000කට නොඅඩු විය යුතුය, ලොරි රථ 02ක් හා ද්විත්ව කාර්ය වාහන 03ක් නවතා තැබීමේ හැකියාව තිබිය යුතුය, ජලය, විදුලිය, මාර්ග පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් තිබිය යුතුය, ප්‍රධාන මාර්ගයේ සිට පහසුවෙන් පිවිසිය හැකිවීම, ගොඩනැගිල්ල පිහිටි ඉඩම වටා ආරක්ෂිත වැටක් හෝ තාප්පයක් ඉදිකර තිබීම අමතර සුදුසුකමකි. | 07/04/2021<br>14.00 පැය | ප්‍ර.ඉ. (වාණිජ) - මප 02 කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, ගල්වල පාර, ඊරියගම, පේරාදෙණිය. දු.අ. 081-4949160 | - | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 02) | CP2/CE(COM)/PPC/2021/038<br>කුලී පදනම මත වාහන ලබා ගැනීම ලං. වි.ම. (මධ්‍යම පළාත 02) - ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු(මාවනැල්ල) බල ප්‍රදේශයේ වාණිජඋප ඒකකය සඳහා වසර දෙකක කාලයකට ත්‍රී රෝද රථයක් ලබා ගැනීම | 07/04/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 02) | CP2/CE(COM)/PPC/2021/039<br>ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු(පේරාදෙණිය) කාර්යාලයේ නාය යෑම වැලැක්වීම සඳහා - අදියර 11 | 07/04/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 01) | CP1/CE(COM)/PPC/2020/048<br>ගලගෙදර ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු බලප්‍රදේශයට අයත් නුගවෙල පා.සේ.මධ්‍යස්ථානය සඳහා කුලී පදනම මත වසර 02ක කාලයකට මෝටර් වෑන් රථයක් ලබා ගැනීම . | 07/04/2021<br>14.00 පැය | ප්‍ර. ඉ. (වාණිජ) කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, අස්ගිරිය පාර, මහනුවර. දු.අ. 081-2234324 / 081-2234000 | 1,000.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 01) | CP1/CE(COM)/PPC/2020/050<br>කුණ්ඩසාලේ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු බල ප්‍රදේශයට අයත් බත්ගම්පොළ උප පා.සේ.මධ්‍යස්ථානය සඳහා කුලී පදනම මත වසර 02ක කාලයකට සැහැල්ලු ලොරි රථයක් ලබා ගැනීම . | 07/04/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 01) | CP1/CE(COM)/PPC/2020/051<br>කටුගස්තොට ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයේ වාණිජ උප ඒකකය සඳහා කුලී පදනම මත වසර 02ක කාලයකට වෑන් රථයක් ලබා ගැනීම . | 07/04/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 01) | CP1/CE(COM)/PPC/2020/052<br>කටුගස්තොට ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයේ නඩත්තු උප ඒකකය සඳහා කුලී පදනම මත වසර 02ක කාලයකට කෲ කැබ් රථයක් ලබා ගැනීම . | 07/04/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 01) | CP1/CE(COM)/PPC/2020/053<br>ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු (දඹුල්ල) සඳහා කුලී පදනම මත වසර 02ක කාලයකට මෝටර් කාර් රථයක් ලබා ගැනීම . | 07/04/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 01) | CP1/CE(COM)/PPC/2020/054<br>ප්‍රධාන ඉංජිනේරු (නැතිම්) ම.ප.01 ඒකකය සඳහා කුලී පදනම මත වසර 02ක කාලයකට සැහැල්ලු ලොරි රථයක් ලබා ගැනීම . | 07/04/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 01) | CP1/CE(COM)/PPC/2020/055<br>ප්‍රධාන ඉංජිනේරු (බෙදහැරීම් නඩත්තු ) ඒකකය සඳහා කුලී පදනම මත වසර 02ක කාලයකට 4WD ඩබල් කැබ් රථයක් ලබා ගැනීම . | 07/04/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 01) | CP1/CE(COM)/PPC/2020/062<br>දඹුල්ල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයට අනුයුක්ත නා උල උප ඒකකයේ විදුලි අධිකාරී සඳහා බදු/කුලී පදනම මත නිල නිවාසයක් ලබා ගැනීම.ගොඩනැගිල්ල අවම වශයෙන් වර්ග අඩි 1500කින් යුක්ත වීම,නාඋල උප ඒකකයට ආසන්නයේ පිහිටා තිබීම, ජලය, විදුලිය, මාර්ග පහසුකම් තිබිය යුතු වීම, වාහන 02ක් නවතා තැබිය හැකි වීම. | 07/04/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 01) | CP1/CE(COM)/PPC/2020/063<br>ප්‍රධාන ඉංජිනේරු (බලශක්ති කළමනාකරණ) ම.ප.-01 ඒකකයට අයත් ද්‍රව්‍ය ගබඩා කර තැබීම සඳහා අදල වැඩ කණ්ඩායම් හා මණ්ඩලීය වාහන නවතා තැබීම සඳහා බදු/කුලී පදනම මත ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් ලබා ගැනීම.ගොඩනැගිල්ල අවම වශයෙන් වර්ග අඩි 1500කින් යුක්ත වීම,ජලය හා විදුලිය තිබිය යුතු අතර, වැසිකිළි 02ක් හෝ වැඩි ප්‍රමාණයක් සහ අනෙකුත් සනීපාරක්ෂක පහසුකම් තිබිය යුතුය, නිරවුල් ප්‍රවේශ මාර්ග තිබිය යුතුය, කෲ කැබ් 02ක් හා ඩබල් කැබ් 02ක් පමණ ගාල් කර තැබීමට ඉඩ ඇති බිම් කොටසක් තිබිය යුතුය,මහනුවර නගරයට ආසන්න ස්ථානයක් විය යුතුය, අදළ භූමිය ආරක්ෂක වැටකින් ආවරණ ය කර තිබිය යුතුය. | 07/04/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.02 (මධ්‍යම 01) | CP1/CE(COM)/PPC/2020/064<br>දඹුල්ල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු නිල නිවස සඳහා බදු/කුලී පදනම මත නිල නිවාසයක් ලබා ගැනීම. ගොඩනැගිල්ල වර්ග අඩි 2000 සහිතව අවම කාමර 03ක් සහිත දඹුල්ල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයට ආසන්නයේ පිහිටා තිබිය යුතුය, ගේට්ටුවක් සහිතව වැටක්/තාප්පයක් භූමිය වටා තිබිය යුතුය, ජලය, විදුලිය, දුරකථන මාර්ග පහසුකම් තිබිය යුතු වීම,වාහන 02ක් නවතා තැබිය හැකි පහසුකම් තිබිය යුතුය | 07/04/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.03 (සබරගමුව) | SAB/EM-V06/HV/2021/27<br>ප්‍රධාන ඉංජිනේරු (බලශක්ති කළමනාකරණ) ඒකකයට අයත් ඇහැලියගොඩ උප ඒකකයේ රාජකාරී කටයුතු සඳහා වෑන්(ද්විත්ව කාර්යය) රථ 1 ක් කුලී පදනම මත ලබා ගැනීම. | 07/04/2021<br>14.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සබරගමුව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය, ලං.වි.ම., නවනගරය, රත්නපුර. 045-2225891-5 ෆැක්ස් - 045-2226084 | 1,000.00 | NCB |

| | | | | | |
|---|---|---|---|---|---|
| බෙ.අ.03 (සබරගමුව) | SAB/RAT-V79/HV/2021/28<br>විදුලි ඉංජිනේරු (රත්නපුර) ඒකකයේ රාජකාරි කටයුතු සඳහා ත්‍රී රෝද රථ 1 ක් කුලී පදනම මත ලබා ගැනීම. | 07/04/2021 14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.03 (සබරගමුව) | SAB/EM-V77/HV/2021/29<br>ප්‍රධාන ඉංජිනේරු (බලශක්ති කළමනාකරණ) ඒකකයට අයත් රත්නපුර වැඩ කණ්ඩායමහි රාජකාරි කටයුතු සඳහා වෑන් (ද්විත්ව කාර්යය) රථ 1 ක් කුලී පදනම මත ලබා ගැනීම. | 07/04/2021 14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.03 (සබරගමුව) | SAB/DM-V66/HV/2021/30<br>ප්‍රධාන ඉංජිනේරු (බෙදාහැරීම් නඩත්තු) ඒකකයට අයත් ඇඹිලිපිටිය වැඩ කණ්ඩායමහි රාජකාරි කටයුතු සඳහා වෑන් (ද්විත්ව කාර්යය) රථ 1 ක් කුලී පදනම මත ලබා ගැනීම. | 07/04/2021 14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.03 (සබරගමුව) | SAB/DM-V61/HV/2021/31<br>ප්‍රධාන ඉංජිනේරු (බෙදාහැරීම් නඩත්තු) ඒකකයට අයත් රත්නපුර II වැඩ කණ්ඩායමහි රාජකාරි කටයුතු සඳහා 4WD ඩබල් කැබ් රථ 1 ක් කුලී පදනම මත ලබා ගැනීම. | 07/04/2021 14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ.03 (ඌව) | DGM(UVA)/CE(COM)/DEO1/HV-117/DI-11/2K21/12<br>විදුලි ඉංජිනේරු (දියතලාව) ඒකකයේ වාණිජ උප ඒකකයේ විදුලිය විසංධි කිරීමේ කණ්ඩායම් 01 සඳහා කුලී පදනම මත වසර දෙකක් සඳහා ත්‍රී රෝද රථයක් ලබාගැනීම | 07/04/2021 15.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල. දූ.ක : 0552222474 | 500.00 | NCB |
| බෙ.අ.03 (ඌව) | DGM(UVA)/CE(COM)/DEO1/HV-126/DI-12/2K21/13<br>විදුලි ඉංජිනේරු (දියතලාව) ඒකකයේ වාණිජ උප ඒකකයේ විදුලිය විසංධි කිරීමේ කණ්ඩායම් 02 සඳහා කුලී පදනම මත වසර දෙකක් සඳහා ත්‍රී රෝද රථයක් ලබාගැනීම | 07/04/2021 15.00 පැය | එම | 500.00 | NCB |
| බෙ.අ.03 (ඌව) | තිසා(ඌව)/ප්‍රඉ(වාණිජ)/නිල නිවාස/සි6/2කේ21/02<br>වැල්ලවාය නගරය අවට්න් විදුලි අධිකාරි (වැල්ලවාය) සඳහා නිවසක් බද්දට ලබාගැනීම | 07/04/2021 15.00 පැය | ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, වැල්ලවාය පාර, මොණරාගල දූ.ක : 0552277350 | 500.00 | NCB |
| ව්‍යාපෘති අංශය (PSRSP) | PSRSP/PM4/TENDERS/2021/04<br>බලශක්ති පද්ධති විශ්වාසනීයව සවි බලගැන්වීමේ ව්‍යාපෘති කාර්යාලය (PSRSP) - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 4 සඳහා වර්ග අඩි 2,500ක ඉඩකින් යුත් අවම වශයෙන් ඩබල් කැබ් රථ 8ක් නවතා තැබීමේ පහසුකම් සහිත ගොඩනැගිල්ලක් ශ්‍රී ජයවර්ධනපුර ප්‍රදේශය අවට්න් (පැලවත්ත හංදියේ සිට කි.මී2 ක අරිය දුරක් ඇතුළත) වසර 03ක කාලයක් සඳහා කුලී පදනම මත ලබා ගැනීමට | 31/03/2021 10.00 පැය | ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය, බලශක්ති පද්ධති විශ්වාසනීයව සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය, ලංකා විදුලිබල මණ්ඩලය, 759, තලංගම දකුණ පැලවත්ත. 0112 888495/6 ,071 399 1727 | මුදල් අය නොකෙරේ | NCB |

ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන් සපයාගැනීම් කමිටුවේ සභාපති විසින් හැකියාවැති සැපයුම්කරුවන් වෙතින්, ජාත්‍යන්තර / ජාතික තරගකාරී ලංසු ඉදිරිපත් කිරීමේ පදනම මත මුද්‍ර, තබන ලද ලංසු කැඳවන අතර,එම ලංසු ඉදිරිපත් කළ යුත්තේ ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් මිලදී ගන්නා ලද ලංසු පොත් පමණක් උපයෝගී කරගෙනය.

අපේක්ෂිත ලංසු ඉදිරිපත් කරන්නන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට පමණක් ලංසු පොත් නිකුත් කරනු ලැබේ. අවශ්‍ය වූ විටක ඔවුන් 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුකූලව ලියාපදිංචි විය යුතුය.

ලංසු භාර ගන්නා අවසාන දිනයට කලින් දින දක්වා සෑම ලංසු පොතක් වෙනුවෙන්ම ඉහත 6 වන තීරුවේ සඳහන් මුදල ගෙවා ලංකා විදුලිබල මණ්ඩලයේ අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / ප්‍රධාන ඉංජිනේරු වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මගින් 0900 පැය සිට 1500 පැය දක්වා සාමාන්‍ය වැඩ කරන දිනයන් තුළ මිලදී ගත හැක. මේ සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී නමින් ලියන ලද බැංකු අණකරයක් මගින් හෝ මුදල් මගින් හෝ ගෙවිය හැක.

විදේශීය තානාපති කාර්යාල /වෙළඳ කොමිෂන්වලට, ලංසු පොත්වල තොරතුරු පිටපත් ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ දී නොමිලේ ලබා ගත හැක. එමෙන්ම ලංසු පොත් අපේක්ෂිත ලංසු ඉදිරිපත් කරන්නන් හා ඔවුන්ගේ නියෝජිතයින්ට අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කළ හැක.

ලංසු ඉදිරිපත් කරන්නන් හෝ ඔවුන්ගේ අනුමැතියලත් නියෝජිතයින් ඉදිරිපිටදී ඉහත තීරු අංක 9 හි සඳහන් ස්ථානයන්හිදී ලංසු භාරගැනීම අවසන් කරන වේලාවේදීම, එසේ ඉදිරිපත් කරන ලද සියලුම ලංසු විවෘත කරනු ලබන අතර, ප්‍රමාදව ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මීට අදාළ සියලු විස්තර හා පැහැදිලි කිරීම් විමසිය යුත්තේ ලංසු පොත් නිකුත් කරනු ලබන ලංකා විදුලිබල මණ්ඩලයේ අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන ඉංජිනේරු වෙතිනි.

✷ ICB - **අන්තර්ජාතික තරගකාරී ලංසු**, NCB - **දේශීය තරගකාරී ලංසු**

**සාමාන්‍යාධිකාරී**

**විදුලිබලයෙන් සැසිරීමත් දිවියක්**

ටෙන්ඩර් අයිතමයන් සඳහා අදාළ තොරතුරු පිටපත් **www.ceb.lk** නිල වෙබ් අඩවියෙන් භාගත කරගැනීමට හැකිය.

# ලංසු සඳහා ආරාධනයයි

## අධ්‍යාපන අමාත්‍යාංශය

## රුහුණ විශ්වවිද්‍යාලය

## උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමේ හා සංවර්ධනය කිරීමේ කඩිනම් ව්‍යාපාරය - (AHEAD)

**රුහුණ විශ්වවිද්‍යාලය සඳහා ගෘහ භාණ්ඩ, විද්‍යාගාර උපකරණ හා සූර්ය බලශක්ති පද්ධතියක් සපයා, ගෙනැවිත් භාරදී, ස්ථාපිත කොට, ක්‍රියාත්මක කොට, පරීක්ෂා කිරීම**

**ලංසු ආරාධනා අංක : AHEAD/RUH/STEM03/GOODS/2021/01**

01. රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, පහත වගුවේ ලැයිස්තු ගත කොට ඇති අයිතම ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම් ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| පැකේජ අංකය | අයිතම අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය | ලංසු ඇපකරය - රුපියල් - | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු - රුපියල් - |
|---|---|---|---|---|---|
| **01. ගෘහ භාණ්ඩ** | 1.1 | දේශනශාලා මේස | 72 | 283,500.00 | 5,600.00 |
| | 1.2 | දේශනශාලා බංකු | 72 | | |
| | 1.3 | ද්‍රවමය පරිගණක මේස | 70 | | |
| | 1.4 | පරිගණක පුටු | 70 | | |
| | 1.5 | විභාග මේස | 300 | | |
| **02. විද්‍යාගාර උපකරණ** | 2.1 | EDSPOT GALVANOMETER | 10 | 42,000.00 | 1,250.00 |
| | 2.2 | ICE FLAKE MAKER MACHINE (120L) | 01 | | |
| **03. වෙනත්** | 3.1 | සූර්ය බලශක්ති පද්ධතියක් | 01 | 172,500.00 | 4,000.00 |

02. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. ආපසු ගෙවනු නොලබන ගාස්තු ඉහත වගුවේ සඳහන් වටිනාකමට මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ සරප් වෙත මුදලින් ගෙවීමෙන් හෝ විශ්වවිද්‍යාලයට අයත්, මහජන බැංකුවේ පවත්නා ගිණුම් අංක – 032100112477589 වෙත තැන්පත් කොට ලබාගත් බැංකු ලදුපත සමග මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ – ප්‍රසම්පාදන, මෙහෙයුම් තාක්ෂණ ලේකම් කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, රාජකාරී දිනවල 09.00 පැය හා 15.00 පැය අතර කාලය තුළ 2021 අප්‍රේල් 05 දින දක්වා, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

04. ලංසු, 2021 ජූලි 08 දින දක්වා වලංගු විය යුතුය.

05. සියලුම ලංසු සමග ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පිළිගත හැකි වාණිජ බැංකුවකින් නිකුත් කළ අදාළ ලංසු පැකේජවලට අදාළව වූ කොන්දේසි විරහිත ලංසු ඇපකරය බැගින් තිබිය යුතුය.

06. අදාළ ලංසු ඇපකරය, 2021 අගෝස්තු 05 වන දින දක්වා වලංගු, මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති නමට ගත් එකක් විය යුතුය.

07. ලංසු භාරගැනීම 2021 අප්‍රේල් 08 දින පස්වරු 1.00 ට අවසන් කරනු ලැබේ.

08. යථා පරිදි සම්පූර්ණ කොට මුද්‍රා තැබූ ලංසු, ලියාපදිංචි තැපෑලෙන් **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර** යන ලිපිනයට එවීමෙන් හෝ මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති **"ටෙන්ඩර් පෙට්ටි අංක 2"** හි තැන්පත් කිරීමෙන්, අදාළ ඉහත සඳහන් අවසාන දිනයට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ ප්‍රසම්පාදන නාමය, අංකය හා පැකේජ අංකය සඳහන් කළ යුතුය.

09. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

10. අගැයුම් කටයුතු එක් එක් අයිතමය පදනමින් සිදු කෙරෙනු ඇත.

11. ලැබී ඇති ලංසු, 2021 අප්‍රේල් 08 දින පස්වරු 1.00 ට, මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන කාමරයේදී, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගේ ඉදිරියේ විවෘත කරනු ලැබේ.

12. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ – ප්‍රසම්පාදන, මෙහෙයුම් තාක්ෂණ ලේකම් කාර්යාලය වෙතින් ලබාගත හැක. දුරකථන – 041–2227027, 041–2222681, දිගුව – 2151, ඉහත ලිපිනයේදී කාර්යාල වේලාවන් තුළදී අදාළ ලංසු ලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර.**
**2021 මාර්තු 17**

# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO)

**රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

## ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)

**අරමුදල් සැපයීම - ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB)**

**ණය අරමුදල් අංක - L0124A, රට : ශ්‍රී ලංකාව**

**කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට - දැරණියගල නූරි පාරේ අංක 5/11 හා 5/13 බෝක්කු අතරතුර, කෑගල්ල දිස්ත්‍රික්කයේ LHS අරණායක - හුලංකපොල්ල පාර දක්වාත් මහනුවර දිස්ත්‍රික්කයේ දිගන කුණ්ඩසාලේ හා දංගොල්ල පහළ රවුම් පාර - පැකේජය 4B දක්වාත් නායයෑම් අවදානම අවම කිරීමේ වැඩ.**

**යෝජනා සඳහා ඉල්ලීම් යොමු අංකය : RLVMMP/WORKS/04B**

1. ශ්‍රී ලංකා රජය විසින්, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) වෙතින්, ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘති (RLVMMP) පිරිවැය සඳහා මුදල් යෙදවීමක් දැනටමත් ලබාගෙන ඇති අතර, ඉන් කොටසක්, කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට දැරණියගල නූරි පාරේ අංක 5/11 හා 5/13 බෝක්කු අතරතුර - කෑගල්ල දිස්ත්‍රික්කයේ LHS අරණායක - හුලංකපොල්ල පාර දක්වාත්, මහනුවර දිස්ත්‍රික්කයේ දිගන කුණ්ඩසාලේ හා දංගොල්ල පහළ රවුම් පාර, පැකේජය 4B දක්වාත් නාය යෑම් අවදානම අවම කිරීමේ වැඩ සඳහා වන කොන්ත්‍රාත්තු යටතේ වන ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂිත අතර, එහි ඇස්තමේන්තුගත පිරිවැය **(වැට් හා අවිනිශ්චිතතා හැර) ශ්‍රී ලංකා රුපියල් මිලියන 238 (ඇමරිකන් ඩොලර් මිලියන 1.2)** වේ.

2. ඒ අනුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, සුදුසුකම්ලත් ටෙන්ඩර්කරුවන් වෙතින් මහනුවර හා කෑගල්ල දිස්ත්‍රික්කවල ඉහත සඳහන් කාර්ය ඉටු කිරීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර් කැඳවනු ලැබේ. (එනම් කෑගල්ල දිස්ත්‍රික්කයේ අංක 5/11 හා 5/13 බෝක්කු අතරතුර දෙහිඕවිට - දැරණියගල නූරි පාර හා LHS අරණායක හුලංකපොල්ල පාර, මහනුවර දිස්ත්‍රික්කයේ දිගන කුණ්ඩසාලේ හා දංගොල්ල පහළ රවුම් පාර, පැකේජය 4B). මෙම කොන්ත්‍රාත්තුව සඳහා ඉදිකිරීම් කාලය **ලිත් දින 365** වන අතර, දෝෂ වගකීම් කාලය අදාළ ඉදිකිරීම් සම්පූර්ණ කිරීමෙන් පසු **දින 365** ක් වේ.
කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරුවා අපලේඛන ගතවූ ප්‍රතික්ෂේපිත වූ අයකු නොවිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය.

   අ) දේශීය ටෙන්ඩර්කරුවන්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (සීඩා / ඉක්ටැඩ්) (මින් පෙර ඉක්ටැඩ් ලෙස හැඳින්විය) C3 හෝ ඉහළ ශ්‍රේණියක ගොඩනැගිලි හා සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ හෝ SP1 ශ්‍රේණියේ පාංශු වැරගැන්වීම හා ස්ථාපිතකරණය යටතේ වලංගු ලියාපදිංචිය සතු අය විය යුතුය. යම් විදේශ කොන්ත්‍රාත්කරුවකු හට ප්‍රධාන / නියමුවන පාර්ශවය ලෙස යම් "ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක්" ඉටුකිරීමට අවශ්‍යවනුයේ නම්, තම ටෙන්ඩරය පිළිගත් පසු, තාවකාලික ලියාපදිංචි සහතිකයක් ලබාගත යුතුය. මේ සඳහා, කරුණාකර 2018-08-23 දිනැති අංක 2085/19 දරන ගැසට් පත්‍රයේ "විදේශ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම" වෙත යොමුකරන්න. මෙය, www.documents.gov.lk වෙතින් බාගත කළ හැක. වැඩිදුර විස්තර සඳහා www.cida.gov.lk වෙත යොමුවන්න.

   ආ) පහත සඳහන් ප්‍රධාන නිපුණතා සහිත සුදුසුකම්ලත් ටෙන්ඩර්කරුවන් පමණක් මෙම ටෙන්ඩරයට සහභාගි විය යුතුවේ.

**අ) මූල්‍ය**

i. ටෙන්ඩර්කරු විසින්, මෙම කොන්ත්‍රාත්තුව / කොන්ත්‍රාත්තු සඳහා ඇස්තමේන්තුගත කොට ඇති ඉදිකිරීම් මුදල් ප්‍රවාහ අවශ්‍යතා වන ශ්‍රී ලංකා රුපියල් මිලියන 65 **(ඇමරිකන් ඩොලර් මිලියන 0.33) ක** මුදල ආවරණය කිරීම සඳහා අවශ්‍ය ද්‍රවශීල වත්කම්, බැඳීම් නොමැති සත්‍ය වත්කම් ණය මාර්ග හා වෙනත් මූල්‍ය මාර්ග (කොන්ත්‍රාත්තුමය අත්තිකාරම් ගෙවීම් හැර) සතු බවට ප්‍රදර්ශනය කළ යුතුය. මේවා ටෙන්ඩර්කරුගේ අනෙකුත් වගකීම්වලින් තොර ඒවා විය යුතුය.

ii. තවද, ටෙන්ඩර්කරු විසින්, දැනට කෙරෙමින් පවත්නා හා අනාගත කොන්ත්‍රාත් වගකීම් සඳහා වන මුදල් ප්‍රවාහ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රභව තමන් සතු බවට සේවායෝජකගේ සෑහීමට පත්වන ලෙස ප්‍රදර්ශනය කළ යුතුය.

iii. පසුගිය වසර 5 තුළ, විගණනය කළ ශේෂපත්‍ර හෝ ටෙන්ඩර්කරුගේ රටෙහි නීතිවලට අවශ්‍ය නොවේනොත් සේවා යෝජකහට පිළිගත හැකි වෙනත් මූල්‍ය ප්‍රකාශ (2015 - 2016 සිට 2019 - 2020 දක්වා) ඉදිරිපත් කළ යුතු අතර, ටෙන්ඩර්කරුගේ වර්තමාන මූල්‍ය තත්ත්වයේ ස්ථාවර භාවය ප්‍රදර්ශනය කළ යුතු අතර, අපේක්ෂිත දිගුකාලීන ලාභත්ව සම්බන්ධයෙන් සඳහන් කළ යුතුය. (අවම අවශ්‍යතාවය ලෙස ටෙන්ඩර්කරුගේ, මුළු වත්කම් හා මුළු වගකීම්වල වෙනස ලෙස ගණනය කළ ශුද්ධ වටිනාකම ධනාත්මක විය යුතුය. ඍණාත්මක ලාභාංශ තත්ත්වයන් හේතුවෙන් ටෙන්ඩරය ප්‍රතික්ෂේප වීමට අවකාශ ඇත.)

iv) පසුගිය වසර පහ තුළ (2015 ජනවාරි 01 දින සිට) පවත්වාගත් ඉදිකිරීම් කාර්යයන්හි වාර්ෂික පිරිවැටුමේ සාමාන්‍යය අවම වශයෙන් **ශ්‍රී ලංකා රුපියල් මිලියන 408 (ඇමරිකන් ඩොලර් මිලියන 2.05)** විය යුතුය.

**ආ) ඉදිකිරීම් පළපුරුද්ද**

**සාමාන්‍ය පළපුරුද්ද :**

(i) අවම වශයෙන් පසුගිය වසර 05 තුළ (2016 ජනවාරි 1 දින සිට ආරම්භව) ප්‍රධාන කොන්ත්‍රාත්කරු, බද්ධ ව්‍යාපාර සාමාජික, උප කොන්ත්‍රාත්කරු හෝ කළමනාකරණ කොන්ත්‍රාත්කරු ලෙසට ඉදිකිරීම් කොන්ත්‍රාත් යටතේ පළපුරුද්ද.

**විශේෂිත පළපුරුද්ද**

(ii) 2011 ජනවාරි 1 දින සිට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි අවසන් දිනය දක්වා කාලය තුළ, ප්‍රධාන කොන්ත්‍රාත්කරු, බද්ධ ව්‍යාපාර සාමාජික, කළමනාකරණ කොන්ත්‍රාත්කරු හෝ උප කොන්ත්‍රාත්කරු ලෙස, අවම වටිනාකම **ශ්‍රී ලංකා රුපියල් මිලියන 197 (ඇමරිකන් ඩොලර් මිලියන 0.98)** වූ සාර්ථකව හෝ ප්‍රමාණාත්මකව නිමකළ එක් කොන්ත්‍රාත්තුවක් ඉටු කිරීම.

**හෝ**

2011 ජනවාරි 1 දින සිට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි අවසන් දිනය දක්වා කාලය තුළ, ප්‍රධාන කොන්ත්‍රාත්කරු, බද්ධ ව්‍යාපාර සාමාජික, කළමනාකරණ කොන්ත්‍රාත්කරු හෝ උප කොන්ත්‍රාත්කරු ලෙසට, සමාන ඉදිකිරීම් තාක්ෂණ ශිල්පී ක්‍රම මත එක්වරම සම්පූර්ණ කළ, මුළු වටිනාකම **ශ්‍රී ලංකා රුපියල් මිලියන 197 (ඇමරිකන් ඩොලර් මිලියන 0.98)** කට වැඩි හෝ සමානවූ අවම අගයෙන් උපරිම කොන්ත්‍රාත් 03 ක් සතුටුදායක ලෙස හා ප්‍රමාණාත්මකව සම්පූර්ණ කොට තිබීමද සලකා බැලෙනු ඇත;

(iii) 2011 ජනවාරි 1 වන දින හා අයදුම්පත් භාර ගනු ලබන අවසාන දිනය අතර කාලය තුළ, ප්‍රධාන කොන්ත්‍රාත්කරු, බද්ධ ව්‍යාපාර සාමාජික හෝ උප කොන්ත්‍රාත්කරු ලෙස ඉහත සඳහන් හා අනෙකුත් කොන්ත්‍රාත් (ප්‍රමාණාත්මකව සම්පූර්ණ කළ හෝ කෙරෙමින් පවත්නා) වල, සඳහන් කාලයේ එක් වර්ෂයක් තුළ, පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම්වල අවම ඉදිකිරීම් පළපුරුද්ද තිබිය යුතුය;

- පාංශු වැරගැන්වීම / පාංශු ඇණ සවිකිරීම හා ආශ්‍රිත කාර්ය ඉදිකිරීම් : **වසරකට 480m**
- තිරස් කානු ඉදිකිරීම : **වසරකට 300m**

**ඇ) ප්‍රධාන උපකරණ හා කාර්ය මණ්ඩලය**

ටෙන්ඩර් ලේඛනවල iii කොටසේ අයිතම 4 හා 5 යටතේ ලැයිස්තුගත අත්‍යවශ්‍ය උපකරණ හා කාර්ය මණ්ඩලය අවශ්‍ය කාලරාමුව තුළ ලබාගන්නා ආකාරය පිළිබඳ යෝජනා

3) 2016 ජූනි 2 දිනැති AIIB ආයතනයේ ලාභීන් සඳහා ප්‍රසම්පාදන උපදෙස් සඳහා අන්තර් මෙහෙයුම් නිර්දේශයන්හි නිශ්චිත, ටෙන්ඩර් සඳහා ඉල්ලීම් (RFT) භාවිත කරමින් ජාත්‍යන්තර විවෘත තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

4) උනන්දුවක් දක්වන දේශීය හා ජාත්‍යන්තර ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, RLVMMP ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති අධ්‍යක්ෂ (දුරකථනය - 0112559869) වෙතින් ලබාගත හැකි අතර, රාජකාරි දිනවල, කොළඹ 05, ජාවත්ත පාරේ, අංක 99/1, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ දී කාර්යාල වේලාවන් තුළ, 09.00 පැය හා 14.00 පැය අතර කාලය තුළ ටෙන්ඩර් ලේඛන පරීක්ෂා කොට බැලිය හැක. අදාළ ටෙන්ඩර් ලේඛන www.nbro.gov.lk වෙතින්ද, 2021-03-17 දින සිට 2021-05-03 දින දක්වා කාලය තුළ පරීක්ෂා කොට බැලිය හැක. වෙබ් අඩවි තුළින් බාගත කොට ගත් ටෙන්ඩර් ලේඛන භාරගනු නොලැබේ.

5) ආපසු ගෙවනු නොලබන ගාස්තු **ශ්‍රී ලංකා රුපියල් 40,000.00 ක්** ගෙවීමෙන් හා, කොළඹ 05, ජාවත්ත පාරේ, අංක 99/1, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත තම ව්‍යාපාර ලිපිශීර්ෂයක් මගින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන්, 2021-03-18 දින සිට 2021-05-03 දින දක්වා කාලය තුළ, උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අදාළ ටෙන්ඩර් ලේඛන මිලදීගත හැක. ගෙවීම්, NBRO ආයතනයේ මුදල් අයකැමි වෙත මුදලින්ම ගෙවිය යුතුය.
තවද, PCA-3 ආකෘති පත්‍රය ලබා ගැනීම සඳහා, www.drc.gov.lk හරහා මාර්ගගත ක්‍රමවේදය තුළින් සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතුය. ලියාපදිංචි වීමේ ක්‍රියාපටිපාටිය, වෙබ් අංක : eroc.drc.gov.lk තුළින් මාර්ගගත පද්ධතියක් ලෙසට පරිවර්තනය කොට ඇත.

6) මේ සම්බන්ධ පෙර - ටෙන්ඩර් හමුවක්, කොළඹ 5, ජාවත්ත පාරේ, අංක 99/1, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ශ්‍රවණාගාරයේදී, 2021-03-26 දින 10.00 පැයට ආරම්භ වීමට නියමිතය. අදාළ වැඩ බිම් චාරිකාව, 2021-03-24 දින 08.00 පැයට NBRO මහනුවර දිස්ත්‍රික් කාර්යාලයෙන් ආරම්භ වේ.

7) ටෙන්ඩර්, **2021-05-04 දින 14.00 පැයට** පෙර පහත සඳහන් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතුය. ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලංසු ඉදිරිපත් කිරීමට අවසර නොලැබේ. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, පහත සඳහන් ලිපිනයේදී, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නම් කළ නියෝජිතයන්ගේ හෝ ඒ සඳහා තෝරාගත් අයවලුන්ගේ ඉදිරියේ, ලැබී ඇති ටෙන්ඩර් ප්‍රසිද්ධියේ විවෘත කරනු ලැබේ.

8) සියලුම ටෙන්ඩර් සමග වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 4 හෝ **නිදහසේ හුවමාරු කළ හැකි විදේශ මුදල්වලින් යුත් ටෙන්ඩර් ඇපකරයක් බැගින් තිබිය යුතුය.**
එම ලංසු ඇපකරය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ, සේවායෝජකහට පිළිගත හැකි වාණිජ බැංකුවකින් නිකුත් කළ, ටෙන්ඩර් ලේඛනයන්හි iv කොටසේ සඳහන් ආකෘතියෙන් යුත් කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.
අවශ්‍ය ටෙන්ඩර් ඇපකර මුදල, නිදහසේ හුවමාරු කළ හැකි මුදල් බවට පරිවර්තනය කිරීමේදී ටෙන්ඩර් භාර ගැනීම අවසන් කළ දින සිට දින 28 කට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද හුවමාරු විනිමය අගය අදාළ කරගත යුතුය.
අදාළ ටෙන්ඩර් ඇපකරය ලබාගනු ලබන්නේ වෙනත් රටක ස්ථාපිත බැංකුවකින් වෙතොත්, එම ඇපකරය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ දේශීය අනුරූපී බැංකුවක් මගින් ස්ථිර කළයුතු අතර, ටෙන්ඩර් ලියවිලිවල iv කොටසේ සඳහන් ආකෘතියෙන් යුක්ත විය යුතුය.

9) අදාළ ප්‍රසම්පාදන රෙගුලාසි ප්‍රකාරව, ප්‍රතිග්‍රාහකයා වෙතින් අවශ්‍ය කරන, කොන්ත්‍රාත් ප්‍රදාන දැන්වීමේ කොටසක් ලෙස සාර්ථක ටෙන්ඩර්කරුවාගේ ප්‍රතිලාභී හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු හෙළි කිරීම සම්බන්ධයෙන් ටෙන්ඩර් ලේඛනයන්හි සඳහන් හිමිකාරිත්ව අනාවරණ ආකෘති පත්‍රය භාවිත කිරීම පිළිබඳව අවධානය යොමු කෙරේ.

10) ඉහතින් යොමු කළ ලිපිනය, වනුයේ : ව්‍යාපෘති අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, අංක 99/1, ජාවත්ත පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව.

**සභාපති, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,**
**රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය,**
**විද්‍යා මාවත, කොළඹ 07,**
**ශ්‍රී ලංකාව.**

# ලංසු සඳහා ආරාධනයයි

## මුදල් අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා රේගුව

**පෞද්ගලික පරිගණක 230 ක් සපයා, ස්ථාපිත කොට, ක්‍රියාත්මක කිරීම**

01. රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (සුළු) සභාපති විසින්, ශ්‍රී ලංකා රේගුව සඳහා පෞද්ගලික පරිගණක 230 ක් ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත් නාමය හා විස්තරය | ලංසු ඇපකර මුදල (ශ්‍රී ලංකා රුපියල්) | ලංසු අවසන් දිනය හා වේලාව | |
|---|---|---|---|---|
| | | | දිනය | වේලාව |
| Log/S/09/ Com/2021 | පෞද්ගලික පරිගණක 230 ක් ප්‍රසම්පාදනය | 500,000.00 | 2021.04.09 | පස්වරු 2.00 |

02. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 3,000.00 ක් ශ්‍රී ලංකා රේගුවේ, 2 වන මහලේ, ප්‍රධාන සරප් වෙත ගෙවීමෙන් හා පහත සඳහන් ලිපිනයට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන්, රාජකාරී දිනවල පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ 2021 අප්‍රේල් 07 දින දක්වා, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් මුදලින්ම කළ යුතු වේ.

04. ලංසු, රේගු අධ්‍යක්ෂ (සේවා සැපයුම්), සේවා සැපයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, 6 වන මහල, ශ්‍රී ලංකා රේගුව, කස්ටම්ස් හවුස්, අංක 40, කෙලින් වීදිය, කොළඹ 11 යන ලිපිනයට, 2021 අප්‍රේල් 09 වන දින පස්වරු 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ. සියලුම ලංසු සමග ඉහත වගුවේ සඳහන් වටිනාකමට ලංසු ඇපකරය බැගින් තිබිය යුතුය.

05. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, ශ්‍රී ලංකා රේගුවේ රේගු අධ්‍යක්ෂ (සේවා සැපයුම්) වෙතින් ලබාගත හැකි අතර, සේවා සැපයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේදී රාජකාරී දිනවල පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ 2021 මාර්තු 19 දින දක්වා ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (සුළු),**
**ශ්‍රී ලංකා රේගුව,**
**අංක 40, කෙලින් වීදිය, කොළඹ 11.**
**දුරකථනය - 011-2221680**

# පන්නල ප්‍රාදේශීය සභාව

# ප්‍රසම්පාදන දැන්වීමයි

**01. කඩ කාමර බදු දීම**

පන්නල ප්‍රාදේශීයස භාවට අයත් පන්නල බස් නැවතුම්පල නව වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ කඩ කාමර 05 සඳහා පෙර ගෙවුම් (Key Money) පදනම මත බදු ලබා දීම සඳහා මා විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

**ටෙන්ඩර්පත් නිකුත් කිරීම** : 2021.03.16 දින සිට 2021.03.30 දින ප.ව. 2.00 දක්වා

**ටෙන්ඩර්පත් භාර ගැනීම** : 2021.03.31 දින ප.ව. 2.00 දක්වා

**ටෙන්ඩර් විවෘත කිරීම** : 2021.03.31 දින ප. ව. 2.00 ට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී සිදු කෙරේ.

- ❖ උප ලේඛනයේ දක්වා ඇති පරිදි නියමිත ලංසු ඇප මුදල හා රු. 1,000.00 ක අයදුම්පත් ගාස්තුව ගෙවා එක් එක් කඩ කාමරය සඳහා මෙම කාර්යාලයෙන් ලබා ගන්නා ටෙන්ඩර් පත් මගින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා චෙක්පත් භාර ගනු නොලැබේ.
- ❖ පහත උපලේඛනයේ විස්තර වන පරිදි ටෙන්ඩර් ඉල්ලුම්පත් පිටපත් දෙකකින් නිකුත් කරනු ලබන අතර එම පිටපත් දෙක වෙන වෙනම කවර වල බහා එම කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**කඩ කාමර අංකය**" පළමු පිටපත, දෙවන පිටපත වශයෙන් සඳහන් කර ලේකම්, පන්නල ප්‍රාදේශීය සභාව, පන්නල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම කළ හැකිය.

**ප්‍රසම්පාදන කොන්දේසි**

- ❖ ගිවිසුම් අත්සන් තැබීමේදී එකවර ගෙවන කී මනි මුදලට යටත්ව, මාසික කුලිය මෙන් 4 ගුණයකට සමාන මුදලක් ආරක්ෂක තැන්පත් ලෙස එකවර දින 14 ක් ඇතුළත තැන්පත් කර සභාව සමග ගිවිසුමකට එළඹිය යුතුය. එසේ ගිවිසුම් ගත වීමෙන් පසු සියලු ලංසු කරුවන්ගේ ලංසු ඇප නිදහස් කරනු ලැබේ. (රජයේ මාසික කුලී තක්සේරුව බල පැවැත්වෙන වසර 02 ට යටත්ව)
- ❖ ඉල්ලුම්කරු හෝ ඔහු විසින් නම් කරනු ලබන අයෙකුට ලංසු විවෘත කිරීම සඳහා සහභාගි විය හැකිය.
- ❖ අවම ලංසුවට (පෙර ගෙවුම් වටිනාකමට) වඩා අඩුවෙන් ඉදිරිපත් වන ලංසු අවලංගු කරනු ලැබේ.
- ❖ පෝරම සම්පූර්ණ කරන විට වැරදීමක් සිදුවුවහොත් තනි ඉරකින් කපා නිවැරදි කර කෙටි අත්සන යොදන්න. (ටිපෙක්ස් භාවිතා නොකළ යුතුය)
- ❖ ඕනෑම ලංසුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය පන්නල ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

**උපලේඛනය**

| කඩ කාමරය | ව්‍යාපාර ස්ථානයේ වර්ග අඩි ප්‍රමාණය | අවම පෙර ගෙවුම් (Key Money) මුදල (රු. ශත) | ආපසු ගෙවන ලංසු තැන්පතුව (රු. ශත) | මාසික කුලිය (රු. ශත) |
|---|---|---|---|---|
| උඩු මහල 06 | 130 | 620,000.00 | 31,000.00 | 2,100.00 |
| උඩු මහල 07 | 130 | 620,000.00 | 31,000.00 | 2,100.00 |
| උඩු මහල 08 | 130 | 620,000.00 | 31,000.00 | 2,300.00 |
| උඩු මහල 09 | 130 | 620,000.00 | 31,000.00 | 2,400.00 |

**02. 2 *3/3*5 වයිට් බෝඩ්**

**03. පාදයෙන් ක්‍රියාත්මක කරන සින්ක්**

(නිමැවුමෙහි ඡායාරූපයක් අප වෙත එවීමට කාරුණික වන්න)

**04. මි. ලී. 1000 වතුර ටැංකි**

මේ පිළිබඳ විස්තර පන්නල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැකිය.

දු. අංකය : 037-2246049 / 037-4947136

**එල්.එම්.එස්.කේ. රංජිත් ලංසකාර,**
**සභාපති,**
**පන්නල ප්‍රාදේශීය සභාව.**

# ප්‍රසම්පාදන දැන්වීමයි

## බණ්ඩාරවෙල මහා නගර සභාව

**ඉලෙක්ට්‍රොනික මාධ්‍ය භාවිතා කරමින් බණ්ඩාරවෙල නගරයේ අනුමත වීථිවල නවත්වන රථ වාහන වලින් ගාස්තු අය කිරීමේ සේවාව සඳහා මෘදුකාංගයක් නිර්මාණය කිරීම සහ එය ක්‍රියාත්මක කර ආදායම් රැස්කිරීමේ සේවාව බදුදීම**

බණ්ඩාරවෙල මහා නගර සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින් බණ්ඩාරවෙල නගරයේ වීථිවල ස්ථාපිත වාහන නවතා තැබීමේ ස්ථාන 434 දිනකට එක් ස්ථානයකින් බණ්ඩාරවෙල මහා නගර සභාවට රු. 30.00 අවම ගාස්තුවක් හා දිනකට උපයන දළ ආදායමින් 20% ක අවම ගාස්තුවක් ලබාගැනීමේ පදනම මත ඉලෙක්ට්‍රොනික මාධ්‍ය භාවිත කරමින් ගාස්තු අයකිරීමේ සේවාව සඳහා මෘදුකාංගයක් නිර්මාණය කර එය අනුසාරයෙන් ආදායම් රැස්කිරීමේ සේවාව බදුදීම පිණිස ශ්‍රී ලංකාවේ පුද්ගලයින්ගෙන් හා ලියාපදිංචි සමිති හා සමාගම් වලින් ද්විත්ව කවර ක්‍රමය යටතේ ලංසු මෙයින් කැඳවනු ලැබේ.

02. ලංසු ඉදිරිපත් කිරීම සඳහා ආපසු නොගෙවන රු. 5,000.00 ලංසු ආකෘති පත්‍ර ගාස්තුවක් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් මහා නගර සභාවේ සරප් වෙත ගෙවා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර මහා නගර සභාවේ ආදායම් අංශයෙන් අවශ්‍ය ආකෘති පත්‍ර ලබාගත හැක. එසේම ලංසු ඉදිරිපත් කිරීමේදී ලංසු සුරක්ෂණයක් ලෙස ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රු. 200,000.00 ක් 2021.04.07 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර නගර සභාවේ තැන්පත් කර ලබාගත් කුවිතාන්සියේ පිටපතක් ලංසු ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.

03. ලංසු නිකුත් කිරීම භාරගැනීම හා විවෘත කිරීම පහත සඳහන් දින හා වේලාවන්හිදී බණ්ඩාරවෙල මහා නගර සභාවේදී සිදු කරනු ලැබේ.

i. ලංසු නිකුත් කිරීම - 2021.03.18 සිට 2021.04.07 දක්වා (සතියේ වැඩ කරන දිනයන්හි ප.ව. 2.00 දක්වා)

ii. ලංසු භාරගැනීම - 2021.04.08 ප.ව. 2.00 දක්වා

iii. ලංසු විවෘත කිරීම - 2021.04.08 වන දින ප.ව 2.00 පසුවූ වහාම

04. තවද මෙම ලංසු කැඳවීම පිළිබඳ වැඩි විස්තර මහා නගර සභාවට පැමිණ හෝ දුරකථන අංක 057-2222275 මගින් නාගරික කොමසාරිස් හෝ නාගරික ගණකාධිකාරී ඇමතීමෙන් ලබාගත හැක.

**අ/කළේ: ජනක නිශාන්ත රත්නායක**
**සභාපති/ ප්‍රසම්පාදන කමිටුව**

**2021.03.12 දින**
**බණ්ඩාරවෙල මහා නගර සභාවේදීය.**

# ප්‍රසම්පාදන දැන්වීමයි

## පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බ.ප)

**(පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත)**

**Laptop පරිගණක යන්ත්‍ර 13 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම**

**ලංසු අංකය : PRDA/WP/2020/PRO/12**

මෙම අධිකාරියේ කාර්යාලයීය අවශ්‍යතාවයන් සඳහා, Laptop පරිගණක යන්ත්‍ර 13 ක් මිලදී ගැනීම් සිදු කිරීමට මෙවැනි සැපයීම් සිදුකරනු ලබන, පිළිගත් සැපයුම්කරුවන් වෙතින් විවෘත ලංසු කැඳවනු ලැබේ.

02. මේ සඳහා ලංසු ලියවිලි කට්ටල 2021/03/18 දින සිට 2021/03/30 දින දක්වා පෙ.ව. 09.00 සිට ප.ව. 02.30 දක්වා රු. 1,080.00 ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තුවලට යටත්ව, (ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් හැර) මෙම අධිකාරියේ ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත හැක. මේ සඳහා වන ලංසු ඇපකරය මුදලින් හෝ බැංකු/ රක්ෂණ ඇපකරයක් මගින් ප්‍රසම්පාදන ලියකියවිලි සඳහන් කොන්දේසිවලට අනුකූලව ඉදිරිපත් කළ යුතුය.

03. ලංසු භාර ගන්නා අවසන් දිනය **2021/03/31** දින වන අතර, ලංසු විවෘත කිරීම එදින **පෙ.ව. 10.30 ට** මෙම කාර්යාලයේදී සිදු කරනු ලැබේ.

04. එම අවස්ථාවට සැපයුම්කරුට හෝ ඔහුන්ගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

**සභාපති, ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බ/ප.),**
**අංක 59, ශාන්ත සෙබස්තියන් කන්ද,**
**කොළඹ 12.**

**දු.අ. 011-5676903.**

**2021-03-09**

# ප්‍රසම්පාදන දැන්වීමයි

# (ලංසු සඳහා ආරාධනය IFB)

**කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය**

**ජාතික පාසල් සඳහා සෞන්දර්යාත්මක උපකරණ ප්‍රසම්පාදනය - 2021**

**IFB අංකය : (MWCDSS/ED/PRO/02/2)**

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ජාතික පාසල් සඳහා 2021 වසරට සෞන්දර්යාත්මක උපකරණ සැපයීම සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු දැන් කැඳවනු ලැබේ. සම්පූර්ණ විස්තර ලංසුකරණ ලිපි ලේඛන තුළින් බලාගත හැකිය. ලංසුකරුවන්ට අයිතම එකකට හෝ වැඩි ගණනකට මිල ගණන් ඉදිරිපත් කළ හැකිය. එක් එක් අයිතමය සඳහා ගෙනැවිත් භාරදීමේ කාලය සති 08 සිට 10 දක්වා වේ.

2. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

3. අභිලාෂී යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ට, බත්තරමුල්ල, සුහුරුපාය පියවර II, සෙත්සිරිපාය, D කොටස, 6 වන මහල, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ, ප්‍රසම්පාදන අංශයෙන් වැඩිමනත් තොරතුරු ලබාගැනීමටත් කාර්යාල දිනයන්හි පෙ.ව. 09.00 සිට ප.ව.03.30 දක්වා ලංසුකරණ ලිපිලේඛන (ගාස්තු ගෙවීමකින් තොරව) පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

4. 2021 අප්‍රේල් 06 වැනිදා දක්වා (පෙ.ව. 9.00 සිට ප.ව 3.00) ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 2000/= ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ප්‍රසම්පාදන අංශයෙන් ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

5. ලංසු, බත්තරමුල්ල, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය වෙත, 2021 අප්‍රේල් 06 වැනිදා ප.ව. 02.00 ට හෝ ඊට පෙර ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. 2021 අප්‍රේල් 07 වැනිදා ප.ව 02.00 ට ලංසු භාර ගැනීම අවසාන වූ වහාම ඉහත සඳහන් ලිපිනයේදී එම අවස්ථාවට සහභාගී වීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරේ. සියලුම ලංසු සමග ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

**දුරකථනය : 0113611110/ ෆැක්ස් : 0112187255**

**ලේකම්,**
**කාන්තා හා ළමා සංවර්ධනය, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය.**
**2021.03.17**

---

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 369/1, මහසෙන් මාවත අක්කර 70 හිගුරක්ගොඩ පදිංචි **කුලතුංග ආරච්චිගේ ඩිලානි චන්ද්‍රා කුමාරි බාලසූරිය** වන මම අද දින සිට **බාලසූරිය ආරච්චිගේ ඩිලානි චන්ද්‍රා කුමාරි බාලසූරිය** යන නම භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

## නම වෙනස් කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ අංක 341/6, උඩුමුල්ල, මුල්ලේරියාව ලිපිනයේ පදිංචි **මොහොමඩ් ඉම්රාන් ඛාන්** වන මම මෙතැන් සිට **අම්පේ වෙදරාලලාගේ ශෂි ඉමෝ පෙරේරා** වශයෙන් භාවිත කරන බවත්, සියලු ලිපි ලේඛනවල මින් ඉදිරියට එම නම සඳහන් කරන බවත් ශ්‍රී ලංකා ජනරජයටත් සියලු මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම
**මොස්ත්‍රා (පීවීටී) එල්ටීඩී**
ලියාපදිංචි අංකය : පීවී 00234173
ලියාපදිංචි කළ දිනය : 03.02.2021
ලියාපදිංචි ලිපිනය :
නො. 34/3, කොට්ටාව පාර,
මාවිත්තර, පිළියන්දල

## නම වෙනස් කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 521 ඇතුල් කෝට්ටේ ග්‍රාම නිලධාරී වසමට අයත් තොටුපොල පාර, ඇතුල් කෝට්ටේ ලිපිනයේ පදිංචි **කොටුවිල කන්කානමලාගේ එමල්ක හසන්ත** පියුමාල් වන මම මෙතැන් සිට **කොටුවිල කන්කානමලාගේ එමල්ක හසන්ත** යනුවෙන් භාවිත කරන බවට ශ්‍රී ලංකා ජනරජයට සහ මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙයට,
**කොටුවිල කන්කානමලාගේ**
**එමල්ක හසන්ත**

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමි.

**සමාගමේ නම :**
නේචර්ස් පික් සිනමන් (ප්‍රයිවට්) ලිමිටඩ්
**ලියාපදිංචි අංකය :**
පී. වී. 00235325
**ලියාපදිංචි දිනය :** 2021.02.22
**ලියාපදිංචි කාර්යාලය :**
අංක 9/1, සිරිමංගල මාවත,
වල්පල, මාතර.

ඔබ සොයන වාහනය තෝරාගන්න බලන්න

# සංශෝධනයයි

## ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය සඳහා උපකරණ මිලදී ගැනීම හා පාසල් උපකරණ අලුත්වැඩියා කිරීම**

2021 මාර්තු 15 වන දින පළ කරන ලද ප්‍රසම්පාදන දැන්වීමේ අනු අංක 05 යටතේ සඳහන් පූර්ව ලංසු හමුව පැවැත්වෙන දිනය 2021 මාර්තු 29 වන දින පෙ.ව. 9.00 ලෙස සංශෝධනය විය යුතු බව කරුණාවෙන් සලකන්න. පෙර පළ කරන ලද දැන්වීමේ සඳහන් අනෙකුත් සියලු විස්තර නොවෙනස්ව පවතී.

**සභාපති, ප්‍රසම්පාදන කමිටුව,**
**ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,**
**වෙලගෙදර පාර, බදුල්ල.**

ඔබ කැමති පුවත්පත් කීපයකම
දැරිය හැකි මිලකට
ලුහුඬු දැන්වීමක්
පල දරන්න - පළ කරන්න
* වචන 15ක් සඳහා
adz + රු. 500/-
adz + Daily News රු. 350/-
+ දිනමිණ රු. 350/-
adz + රු. 400/-
+ රු. 400/-
Daily News + රු. 250/-
දිනමිණ + රු. 250/-
ඔබගේ ලුහුඬු දැන්වීම අදම අප වෙත E-Mail කරන්න...
classified@lakehouse.lk
වැඩි විස්තර සඳහා අමතන්න -
පියුමි - 011 2 429 383 / රමණි - 011 2 429 347

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව (SPC)

**IFB (ලංසු කැඳවීම්) අංකය : SPC/SU/L/2021/FI/12**

## වෙබ් ඕෆ්සෙට් (සමතල) සිව් වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් සැපයීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කර පෙන්වීම හා පුහුණු කරලීම

- ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙතින් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව (SPC) වෙත මුද්‍රණ යන්ත්‍රෝපකරණ හා යන්ත්‍ර සූත්‍ර ප්‍රසම්පාදනය අරභයා ප්‍රදානයක් ලැබී ඇති අතර මෙම ප්‍රදානයේ ලැබීම්වලින් කොටසක් වෙබ් ඕෆ්සෙට් සිව් වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් සැපයීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කර පෙන්වීම හා පුහුණු කරලීම සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ වන යෝග්‍ය ගෙවීම් සඳහා යෙදවීමට අදහස් කෙරේ.
- ඉහත සඳහන් අරමුදල් සම්පාදනය යටතේ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව (SPC) විසින් වෙබ් ඕෆ්සෙට් සිව් වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් සැපයීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කර පෙන්වීම සහ පුහුණු කරලීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්, ආනයනකරුවන් හෝ නිෂ්පාදකවරුන්, (ඔවුන්ගේ බලයලත් දේශීය ඒජන්තවරුන් මාර්ගයෙන්) වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.
- ලංසුකරුවන් විසින් රුපියල් 1,300,000.00 ක වටිනාකමින් යුත් (ලක්ෂ 13 ක) ලංසු සුරක්ෂණ ඇපකරයක් ද ඉදිරිපත් කළ යුතුය.
- ලංසුකරණය, ජාතික තරගකාරී ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ මෙහෙයවනු ලැබේ.
- ලංසු සමාන ස්වභාවයේ යන්ත්‍ර සූත්‍ර සැපයීම, ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳව අඩුම තරමින් වසර දහයක (10) ක පෙර පළපුරුද්දක් සහිත දේශීය ඒජන්තවරුන් (සිය අදාළ මූලිකයින්) ප්‍රධානීන් වෙනුවෙන් විසින් ඉදිරිපත් කළ යුතුය.
- පූර්ව ලංසු හමුවක් 2021/03/29 වන දින පෙ.ව. 9.30 ට පාදුක්ක පානළුව, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේදී පැවැත්වෙනු ඇත.
- අභිලාෂී ලංසුකරුවන් හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු ගෙවනු නොලබන රු. 20,000.00 (විසි දහසක) ගාස්තුවක් ගෙවූ බවට වන ලදුපතද සමග ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, 2021/03/18 වන දින සිට 2021/04/07 වන දින දක්වා රාජකාරී දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අතරතුර මිලදී ලබාගත හැකිය.
- අනු පිටපතකින් යුක්තව (පිටපත් 2) සම්පූර්ණ කරන ලද ලංසු, "මුල් පිටපත" හා "අනු පිටපත" යනුවෙන් පැහැදිලිව මුද්‍රා තබන ලද ලිපිකවරවල අදාළ පරිදි සටහන් කර එම ලිපි කවර දෙකම එක් තනි මුද්‍රා තැබූ ලිපි කවරයක බහා ඇතුළත් කර කවරයේ වම්පස ඉහළ කෙළවරේ වෙබ් ඕෆ්සෙට් සිව් වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් සඳහා ලංසු : SPC/SU/L/2021/FI/12" යනුවෙන් පැහැදිලිව සටහන් කර 2021/04/08 වන දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ පාදුක්ක, පානළුව, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සැපයුම් කළමනාකරුගේ කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ප්‍රමාද ලංසු භාරගනු නොලැබේ.
- ලංසු 2021/04/08 වන දින ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම, මේ සඳහා පුද්ගලිකව පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේදී විවෘත කරනු ලැබේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව**
**පානළුව, පාදුක්ක.**

SPC

# ප්‍රසම්පාදන දැන්වීමයි !

## පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බ.ප.)

**(පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත)**

## පන්නල සහ වගවත්ත ඇස්පෝල්ට් නිෂ්පාදනාගාරවල නිෂ්පාදිත ඇස්පෝල්ට් ප්‍රවාහනය සඳහා අවශ්‍ය කියුබ් 03/05 ප්‍රමාණයේ ටිපර් රථ සහ විධායක ඉංජිනේරු කාර්යාල සඳහා අවශ්‍ය ටිපර් රථ කුලී පදනම මත ලබා ගැනීම

අධිකාරියට අයත් පන්නල / වගවත්ත ඇස්පෝල්ට් නිෂ්පාදන අංගනවල නිෂ්පාදිත ඇස්පෝල්ට් ප්‍රවාහනය සඳහා කියුබ් 03/05 ප්‍රමාණයේ ටිපර් රථ සහ විධායක ඉංජිනේරු කාර්යාල සඳහා අවශ්‍ය ටිපර් රථ කුලී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් ටිපර් රථ සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

**ලංසු සාරාංශය**

| ලංසු අංකය | විස්තරය | ප්‍රමාණය $M^3$ | ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තුව (වැට් බදු රහිතව) | ලංසු ඇපකරයේ වටිනාකම | |
|---|---|---|---|---|---|
| | | | | මුදලින් | බැංකු / රක්ෂණ ඇපකරය මගින් |
| **වගවත්ත ඇස්පෝල්ට් නිෂ්පාදනාගාරය සඳහා** | | | | | |
| PRDA/WP/PRO/2021/09 | කියුබ් 03/05 ප්‍රමාණයේ ටිපර් රථ කුලී පදනම මත ලබා ගැනීම | | රු. 2,000.00 | රු. 20,000.00 | - |
| **පන්නල ඇස්පෝල්ට් නිෂ්පාදනාගාරය සඳහා** | | | | | |
| PRDA/WP/PRO/2021/10 | කියුබ් 03/05 ප්‍රමාණයේ ටිපර් රථ කුලී පදනම මත ලබා ගැනීම | | රු. 2,000.00 | රු. 20,000.00 | - |
| **හොරණ, මොරටුව, නිට්ටඹුව, අවිස්සාවේල්ල, උඩුගම්පොළ වි. ඉ.ත කා. වල සේවයේ යෙදවීමට කුලී පදනම මත ලොරි / ටිපර් රථ ලබා ගැනීම** | | | | | |
| PRDA/WP/PRO/2021/13 | හොරණ, මොරටුව, නිට්ටඹුව, අවිස්සාවේල්ල, උඩුගම්පොල වි. ඉ. කා. වල සේවයේ යෙදවීමට කුලී පදනම මත ලොරි / ටිපර් රථ ලබා ගැනීම | | රු. 1,000.00 | රු. 10,000.00 | - |

02. මේ සඳහා වන ලංසු ලියවිලි කට්ටල 2021.03.18 දින සිට 2021.03.31 දින පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා ඉහත සඳහන් ටෙන්ඩර් පෝරම ගාස්තු වලට යටත්ව (අධිකාරියේ ලොරි රථ කුලී පදනම මත සැපයීම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් හැර) මෙම අධිකාරියේ ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත හැකිය. මේ සඳහා වන ලංසු ඇපකරය මුදලින් හෝ බැංකු ඇපකරයක් මගින් ප්‍රසම්පාදන ලියවිලි වල සඳහන් කොන්දේසි වලට අනුකූලව ඉහත සඳහන් වටිනාකමට ඉදිරිපත් කළ යුතුය.

03. ලංසු භාර ගැනීම හා විවෘත කිරීම 2021.04.01 වන දින ප.ව. 2.30 ට මෙම කාර්යාලයේදී සිදු කරනු ලබන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බ.ප.),**
**අංක 59, ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12.**
**දුරකථන අංකය - 011-5676903**

# මධ්‍යම පළාත් සභාව

## ලංසු සඳහා ආරාධනාවයි

## ඉදිකිරීම්

### අරමුදල් ප්‍රභවය - ප්‍රාථමික සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය

## සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය

01. පහත ලැයිස්තුවේ විස්තර සඳහන් ව්‍යාපෘති සඳහා මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් 2021-02-18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 4/2016(iii) අනුව, ජාතික තරගකාරී ක්‍රමය යටතේ ලංසු කැඳවනු ලැබේ.
02. පහත වගුවේ දැක්වෙන සුදුසුකම් සපුරා ඇති සහ අසාධු ලේඛනගත නොවූ ලංසුකරුන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.
03. ලංසුවලට අදාළ වැඩිමනත් විස්තර මහනුවර, සංඝරාජ මාවත තැපෙ. 121 හි මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙතින් හෝ මහනුවර. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මාවතේ පිහිටි ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සෞඛ්‍ය ගොඩනැගිලි) වෙතින් ලබාගත හැකිය. (දුරකථන අංක පිළිවෙලින් 081-2232620 හා 081-2201624 වේ.)
04. පහත වගුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ලංසු ලියවිලි ගාස්තුව මහනුවර සංඝරාජ මාවත තැ.පෙ. 121 හි මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත මුදලින් ගෙවා ලබා ගත් රිසිට්පත අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් 2021-03-18 දින සිට 2021-04-07 දින දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා අදළ ලංසු ලියවිලි ලබාගත හැකිය.
05. නිසි පරිදි සම්පූර්ණ කර මුද්‍රා තැබූ ලංසුපත් 2021-04-08 දින ප.ව. 2.00 ට (14.00 පැයට) හෝ ඊට පෙර මහනුවර, සංඝරාජ මාවතේ, තැ.පෙ. 121 හි පිහිටි සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම කාර්යාලයේ ගිණුම් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම කළ හැකි ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
06. ලංසුපත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනුපිටපත වෙන වෙනම කවරවල බහා නම් කර මුද්‍රා තබා එක කවරයක බහා එවිය යුතුය. එම කවරයේ ඉහළ වම් කෙළවර කර්මාන්තයේ නම සහ කොන්ත්‍රාත් අංකය සඳහන් කළ යුතුය.
07. ලංසුපත් භාරගැනීම අවසන් වූ වහාම ලංසුපත් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.
08. ඉදිරිපත් කරනු ලබන ලංසුව 2021-06-24 දක්වා වලංගු විය යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවකින් හෝ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය අනුමත කළ රක්ෂණ සමාගම විසින් හෝ ඉදිකිරීම් සඳහා සහතික කිරීමේ අරමුදලින් මධ්‍යම පළාත් සෞඛ්‍ය දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශ ලේකම් නමින් නිකුත් කළ පහත වගුවේ සඳහන් පරිදි වටිනාකමකින් යුත් ලංසු සුරක්ෂණයක් ලංසුපත සමග ඉදිරිපත් කළ යුතු අතර, එය මුදලින් ගෙවන්නේ නම්, මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සරප් වෙත පහත වගුවේ සඳහන් මුදල් ගෙවා ලබාගන්නා ලද ලදුපතේ සහතික කළ පිටතක් ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. එම ලංසු සුරක්ෂණය 2021-07-28 දින දක්වා වලංගු විය යුතුය.
09. මෙම ලංසු පිළිබඳ පූර්ව ලංසු රැස්වීමක් 2021-04-01 දින පෙ.ව. 10.00 ට මධ්‍යම පළාත් සෞඛ්‍ය දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ දී පැවැත්වේ.
10. සෑම ලංසුවක්ම තාක්ෂණ ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරනු ලබන අතර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

| ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | ලියාපදිංචිය | ලංසු ලියවිලි ගාස්තු | ලංසු සුරක්ෂණයේ වටිනාකම | | ඉංජිනේරු ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|---|
| | | CIDA | (රු.) | මුදලින් නොවන (රු.) | මුදලින් ගෙවන්නේ නම් (රු.) | (රු.) |
| **මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව** | | | | | | |
| 1 | ජම්බුගහපිටිය ප්‍රාදේශීය රෝහලේ ගිලන්රථ ගරාජය හා විවේක කාමරය ඉදිකිරීම හා සුවදිවි සායනය අලුත්වැඩියාව | C6, C5 | 3,500.00 | 169,400.00 | 84,700.00 | 8,471,163.36 |
| 2 | කඩුගන්නාව ප්‍රාදේශීය රෝහලේ මාතෘ වාට්ටුව හා සුවිදිවි සායනය අලුත්වැඩියාව | C6, C5 | 3,500.00 | 173,700.00 | 86,850.00 | 8,687,230.92 |

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන,**
**පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය,**
**මධ්‍යම පළාත, තැ.පෙ. 121, සංඝරාජ මාවත, මහනුවර.** **2021-03-18**

# ලංසු සඳහා ආරාධනයයි

## ප්‍රධාන ලේකම්ගේ මහලේකම් කාර්යාලය

### නැගෙනහිර පළාත

1. ප්‍රධාන ලේකම්ගේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2021 වර්ෂය සඳහා නැගෙනහිර පළාත් සභාවේ ආයතනවලට ආරක්ෂක හා ජැනිටෝරියල් සේවාවන් සැපයීම සඳහා පුද්ගලයෙකු හෝ සමාගමක් ලෙස වලංගු ව්‍යාපාර ලියාපදිංචියක් සහිත යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. ආරක්ෂක සේවාව සඳහා ලංසු ඉදිරිපත් කරන ලංසුකරුවන් සතුව වලංගු ආරක්ෂක අමාත්‍යාංශ ලියාපදිංචියක් තිබිය යුතුය.
2. ආපසු ගෙවනු නොලබන රු. 20,000.00 ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ත්‍රිකුණාමලය, වරෝදයනගර්, කන්නියා පාරේ නැගෙනහිර පළාත, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා හා යටිතල පහසුකම්) කාර්යාලය වෙතින් 2021 මාර්තු 18 වෙනි දින සිට 2021 අප්‍රේල් 07 වෙනි දින දක්වා රාජකාරි දිනයන්හි කාර්යාල වේලාව තුළදී ලිඛිත අයදුම්තක් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන කට්ටලයක් මිලදීගත හැකිය.
3. ජාතික තරඟකාරී ලංසුකරණ තනි අදියර තනි කවරය ක්‍රමය ප්‍රසම්පාදන ක්‍රමය වේ.
4. ලංසු ලිපිලේඛන පිටපත් දෙකකින් යුතුව ලංසුකරුවන්ට ලබාගත හැකිය. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් කැමැති නම් ලංසු ලිපිලේඛන මිලදී ගැනීමට පෙර ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි අතර වරෝදයනගර්, කන්නියා පාර, නැගෙනහිර පළාත, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා හා යටිතල පහසුකම්) වෙතින් ලබාගත හැකිය. (දුරකථනය : 026-2222009)
5. ලංසු ඇපකරයක් අමුණන ලද ලංසු, 2021 අප්‍රේල් 08 වෙනි දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි "සභාපති, ප්‍රධාන ලේකම්ගේ ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය, නැගෙනහිර පළාත, කන්නියා පාර, වරෝදයනගර්, ත්‍රිකුණාමලය" යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන්වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් / නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
6. පූර්ව ලංසු රැස්වීමක් 2021 මාර්තු 29 වෙනි දින පෙ.ව. 10.00 ට ත්‍රිකුණාමලය, වරෝදයනගර්, කන්නියා පාර, නැගෙනහිර පළාත, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා හා යටිතල පහසුකම්) කාර්යාලයේදී පැවැත්වේ.
7. ලංසුකරුවෙකු තෝරා ගැනීම, III වන කොටසේ පිටු අංක 26 සඳහන් සුදුසුකම් සහ ඇගයීම මත සිදු කරනු ලැබේ.
8. කොන්ත්‍රාත් ප්‍රදානය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.


**වගුව**

| ලංසු අංකය | කර්මාන්තයේ නම | කොන්ත්‍රාත් කාලය | ලංසු වලංගු කාලය | ලංසු ඇපකරය | |
|---|---|---|---|---|---|
| | | | | වටිනාකම රු. | වලංගු කාලය |
| EPC/SS/2021 | නැගෙනහිර පළාත් සභාවේ ආයතන සඳහා ආරක්ෂක සේවාව සැපයීම - 2021 | කොන්ත්‍රාත් ප්‍රදානය කළ දිනයේ සිට මාස 12 ක් | 2021 ජූලි 07 වෙනි දින දක්වා | 1,200,000.00 | 2021 අගෝස්තු 04 වෙනි දින දක්වා |
| EPC/JS/2021 | නැගෙනහිර පළාත් සභාවේ ආයතන සඳහා ජැනිටෝරියල් සේවාව සැපයීම - 2021 | කොන්ත්‍රාත් ප්‍රදානය කළ දිනයේ සිට මාස 12 ක් | 2021 ජූලි 07 වෙනි දින දක්වා | 630,000.00 | 2021 අගෝස්තු 04 වෙනි දින දක්වා |

**තුසිත පී. වනිගසිංහ,**
**සභාපති,**
**ප්‍රධාන ලේකම්ගේ ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රධාන ලේකම්ගේ මහලේකම් කාර්යාලය,**
**කන්නියා පාර, වරෝදයනගර්, ත්‍රිකුණාමලය.**

# කටාරම


## ස්වර්ණභූමියේ අතීතාවලෝකනය



පණ්ඩුකාභය කුමරු ස්වකීය මාමාවරුන්ට එරෙහිව සේනා සංවිධානය කළේ මහවැලි ගඟෙන් නැඟෙනහිර වූ ධූමරක්ඛ පර්වතයේ සිට යැයි මහාවංශය කියයි. ජුතින්දර නම් යක් රජු විසුවේද ධූමරක්ඛ පර්වතයේ බව වංශකතාව සඳහන් කරයි. විජයාවතරණයට පෙර යක්ෂ ගෝත්‍රිකයන්ගේ ප්‍රධාන වාසස්ථානයක් වූ ධූමරක්ඛය පසු කලෙක භික්ෂූන් වහන්සේලා වැඩ සිටි ආරණ්‍ය සේනාසනයක් විය. පොලොන්නරු යුගයේදී එය භික්ෂු ශාස්ත්‍ර පීඨයකි.

# සාහිත්‍යයෙන් යුගයක් බැබළ වූ උදුම්බරගිරි අරණ

තමන්කඩුව පළාතට අයත් මේ ප්‍රදේශය පාළි වංශකතාවල සඳහන් වන්නේ දුම්රක්ගල, ධූමරක්ඛපබ්බත ලෙසිනි. පසු කලෙක එය උදුම්බරගිරි විය. උදුම්බර යනු දිවුල්වලට කියන නමකි. සමහරු ඊට දිඹුල් කියා ද වහරති. ගිරි යනු පර්වතයයි. දිවුල් (දිඹුල්) වලින් ගහන වූ පර්වතය (ගිරි) දිඹුලාගල හෙවත් උදුම්බරගිරි වූ බව සඳහන් වේ.





මාරාවීදිය සෙල්ලිපිය(වමේ) සහ දිඹුලාගල ලෙනක්

### විජය රජ සමය

විජය රජුගේ බලය ලක්දිව වයඹ දිගට පැතිරීමත් සමගම යක්ෂ ගෝත්‍රිකයෝ රිටිගල හා උදුම්බරගිරියේ වාසස්ථාන ඇති කරගත්හ. මහවැලි ගඟ අද්දර සිට මොවුහු විජයට එරෙහිව සේනා සංවිධානය කළ අතර ශාක්‍ය වංශික පණ්ඩුකාභය කුමරුට යක්ෂ සේනා උදව් කළේ ද ඒ අනුව බව පැවසේ.

පණ්ඩුකාභය කුමරු එකල තිඹිරියංගන විල අසලදී දුම්රක්ගල විසූ චේතියා යක්ෂණිය බලෙන් අල්ලා ගත් බව මහාවංශයේ මෙසේ සඳහන් කර ඇත.

**වසන්ති ධුමරක්ඛංගෙ - සරෙ තිඹිරියංගනේ**

**වරතේ වළවා රූපා - යක්ඛි චේතිය නමිකා**

(ද.ස.ම.පරි. 53)

මෙහි ධුමරක්ඛංග (දුම්රක්ගල) ලෙස හඳුන්වන්නේ දිඹුලාගලය. ඒ බව වංසත්ථප්පකාසිනියේ "ධුමරක්ඛාගේ ති ධුමරක්ඛ සංඛාතෙ උදුම්බර පබ්බතේනි අත්ථො" යනුවෙන් සඳහන් වන්නේ ද දුම්රකුස් යැයි කියන දිඹුලාගල පර්වතය යැයි අර්ථකථනය කොට තිබේ.

### පණ්ඩුකාභය සමය

විජය රජ සමයේ යක්ෂ පුරය පිහිටියේ පොලොන්නරුව යක්කුරේ ප්‍රදේශයේය. යක්ෂ සේනාපතිගේ වාසභවන වූයේ උදුම්බරගිරියේය. දිඹුලාගලට සැතපුම් 5ක් පමණ දුරින් පිහිටි තිඹිරියංගන විල (තිඹිරියාන වැව) අසලදී පණ්ඩුකාභය කුමරුට සුදු වෙළඹකගේ වෙස්ගත් චේතියා යක්ෂණිය හමු වූ බවත් ඇය දුම්රක්ගල විසූ ජුතින්දර යක්ෂයාගේ බිරිය බවත් උත්තරවිහාර අටුවාවේ සඳහන්ය. කුමරු වසර 4ක කාලයක් දිඹුලාගල විසූ බවත් පැවසෙයි. පණ්ඩුකාභය පුත් මුටසිව කුමරු උපන්නේද උදුම්බරගිරි ලෙනක බව කියැවේ.

මුටසිව ගෙන් පසු රජකමට පත් දෙවනපෑතිස් රජු ක්‍රි.පූ.247 දී මිහිඳු හිමියන් ලක්දිවට වැඩි පසු බුදුදහම වැළඳ ගෙන එකල කරවූ මුල්ම විහාර අතුරින් එකක් ලෙසද දිඹුලාගල සැලකේ. 5 වැනි සියවසේදී මහානාම රජු දිඹුලාගල විහාරයට ගොඩනැඟිලි කරවා සංඝයා වහන්සේ වෙත පිදූ බව වංශකතාවේ සඳහන් වේ.

එතැන් සිට මෙරට අවසන් මහ රහතන් වහන්සේ වන මලියදේව මහ රහතන් වහන්සේගේ කාලය දක්වාම මෙහි භික්ෂු සංඝයා වැඩ සිටි බව කියැවේ. සද්ධර්මාලංකාරයේ 'මේඝවර්ණ වස්තුවේ' මේ පිළිබඳව සඳහන් වේ.

ථූපාරාමයේ වැඩ සිටි කුන්තගන්තතිස්ස මහ රහතන් වහන්සේගේ මූලිකත්වයෙන් සංඝයා වහන්සේලා 500ක් මාතලේ අලු විහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කර, දිඹුලාගලට වැඩම කර ගිරි ලෙනක ධ්‍යාන සුවයෙන් සිටි බවත් එය දැනගත් වළගම්බා රජු ඒ ගිරි ලෙන ඇතුළු විහාර කර්මාන්ත කරවා කෙත්වතු හා ගම්වර පිදූ බවත් පැවසේ. කුන්තගන්තතිස්ස මහරහතන් වහන්සේ සිය පරිනිර්වාණය දක්වාම වැඩ සිටියේ දිඹුලාගල බව ද 'මේඝවර්ණ වස්තුව' කියයි.

### පළමුවැනි විජයබාහු සමය

ක්‍රි.ව. 1056 දී රජ පැමිණි මහ විජයබාහු රජු සතුරු උපද්‍රවයට ලක්ව තිබූ දිඹුලාගල යළි පිළිසකර කළේය. එරජු රාමඤ්ඤ දේශයේ අනුරුද්ධ රජුගේ අනුග්‍රහය ඇතිව පේගු නුවරින් උපසම්පදාව ලද සංඝයා වහන්සේලා වැඩම කරවා දිඹුලාගල සිට සැතපුම් 6ක් දුරින් පිහිටි යක්කුරේ අසල මහවැලි ගඟේ දහස්තොට (සහස්සතිස්ස) නම් ස්ථානයේ දී උපසම්පදා කර්මය මෙරට ස්ථාපිත කිරීමට ද කටයුතු කළේය.

### මහා පරාක්‍රමබාහු සමය

ක්‍රි.ව.1153 දී මහා පරාක්‍රමබාහු රාජ්‍ය බලයට පත් විය. එතෙක් වෙන්ව තිබූ ත්‍රිසිංහලය එක්සේසත් කොට සංඝයා වහන්සේලා අතර ශාසන ශුද්ධියක් කළ යුතු බව රජු වටහා ගෙන ක්‍රියා කළේය. ඒ සඳහා මූලිකත්වය පැවරුනේ දිඹුලාගල විහාරාධිපති ධර්මධර, විනයධර මහා කාශ්‍යප සංඝ පීතෘවරයාණන් වහන්සේටය.

මේ විනය සංඝායනාව පොලොන්නරු කතිකාවත (නීති මාලාව) නමින් හැඳින්වේ. මහා කාශ්‍යප හිමිපාණෝ සංස්කෘත ව්‍යාකරණ පිළිබඳව දැන සිටි එකල විසූ උසස්ම පඬිවරයා වූහ. චන්ද්‍ර ව්‍යාකරණය හඳුන්වා දෙමින් බාලාවබෝධනය (වියරණ ග්‍රන්ථය), බුද්ධ වංශය සහ, අනාගත වංශය (පාළි), සමන්තපාසාදිකා සන්නය, මෝහ විච්ඡේදනී (විනය අට්ඨ කතාව), අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය, යන කෘති මහා කාශ්‍යප හිමියන් දිඹුලාගලදී රචිත කෘති අතර වේ.

### අධ්‍යාපන මධ්‍යස්ථානය

දිඹුලාගල අධ්‍යාපන මධ්‍යස්ථානය අනුරාධපුර යුගයේ සිටම පැවත ආ අතර එහි ආරම්භය වළගම්බා රජ සමයේදී බව 'අස්ගිරි තල්පත' කියයි. පොලොන්නරු යුගයේදී එහි ප්‍රධානියාව සිටියේ මහා කාශ්‍යප හිමිපාණන්ය. (මහා වංශය 78:7-8) පණ්ඩිත්‍යයෙන් හෙබි සුමේධ හිමි කාශ්‍යප හිමියන්ගේ සම වයස වූහ. මේ දෙනමගේ ශිෂ්‍යයන් අතර සිටි 'සාගරමති' විරුදාවලි ලත් සාරිපුත්‍ර මහා ස්ථවිරයෝ ත්‍රිපිටකය හා අටුවා පිළිබඳ විස්තර අඩංගු ටීකා ග්‍රන්ථකරණයේ අගතැන් වූහ. මෙරට ප්‍රථමවරට සංඝරාජ පදවියෙන් පිදුම් ලැබුවේද උන්වහන්සේය.

දිඹුලාගල වනවාසී මධ්‍යස්ථානයක් වූ බැවින් භික්ෂූන් වහන්සේලා එහි සිට ආගමික, අධ්‍යාපනික හා සාහිත්‍යමය කටයුතුවල නිරත වූයේ ලෙන් තුළ වැඩ හිඳිමිනි. පළමුවන විජයබාහු රජුගේ බිසව වූ 'සුන්දරදේවි' එහි ඇති සඳ මහ ලෙන සහ ඉර මහ ලෙන අතර මාවතක් තනවා ඇති බව දිඹුලාගල මාරාවීදිය සෙල්ලිපියක සඳහන් වේ.

එදා රාමඤ්ඤ දේශයේ පගාන් නුවර විසූ උත්තරජීව හිමියෝත් ඡප්පට සාමණේරයෝත් මහාවිහාරයේ සිට දිඹුලාගලට වැඩ එහි අධ්‍යාපනය හදාරා අභිධම්මත්ථ සංග්‍රහයට 'සංඛෙප වණ්ණනා' නමින් ටීකා ග්‍රන්ථයක් රචනා කළහ. ඡප්පට හිමියෝ දිඹුලාගලදී උපසපන් වී සද්ධම්ම ජෝතිපාල නමින් ප්‍රකටව දිඹුලාගල වැඩ සිටි භික්ෂූන් වහන්සේලා කිහිප නමක් සමග යළි රාමඤ්ඤ දේශයට වැඩම කර එරට 'සිංහල සංඝ නිකාය' පිහිටුවූ බව කල්‍යාණි ශිලා ලිපියේ සඳහන් වේ.

අනුරුද්ධ හිමියෝ දිඹුලාගලදී 'අනුරුද්ධ ශතකය' (බුදු ගුණ ගායනා), අභිධම්මත්ථ සංග්‍රහයද රචනා කළහ. දිඹුලාගල ගුරු කුලයෙන් මෙරට සාහිත්‍යයට විශාල කෘති සංඛ්‍යාවක් එක්වී ඇති නමුත් අද ඒවා අවිද්‍යාමාන අතර ඉතිරිව ඇත්තේ නාමශේෂ පමණකි.

### පරාක්‍රමබාහු යුගය

ක්‍රි.ව. 1153 දී පරාක්‍රමබාහු රජු දිඹුලාගල කොටස් දෙකකට වෙන් කළේය. ඒ ග්‍රන්ථ ධුරය හා විදර්ශනාධුරය ලෙසිනි. ජන අවශ්‍යතා සපුරාලීම, ග්‍රන්ථකරණය, ශාස්ත්‍රීය හා ඉගැන්වීම ග්‍රන්ථ ධුරයට අයත් විය. සිය ගණනක් භික්ෂූන් වහන්සේලා වැඩ සිටි එම කොටස අද නාමල් පොකුණ නමින් හැඳින්වෙයි.

වර්තමාන දිඹුලාගල විහාරයේ සිට මාරාවීදිය දක්වා වූ කොටස විදර්ශනා වඩන සංඝයා වහන්සේලා වෙනුවෙන් වෙන් විය. බෞද්ධ ලෝකයට විසල් මෙහෙවරක් ඉටු කළ උදුම්බරගිරි වෙහෙර, නිශ්ශංකමල්ල රජ සමයෙන් පසු 1213 දී ඉන්දියාවේ කාලිංග මාඝ ආක්‍රමණය හේතුවෙන් යළි විනාශය කරා එළැඹිණි.



දිඹුලාගල ලෙනේ ඉපැරණිම සිතුවමක්

> ථූපාරාමයේ වැඩ සිටි කුන්තගන්තතිස්ස මහ රහතන් වහන්සේගේ මූලිකත්වයෙන් සංඝයා වහන්සේලා 500ක් මාතලේ අලු විහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කර, දිඹුලාගලට වැඩම කර ගිරි ලෙනක ධ්‍යාන සුවයෙන් සිටි බවත් එය දැනගත් වළගම්බා රජු ඒ ගිරි ලෙන ඇතුළු විහාර කර්මාන්ත කරවා කෙත්වතු හා ගම්වර පිදූ බවත් පැවසේ

### මාඝ ආක්‍රමණයෙන් පසු

මාඝ ආක්‍රමණයෙන් පසු දිඹුලාගල විහාරාධිපති බුද්ධවංශ වනරතන හිමිපාණෝ තම ශිෂ්‍ය පිරිස දෙකොටසකට බෙදා දිඹුලාගල මේධංකර හිමි ප්‍රමුඛ භික්ෂූහු දඹදෙණියටත්, දිඹුලාගල දීපංකර හිමි ප්‍රමුඛ භික්ෂූහු යාපහුවටත් වැඩම කරවූහ.

සියවස් ගණනාවක් ලක්දිව ධර්මාලෝකයෙන් බැබළවූ දිඹුලාගල මිණිපහන දඹදෙණි යුගයෙන් පසු තවත් සියවස් ගණනාවක් නිවී ගියේය. (අනතුරුව දිඹුලාගල සඟ පරපුර යළි ඇරඹෙන්නේ සෙංකඩගලපුර අස්ගිරි විහාරයෙනි)

වසර සිය ගණනක් ඝන වනාන්තරයට යටවූ දිඹුලාගල වග වලසුන්ගේ වාස භූමියක් වූ පසු බිම්තැන්න ඇතුළු ඈත ජීවත් වූ වැදි ජනතාව දිඹුලාගල අරණට විත් එහි ගල්ලෙන්වල පදිංචි වූහ.

### ලක්දිව මුල් කාලීන සෙල්ලිපි

ලක්දිව සෙල්ලිපිවල ආරම්භක යුගය හා උදුම්බරගිරි සෙල්ලිපිවල සබඳතාවයක් පවතී. පරණවිතාන සූරීහු දිඹුලාගල සෙල්ලිපි 16ක් පිළිබඳ සඳහන් කරති. මාරාවීදිය සෙල්ලිපි 4කි. කොස්ගහඋල්පත සෙල්ලිපි දෙකකි. නාමල් පොකුණ සෙල්ලිපි 9ක් හා පුල්ලිගොඩ සෙල්ලිපි 1ක් වශයෙනි. එනමුත් ඊට අමතරව දිඹුලාගල අහස් මාලිගය අසලින් ද ක්‍රි.පූ. පළමු සියවසට අයත් සෙල්ලිපියක් හමු වී ඇත. ක්‍රි. පූ. 3 වැනි සියවසට අයත් පළමුවන පරාක්‍රමබාහු රජුගේ බිසව වූ සුන්දරදේවි විසින් සඟ රුවනට කළ පූජාවක් ගැන සෙල්ලිපියක් එහි වෙයි.

සඳ මහ ලෙන සහ හිරු මහ ලෙන අතර බැතිමතුන් දම්වැල්වල එල්ලී දුකසේ දණ නමමින් නගින අයුරු දැක සුන්දර මහදේවිය උදුම්බරගිරි මුඳුනට නැඟීම සඳහා මහ ගල් උගුලුවා එහි පිළිම, දාගැබ්, මහ බෝ සිටුවා මාවත සාදා ඊට කාලිංග ලෙනයැයි නම් කර 500ක් පමණ වූ භික්ෂූන් වහන්සේලාට පූජා කළ බැව් එහි දැක්වේ.

දිඹුලාගල ලෙන කාලිංග ලෙනයැයි නම් කළ පසු කාලිංගයන් සමග තරගකාරීව සිටි මාරයින් (පාඬින්) එම මාවත මාරාවීදිය ලෙසින් නම් කළ බැව් සඳහන්ය.

දිඹුලාගල අහස් මාලිගය අසල ක්‍රි.පූ.1 සියවසට අයත් සෙල්ලිපිය භාතියතිස්ස රජු බුද්ධ වර්ෂ 522 උපරාජ පදවිය දරන සමයේ කරවන ලද්දකි. එහි මෙසේ සඳහන්ය.

"සිය දෙවනපිය කුලහ රක්ඛ කුටහක අභයහ පුත තිස රක්ඛ.. උපක්ඛ කලයි කට... (යහපතක් වේවා. දේවානම්පියතිස්ස කුලගෙයි කුට කරණ්ණ අභය රජුගේ පුත් කිස (භාතිය තිස්ස රජු) උපරාජ පදවිය දරන කාලයේ කරවන ලදි.)

මීට අමතරව දිඹුලාගලට අයත් සෙල්ලිපියක් පොලොන්නරුව රාජ වෛශ්‍යා භූජංග මණ්ඩපයේ බැම්මට යෙදූ ගල් අතර දක්නට ලැබේ. බෝසත් විජයබා රජු පුත් කළ පිළිසකර කිරීම්වලදී මේ ගල එතැනට රැගෙනවිත් යොදන්නට ඇතැයි මතයක් වේ.

### මාරවීදිය ගුහා සිතුවම්

දිඹුලාගල ග්‍රාමයට මායිම්ව කඳු මුදුනේ තරමක් බෑවුම්ව පිහිටි මාරාවීදියේ කුඩා ලෙන් කිහිපයක් එක්කොට තනා ගත් ඉදි කිරීමක තිබූ ඉපැරණි සිතුවම්වලින් අවශේෂ පමණක් ඉතිරිව තිබේ. කුඩා ලෙන්වල ද චිත්‍ර තිබෙන්නට ඇතැයි 1897 – 99 අතර කාලයේ එහි චිත්‍රවල අවශේෂ සොයාගත් එච්.සී.පී. බෙල් වාර්තා සඳහන් කරයි.

මාරාවිදියේ චිත්‍ර සම්බන්ධයෙන් ඒ.එම්. හෝකාර්ට් (1928), ආනන්ද කුමාරස්වාමි (1927), වින්සන්ට් ස්මිත් (1930), ආචාර්ය සෙනරත් පරණවිතාන වැනි විද්වත්හු විශේෂ අවධානයක් යොමු කළහ.

එක් ලෙනක ප්‍රභා මණ්ඩලය සහිත තොරණක් යට වැඩ හිඳින බුදු රුවක්ද, හංස මෝස්තරයකට සමාන අලංකරණයක් ද තිබී ඇතැයි කියැවේ. 1897 දී බෙල් වාර්තා කර ඇත්තේ ලෙන් වියන පවා සිතුවම් කර තිබෙන්නට ඇති බව ශේෂවලින් හඳුනාගත හැකි බවයි.

හාවකු සහිත මානව රූපයක් එහි දක්නට තිබූ තවත් සිතුවමකි. එය සක්දෙව් රජු සඳ මත හාවකුගේ චිත්‍රය සලකුණු කරන අයුරු නිරූපණය කරන්නට ඇතැයි පරණවිතානයෝ අදහස් කරති.

පුරාවිදු කොමසාරිස් රාජා ද සිල්වාගේ අදහස වන්නේ එම චිත්‍රවල වර්ණ, නිමැයුම හා ශිල්ප ක්‍රමය ක්‍රි.පූ. 3 – 8 අතර අනුරාධපුර කාල පරාසයට අයත්විය හැකි බවය. අංක 2 ලෙන් වියනේද බුද්ධ චරිතයට සම්බන්ධ අවස්ථා චිත්‍රගත කර තිබෙන්නට ඇතැයි අනුමාන කෙරේ.

### නටබුන්

අතීත භික්ෂූන් වහන්සේලා භාවිත කළ පොකුණු දෙකක් දක්නට ඇත. ඉන් එකක් ඖෂධ පොකුණ ලෙස හැඳින්වේ. පොලොන්නරු යුගයට අයත් ගොඩනැඟිලි නටබුන්, ශෛලමය බුදු පිළිම, විහාර ගෙය, සඳකඩපහණ, කොරවක්ගල්, දාගැබ්, ගල්කණු, බහිරව රූප හා සංඝාවාස නටබුන් මෙහි දක්නට ලැබේ.

1954 දී කිතලගම ශ්‍රී සීලාලංකාර හිමි වනගත දිඹුලාගලට වැඩ එය වර්තමාන ජනතාවට අනාවරණය කර දුන් හිමි නම වූහ. එවකට පර්වතය පාමුල 'චන්ද්‍රමුඛි' ගල් ලෙනේ වාසය කළේ මොරානේ විල්ලානා යාපා වැදි ජන ප්‍රධානියා ඇතුළු පිරිසකි. අද වන විට එහි වැදි ජනතාවක් දක්නට නොලැබෙන අතර ඔවුහු නූතන සංස්කෘතියට අනුගත වී සිටිනු දක්නට ලැබේ.

බන්ධුල ගුණරත්න



වැදි ජන ප්‍රධානී මිල්ලානා යාපා



දිඹුලාගල ඈතට පෙනෙන අයුරු

කටාරම

# සීහලවත්ථුපකරණයෙන් හෙළිවන ඒදා ජන සමාජය

**මහාවංශය, දීපවංශය වැනි මහා සම්ප්‍රදායේ මූලාශ්‍ර තුළින් සමාජයේ ප්‍රධාන සමාජ ස්ථර පිළිබඳව විවරණයක් සිදු කළ ද එහි චූල සමාජ පිළිබඳව වාර්තාවනුයේ ඉතාම අල්ප වශයෙනි. මෙවැනි මහා සම්ප්‍රදායේ මූලාශ්‍ර අතර ජන සාහිත්‍ය මූලාශ්‍රයක් වන සීහලවත්ථුපකරණයෙන් මහා සමාජය මෙන්ම එහි චූල සමාජයන් පිළිබඳව ඉතා සියුම් විවරණයක් ලබාදෙයි.**

සීහලවත්ථුපකරණය රචනා කරන ලද්දේ කණ්ටකසෝල පටුනේ උපන් පට්ටකොට්ටි විහාරයේ විසූ ආචාර්ය ධම්මනඳී තෙරුන් වහන්සේය. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් 'ඉතා පැරණි සිංහල බණ කථා' ලෙසින් සිංහලයට පරිවර්තනය කරන ලද සීහලවත්ථුප්පකරණය සද්ධාතිස්ස රජ සමයේ රචනා කළ බවට මෙහි පවතින ප්‍රධාන රාජකීය චරිතය සද්ධාතිස්ස රජුවීමෙන් අනාවරණය වෙයි. සද්ධාතිස්ස රජු හා වළගම්බා රජු අතර කාල පරිච්ඡේදයේ සමකාලීන සමාජය මේ තුළින් හෙළිදරව් වේ.

සීහලවත්ථුපකරණය විෂය කරගත් පුරාණ සමාජය රජ, සිටු පවුල්, ධනවත් පවුල්, වෙළෙඳ පවුල්, ශිල්පීන්, කම්කරුවන්, ගොවීන්, දාසයන් සහ සැඩොල් ජනතාවගෙන්ද යුක්ත සංකීර්ණ සමාජයකි. සද්ධාතිස්ස රජු පිළිබඳව නිරන්තරයෙන් සඳහන් කිරීමෙන් ද, සිටු පවුලක් පිළිබඳව දානානිසංසය දක්වන කථාවක් සඳහන් කිරීමෙන් ද, ලජ්ජි සාමනේරයන්ගේ කථාව තුළින් මහ වෙළෙඳ පවුලක් පිළිබඳව සඳහන් කිරීමෙන් ද, දාසියක් පිළිබඳව වැඳිරියකගේ කථා වස්තුව තුළ සඳහන් කිරීමෙන් ද, අශෝකමාලා සැඩොල් කුලයක උපන් තැනැත්තියක ලෙස නිරන්තරයෙන් ඉස්මතු කිරීමෙන් ද මෙම සමාජ ක්‍රමය තුළ අනිවාර්ය සාධකයක් ලෙස 'සමාජ ස්ථරායණය' පැවති බව අනාවරණය වේ.

මෙම සමාජ ක්‍රමය තුළ සමාජයේ පහළ ස්ථරයේ සාමාන්‍ය ජනතාව සිය ජීවිතය ඉතා අපහසුවෙන් පවත්වාගෙන ගිය බව මෙයින් හෙළිදරව් වේ. සිය ප්‍රාණය මෙන් රැකගත් දියණියක උකසට තබා ලබාගන්නා ලද කහවණු අටකින් කුඩා ඉඩමක් මිලදී ගෙන ගඩොල් නිෂ්පාදනය කර ඔහුට කහවණු අටක් ඉතිරි කර ගැනීමට අවුරුදු හතක් ගිය බව දුගී ගොවියාගේ කථාවෙන් හෙළිවේ. එය එක් උදාහරණයකි. ඉහළ සමාජ ස්ථරය සැපවත් ජීවිතයක් ගත කළ ද මෙකල පහළ සමාජ ස්ථරය දුක්ඛිත ජීවිතයක් ගත කළ බව මෙයින් අනාවරණය වේ.

මෙම සමාජ ක්‍රමය තුළ එදා කුලය අනිවාර්ය සාධකයක් විය. එනම් අශෝකමාලා සැඩොල් කුලයක ඉපදීමෙන් ද ඇය හා සාලිය කුමරුගේ විවාහයට පැවති විරෝධතාවය මත සමාන කුල අතර විවාහය මෙම කාලවකවානුව තුළ ද අනිවාර්ය සාධකයක් වූ බව ගම්‍ය වේ.

සමාජයේ පහළ ස්ථිර අතර පමණක් නොව රජ සිටු මැදුරුවල ද සමාන කුල අතර විවාහ සබඳතා සිදු වූ බවට කාවන්තිස්ස රජතුමාගේ හා විහාරමහාදේවියගේ විවාහය පිළිබඳව දැක්වෙන කාවන්තිස්ස රජුගේ කතාවෙන් කියැවේ. සමාන කුල අතර විවාහය සමාජ සම්මතයක් ලෙස පැවතිය ද ඇතැම් අවස්ථාවල මෙම සමාජ සම්මතයට එරෙහිව යමින් රාජකීය වංශිකයන් ද කුලීනයන් සමග විවාහ වූ බව දැක්වෙන සැඩොල් කුලයේ දියණියක සාලිය අශෝකමාලා සමග සාලිය කුමරු විවාහයෙන් අනාවරණය වේ.

විවාහය තුළ අනිවාර්ය සාධකයක් ලෙස එකල දෑවැදි ලබාදීම සිදු විය. ඔවුන් මේ සඳහා එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ යොදා ගෙන තිබුණි. හරිතාලතිස්සගේ විවාහයේදී සුමනාට ඇයගේ මාපියන් විසින් සහල් නැළියක්, මෝල්ගසක්, වංගෙඩියක්, පියන සහිත කළයක්, බත් කන භාජනයක් ලබාදීමෙන් මේ බව තහවුරු වේ.

රජ මාළිගය තුළ ද විවාහයේදී දෑවැදි ක්‍රමය පැවති බව සඳුන් පළගේ කථාවේ සඳහන් වේ. නා රජ තම දියණියට දෑවැදි වශයෙන් රත් සඳුන් පුටුවක් ලබාදීම පිළිබඳව සඳුන් පළගේ කථාවෙන් අනාවරණය වේ.

පුරාණ සමාජය තුළ ද වැසියාගේ ප්‍රධාන ආහාරය බත් වූ අතර විවිධ සහල් වර්ග ලක්දිව තුළ පැවතුණි. එනම් ඇල් හාල්, නිවුඩු හාල්, සුවඳ හාල් සහ රත් හැල් වලින් බත් සපයා ගත් අතර මුං, මෑ, මෙනේරි, කොස්, අඹ, නෙල්ලි, පිටි, කොංගු ආදිය ද ඔවුන් ආහාරයට ගත්හ. ප්‍රධානතම ආහාරය වූයේ කැඳය. කාඩි හොදි, මොණර මස්, හා මස්, මුව මස්, ඌරු මස් වැනි ආහාර ද මී පැණි, ගිතෙල් යොදා සකස් කළ කිරිබත් ද ඔවුන් ආහාරයට ගත් ප්‍රණීත ආහාර අතර විය.

සීහලවත්ථුපකරණයෙන් හෙළිදරව් වන පුරාණ සමාජයේ පැවති වස්ත්‍ර අතර 'පොත්පීය' නම් විශේෂිත ඇඳුමක් පිළිබඳව සඳහන් වේ. කොනතිපුත්ත තෙරුන්ගේ කථාව තුළ කිඳුරියන් අහසට ගමන් කිරීමට භාවිත කළ වස්ත්‍රය 'පොත්පීය' නම් විය. මලයවාසී චුල්ල සුමනාවගේ කථාවේ එන සොහොයුරු සත් දෙනාගේ නැඟණියද පොත්පීයක් ඇඳි බව සඳහන්ය. මේ අනුව පොත්පීය යනු ගවුමක් වැනි වස්ත්‍රයක් බව අනුමාන කළ හැකිය.



සීහලවත්ථුපකරණයෙන් හෙළිදරව් කරන සමාජය ඉතා ධාර්මික සමාජ ක්‍රමයකි. සද්ධාතිස්ස රජු කුලියට ගොයම් පාගවා ගන්නා ලද මුදලින් දානයක් දීම පිළිබඳව සඳහන්වීමෙන් රජු ක්‍රියාවෙන්ම සිය ධාර්මිකභාවය පෙන්නුම් කළ බව පැහැදිලිය.

"සොඳුර දැන් ශස්‍යය කාලයයි. ශස්‍ය පැහී ඇති බැවින් බොහෝදෙන තුමූම ගොයම් කැපීම කරත්. මමත් කසාවත් හැඳගෙන දෑකැත්ත ගෙන ඇල්කෙත්වලට ගොස් ඇල්ගොයම් කපන්නෙමි. ඒ වී ගෙනවුත් බත් සාදා ව්‍යඤ්ජන සහිතකොට සංඝයාගෙන් ලබාගත් භික්ෂුනමකට දන් දෙන්නෙමි," යැයි එහි සඳහන්ය.

ධාර්මික කටයුතු ඉටු කරන්නන්හට ගම්, ජනපද, දාස දාසියන්,රාජාභරණ, රත්‍රං, ඇත් අස් රථ සහ කහවණු ලබාදීම මඟින් රජු ජනයා තුළ ධාර්මිකත්වය ඔප් නැංවීමට ක්‍රියා කළේය.

මෙම සමාජ ක්‍රමය තුළ උපාසක උපාසිකාවන්ගෙන් යුක්ත සමාජ ක්‍රමයක් බිහි වූ අතර මහා චූළී, මහාදේව වැනි උපාසකයන් ද, චුල්ලී වැනි උපාසිකාවන් ද මෙයට නිදර්ශනය. මෙනිසා එකල අඹුසැමි දූ-දරු සබඳතා මෙම සමාජ ක්‍රමය තුළ සුරක්ෂිත විය.

කම්බුඪ උපාසකයාගේ කථාව තුළ සිය සැමියාට කැඳ නිරන්තරයෙන් සපයා ඔහුගේ කුසගින්න නිමා කිරීමට වෙහෙසන කත සැමියා විසින් අස්වනු නෙළන ලද බිත්තර වී නිවෙසට ගෙන යමින් ඔහුගේ කාර්යයන්ට ද සහාය දැක්වීය.

ගඩොල් කපා ජීවත්වන දුගී ගොවියාගේ කථා වස්තුව තුළ ගොවියා පමණක් නොව දූවරුන් ද ඔහුට සහාය දක්වමින් ජීවිකා වෘත්තිය සඳහා සියල්ලන්ම එක්ව කටයුතු කර ඇති බව දක්වයි. කුටුම්භ සංරක්ෂණය උදෙසා මෙම ධාර්මික සමාජය තුළ එකිනෙකා අතර අන්‍යෝන්‍ය සහසම්බන්ධය මැනවින් සුරක්ෂිත වූ බව පැහැදිලිය.

සීහලවත්ථුපකරණයෙන් හෙළිදරව් කරන මෙම පුරාණ සමාජ ක්‍රමය තුළ විවිධ වෘත්තීන් පැවතුණි. මෙහිදී ඇඳුම් මැසීම, කපු කෙටීම, ගඩොල් කර්මාන්තය, කුඹල් කර්මාන්තය, ලෝහ කර්මාන්තය සහ විවිධ කලා ශිල්ප පැවතුණි. තිස්ස සන්නාලියගේ කථාවේ සන්නාලියක් පිළිබඳ සඳහන්වීමෙන් ද, මහාදත්තගේ කථාවෙන් වළං සාදන්නෙක් ගැන සඳහන්වීමෙන් ද, දුගී ගොවියාගේ කථාවේ ගඩොල් කපා ජීවත්වන පියෙක් හා දුවණියක් පිළිබඳව සඳහන් වීමෙන්ද මෙම සමාජ ක්‍රමය තුළ විවිධ කර්මාන්ත පැවති බව අනාවරණය වෙයි. ලෝහ කර්මාන්තය ඇසුරේ යකඩ, තඹ, රිදී, රත්‍රං, පිත්තල යන කර්මාන්ත පැවති අතර රන්කරුගේ කථාව තුළ ලෝකුරු කුනත නම් රන්කරුවකු පිළිබඳව සඳහන්වීමෙන් රන් කර්මාන්තය මෙන්ම සෙසු කර්මාන්තයන් ද පැවති බව විශ්වාස කළ හැකිය.

> ජන සමාජය තුළ පැවති කිරුම් මිණුම් පිළිබඳව විමසා බැලීමේදී අමුණ, නැළිය, නැළි භාගය, මනාව, කාල් තුනක්, එක් කාලක්, කිරිය වැනි උපකරණ භාවිත කළ අතර අමතරව ගැල්වලින් බර මැනීමේ ක්‍රමවේදයක්ද පැවතුණි.

මෙම සියලු කර්මාන්ත අතර කෘෂිකර්මාන්තය ප්‍රමුඛ විය. නූතන සමාජ ක්‍රමය තුළ පවතින කුලී ක්‍රමය සහ කුලිය සඳහා අස්වනු ලබාදීමේ ක්‍රමවේදය අතීත සමාජ ක්‍රමය තුළ ද පැවතුණි. මේ පිළිබඳව හරිතාලතිස්සයන්ගේ කථාව අනාවරණය කරයි.

"පසුදා උදෑසන දෑකැත්ත ගෙන කුඹුරකට ගොස් කුලියට ගොයම් කැපීය. ශක්තිමත් හෙතෙම ඉක්මනින් ගොයම් කපා මිනිසුන්ගේ සිත් සතුටු කළේය....ඔවුහු මධ්‍යාහ්න කාලයේදීම ඔහුට වී අමුණක් දුන්හ."

මෙම අතීත සමාජ ක්‍රමය තුළ 'කොංගු' නම් සුවිශේෂී ධාන්‍ය වර්ගයක් පිළිබඳව සඳහන් වේ. එනම් දුටුගැමුණු රජුගේ මරණය පිළිබඳ දක්වන කථා වස්තුව තුළ රජුට අතරමගදී හමු වූ කාන්තාවක කොංගු නම් ධාන්‍යයක් ලබාදීම පිළිබඳව සඳහන් වෙයි. මෙයට අමතරව වී, අමු, මුං, මෑ, මෙනේරි වැනි ධාන්‍ය වර්ග ද වගා කර තිබේ. එදා

ජන සමාජය තුළ පැවති කිරුම් මිණුම් පිළිබඳව විමසා බැලීමේදී අමුණ, නැළිය, නැළි භාගය, මනාව, කාල් තුනක්, එක් කාලක්, කිරිය වැනි උපකරණ භාවිත කළ අතර අමතරව ගැල්වලින් බර මැනීමේ ක්‍රමවේදයක්ද පැවතුණි. තෙල්, ගිතෙල් මැනීමේදී, මී පැණි මැනීමේදී නැළිය භාවිතා කළ අතර ධාන්‍ය මැනීමට ද මෙය යොදා ගත්හ.

දානයේ ආනිසංස දක්වන කථාව තුළ සිටු පවුලක එක් මහලු කාන්තාවක දුර්භික්ෂ සමයක හාල් මනාවක් ඇය සන්තකයේ පැවති බව සඳහන් කිරීමෙන් 'මනාව' යන්න ධාන්‍ය මැනීමේදී භාවිත කළ ඒකකයක් බව පැහැදිලිය. ගොවියකු විසිකිරියක ඉඩමක් මිලදී ගැනීම පිළිබඳව දුගී ගොවියාගේ කථාව ඇසුරින් සඳහන් කිරීමෙන් 'කිරිය' වැනි ඒකකයක් ඉඩම් මැනීමට භාවිතා කළ බව පැහැදිලිය. වඩා බරති හා වඩා විශාල ද්‍රව්‍ය මැන ඇත්තේ ගැල් වලිනි.

භාණ්ඩාගාරික තිස්සයන්ගේ කථා වස්තුව තුළ ගැල් සැටක් බර වස්ත්‍රවලින් කොඩි සැදූ බව සඳහන් කිරීමෙන් මේ බව අනාවරණය වේ. මෙකල පැවති ආර්ථික ක්‍රමය තුළ භාණ්ඩ හුවමාරුව ප්‍රධාන අංගයක් විය. නමුත් මෙම සමාජ ක්‍රමය තුළ මුදල් භාවිතය ද පැවතුණි. ලජ්ජි සාමණේරයන්ගේ කථා වස්තුවේ සාමණේරයන්ගේ මව මස්සක් රැගෙන දානයට බත් සෙවූ ආකාරය පිළිබඳව සඳහන් වෙයි. සැටනමකට දන්දුන් මෙහෙකාරියගේ කථාව තුළ කහවණුව පිළිබඳව සඳහන් කිරීමෙන් ද පිණ්ඩපාත විශුද්ධිය කථා වස්තුව තුළ අඩකහවණුවක් පිළිබඳව සඳහන්ව තිබීමෙන් ද මස්ස, කහවණුව සහ අඩ කහවණුව, මිල මුදල් සඳහා භාවිත කළ බව පැහැදිලිය. මෙම මිල මුදල් සංචරණය ශිල්ප ගම්මාන තුළින් තවදුරටත් වර්ධනය වන්නට ඇත. කුඹල්ගම, කිණිහිරිගම, තම්මණ, කම්පුවගම වැනි ශිල්ප ගම්මාන පිළිබඳව සඳහන්ව තිබීමෙන් මෙම සමාජ ක්‍රමය තුළ එක් එක් ශිල්පයන්ට අයත් ශිල්පීය ගම්මානවලින් යුක්ත සමාජ ක්‍රමයක් පැවති බවට ද මේ ඇසුරේ වෙළෙඳාම සීඝ්‍ර ලෙස වර්ධනය වන්නට ඇති බව ද උපකල්පනය කළ හැකිය.

මේ අනුව සීහලවත්ථුපකරණය යනු සද්ධාතිස්ස හා වළගම්බා රජුන්ගේ කාලපරිච්ඡේදයන් තුළ මෙරට ජන සමාජ හා ආර්ථික ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ඉතා වැදගත්වන මූලාශ්‍රයක් වන බව පැහැදිලිය. මෙමගින් සමාජ, ආර්ථික ලක්ෂණ පමණක් නොව ආගමික තත්ත්වය, චාරිත්‍රවාරිත්‍ර හා අභිචාර විධි පිළිබඳව අධ්‍යයනය කළ හැකි සුවිශේෂී මූලාශ්‍රයක් ලෙස නිගමනය කළ හැකිය.

දිලිනි ධනවර්ධන

---

## පූජාවලි විමසුම ~ 16

පසුගිය ලිපියෙන් අප ඔබට ඉදිරිපත් කළේ තාපස ධර්ම අටක් පිළිබඳ පූජාවලී විමසුමයි. සිල්වත් ලෙස ජීවත් වන අය මෙවැනි උසස් ජීවිත වෙතට යොමු වන අයුරු අපි පැහැදිලි කළෙමු. අද ලිපියෙන් ද ඔබ වෙත රැගෙන එන්නේ පූජාවලියේ සවන පරිච්ඡේදයෙහි එන බලවත් ඇත්තන්ට හෙවත් පාලකයන්ට කළ ජම්බුකෝවාදයයි. නැතහොත් රාජ ධර්මයට උපදෙස් දුන් බෝසත් ගිරවෙකු ගැනයි.



# බලවතුන්ට කළ ජම්බුකෝවාදය

බුදුන්වහන්සේ බලය පිළිබඳ කළ දේශනා බෞද්ධ දේශපාලන සංකල්ප විමසීමෙන් දත හැකිය. අග්ගඤ්ඤ සූත්‍රය පහදන්නේ බලය පාලකයාට අවශ්‍ය වන්නේ සමාජයේ දේපළ ආරක්ෂා කරදීම වෙනුවෙනි. තම තමන් සතු බලය එක් කෙනෙකු වෙතට ලබා දීමෙන් බලවන්තයකු නිර්මාණය කර ගනී. ඔහු මහා සම්මත

නම් වීය. පාලකයා නිර්මාණය වූයේ එතැනිනි. ඒ අනුව ජනතාවගේ බලය ගත් පාලකයා ඒ ජනතා අරමුණු ඉටු කළ යුතු වීම බෞද්ධ ඉගැන්වීමයි. අනතුරුව බලය ගැන කථා කළ චින්තකයා වූයේ මැකියාවේලිය. ඔහු ලියූ කුමාරයා පොතෙන් පාලකයා හොඳින් හෝ නරකින් බලය ලබා ගත යුතු බවත් එය තහවුරු කර ගත යුතු බවත් කියා තිබෙයි. ලෝකයේ බොහෝ නූතන පාලකයෝ මැකියාවේලිගේ ගෝලයෝ වෙති.

එලුඅත්තනගලුවංසයෙහි සංඝබෝධි කුමාරයා කරන දෙසුම තුළ බලය පාලකයා අගතිගාමී කරන අයුරු පිළිබද ප්‍රබල අදහස් ඇතුළත්ය. මේ හැර බෞද්ධ සාහිත්‍යයේ අෂ්ට බලයක් කියවෙයි. එනම් දරුවන්ගේ බලය

හැඬීමයි. ගෘහණියගේ බලය ක්‍රෝධයයි. සොරුන්ගේ බලය ආයුධයයි. රජුගේ බලය ඉසුරුමත් බවයි.

නුගතුන්ගේ බලය කලහයයි. උගතුන්ගේ බලය විමසීමයි. බහුශ්‍රැතයන්ගේ බලය නුවණයි.

ශ්‍රමණයන්ගේ බලය ඉවසීමයි. මේ ආකාරයෙන් බලය පිළිබද දීර්ඝ රසවත් කරුණු සාහිත්‍යය තුළ අන්තර්ගතය. දඹදෙණි යුගය බලවත් රජුන්ගේ යුගයකි. දෙවන පණ්ඩිත පරාක්‍රමබාහු වනාහී එකල මෙකල සිටි

ශ්‍රේෂ්ඨ දැහැමි නරපතියා ය. ඔහු බලය හොඳින් ද නරකින් ද භාවිත කළේය. රට එක්සත් කරමින් ගැඹුරු සාහිත්‍යයකට මග පෙන්වීය. ඒ සඳහා නිතරම වියත් යතිවරුන්ගෙන් උපදෙස් පැතීය. බුදුපුත් තෙරණුවෝ පූජාවලියෙන් රජුන්ට උපදෙස් දීම නිතරම සිදු කළහ. මේ එවන් අවස්ථාවකි.

තවද තෙසකුණ ජාතකයෙහි ජම්බුක නම් ගිරා පණ්ඩිතව බ්‍රහ්මදත්ත රජුගේ සිංහාසන මස්තකයෙහි වැඩ හිඳ පඤ්ච බල ප්‍රශ්නය එරජු විචාල වේලෙහි

බලං පඤ්චවිධං ලෝකෙ - පුරිසස්මිං මහග්ඝතෙ
තත්ථ බාහු බලං නාම - චරිමං වුච්චතෙ බලං
භොගබලං ච දීඝායු - දුත්‍යං වුච්චගෙ බලං
අමච්චබලං ච දීඝායු - තතියං වුච්චගෙ බලං
පඤ්චබලෙනු පත්ථද්ධො - අත්ථං වින්දති පණ්ඩිතො

යනාදීන් පඤ්ච බල ප්‍රශ්නය හා දස රාජ ධර්මයෙන් ජම්බුකෝවාද නම් ධර්ම දේශනාවක් ගිරා තුඩින් කළ දැය. ඒ දේශනාවෙහි සංතෝෂ වු රජු හා අමාත්‍යයෝ සේනාධිපති ධුරය දී අප්‍රමාණ වූ ධනයෙන් පූජා කළහ.

මේ ජම්බුකෝවාදය නම් ගිරවෙකු රජුට බලය පිළිබද කරන ලද අනුශාසනාවකි. මෙය කවර කලටත් ඔබිනය. විශේෂයෙන් කතුවරයා මෙම අදහස ඉදිරිපත් කරන්නේ තෙසකුණ ජාතක කථාව මූලාශ්‍ර කොට ගෙනය. මෙම ජාතක කථාවේ සංක්ෂිප්තාර්ථය මෙසේය.

බලය නිවැරදිව භාවිත කරන්නැයි කොසොල් රජුට දෙසූ මෙම ජාතකයෙහි අතීත කථාව රසබරය. බඹදත් රජුට දරු සම්පත් නොමැත. මෙය රජතුමා මහත් පීඩාවට පත් කළ කරුණක් වීය. දිනක් මගුල් උයනෙහි සල්ගසක තිබු කැදැල්ලක පක්ෂියෙකු දැමු බිජුවට තුනක් දැක ඒවා කවර පක්ෂියෙකුගේදැයි වැද්දන් ලවා පරීක්ෂා කර බැලීය. ඒ අනුව එකක් බකමූණු බිජුවටක් බව ද තවෙකක් සැලළිහිණි බිජුවටක් බව ද අනෙක ගිරා බිජුවටක් බව ද දැනගත් රජතුමා ඒ බිජුවට ඇමතිවරුන් තිදෙනෙකුට පවරා ආරක්ෂා කරන ලෙසත්

පැටියෙකු ලද පසු වහාම තමන්ට දන්වන ලෙසත් කීය. ඒ අනුව මුලින් උපන් බකමූණු පැටියාට වෙස්සන්තර යයි ද ඊ ළගට උපන් සැලළිහිණි පැටියාට කුණ්ඩලී යයි ද අනතුරුව උපන් ගිරා පැටියාට ජම්බුක යයිද නම් තැබීය. මේ මගේ දරුවන් යයි සිතා දරුවන් සෙයින් ම මෙම පැටවු රජ ගෙදර වැඩුණහ.

පසු දවසක මෙම දරුවන් තිදෙනා ම මහත් ගෞරවයෙන් රජ සබයට කැදවා ධර්මාසනයක් සකසා එහි හිදුවා පුත මා හැම දෙනාගේම සිත් ගන්නා රජෙකු වීමට කුමක් කළ යුතුදැයි විමසීය. දසරාජ ධර්මයෙන් රාජ්‍යය විචාරන ලෙස වෙස්සන්තර සහ කුණ්ඩලී යන දෙදෙනාම කියා සිටියහ. අනතුරුව ධර්මාසනයට නැගි ජම්බුක නම් බෝසත් ගිරවා රජුට ජම්බුකෝවාදය දේශනා කළේය. එනම් කිම?

රජ තුමනි ලෝකයේ මහත් වූ උත්සාහවන්ත රජෙකු හට බල පහක් වන්නේය.

1. අසහාය කාය බලයක් රජුට පැවතිය යුතුය.
2. රන්රිදී මුතු මැණික් සහිත භෝග සම්පත් ඇති බව ඊළඟ බලයයි.
3. සූර වීර ඇති මැති ඇමැතින් සහිත පරිවාර සම්පත් ඇති බව ද තවත් බලයකි.
4. ක්ෂත්‍රිය කුලයක හෙවත් උසස් පරපුරක ඉපදීම ද රජුට බලයකි.
5. මේ සියල්ලට ම වඩා ප්‍රඥා බලය ම උතුම් වන්නේය.

මෙහි දැක්වූ මුල් බල හතර ම පාලකයකු අගතියට ගෙන යාමට සමත් වෙයි. එහෙත් ප්‍රඥාවන්ත පාලකයා හැමකල්හි ම බබළන්නේය. ප්‍රඥාවෙන් තොර පාලකයා මහපොළවට එරෙහි වෙයි. එයින් මහපොළව කම්පා වෙයි. උපායශීලි නොවන බැවින් රාජ්‍යය දුක්පත් වෙයි. එහෙත් ප්‍රඥාසම්පන්න පාලකයා බහුශ්‍රැත බැවින් කාරණාකාරණ මැනවින් දනී. යුක්තායුක්ත දනී. එනිසා ම කීර්තිඝෝෂාව පැතිරේ. ලාභ සත්කාර ද නොඅඩුව ලැබේ. යනාදී වශයෙන් රජෙකුට ප්‍රඥාව මහත් වූ බලයක් වන අයුරු කියා දුන් බෝසත් ගිරවාගේ මෙම ජම්බුකෝවාදය වනාහී හුදෙක් අතීත බරණැස් පුරයට මතු නොව දඹදෙණි එදා යුගයටත් අප ජීවත් වන මෙදා යුගයටත් උතුම් වන්නේය.

මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි
සිංහල අංශය
කොළඹ විශ්වවිද්‍යාලය

# රහතුන් වැඩ සිටි යහන්ගල රජමහා විහාරය



පර්වතය මත ඉපැරණි චෛත්‍යය



ප්‍රදේශය පුරා විසිරී ඇති නටබුන්



කටාරම් කෙටූ ලෙනක්



දිය නොසිඳෙන ජලාශයක්

ශ්‍රී ලංකාවෙහි දක්ෂිණ ප්‍රදේශය අතීතයේදී රෝහණය සහ මාගම යන නම්වලින් හඳුන්වා ඇති අතර රෝහණ රාජ්‍යයේ දේවානම්පියතිස්ස රජතුමාගේ සොහොයුරකු වූ මහානාම කුමරු විසින් පිහිටුවන ලද බව සඳහන් වේ. යහන්ගල පුරාණ රජමහා විහාරය ඓතිහාසික රෝහණ ජනපදයෙහි පිහිටි අනුරාධපුර යුගයට අයත් විහාර සංකීර්ණයකි. එය හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් බඳගිරිය ජනපදය මධ්‍යයෙහි පිහිටා ඇත.

## භූගෝලීය පිහිටීම

ඓතිහාසික යහන්ගල පුරාණ රජමහා විහාරය හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් බඳගිරිය ජනපදය මධ්‍යයෙහි පිහිටා ඇත. වර්තමාන මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ හම්බන්තොට වරාය අතරමැද භූමි භාගයේ ස්ථාපිතව තිබේ. අක්කර පහළොවකට අධික වපසරියක ව්‍යාප්තව ඇති යහන්ගල පුරාණ රජමහා විහාරයට ඉතා පහසුවෙන් ළඟා විය හැකි ස්ථානයක පිහිටා ඇත.

## ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම

මෙම ස්ථානයේ ආරම්භය පිළිබඳව මත දෙකක් ඉදිරිපත්ව තිබේ. එක් මතයකට අනුව මෙම ස්ථානය රෝහණ රාජ්‍යය ආරම්භ වූ මහානාම රජු දවස සිදු වූවකි. ඒ අනුව මෙම ස්ථානය ක්‍රි.පූ. දෙවැනි සියවසට අයත්ය. අනෙක් මතය වනුයේ කාවන්තිස්ස රජු දවස නිර්මාණය කරන ලද්දක් බවය. මත දෙකම සැලකීමට ගත්විට මෙම ස්ථානය ක්‍රි.පූ. යුගයට අයත්වන බව පැවසිය හැකිය.



විහාරාධිපති
වඩිනාගල පඤ්ඤාලෝක හිමි

මහනුවර යුගයේ රචිත 'නම්පොත' නමැති ග්‍රන්ථයෙහි 'යාම්ලෙන' ලෙස දැක්වෙනුයේ ද මෙම ස්ථානය යැයි විශ්වාස කෙරේ. මෙයට අයත් ඉතිහාසය සනාථ කිරීමට අවශ්‍ය සාධක රාශියක් විහාර භූමියේ පැතිර පවතී.

## පාත්‍රාකාර චෛත්‍යරාජයාණන් වහන්සේ

පැතිරයන ගල්තලාවෙහි උසම ස්ථානයේ පාත්‍රාකාර චෛත්‍යයක් පිහිටා තිබෙන අතර එය මෙම ස්ථානයේ ඉතාම වැදගත් ස්ථානය වේ. විශේෂ කරුණු කීපයක් මෙම චෛත්‍ය පිළිබඳව සඳහන් කළ යුතුය. මෙම චෛත්‍යය වෙත යා යුත්තේ ගල් පඩිපෙළකිනි. එය පසෙක ප්‍රතිමා ගෘහයක් යැයි සිතිය හැකි නිර්මාණයක නෂ්ඨාවශේෂ දක්නට ලැබේ. එම නෂ්ඨාවශේෂ අතර ශෛලමය බුදු පිළිමයක් යැයි සිතිය හැකි කැඩී බිඳී ගිය කොටස් කිහිපයකි.

මෙම චෛත්‍යයට යාබදව ප්‍රමාණයෙන් අඩක් පමණ වන තවත් චෛත්‍යයක් ද දක්නට ලැබේ. එයට පසුව තවත් චෛත්‍යයක් යැයි සිතිය හැකි නටබුන් ද ඇත. අනාගතයෙහි සිදුකරනු ලබන කැණීමක දී මෙම තුන්වැනි චෛත්‍යය ද එවැන්නක් බවට තහවුරු වුවහොත් මෙය චෛත්‍ය දාමයක් පිහිටි තැනක් බවට පත්වේ.

## සඳකඩපහණ

මූලික වශයෙන් අනුරාධපුර යුගයට අයත් කලා ශිල්පවල ලක්ෂණ මෙම ස්ථානයෙන් හමුවේ. ඉහත පඩිපෙළ චෛත්‍යය වෙතට ආසන්නවත්ම තවත් එබඳු පඩිපෙළක් පිළිමගෙයක් ලෙස සැලකිය හැකි ස්ථානයකට යොමු වේ. එහි අවසානය සඳකඩපහණකි. සඳකඩ පහන් කලාවේ ආරම්භක යුගය සනිටුහන් කරන එහි කිසිඳු කැටයමක් දක්නට නැත.

## පොකුණු

ගල්තලාවේ විවිධ ස්ථානවල පිහිටි පොකුණු හයකි. ඒවා අතුරින් එකක් හැරුණු විට අනෙක් පහ විශාල පොකුණු වේ. කෙතරම් වියළි කාලගුණයකට හසු වුව ද මේවායේ ජලය සම්පූර්ණයෙන් සිඳීයාමක් දක්නට නැත.

## ශෛලමය ගෘහ නිර්මාණ

ගල්කණු යොදා ගනිමින් සකසන ලද නිර්මාණ කිහිපයක් මෙහි දක්නට ඇත. ඒවායේ කොටස් බොහෝමයක් කැඩී ගොස් ඇත. මෙම ස්ථානය පස්වලින් යටව යම්යම් කොටස් පමණක් දැක ගැනීමට හැකි තත්ත්වයේ පවතී.



## කටාරම් කෙටූ ගල් ලෙන්

කටාරම් යොදා සකස් කරන ලද ගල් ලෙන් දෙකක් මෙහි දක්නට ලැබේ. ඒ දෙකම එකිනෙකට යාබදව පවතී. ජනප්‍රවාදය අනුව අතීතයෙහි මේවායේ රහතුන්වහන්සේලා වැඩ සිට ඇත.

## මානසික සුවය සලසන පරිසරය

බඳගිරිය ගොවි ජනපදය මැද පිහිටි මෙම ස්ථානය ස්වාභාවිකවම කෙනෙකුගේ සිත සන්සුන් කිරීමට සමත් වටපිටාවකින් යුතුය. ගල මතට නගින අයකුට තමා ලෝකය මැදට පැමිණ සිටී යන හැඟීමක් ඇති වන ආකාරයට අවට පරිසරයම දර්ශනය වේ. වෙනත් ලෙසකින් පැවසුවහොත් අංශක 360ක දර්ශනයක් දැකිය හැකිය. විශේෂයෙන් නාගරික පරිසරයේ අවිවේකී බවින් සහ කෘත්‍රිම වටපිටාව හේතුවෙන් මතු වන පීඩනයෙන් මිදීම පිණිස උපකාර වන සාධකවලින් මෙම ස්ථානය නිර්මාණය වී තිබෙන බව සඳහන් කළ හැකිය.

## ජාතික උරුමය

රුහුණු රාජ්‍යය ආශ්‍රිතව නිර්මාණය වූ පුරාතන සංස්කෘතිය දැක ගැනීමටත් අධ්‍යයනය කිරීමටත් ලාංකික උරුමය කෙතරම් ඈත අතීතයක සිට පැවතෙන්නක්දැයි වටහා ගැනීමටත් මෙම ස්ථානය කදිම නිදසුනකි.

## පුදබිමට ළඟාවිය හැකි ගමන් මාර්ග

බඳගිරිය යහන්ගල පුරාණ රජමහා විහාරය වෙත ළඟා විය හැකි ප්‍රධාන මාර්ග දෙකකි. හම්බන්තොට නගරය පසුකොට තිස්ස - කතරගම වෙත දිවෙන ප්‍රධාන මාර්ගයෙහි සැතපුම් දහයක් පමණ ගිය විට පල්ලේ මත්තල මංසන්දිය මුණගැසෙන අතර එම ස්ථානයෙන් වමට හැරීමත් සමඟ බඳගිරිය ජනපදය ආරම්භ වේ.

තිස්ස - කතරගම ප්‍රධාන මාර්ගයට බද්ධවන බඳගිරිය මාර්ගයේ ආරම්භය ද මෙයම වේ.

එම මාර්ගයෙහි සැතපුම් තුනක් පමණ දුරට ගමන් ගත් විට පර්වතය ආශ්‍රිත යහන්ගල පුරාණ විහාරය හමුවේ.

මෙම ස්ථානයට ළඟා විය හැකි දෙවන මාර්ගය වනුයේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ මීගහජඳුර පිටවීමෙන් පසු හම්බන්තොට දිශාවට ගමන්කොට හයේ කණුව යන ස්ථානයෙන් වමට හැරී අනතුරුව බඳගිරිය පුරාණ රජමහා විහාරය පසුකොට බඳගිරිය මැදින් තිස්ස-කතරගම මාවතට සම්බන්ධ වන මාර්ගයේ කිලෝමීටර් හතක් පමණ ගමන් කිරීමෙනි.

**සේන වී. ගමගේ**

# කාම්බෝජ වාසල

**කාම්බෝජ වංශිකයන් සිංහල ඉතිහාසය තුළ මහත් ගරුසරුව සඳහන්ව ඇති ජනවංශයකි. ඔවුහු පූර්ව අනුරාධපුරයේ සිට මෙරට සෙල් ලිපිවල පවා සඳහන්ව ඇත්තාහ. එතැන් සිට පොළොන්නරුව ඇද වැටීම දක්වා කාම්බෝජ ජාතිකයන් ලිඛිත ලේඛනවල සනිටුහන්ව ඇත්තේ ගෞරවනීය ස්වරූපයකටය. මේ අතරින් නිශ්ශංකමල්ල(ක්‍රි.ව. 1179 -1187) රජුගේ සමයේදී කාම්බෝජ ජාතිකයන් මහත් ඉහළට නැගවිත් ඇති බව පෙනේ.**

ඒ සමයේ කාම්බෝජ වංශය සිංහල සමාජයේ මුදුනටම නැගී බව සංකේතවත් කරන ප්‍රබලම සාධකය "කාම්බෝජ වාසලය' නිශ්ශංකමල්ල රජු තම වාසල් සතරෙන් එකක් "කාම්බෝජ වාසල" යැයි නම් කර තිබුණේය. එමෙන්ම කුලවත් කුල කතුන් සමඟ සහවාසව ඔවුහු අනුරාධපුර සමයේ සිට බිහි කළ කාම්බෝජ වංශය සමාජ තීරුවක් ලෙස ප්‍රකට භූමිකාවක ද නිරතව සිටියහ. එක් විටම නිශ්ශංකමල්ල රජ සමයේ කාම්බෝජ වංශිකයන් මෙරට බහුල වන්නේ මන්ද?. එය ඉතිහාස පැනයක් නංවන නිමිත්තකි. මේ පිළිබඳ සුලබ මතය වන්නේ පාරම්පරිකව ගලා ආ ස්වදේශික කාම්බෝජ වංශිකයන්, තම මුල් භූමියේ කාම්බෝජ ජාතිකයන් ගෙන්වා ගන්නට ඇති බවයි.

එසේ නම් කාම්බෝජ ජාතිකයන් මෙහි ගෙන්වා ගැනීමට හේතුව කවරක් ද?

බාහිර ජාතීන් මෙරට ආර්ථිකයේ ප්‍රධාන ස්ථාන අත්පත් කරගෙන තිබූ සමයක එවන් බාහිර ජන වංශයකට ලංකාවේ දොර විවර වීමේ පහසුව මෙයට හේතු වන්නට ද ඇත. නමුත් නිශ්ශංකමල්ල රජුගේ රාජ්‍ය පැවැත්ම නිරතුරු අවදානමක පැවතියකි.

ඒ ඔහු මෙරට උපන් ශුද්ධ සිංහලයකු හෝ උභය කුල සිංහල රජ පෙළපත සමඟ නෑකම් හෝ නැති ඕපපාතිකයකු වන බැවිනි. ඒ නිසා දැඩි බෞද්ධාගමික ප්‍රේමයකින් කටයුතු කරමින් ඉමහත් ප්‍රචාරක යාන්ත්‍රණයක් ඒ වෙනුවෙන් දියත් කළ ද, ඔහු එම නිසා තම රජ පදවිය පිළිබඳ බියෙන් පසු වූවෙකි. එම නිසා රටේ අග නගරය විදෙස් ජනගහණයෙන් පිරී පැවතීම ඔහුට සැනසිල්ලක් විය. ඒත් කාම්බෝජ ජාතිකයන් පිළිබඳ නිශ්ශංකමල්ල රජුගේ බැඳීම ඉන් ඔබ්බට ගියාවූ බැඳීමක් බව තහවුරු වන ඉතිහාස සාක්ෂිත් අප හමුවේ ඇත.

ඒ අනුව ඔහු කාම්බෝජ වාසල නමින් තම සිවු වාසලින් එකක් නම් කොට කාම්බෝජකයන්ට ගෞරව දක්වා නැවතී නැත. රජ තෙමේ තම පොලොන්නරු වාසල සෙල් ලිපියේ මෙසේ ලියා තබා ඇත.

" කාම්බෝදීන්ට වාසලින් රන් පිළි හා කැමැති වස්තු දී කුරුල්ලන් ඇල්ලීම"

මෙමගින් හෙළි වන කරුණක් නම් කාම්බෝජ වංශිකයාට

ස්වදේශිකයන් ලවා ගෞරව දැක්වීමේ මාවතක් ඔහු පාදා ඇති බවය. මෙම ලිපිය සමඟ හෙළි වන තවත් වැදගත් ලක්ෂණය වන්නේ රජුගේ අමුතු බෞද්ධ ප්‍රචාරය ඔහුට පාරාවළල්ලක් වී ඇති බවය.

රජ තෙමේ "සිංහල බුද්ධාගම" නමින් බුදු දහමට නව ව්‍යවහාරයක් එක් කළේය. ඒ අනුව දාර්ශනික බුදුදහම තවත් වටයකින් යටපත්ව ව්‍යවහාරයන් සහ අන්තයන්වලින් විසිතුරු කර "බුද්ධාගම" නමින් විලාසිතාවක් ඔහු ඇති කළේය. නිශ්ශංකමල්ල රජතුමා මේ සියල්ල සිදු කළේ තමා පරම පූජනීය බෞද්ධයකු බව සනාථ කර දීමටය. ඒ හැර වෙන මඟක් සිංහල රාජ්‍යය පාලනය කිරීමේදී ඔහුට උරුම නොවීය.

මේ විලාසිතා බුද්ධාගම නිසා ඔහු බුදු දහමට නව නියමයන් පනවන්නේය. ඒ අනුව මතට තිත, නිර්මාංශ ප්‍රතිපදාව, සුදු වස්ත්‍ර දැරීම, දඩයම, මසුන් ඇල්ලීම පිටු දැකීම සහ බහු සරාගය, සමසරාගය පාපයක් වීම, සිරුර සපුරා වසා ගැනීම ආදී වත් සිල්වත් ප්‍රතිපදා ලෙස කියවීමක් ඇති විය. මේ සියල්ල බුදු දහම් ලෙස අරුත් ගන්වා නිශ්ශංකමල්ල ඒවා රැකීමට රාජ්‍ය මතවාදයක් සහ මෙම සදාචාර නීති රාජ නියෝග බවට ද පත් කරමින් වඩ වඩා බෞද්ධාගමිකවන්නට යත්න දැරුවේය.

ඔහුගේ වසර නවයක පාලනය මෙවන් විලාසිතා බෞද්ධ සළු පිළිවලින් වැසුණු වෙනම කතිකා කළ යුතු යුගයකි. මින් පසු කලෙක මෙරට රාජ්‍ය බලයට ඕපපාතිකව කඩා වැටෙන්නෝ සියල්ලෝම නිශ්ශංක මල්ලගේ තාලය තම තාලය ලෙස ගත්හ. ගෞතම බුදුන් වහන්සේගේ සද්ධර්මයට ඔවුහු අමුතු අන්තයක් විලාසිතාවකට හරවන අපූරුව නිරීක්ෂණය කළ හැකිය.

මෙම අන්තවාදවලින් දර්ශනවාදය වසා දැමීම එළාර රජතුමා විසින් ආරම්භ කර නිශ්ශංකමල්ල රජතුමා විසින් ස්ථාවර කළ ක්‍රියාවලියකි. එය එතැන් පටන් දඹදෙණිය යුගයේදී දේව ආගම් සමඟ මුසු වී බුද්ධාගම බවට පත්ව බුදු දහම යටපත් කළේය.

කෙසේ හෝ නිශ්ශංකමල්ලගේ දඩයම් තහනම දේශීය ජන වර්ගවලට මෙන්ම කාම්බෝජ වංශයට ද බලවත් මරු පහරක් වූයේය. බෞද්ධ ජන කොටසක් වූ කාම්බෝජ වංශිකයන්ගේ ප්‍රියතම ආහාරයක් වූයේ කුරුලු මස්ය. එමෙන්ම කුරුල්ලන් ඇති කිරීම ද කාම්බෝජයන්ගේ සිරිතකි. වෙසසින්ම කාම්බෝජ ජාතිකයන් ලෝක තරණය කළ අතීත සිදු වීම කුරුලු අපනයනය ය. භාරතය, මිසරය සහ මැලේසියානු ඉතිහාසය තුළ පවා එම රටවල කුරුලු මස් සහ කුරුල්ලන් අපනයනය කරන පිරිස් ලෙස කාම්බෝජ ජාතිකයන් හඳුන්වා දී ඇත.

මෙවන් ජන වංශයක පාරම්පරික ආහාර වේලට තහංචි පැනවීම ඔවුහු කුපිත කරවන හේතුවක් විය. නිශ්ශංකමල්ලගේ බෞද්ධ විලාසිතාව ඔහුට පාරාවළල්ල විය. එබැවින් ඔහු ඉහත දැක්වූ සෙල් ලිපිය ලියා තැබුවේය. එයින් කිය වුණේ කාම්බෝජයන්ට රන් සළුපිළි දී කුරුලු දඩයමෙන් ඉවත් කරන බවය. එය රාජ්‍ය භාණ්ඩාගාරයට බරක් එක් කළ විකාරයක් ද විය.

ඒ අනුව සිදු වූයේ කුරුලු දඩයමට පිවිස සිටි දේශීය ජනතාවට කාම්බෝජ වංශයට රන් රිදී- පටසළු පුද දී කුරුලු මස් හෝ ඇති දැඩි කිරීම සඳහා කුරුල්ලන් ලබා ගැනීමටය. මෙය නිශ්ශංකමල්ල රජතුමාට තවත් වටයකින් පාරාවළල්ලක් විය. ඒත් පැතිර ගිය මතය වූයේ සිදු වන්නේ දේශීය ජනයා සුචරිතවත් කිරීමත් විදේශීය ජනතාව සතුටු කිරීමත් බවය.

පසුව මෙරට මහා ජනවංශය වූ ගොවිගම වංශයට එරෙහිව ඍජු මතවාදී යුද්ධයකට බැසීමට නිශ්ශංකමල්ල රජුට වූ සිදු වීමෙහි අතුරු මාවත මේ කාම්බෝජ වංශය සහ ඊනියා සුචරිතය ය. පසුව නිශ්ශංකමල්ල රජතුමා තම ආරක්ෂාව සහ රාජ්‍ය ආරක්ෂාවෙහි

ප්‍රධාන බලය බවට පත් කර ගන්නේ ද කාම්බෝජ ජාතිකයන්ය. මේ සමඟ එකල සිරිලක පුරා කාම්බෝජකරණයක් දියත්ව ඇති බව දැක ගත හැකිය. කම්බෝජ වංශිකයන්ට අදාළ පුවත් සෙල්ලිපි ඉතිහාස වාර්තා එම යුගයට අදාළව රටේ සිවු දිගින්ම ලැබී ඇත.

මේ සියල්ල පෙන්වා දෙන්නේ කාම්බෝජ ජාතිකයන්ගේ සරණින් නිශ්ශංකමල්ල රැකී ඇති බවය. එය රජුට වාසියක් වූයේ කාම්බෝජ ජාතිකයන් බෞද්ධයන් ලෙස සිංහලයන් තුළ ගෞරවයට පාත්‍ර වූ ජාතියක් වීමය. අනෙක් අතින් රසවත් කුරුලු මාංශ රට රටවල රාජ රාජ අමාත්‍යවරුන්ට යවමින් කාම්බෝජ වංශිකයන් ගොඩනඟාගෙන තිබූ බලවත් විදේශීය බැඳීම් ජාලය ය. එය නිශ්ශංකමල්ල රජුට රාජ්‍ය පාලනයට අතිරේක වාසියක් බවට ද පත් වූයේය. නමුත් නිශ්ශංකමල්ල යුගයේ සිට පැතිර ගලා ගිය කාම්බෝජ වංශය

සිංහල ඉතිහාස බල මුදුනේ කාර්යයකට අත තබා නැත. නමුත් ඔවුහු මෙරට ප්‍රභූ වංශ පෙළපතේ සිට සාමාන්‍ය හුදී ජන පෙළපත් දක්වා මුහු වෙමින් ගමන් කොට අද දක්වා පවතී. එවන් වංශ නාම පෙළපත් වලින් ශ්‍රී ලංකා ආරක්ෂා හමුදා එදත් මෙදත් පිරී ඇති බව සිහි කළ යුතු ය. එවන් වංශ නාම ඇත්තන් එදා මෙන්ම මෙදා සිරිලක සූපවේද


කලාව අත්පත් කරගෙන ඇති බවට ද සිහි කළ යුතුය.



**සුජිත් අක්කරවත්ත**

දිනමිණ
2021 මාර්තු 18 බ්‍රහස්පතින්දා

# කටාරම



රිදී විහාරය

# මහනුවර සිතුවම් කලාව හැඩ කළ දෙවරගම්පල සිල්වත් තැන

මහනුවර සම්ප්‍රදායේ සිතුවම් කලාව ව්‍යාප්ත කළ සිත්තර පරම්පරා ගණනාවක් හඳුනාගත හැකිය. ඒ අතරින් නීලවල, නිලගම, උල්ලඳුපිටිය, කඩොල්ගල්ල හා දේවේන්ද්‍ර මූලාචාරී ආදී පරම්පරා කැපී පෙනේ. මෙම යුගයේ දී විහාර බිතේ තෙලිතූරෙන් දස්කම් පෑවේ ගිහියන් පමණක්ම නොවේ. උඩරටින් ඇරැඹි ආගමික ප්‍රබෝධයත්, පහතරටින් ඇරඹි ආගමික පරිහානියත් හමුවේ යුගයේ අවශ්‍යතාව මනාව වටහාගත් භික්ෂූන් වහන්සේ ද ධර්ම දේශනාවෙන් පමණක් නොව තමන්ගේ නිර්මාණශීලී හැකියාවෙන් ද පෘථග්ජන ජනයාට දහම සමීප කරවීමට උත්සුක වූහ. එසේ තෙලිතූරෙන් ධර්මය ප්‍රචාරය කළ පැවිදි සිත්තරු ගණනාවක්ම හඳුනාගත හැකි වේ.



රිදී විහාරයේ සිතුවමක්

**මහනුවර රාජධානි සමයේ බෞද්ධ සිතුවම් ඇඳි සුප්‍රසිද්ධ සිත්තරකු ලෙස "දෙවරගම්පල සිල්වත් තැන" හැඳින්විය හැකිය. උපසම්පදාව නොලත් බෞද්ධ භික්ෂුවක් වූ ඒ හිමියන්ගේ තෙලිතුඩෙන් මැවුණු සිතුවම් අග්‍රගණ්‍ය නිර්මාණ ලෙස ජනාදරයට පාත්‍ර වී ඇත.**

මෙම හිමියන් ඉපදී ඇත්තේ කෑගලු දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රදේශයේ පිහිටි දෙවරගම්පල නම් ග්‍රාමයේය. උන් වහන්සේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේදී බොහෝ ගරුබුහුමන් ලැබූ සිත්තරෙකි.

ආනන්ද කුමාරස්වාමි මහතා සඳහන් කරන්නේ කුලය පිළිබඳ ගැටලුවක් මත දෙවරගම්පල සිල්වත්තැන හිමියන්ට උපසම්පදාව නොලැබුණු බවය. එකල පැවති එකම නිකාය වූ සියම් නිකායෙහි මහණ කරන ලද්දේ ගොවි කුලයට අයත් වූවන් පමණි.

මෙම හිමියන් සමග එකට එකතු වී හෝ සමකාලීනයන් ලෙසට වැඩ කළ අනෙක් සිත්තරුන් ලෙස හිරියාලේ නයිදේ, දේවේන්ද්‍ර මූලාචාරීන්, කොස්වත්තේ හිත්තර නයිදේ, නිලගම පටබැන්දා, වැත්තෑවේ හිමියන් හා කටුවන හිමියන් දැක්විය හැකිය.

ආයිත්තා ලියද්දේ මුහන්දිරම් ලියූ "සංඝ රාජ සාධු චර්යාව" ට අනුව වැලිවිට සරණංකර හිමියන් දෙවරගම්පල සිල්වත්තැන ලවා දඹුල්ලේ බුදුපිළිම බන්දවා ඇත. දෙගල්දොරුවේ බිතුසිතුවම් දෙවරගම්පල සිල්වත්තැනගේ කෘතීන් ලෙස හඳුනාගෙන ඇති අතර උන්වහන්සේ හොඳින් දැන උගත් භික්ෂුවක් ලෙස සමාජයේ කැපී පෙනී තිබේ. "ගණින්නාන්සේ" කෙනකු වශයෙන් ජීවත් වූ හෙතෙම උගතකු වූවා පමණක් නොව උගතුන් ආශ්‍රය කළ අයෙකු වූවාට ද සැකයක් නැත. මෙම හිමියන් ජීවත් වූයේ අගනුවර අසලම විය හැකි අතර මේ නිසා දකුණු ඉන්දියාවේ නායක්කර්වරුන් සමඟ මෙහි ආ ශිල්පීන් හා වෙනත් ප්‍රදේශවලින් පැමිණි ශිල්පීන් සමඟ කටයුතු කර ඔවුන්ගෙන් චිත්‍ර කර්මාන්තය හා ඒ පිළිබඳ විධි ඉගෙන ගන්නට අවස්ථාව ලැබෙන්නට ඇති බව විශ්වාස කළ හැකිය. එම හිමියන්ගේ සිතුවම්වල පෙනෙන චමත්කාරයට හේතුව චිත්‍ර ශිල්පය පිළිබඳව තිබුණු දැනීම බව උගතුන් පෙන්වා දෙයි.

දෙගල්දොරුව විහාරයේ සිතුවම්, සිත්තර කණ්ඩායමක සිතුවම් බව එම්.සෝමතිලක මහතා පෙන්වා දෙන අතර එහි ප්‍රධානියා වී ඇත්තේ නිලගම පටබැන්දා බව එම මතයෙන් ප්‍රකාශ වේ. එස්.ඒ වික්‍රමසිංහ මහතා සඳහන් කරන්නේ මෙම විහාරයේ සියලු බිතුසිතුවම් මෙම හිමියන්ගේ බවය. හෙළ කලා ඉතිහාසයේ ආරම්භයත්, අවසානයත් බෞද්ධ භික්ෂූන් වහන්සේගෙන්ම සිදුවී තිබෙන බවට මෙය කදිම සාක්ෂියක් බව ද හෙතෙම සඳහන් කරයි.

මෙම කෘති දෙවරගම්පල සිල්වත්තැන හිමියන්ගේ බවට කිසිදු ප්‍රාථමික මූලාශ්‍රයකින් තහවුරු නොවන අතර එකම ශෛලිය අවධින් දෙකක දී සිටින ශිල්පීන් දෙදෙනකු විසින් වුව ද ප්‍රගුණ කිරීමට හොඳින් ඉඩකඩ ඇති බව මෙහිදී විශේෂයෙන් අවධානයට ලක්විය යුතු කරුණකි.

නමුත් වර්තමානයේ බොහෝ උගතුන් පිළිගත් මතය වන්නේ මෙම බිතුසිතුවම්වල නිර්මාණ අයිතිය දෙවරගම්පල සිල්වත්තැන හිමියන්ට හිමිවන බවයි. කුරුණෑගල රිදී විහාරයේ සිතුවම් ද මේ හිමියන්ගේ කෘති ලෙස සැලකේ. රිදී විහාරයේ ඉහළ විහාර මන්දිරයේ ඇතුළත දකුණු බිත්තියේ ඇඳ තිබෙන සොළොස්මස්ථාන දැක්වෙන සිත්තම විශිෂ්ට නිර්මාණයක් ලෙස හැඳින්විය හැකි අතර ස්තූපයේ ඒ ඒ කොටස්වල පරිමාව ඉතා නිවැරදිව දක්වා තිබේ. ඒ අනුව මෙය නිපුණ ශිල්පියකුගේ කාර්යයක් බව හඳුනාගත හැකිය.

එසේම ප්‍රධාන විහාර මන්දිරයේ පිට දකුණු බිත්තියේ ඇති ගනේෂ රූපය නුපුහුණු සිත්තරකුගේ නිර්මාණයක් බවට මත ඇත. එම විහාර මන්දිරයේ ඇතුළත වියනේ ඇඳ ඇති පද්ම චක්‍ර පැරණි සිතුවම් සම්ප්‍රදායට පසුකාලීන ඒවාය. තද නිල් හා රන්වන් හිරියල් භාවිතය 18 වැනි සියවස තුළ සුලබ නොවීය. ඒ අනුව මෙම විහාරයේ සිතුවම් දෙවරගම්පල සිල්වත්තැන හිමියන්ගේ කෘති ලෙස පමණක් හැඳින්විය නොහැකි බව පෙනේ.

ජනප්‍රවාදයේ පවතින පුවතකට අනුව දෙවරගම්පල සිල්වත්තැන රිදී විහාරයෙහි වැඩකරන අවධියෙහි රජතුමා උපසම්පදාව අවශ්‍ය ද නැතහොත් ගම අවශ්‍ය ද ඇසූ විට හෙතෙම ගම හොඳ යැයි පවසා ඇත. මෙනිසා ගමක් ලැබුණු බවත් උපසම්පදාව නොලැබුණු බවත් එම මතයේ අන්තර්ගත වේ. මෑතක් වනතුරුම ජීවත්ව සිටි ඇත්දත් කැටයම්කරුවන් අතර රාජගුරු ඔටුනු පණ්ඩිත ශාක්‍ය සෙනෙවිරත්න මූලාචාරිගේ අප්පු ස්වර්ණතිලක මහතා චිත්‍ර කර්මාන්තයෙහි ද පාරම්පරික දක්ෂකම් දැක්වූ මාවනැල්ලේ විසූ දුර්ලභ ගණයේ ශිල්පියෙකි. ඔහුගේ පරම්පරාව ද දෙවරගම්පල සිල්වත්තැන හිමියන් හා සම්බන්ධ වී තිබේ. එස්. ජී. චාර්ල්ස් මහතා පවසන්නේ අහුගොඩ දුම්බර යන පළාත්වල වෙසෙන බොහෝ සිත්තරුන් මේ හිමියන්ගේ පරපුරෙන් පැවත එන බවය. එසේම මාවනැල්ල ප්‍රදේශය අවට චිත්‍ර කර්මාන්තයෙහි නියැළුණු වයෝවෘද්ධ ශිල්පීන් කිහිප දෙනකු පදිංචිව සිටින බව සෝමතිලක මහතා පෙන්වා දෙයි.

එනමුත් මොවුන් දෙවරගම්පල සිල්වත්තැන හිමියන්ගේ පරපුරට ඥාති සබඳකම් තිබේ ද යන්න අනාවරණය කොටගෙන නොමැත. පැරණි අවධියෙහි විහාර චිත්‍රකරණය හා සම්බන්ධ වී සිටි බව සිතීමට තුඩුදෙන පෙළපත් නාම සහිත කාර්මික පවුල් බව හඳුනා ගෙන ඇත. මාවනැල්ල යනු දෙවරගම්පල සිල්වත්තැන හිමියන්ගේ උපන්ගම් ප්‍රදේශය වන නිසා එම ප්‍රදේශයේ චිත්‍ර කර්මය ව්‍යාප්ත වීමට එහිමිගේ බලපෑමක් හෝ සම්බන්ධයක් තිබූ බව පැවසීම සාධාරණ අනුමාන කිරීමක් විය හැකිය. එසේම මෙම ප්‍රදේශය අවට දොඩන්තලේ, දනගිරිගල හා දෙවනගල වැනි මහනුවර සමයට අයත් චිත්‍ර සහිත විහාර ගණනාවක් ද ශේෂවී පවතින අතර දනගිරිගල විහාරයේ සිතුවම් පිළිබඳව "ශ්‍රී ලංකා බිතුසිතුවම්" සඟරාවේ දනගිරිගල කලාපයේ දැක්වෙන්නේ මෙම සිතුවම් දෙගල්දොරුව, රිදී විහාරයේ සහ දඹුලු විහාරයේ සිත්තර ගුරුකුල මඟින් කෙරුණු බවය. එම විහාර ත්‍රිත්වයේ සිතුවම් කටයුතු නිලගම පරපුර මෙන්ම දෙවරගම්පල සිල්වත්තැන හිමි විසින් කරන ලද බවට ද හඳුනා ගෙන ඇත.

මෙම හිමියන්ගේ සිත්තර පරපුරට අයත් බව සැලකෙන කුලගම්මන සිරිමත් ඩයස් මහතා බුදුපිළිම හා විහාර සිතුවම් කලාවේ යෙදී සිටි මෙරට ප්‍රසිද්ධ සිත්තරෙකි. ඒ මහතා මෑතකදී අභාවප්‍රාප්ත වූ අතර ඔහුගේ ගෝලයෝ කිහිපදෙනෙක් දැනට ජීවත්ව සිටින බවත් ඔවුන් චිත්‍ර හා මූර්ති යන අංශ දෙකේම දස්කම් දක්වන බවටත් තොරතුරු ලැබේ. දෙවරගම්පල සිල්වත්තැන හිමියන්ගෙන් විහිදී ගිය සිත්තර පරපුරක් පහතරට විහාරාරාමවල සිත්තර කටයුතු කළ බවට හඳුනාගත හැකි අතර එය පහත පරිදි වේ.



දඹුලු ලෙන තුළ වියනේ සිතුවම්



දෙවරගම්පල සිත්වත්තැන ඇඳ ඇතැයි සැලකෙන සිතුවමක්



දඹුලු ලෙන් විහාරය

"ප්‍රධාන විහාර මන්දිරයේ පිට දකුණු බිත්තියේ ඇති ගනේෂ රූපය නුපුහුණු සිත්තරකුගේ නිර්මාණයක් බවට මත ඇත. එම විහාර මන්දිරයේ ඇතුළත වියනේ ඇඳ ඇති පද්ම චක්‍ර පැරණි සිතුවම් සම්ප්‍රදායට පසුකාලීන ඒවාය. තද නිල් හා රන්වන් හිරියල් භාවිතය 18 වැනි සියවස තුළ සුලබ නොවීය."

පහතරට සිත්තර පරම්පරාව උඩරටින් පෝෂණය වූ සිත්තර පරම්පරාවක් ලෙස හඳුනාගන්නා අතර මෙහිදී කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස මහනුවර විසූ ශ්‍රේෂ්ඨ චිත්‍ර ශිල්පියා වූ දෙවරගම්පල සිල්වත්තැන හිමියන්ගේ ගුරුහරුකම් මැද මෙම සිත්තර පරපුර ඇරඹි බව සනාථ වේ. පහතරටින් ගිය වැත්තෑවේ හිමියන් සහ කටුවන හිමියන්, දෙවරගම්පල සිල්වත්තැන හිමියන්ගෙන් චිත්‍ර ශිල්පය හදාරා ඇති බවට සාධක ලැබේ. තම ගුරුවරයා සමඟ එක්ව, එකී හිමිවරු විහාර කර්මාන්තයේ යෙදුන බවට ද ප්‍රකටය. පසුව සිය ගම් ප්‍රදේශයට පැමිණි කටුවන හිමියන් පහතරට චිත්‍ර ශිල්පීන් බිහිකිරීමේ පරමාර්ථයෙන් නානා කුලිකයන්ට චිත්‍ර ශිල්පය උගන්වා ඇත.

මේ අනුව සමස්තයක් ලෙස බැලූ කල පෙනී යන කරුණ වන්නේ උඩරටින් ඇරඹි ආගමික ප්‍රබෝධයත්, පහතරටින් ඇරඹි ආගමික පරිහානියත් හමුවේ යුගයේ අවශ්‍යතාවය මනාව වටහාගත් දෙවරගම්පල සිල්වත්තැන හිමියන් ධර්ම දේශනාවෙන් පමණක් නොව තමන්ගේ නිර්මාණශීලී හැකියාවෙන් ද පෘථග්ජන ජනයාට දහම සමීප කරවීමට උත්සුක වූ බවයි.

කේ. උදේනි අරුණසිරි
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
රත්නපුර

කටාරම
සංස්කරණය
බන්ධුල ගුණරත්න
'කටාරම', දිනමිණ -ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
katarama@lakehouse.lk
2021 මාර්තු 18 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.